275 වන කාණ්ඩය - 5 වන කලාපය
தொகுதி 275 - இல. 5
Volume 275 - No. 5

2020 ජනවාරි 21වන අඟහරුවාදා
2020 சனவரி 21, செவ்வாய்க்கிழமை
Tuesday, 21st January, 2020

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:
භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව පිළිබඳ වෝහාරික විගණන වාර්තාව

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
රැකියා විරහිත උපාධිධාරීන් රජයේ සේවයට බඳවා ගැනීම
එම්සීසී ගිවිසුමේ වත්මන් තත්ත්වය

දේශපාලන පළිගැනීම්:
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යතුමාගේ ප්‍රකාශය

තේරීම් කාරක සභාව

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:
උඩරට විවාහ හා දික්කසාද (ඉවත් කිරීමේ) – [ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි] – පළමුවන වර කියවන ලදී

ධීවර හා ජලජ සම්පත් පනත:
නියෝග

කල් තැබීමේ යෝජනාව:
දරුවන් පාසල්වලට ඇතුළත් කිරීමේ විධිමත් ක්‍රමවේදයක්

பிரதான உள்ளடக்கம்

அறிவிப்புக்கள்:
பிணைமுறி விநியோகம் பற்றிய தடயவியல் கணக்காய்வறிக்கைகள்

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:
வேலையற்ற பட்டதாரிகளை அரச சேவைக்கு ஆட்சேர்ப்புச் செய்தல்
எம்.சி.சி. உடன்படிக்கையின் தற்போதைய நிலைமை

அரசியல் பழிவாங்கல்:
திறன்கள் அபிவிருத்தி, தொழில்துறை மற்றும் தொழில் உறவுகள் அமைச்சரினது கூற்று

தெரிவுக்குழு

தனி உறுப்பினர் சட்டமூலங்கள்:
கண்டிய விவாகம், மணநீக்கம் (நீக்கம்) - [மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்] - முதன் முறை மதிப்பிடப்பட்டது

கடற்றொழில் நீரியல் வளங்கள் சட்டம்:
ஒழுங்குவிதிகள்

ஒத்திவைப்புப் பிரேரணை:
பாடசாலைகளில் மாணவர்களை அனுமதிப்பதற்கான முறையான வேலைத்திட்டம்

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Forensic Audit Reports on Issuance of Treasury Bonds

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Recruitment of Unemployed Graduates to Public Service
Current Status of the MCC Agreement

POLITICAL VICTIMIZATION:
Statement by Minister of Skills Development, Employment and Labour Relations

COMMITTEE OF SELECTION

PRIVATE MEMBERS' BILLS:
Kandyan Marriage and Divorce (Repeal) - [The Hon. (Ven.) Athuraliye Rathana Thero] - Read the First time

FISHERIES AND AQUATIC RESOURCES ACT:
Regulations

ADJOURNMENT MOTION:
Proper Mechanism for School Admissions

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2020 ජනවාරි 21වන අඟහරුවාදා
2020 சனவரி 21, செவ்வாய்க்கிழமை
Tuesday, 21st January, 2020

අ.භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி.ப.1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව පිළිබඳ වෝහාරික විගණන වාර්තාව
பிணைமுறி விநியோகம் பற்றிய தடயவியல் கணக்காய்வறிக்கைகள்
FORENSIC AUDIT REPORTS ON ISSUANCE OF TREASURY BONDS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත මේ වන විට ලැබී ඇති, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2015 වර්ෂයේදී සිදු කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව සම්බන්ධව විමර්ශනය කර නිර්දේශ ඉදිරිපත් කිරීමට පත් කරන ලද විශේෂ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ නිර්දේශය පරිදි අදාළ භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව පිළිබඳ පිළියෙල කරන ලද වෝහාරික විගණන වාර්තාව පාර්ලිමේන්තුවේ සියලු මන්ත්‍රීවරුන්ගේ දැනගැනීම පිණිස පාර්ලිමේන්තුවේ සභාගත කරන ලෙස මන්ත්‍රීවරුන් බොහෝදෙනෙකු විසින් 2020 ජනවාරි 03වැනි දින සභාගර්භයේදී සහ ඉන් පිටතදීත් දිගින් දිගටම කරන ලද ඉල්ලීම් ද, 2020 ජනවාරි 13වැනි දින පාර්ලිමේන්තුවේ පක්ෂ නායකයන් හා දේශපාලන පක්ෂවල නියෝජිතයන් මා සමඟ පැවැති රැස්වීමේදී කරන ලද ඉල්ලීම් ද සැලකිල්ලට භාජන කර ඒ සම්බන්ධව මාගේ තීරණය පාර්ලිමේන්තුවට දැනුම්දීමට අදහස් කරමි.

2015 වර්ෂයේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන ලද ප්‍රශ්නගත භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුවට අදාළව පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් 2016 වර්ෂයේදී සිදු කරන ලද විමර්ශනයේදී, එකී භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක් සිදුකොට ඒ තුළින් රජයට සිදුවූ නිශ්චිත අලාභය හෝ පාඩුව කොපමණද යන්න සොයා ගැනීමේ අවශ්‍යතාව අවධාරණය කරමින් නිර්දේශ ලබාදී තිබුණි. ඉන් අනතුරුව එකී භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව පිළිබඳ විමර්ශන සිදු කරන ලද විශේෂ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ නිර්දේශය පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයවීමෙන් එකී භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව පිළිබඳ වෝහාරික විගණනයක් සිදු කිරීමට කටයුතු කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව සම්බන්ධව විගණකාධිපතිවරයා විසින් ලබා දෙනු ලබන වාර්ෂික වාර්තාව සහ එකී ගිණුම් පිළිබඳ නිරීක්ෂණ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් සලකා බලන ලද අවස්ථාවේදී, මෙම වෝහාරික විගණනය පැවැත්වීම හා ඊට සම්බන්ධ කටයුතු, ඒ ක්‍රියාදාමය සහ ඊට වැය වන පිරිවැය පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් විසින් කාරක සභාව හමුවේ විස්තරාත්මකව කරුණු දැක්වීම්ද සිදු කරන ලද බව අනාවරණ කර ගන්නා ලදී.

එවැනි විගණනයක් සිදු කිරීම සම්බන්ධව විශේෂ නිපුණතාවක් හා සුදුසුකම් ඇති ජාත්‍යන්තර පාර්ශ්වයක් විසින් සිදු කරන ලද එම වෝහාරික විගණනයට අදාළ අවසන් වාර්තාව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලැබී තිබූ අතර, එම වාර්තාව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස එකී කාරක සභාවේ සභාපතිවරයා විසින් ලිඛිතව කරන ලද ඉල්ලීමට අනුව නීතිපතිවරයාගේ උපදෙස් පරිදි, භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව සම්බන්ධව පැවැත්වෙන සහ ඉදිරියේදී පැවැත්වීමට නියමිත අධිකරණ ක්‍රියාදාමවලට අගතියක් නොවන අයුරින් එකී කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරුන්ට පමණක් ලබා දීම සඳහා එම වාර්තාව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී.

ඉන් අනතුරුව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් මෙම වාර්තාව සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග සාකච්ඡා කිරීම සඳහා රැස්වීමක් කැඳවීමට කටයුතු සූදානම් කර තිබූ නමුදු, 2019.12.02දින අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරය, වාරාවසාන කිරීමත් සමඟ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග විධිවිධාන ප්‍රකාරව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ක්‍රියාත්මක වීම අහෝසි විය.

අටවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරය සඳහා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව නැවත ස්ථාපිතකොට එම කාරක සභාව විසින් මෙම වාර්තාව සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කිරීමට තවත් සැලකිය යුතු කාලයක් ගතවීමට ඉඩ කඩ ඇති බැවින් එකී කාරක සභාව ක්‍රියාත්මකව නොපවතින මෙම කාලය තුළ එවැනි කාරක සභාවල භාරකරු ලෙස මා වෙත පැවරී ඇති බලතල සහ වගකීම්, මා විසින් මෙහිදී සැලකිල්ලට භාජන කරන ලදී. ඒ අනුව, විශේෂයෙන්ම මහජන මුදල් පාලනය පිළිබඳ පූර්ණ බලය පාර්ලිමේන්තුව වෙත පැවරී ඇති බවට වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විධිවිධානද, විශේෂයෙන්ම ඒ සම්බන්ධව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සතු බලතලද සමඟ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 136 ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල මෙන්ම පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු සම්බන්ධයෙන් කිසිදු බාහිර පාර්ශ්වයකගේ මැදිහත් වීමකින් තොරව ස්වාධීනව තීරණ ගැනීමේ අයිතිය අවධාරණය කරමින් මාගේ පූර්වගාමී, හිටපු කථානායක ගරු අනුර බණ්ඩාරනායක මහතා විසින් ලබා දෙන ලද ඓතිහාසික තීරණයද මෙහිලා විශේෂයෙන් සැලකිල්ලට භාජන කරන ලදී.

එලෙසම, මෙම වෝහාරික විගණන වාර්තාව පිළියෙල කිරීම සඳහා ජාත්‍යන්තර සහ දේශීය මට්ටමේ විශේෂඥයන්ගේ සහාය ලබා ගැනීමට විශාල පිරිවැයක් දරා ඇති බැවින් මෙම වාර්තාව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයන්ට පමණක් ලබා දීමට වඩා පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු මන්ත්‍රීතුමන්ලා වෙත ලබා දීම යෝග්‍ය බව මම තරයේ විශ්වාස කරමි.

[ගරු කථානායකතුමා]

තවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14අ. ව්‍යවස්ථාව ප්‍රකාරව තොරතුරු වෙත ප්‍රවේශ වීමේ මූලික අයිතිවාසිකම කෙරෙහිද මා විසින් මෙහිදී අවධානය යොමු කරන ලද බවත් සඳහන් කරනු කැමැත්තෙමි.

ඊට අනුකූලව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව සම්බන්ධව වූ "චෝහාරික විගණන වාර්තාව" අද දින සභාගත කිරීම යෝග්‍ය බවට මම තීරණය කරමි.

තවද, මෙම භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුවට අදාළව දැනටමත් ආරම්භ කර තිබෙන සහ ඉදිරියේදී ආරම්භ වීමට නියමිත අධිකරණ ක්‍රියාමාර්ග විධිමත් හා නීත්‍යනුකූල තත්ත්වයන් යටතේ පවත්වාගෙන යෑමට මෙම තීරණය කිසිදු ආකාරයකින්, එකී අධිකරණමය ක්‍රියාමාර්ගවලට බාධාවක් හෝ බලපෑමක් සිදු වීමට අවකාශයක් ඇති නොවන බවද මාගේ විශ්වාසයයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මෙම විගණන වාර්තාව අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට තීරණය කිරීම පිළිබඳව මා ඔබතුමාට ස්තුතිවන්ත වනවා. නමුත් මා හිතනවා, පාර්ලිමේන්තුවට තමයි අප රටේ මුදල් පිළිබඳ ප්‍රධාන අධිකාරි බලය තිබෙන්නේ කියලා.

පැවැති පාලනයන් විසින් අපේ රටේ මහ ජනයාගේ ධනය මොන තරම් ප්‍රමාණයක් විනාශ කොට තිබෙනවාද කියන එක පිළිබඳව එම වාර්තාව හරහා හෙළිදරව් වෙනවාය කියලා අපි විශ්වාස කරනවා. ගරු කථානායකතුමනි, ඒ නිසා මේ සතියේදීම මේ වාර්තාව සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ දින දෙකක විවාදයක් අපට ලබා දෙන්න. මේ විවාදය පැවැත්වීම තවදුරටත් කල් තබන්න පුළුවන් එකක් නොවෙයි. ඔබතුමා එම වාර්තාව අද ඉදිරිපත් කරනවා නම්, හෙට සහ අනිද්දා කියන දෙදින තුළ මේ පාර්ලිමේන්තුවේ අපි ඒ පිළිබඳව විවාදයක් කරමු. ඒ විවාදය අපට ලබා දෙන්න කියලා මම ඔබතුමාට යෝජනා කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ තීරණය මට තනිවම ගන්න බැහැ, ගරු මන්ත්‍රීතුමනි. පක්ෂ නායකතුමන්ලාගේ රැස්වීමක් කැඳවලා අපි ඒ ගැන සාකච්ඡා කරමු. [බාධා කිරීම්]

ගරු වාසුදේව නානායක්කාර මහතා (ජල සම්පාදන පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - நீர்வழங்கல் வசதிகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - State Minister of Water Supply Facilities)
ගරු කථානායකතුමනි, එතුමාට ඒ ගැන පක්ෂ නායක රැස්වීමේදී කතා කරන්න තිබුණා. ප්‍රසිද්ධිය සඳහායි එතුමා ඒ ගැන දැන් මේ සභාවේ කථා කරන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි පක්ෂ නායක රැස්වීමක් පවත්වනවා. [බාධා කිරීම්] අපි ඒ අනුව කටයුතු කරමු.

ගරු මහින්ද අමරවීර මහතා (ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍ය සහ විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - போக்குவரத்துச் சேவைகள் முகாமைத்துவ அமைச்சரும் மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Mahinda Amaraweera - Minister of Transport Service Management and Minister of Power and Energy)
ගරු කථානායකතුමනි, එම චෝහාරික විගණන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ඔබතුමා ගත් තීන්දුව පිළිබඳවඅපගේ ප්‍රසාදය පළ කරනවා. මේ දැවැන්ත මූල්‍ය වංචාව යට ගහන්න, වැහෙන්න ඉඩ නොදී ඒ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කළ යුතුයි කියන මතයේ මේ පාර්ලිමේන්තුවේ සිටින අපි සියලුදෙනා ඉන්නවා. ඒ නිසා එම වාර්තාව සම්බන්ධයෙන් කඩිනමින් විවාදයක් පවත්වීම පිළිබඳව අප සියලුදෙනාගේ කැමැත්ත තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඒ තීරණය ගැනීම සඳහා ඉක්මනින්ම පක්ෂ නායක රැස්වීමක් කැඳවමු.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඒ ගැන පක්ෂ නායකයන්ගේ රැස්වීමේදී සාකච්ඡා කරලා, විවාදය පිළිබඳ තීන්දුව අරගෙන, එය විවාදයකට පමණක් සීමා නොකර, එම හොරකමට දායක වූ ඉහළ සිට පහළ දක්වා වූ සියලුදෙනාට දඬුවම් ලබා දීම දක්වාම ක්‍රියාත්මක වෙන්න ඔබතුමාගේ අධීක්ෂණය යටතේ කටයුතු කරාවි කියා අපි විශ්වාස කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර කුමාර දිසානායක මැතිතුමනි, අපි ඉතා ඉක්මනින් ඒ සම්බන්ධයෙන් සාකච්ඡාවක් පවත්වනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, ඔබතුමාගේ තීරණය පිළිබඳ පාර්ලිමේන්තුවේ සියලු පක්ෂවල එකඟතාව තිබෙන බවයි පෙනෙන්නේ. මා හිතන හැටියට ඒක ඉතා වැදගත් කරුණක්. මෙම කරුණ පිළිබඳව දැනට විශේෂ ත්‍රිපුද්ගල මහාධිකරණයේ නඩු පවරලයි තිබෙන්නේ. ඒ නඩු විභාගය සමාන්තර කාරණයක්. කොහොමත්, මේ වාර්තාව COPE එකට ලබා දුන් එකක්. මෙය සම්පූර්ණයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලබා දීම ඉතා වැදගත්. මොකද, මේ විෂයය පිළිබඳව අවබෝධය තිබෙන, ස්වාධීනව හිතා බලන, නිගමනවලට එළඹෙන්න පුළුවන් සියලුදෙනාට මෙයින් හොඳ ප්‍රවේශයක් ලැබෙනවා. එතකොට නිගමනවලට එළඹෙන්න පුළුවන්. මොකද, නියම වරදකරුවන් පැත්තක සිටියදී, එයට කිසිම සම්බන්ධයක් නැති මිනිසුන්ටත්, කිසිම සම්බන්ධයක් නැති මන්ත්‍රීවරුන්ටත් එම බරපතළ වංචාව උපයෝගී කරගෙන බරපතළ චෝදනා එල්ල වුණා. [බාධා කිරීමක්]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාටත් අවස්ථාවක් දෙන්නම්. පොඩ්ඩක් ඉන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ කාරණය පිළිබඳ විවාදයක් තවම පටන් ගත්තේත් නැහැ. එවැනි විවාදයක් පටන් ගන්නවා නම්, දැන් එය පටන් ගනිමු. මේ විධියට කථා කරන එකේ තේරුම මොකක්ද?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒ නිසා එම විවාදය ඉක්මනින්ම ලබා දිය යුතුයි, ගරු කථානායකතුමනි.

ගරු නිමල් ලාන්සා මහතා (ප්‍රජා සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிமல் லான்சா - சமுதாய அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Nimal Lanza - State Minister of Community Development)
ගරු කථානායකතුමනි, ඔබතුමා ගත් එඩිතර තීන්දුව පිළිබඳව අපි ඔබතුමාට විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ගරු අනුර දිසානායක මැතිතුමා ඉල්ලා සිටියා, ඉතා ඉක්මනින් ඒ පිළිබඳ විවාදයක් දෙන්න කියලා. ආණ්ඩු පක්ෂය විධියට අප ලෑස්තියි එම විවාදය කරන්න. එවිට, පසුගිය කාලයේදී footnotes දමපු ඒවාත්, ඒවා වහන්න හදපු ඒවාත් පිළිබඳව අපට කථා කරන්න පුළුවන්. රටේ සියලු ජනතාව බලාගෙන ඉන්නවා, ශ්‍රී ලංකා මහ බැංකුව මහ දවල් කොල්ල කෑවේ කවුද කියලා දැන ගන්න. එම නිසා ඉතා ඉක්මනින් ඒ පිළිබඳව විවාදයක් ලබා දෙන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු සභානායකතුමාත්, ගරු විපක්ෂ නායකතුමාත් එක්ක කථා කරලා, පක්ෂ නායකයන් සමඟත් සාකච්ඡා කරලා ඒ ගැන තීරණයක් ගනිමු.

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු කථානායකතුමනි, මෙය මේ රටේ වර්තමාන පාර්ලිමේන්තුවේ ඉන්න සියලු දේශපාලනඥයන්ටත්, මන්ත්‍රීවරුන්ටත් හානි වූ සිද්ධියක්. වර්තමාන ආණ්ඩුවේ සිටින සමහර මන්ත්‍රීවරු, ඇමතිවරු මේ වාර්තාව එළියට එනවාට කැමැති නැහැ. මෙය විමතියට කරුණක්. ඒ වාර්තාව එළියට එනවාට අකැමැති මොකද? [බාධා කිරීම්] එයට අකැමැති වෙන්න, බය වෙන්න එපා. වෙවුලන්න එපා. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අපි ඒ ගැන කතා කරන්නම්.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ජම්පර් අන්දවන්න හදනවා ඇති- [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ලිපි ලේඛනාදිය පිළිගැන්වීමේ අවස්ථාව.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (මාර්ග සහ මහාමාර්ග අමාත්‍ය, වරාය හා නාවික කටයුතු අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - வீதி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Johnston Fernando - Minister of Roads and Highways, Minister of Ports and Shipping and Chief Government Whip)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමා, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන්,

(i) 2016 වර්ෂය සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තා ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමා, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන්, මම 2018.03.01 සිට 2018.10.26 දක්වා කාලයට අදාළව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් 2019.10.23 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභා වාරයේ තෙවැනි වාර්තාවේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියා මාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමා, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන්,

(i) 2019 අංක 6 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය යටතේ 2019.11.01 සිට 2019.11.30 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන් කිරීම් පිළිබඳ සටහන;

(ii) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ජූලි 10 දිනැති අංක 2131/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iii) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 අගෝස්තු 09 දිනැති අංක 2135/55 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iv) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 අගෝස්තු 10 දිනැති අංක 2135/68 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(v) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ඔක්තෝබර් 14 දිනැති අංක 2145/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(vi) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 දෙසැම්බර් 01 දිනැති අංක 2151/60 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය

මම ඉදිරිපත් කරමි.

එම පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන සහ නියම රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු චමල් රාජපක්ෂ මහතා (මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍ය, අභ්‍යන්තර වෙළඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍ය සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சமல் ராஜபக்ஷ - மகாவலி, கமத்தொழில், நீர்ப்பாசனம் மற்றும் கிராமிய அபிவிருத்தி அமைச்சரும் உள்ளக வர்த்தக, உணவுப் பாதுகாப்பு மற்றும் பாவனையாளர் நலனோம்புகை அமைச்சரும் பாதுகாப்பு இராஜாங்க அமைச்சரும்)
(The Hon. Chamal Rajapaksa - Minister of Mahaweli, Agriculture, Irrigation and Rural Development, Minister of Internal Trade, Food Security and Consumer Welfare and State Minister of Defence)

ගරු කථානායකතුමනි, 2016 වර්ෂය සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අමාත්‍යතුමා සහ උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් නියම ඉදිරිපත් කරමි.

(i) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20(4)(ආ) වගන්තිය යටතේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ අධ්‍යක්ෂ වෙනුවට 2019 අගෝස්තු 01 දින සිට බලපැවැත්වෙන පරිදි නිසි බලධරයා ලෙස මේජර් ජනරාල් (විශ්‍රාමික) හේරත් මුදියන්සේලාගේ උදය බණ්ඩාර හේරත් මහතා පත් කිරීම සම්බන්ධයෙන් නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 අගෝස්තු 23 දිනැති අංක 2137/96 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20(4)(ආ) වගන්තිය යටතේ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙනුවට 2019 දෙසැම්බර් 13 දින සිට බලපැවැත්වෙන පරිදි නිසි බලධරයා ලෙස සම්මානිත මහාචාර්ය වීරකෝන් මුදියන්සේලාගේ අබේරත්න බණ්ඩාර මහතා පත් කිරීම සම්බන්ධයෙන් සහ 2019 සැප්තැම්බර් 24 දිනැති අංක 2142/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය පරිච්ඡින්න කරමින් උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 දෙසැම්බර් 13 දිනැති අංක 2153/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(iii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20(4)(ආ) වගන්තිය යටතේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ අධ්‍යක්ෂ වෙනුවට 2019 දෙසැම්බර් 13 දින සිට බලපැවැත්වෙන පරිදි නිසි බලධරයා ලෙස ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජනිතා අබේවික්‍රම ලියනගේ මහත්මිය පත් කිරීම සම්බන්ධයෙන් සහ 2019 නොවැම්බර් 07 දිනැති අංක 2148/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය පරිච්ඡින්න කරමින් උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 දෙසැම්බර් 13 දිනැති අංක 2153/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.

එම නියම අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු සන්දිත් සමරසිංහ මහතා
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)

ගරු කථානායකතුමනි, තිරසර සංවර්ධනය සහ පරිසර සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ

සභාපතිතුමිය වෙනුවෙන්, තිරසර සංවර්ධනය සහ පරිසර සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද, "1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ලියාපදිංචි නොකළ පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථාන: නීතිමය ක්‍රියාමාර්ග
பதிவு செய்யப்படாத தனியார் மருத்துவ நிலையங்கள்: சட்ட நடவடிக்கை
UNREGISTERED PRIVATE MEDICAL CENTRES: LEGAL ACTION

1/2020

1. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වෛද්‍යවරුන්ගේ නමින් ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කර ඇති වෛද්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව පූර්ණ කාලීන හා අර්ධ කාලීන වශයෙන් ලියාපදිංචි කර ඇති ආකාරය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) වෛද්‍යවරුන් සතු පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව පිළිබඳ අවසන් වරට සංගණනයක් සිදු කළ දිනය කවරේද;

(ii) නැවත සංගණනයක් සිදු කිරීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) ලියාපදිංචි සහතිකයක් නොමැතිව පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යෑමට එරෙහිව ගත හැකි නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

(ii) පසුගිය වසර දෙක තුළ නීතිය හමුවට පමුණුවන ලද ලියාපදිංචි නොකළ වෛද්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය සඳහන් කරන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் சுதேச வைத்திய சேவைகள் அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) மருத்துவர்களின் பெயரில் இலங்கையில் பதிவு செய்யப்பட்டுள்ள மருத்துவ நிலையங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி எண்ணிக்கை முழு நேர மற்றும் பகுதி நேர என்ற வகையில் பதிவு செய்துள்ள விதத்திற் கிணங்க தனித்தனியாக எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மருத்துவர்களுக்கு சொந்தமான தனியார் மருத்துவ நிலையங்களின் எண்ணிக்கை தொடர்பாக இறுதியாக கணக்கெடுப்பு மேற் கொண்ட திகதி யாதென்பதையும்;

(ii) மீண்டும் கணக்கெடுப்பு மேற்கொள்ள நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(iii) ஆமெனில் அத்திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) பதிவுச் சான்றிதழ் இல்லாமல் தனியார் மருத்துவ நிலையங்களை நடாத்துவதற்கு எதிராக எடுக்கக் கூடிய சட்டரீதியான நடவடிக்கை யாதென் பதையும்;

(ii) கடந்த இரண்டு ஆண்டுகளுக்குள் சட்டத்தின் முன் கொண்டுவரப்பட்ட பதிவு செய்யப்படாத மருத்துவ நிலையங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Healthcare and Indigenous Medical Services:

(a) Will she inform this House -

(i) the number of medical centres that have been registered in Sri Lanka under the names of doctors; and

(ii) the numbers of such medical centres according to the basis of their registration, i.e. whether as full-time or part-time, separately?

(b) Will she also inform this House -

(i) the date on which a census was last conducted in respect of the numbers of private medical centres belonging to doctors;

(ii) whether steps will be taken to conduct a census again; and

(iii) if so, the date on which it will be done?

(c) Will she state -

(i) what legal measures can be taken against running a private medical centre without a certificate of registration; and

(ii) the number of unregistered medical centres that have been brought before the law during the past two years?

(d) If not, why?

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා මේ වෙලාවේ ඉදිරිපත් කරන point of Order එක මොකක්ද?

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ගරු කථානායකතුමනි, මේ උත්තරීතර පාර්ලිමේන්තුව විසින් විශේෂ කාරක සභාවක් පත්කර තිබුණා, මාර්ග අනතුරු සම්බන්ධයෙන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලට පිළිතුරු දීමෙන් පසුව මම ඔබතුමාට ඒ කාරණය මතු කරන්න අවස්ථාව ලබා දෙන්නම්.

ගරු ඇමතිතුමිය පිළිතුරු දෙන්න.

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය (කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍ය සහ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி - மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூகப் பாதுகாப்பு அமைச்சரும் சுகாதாரம் மற்றும் சுதேச வைத்தியச் சேவைகள் அமைச்சரும்)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi - Minister of Women and Child Affairs and Social Security and Minister of Healthcare and Indigenous Medical Services)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 657කි.

(ii)

	වෛද්‍ය මධ්‍යස්ථාන වර්ගය	ලියාපදිංචිය ලබා ඇති සංඛ්‍යාව (2020/01/09 දිනට)
1	පූර්ණ කාලීන සාමාන්‍ය වෛද්‍ය වෘත්තියේ යෙදීම	194
2	අර්ධ කාලීන සාමාන්‍ය වෛද්‍ය වෘත්තියේ යෙදීම	394
3	පූර්ණ කාලීන විශේෂඥ වෛද්‍ය වෘත්තියේ යෙදීම	07
4	අර්ධ කාලීන විශේෂඥ වෛද්‍ය වෘත්තියේ යෙදීම	05
5	පූර්ණ කාලීන දන්ත ශල්‍ය වෘත්තියේ යෙදීම	37
6	අර්ධ කාලීන දන්ත ශල්‍ය වෘත්තියේ යෙදීම	20
	එකතුව	657

(ආ) (i) 2017.04.20 දින සිට 2018.01.11 දින දක්වා.

(ii) ඔව්.

(iii) 2020.05.01

(ඇ) (i) ලියාපදිංචිය පළමුවර සිදු කිරීම/යාවත්කාලීන කිරීම සඳහා දැනුම් දීම.

ලියාපදිංචිය සිදු කිරීම/යාවත්කාලීන කිරීම සඳහා සුදුසු කාලයක් නියම කර දෙවනවර දැනුම් දීම.

ලියාපදිංචිය පළමුවර සිදු කිරීම/යාවත්කාලීන කිරීම සඳහා වූ නීතිමය නිවේදනය නිකුත් කිරීම. (මාසයක් කල් දීමක් සමඟ)

එම නිවේදනය නොසලකා හැරීම හෝ ඒ අනුව ක්‍රියාත්මක නොවන්නේ නම් අදාළ ප්‍රදේශයේ මහෙස්ත්‍රාත් උසාවියක නඩු පැවරීම

මහෙස්ත්‍රාත් උසාවියක නියෝගය මත එම පෞද්ගලික වෛද්‍ය ආයතනය වසා දැමීමට කටයුතු කිරීම.

(ii) ලියාපදිංචිය නොලබා පවත්වාගෙන යනු ලබන වෛද්‍ය මධ්‍යස්ථාන 511 සඳහා 2019 වසර තුළ නීතිමය නිවේදන නිකුත් කර ඇත.

(ඈ) පැන නොනඟී.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, අටවන පාර්ලිමේන්තුවේ හතරවන සැසිවාරයේදී වාචික පිළිතුරු අපේක්ෂාවෙන් අසන ලද පළමුවන ප්‍රශ්නයට මට අංග සම්පූර්ණ පිළිතුරක් ලබා දීම පිළිබඳව සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා විෂයය භාර අමාත්‍යතුමියට ප්‍රථමයෙන්ම මගේ ගෞරවය පුද කරනවා.

ගරු ඇමතිතුමියනි, මේ සංඛ්‍යා ගැඹුරින් පරිශීලනය කර බැලුවොත් ඔබතුමියට පෙනේවි, ඔබතුමිය නියෝජනය කරන රත්නපුරය දිස්ත්‍රික්කයේ සහ මා නියෝජනය කරන මාතර දිස්ත්‍රික්කයේ -සමස්ත වශයෙන් සබරගමුව සහ දකුණු පළාත්වල- මීට වඩා වෛද්‍ය මධ්‍යස්ථාන ගණනක් තිබෙන බව. ඒක අපේ ඇස් බැල්මටම පෙනෙනවා. මේ කියන සංඛ්‍යාව නොවෙයි, භූමියේ පවතින යථාර්ථය. ඒ නිසා, හුදෙක් ලියාපදිංචි කරන්න කියලා දැන්වීමක් දැමීමෙන් හෝ ඒ පිළිබඳව දැනුවත් කිරීමෙන් එහාට ගිහින්, ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයත් සමඟ බද්ධ කර පසුවිපරමක් සිදු කරන ක්‍රියාමාර්ගයක් හරහා මේ පවතින සෞඛ්‍ය මධ්‍යස්ථාන - දන්ත වෛද්‍ය මධ්‍යස්ථානයක් හෝ සාමාන්‍ය වෛද්‍ය මධ්‍යස්ථානයක් හෝ පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයක් වෙන්න පුළුවන්- වඩා විධිමත් ක්‍රමවේදයක් යටතේ ගොනුගත කරන විශේෂ ක්‍රියා මාර්ගයක් කෙරෙහි අමාත්‍යාංශයේ අවධානය යොමු කරන්න පුළුවන්ද?

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
ඒ සඳහා විශේෂ අවධානයක් යොමු කරලා, අපි පාර්ලිමේන්තුවටත් ඒ ගැන වාර්තා කරන්නම්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා අහනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යාංශය රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයත් එක්ක එකතු වෙලා, ආනයනික කිරි පිටි පරිභෝජනය සීමා කිරීම සඳහා ඊයේ දවසේ දීප ව්‍යාප්ත වැඩ පිළිවෙළක් ආරම්භ කළ ආකාරය මා දැක්කා. ගරු ඇමතිතුමියනි, ඔබතුමියටත් මතක ඇති, ගරු බුද්ධික පතිරණ මැතිතුමා කර්මාන්ත හා වාණිජ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා වශයෙන් සිටි කාලයේ ආනයනික කිරි පිටි සම්බන්ධයෙන් වාර්තාවකුත් මේ පාර්ලිමේන්තුවේ සභාගත කළ බව. ගරු කථානායකතුමනි, මට මතකයි ඔබතුමා ඒ වෙලාවේ කිව්වා, ඒ සම්බන්ධයෙන් දිනක විවාදයක් දෙන්නම් කියලා. මම ඒ කාරණයත් මේ අවස්ථාවේ මතක් කරනවා.

ගරු ඇමතිතුමියනි, ආනයනික කිරි පිටි පරිභෝජනය අඩු කරන්න සෞඛ්‍ය අමාත්‍යාංශය පැත්තෙන් සිදු කෙරෙන මැදිහත් වීම හොඳයි. ආනයනික කිරි පිටි නිසා සෞඛ්‍ය ක්ෂේත්‍රයටත් ප්‍රශ්න ගණනාවකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ කිරි පිටි ආනයනය සීමා කිරීම සඳහා ආණ්ඩුවක් හැටියට ඔබතුමන්ලාට ස්ථාවර පියවරක් ගන්න බැරිද?

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

ගරු කථානායකතුමනි, රටේ පරිභෝජනය සඳහා අවශ්‍ය දියර කිරි ප්‍රමාණය අපට තවම නිෂ්පාදනය කර ගන්න බැරි වෙලා තිබෙනවා. අපි පුංචි කාලයේ නම් ගමේ ඉන්න බටු හරකාගෙන් ලබාගත් කිරි බෝතලයක් අපේ ගෙවල්වලට ගෙනැල්ලා දුන්නා. හැබැයි දැන් ග්‍රාමීය මට්ටමිනුත් ඒ තරම් කිරි ගවයන් සංඛ්‍යාවක් නැහැ. ඒ නිසා මම හිතන විධියට රටට අවශ්‍ය ප්‍රමාණයට දියර කිරි නිෂ්පාදනය තවම සිදු වන්නේ නැහැ, මේ ගැටලුව සම්බන්ධයෙන් දැඩි ස්ථාවරයකට යන්න. ඒ නිසා අදාළ අනෙක් අමාත්‍යාංශ සමඟත් එකතු වෙලා, ඉදිරියේදී ක්‍රමක්‍රමයෙන් තමයි දියර කිරි භාවිතයට ජනතාව යොමු කරන්න සිද්ධ වෙන්නේ. තවම මේ ආණ්ඩුව වැඩ කටයුතු පටන් ගෙන මාස දෙකක්වත් නැහැ. ආණ්ඩුවක් විධියට අපි ඉදිරියේදී ඒ සඳහා ක්‍රියාමාර්ග ගන්නවා. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්න දෙකකට විතරයි අවස්ථාව දෙන්නේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, ඒ පිළිබඳ කලින් පොරොන්දු වූ විවාදය - [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒ විවාදය ගැන මම පක්ෂ නායක රැස්වීමේදී කථා කරන්නම්, ගරු මන්ත්‍රීතුමනි.

ප්‍රශ්න අංක 2 -41/2020- (1), ගරු චමින්ද විජේසිරි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

පිරිවෙන් අධ්‍යාපන ආයතන: ගුරු හිඟය
பிரிவெனாக் கல்வி நிறுவனங்கள்: ஆசிரியர் பற்றாக்குறை
PIRIVENA EDUCATIONAL INSTITUTES: TEACHERS' SHORTAGE

69/2020

3. ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) පිරිවෙන් අධ්‍යාපන ආයතන සඳහා ගුරුවරුන් බඳවා ගැනීමේදී සලකා බලනු ලබන මූලික අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(ii) දැනට පිරිවෙන් අධ්‍යාපන ආයතනවල ගුරු හිඟයක් පවතින්නේද;

(iii) එසේ නම්, ගුරුවරුන්ගේ හිඟය කොපමණද;

(iv) අධ්‍යාපන අමාත්‍යාංශයේ, පිරිවෙන් අධ්‍යාපන ඒකකය මඟින් පිරිවෙන් අධ්‍යාපනය නංවාලීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) பிரிவெனாக் கல்வி நிறுவனங்களுக்கான ஆசிரியர்களை ஆட்சேர்ப்பு செய்கையில் கவனத்திற் கொள்ளப்படுகின்ற அடிப்படை கல்வித்தகைமைகள் யாவை;

(ii) தற்போது பிரிவெனாக் கல்வி நிறுவனங்களில் ஆசிரியர் பற்றாக்குறை நிலவுகின்றதா;

(iii) ஆமெனில் மேற்படி பற்றாக்குறை நிலவுகின்ற ஆசிரியர்களின் எண்ணிக்கை யாது;

(iv) கல்வி அமைச்சின் பிரிவெனாக் கல்விக் கூறு மூலமாக பிரிவெனாக் கல்வியை மேம்படுத்த மேற்கொண்டுள்ள நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House-

(i) the basic educational qualifications that are taken into consideration when teachers are recruited to Pirivena educational institutes;

(ii) whether there is a shortage of teachers in Pirivena educational institutes at present;

(iii) if so, what the shortage of teachers is; and

(iv) the steps that have been taken to uplift Pirivena education by the Pirivena Education Unit in the Ministry of Education?

(b) If not, why?

ගරු රංජිත් සියඹලාපිටිය මහතා (අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய - கல்விச் சேவைகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Ranjith Siyambalapitiya - State Minister of Education Services)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලය මඟින් පරිවේණාචාර්යවරුන් අනුමත කිරීම සඳහා සලකා බැලෙන සුදුසුකම් වශයෙන් දක්වා ඇති පහත සඳහන් සුදුසුකම් අතුරින් එක් සුදුසුකමක් සපුරා තිබීම ප්‍රමාණවත් වේ.

* විශ්වවිද්‍යාල උපාධිය.
* ප්‍රාචීන පණ්ඩිත උපාධිය.
* විශ්වවිද්‍යාලවල කලා යෝග්‍යතා ප්‍රථම ශාස්ත්‍ර පරීක්ෂණය.
* ප්‍රාචීන මධ්‍යම සාමර්ථ්‍ය සුදුසුකම.
* විද්‍යෝදය හා විද්‍යාලංකාර අවසාන විභාග සාමර්ථ්‍ය සහතිකය.
* වේනමුල්ල සමාජ සේවා භික්ෂු පුහුණු ආයතනයේ අවසන් විභාග සාමර්ථ්‍ය සහතිකය.
* පල්ලේකැලේ ජාත්‍යන්තර බෞද්ධ විශ්වවිද්‍යාල උපාධිය.
* රජයේ ගුරු විද්‍යාල පුහුණු සහතිකය.
* අ.පො.ස. උසස් පෙළ විභාග සාමර්ථ්‍ය සහතිකය.
* ජාතික නැටුම්/සංගීත අවසාන විභාග සාමර්ථ්‍ය සහතිකය.
* එච්.එන්.ඩී/චාර්ටඩ් සහතික හා විශ්වවිද්‍යාල කොමිෂන් සභාව මඟින් පිළිගනු ලබන අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පත්වීම් ලබාදීම සඳහා අනුමත කර ඇති අධ්‍යාපන සහතික.
* පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලය මඟින් අනුමත කරනු ලබන වෙනත් සහතික.

(ii) 2019 මැයි මස 09වන දිනට පැවැති සියලු ගුරු පුරප්පාඩු පුරවා ඇත.

(iii) 2019 මැයි මස 09වන දිනට පැවැති සියලු ගුරු පුරප්පාඩු පියවා ඇත. ඉන්පසු ඉදිරිපත් වූ පුරප්පාඩු සඳහා 2019.11.11 දින පැවැති පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලයේදී, ගුරු යෝජනා 272ක් අනුමත වී ඇත. ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කරන ලද කාල සීමාවේදී මෙම පත්වීම් අනුමත වී ඇති අතර, මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිගේ අංක. EC/EDR/PRE-2019 හා 2019.09.18 දිනැති චක්‍රලේඛයේ උපදෙස් පරිදි පත්වීම් ලබාදීම අත්හිටුවා ඇත.

තවද, ජනාධිපතිවරණය හේතුවෙන් අත්හිටුවන ලද සියලු බඳවා ගැනීම් නැවත සමාලෝචනය කර දැනුම් දෙන තෙක් තවදුරටත් තාවකාලිකව අත්හිටුවන ලෙස භාණ්ඩාගාර ලේකම්ගේ අංක DMS/Policy/Recruitments හා 2019.11.20 දිනැති ලිපියෙන් උපදෙස් ලබා දී ඇත.

නමුත්, තාවකාලිකව අත්හිටුවා ඇති එම පත්වීම් නැවතත් ලබාදීම සඳහා ඉල්ලීමක් මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කර ඇති අතර, ඉන් ලැබෙන තීරණය මත අදාළ පත්වීම් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

(iv) ඔව්.

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ඒකකය මඟින් පිරිවෙන් අධ්‍යාපනය නංවාලීමට ගෙන ඇති පියවර.

* දුෂ්කර පළාත්වල සහ උතුරු-නැඟෙනහිර පළාත්වල පිරිවෙන් ආරම්භ කිරීමට හා ඊට අවශ්‍ය මානව, භෞතික සම්පත් ලබාදීම.
* පිරිවෙන්වල ගුරු පුරප්පාඩු ප්‍රමාදයකින් තොරව ලබාදීම හා පිරිවෙන්වල සියලු පරිවේණාචාර්යවරුන් සඳහා නේවාසික වැඩමුළු පවත්වා, ගුරු පුහුණු පළාත් මට්ටමින් හා ජාතික මට්ටමින් පවත්වා අවසන් කිරීම.
* 2015 වසරේ සිට 2019 වසර දක්වා පිරිවෙන් 100ක් සඳහා රුපියල් ලක්ෂ 40කට වැඩි කාර්යාල ගොඩනැඟිලි සහ නේවාසිකාගාර ලබාදීම.
* 2015 වසරේ සිට 2019 වසර දක්වා පිරිවෙන් 292ක් සඳහා රුපියල් ලක්ෂ 12ක් වන සනීපාරක්ෂක පද්ධති හා ගොඩනැඟිලි ලබාදීම.
* නව විෂය නිර්දේශ පොත් රචනා කොට, මුද්‍රණය කොට නිසි පරිදි බෙදා හැරීම.
* නව විෂය නිර්දේශයට අදාළ නව පෙළ පොත් රචනා කොට, මුද්‍රණය කොට නිසි පරිදි බෙදා හැරීම.
* සියලු පිරිවෙන් සිසුන් සඳහා සුරක්ෂා සිසු රක්ෂණය ක්‍රියාත්මක වීම.
* රජයේ පාසල් සඳහා ලබා දෙන පොදු පහසුකම් ද ලබා දීමට පියවර ගෙන තිබීම.
* පිරිවෙන්වල අධීක්ෂණ හා නියාමන කටයුතු කඩිනම්ව හා ක්‍රමවත්ව පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය මානව සම්පත් වන, පිරිවෙන් අධීක්ෂණ සම්බන්ධීකරණ නිලධාරින් අනුයුක්ත කොට අවශ්‍ය පියවර ගෙන තිබීම.

(ආ) අදාළ නොවේ.

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු කථානායකතුමනි, සම්පූර්ණ පිළිතුරක් ලබා දීම සම්බන්ධව අපේ රාජ්‍ය ඇමතිතුමාට මා ස්තුතිවන්ත වනවා.

මා ඇසූ ප්‍රශ්නයට එතුමා ලබා දුන් පළමුවැනි පිළිතුරේ තිබුණා, අපොස උසස් පෙළ සමත්වීම ප්‍රමාණවත් කියන කාරණය. ඒ කාරණය පිළිබඳව විස්තරාත්මකව දැනගන්න මා බලාපොරොත්තු වනවා. ඒ කියන්නේ, තරග විභාගයකින් තොරව, සෘජුව ගුරු පත්වීමක් ලබාගැනීමට G.C.E. A/L පමණක් තිබීම ප්‍රමාණවත්ද කියන කාරණය.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ වෙනකොට සමාජය තුළ කථිකාවක් යනවා, රජයේ පාසල්වලට ගුරු සහායකයන් බඳවා ගැනීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වනවා කියලා. මා දන්නා තරමින්, ගුරුවරුන් බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියට අනුව, - විශේෂයෙන් පළාත් සභාවලත් මෙය තිබෙනවා- ගුරු සහායකයන් වේවා, ගුරුවරුන් වේවා, තරග විභාගයක් පවත්වා බඳවා ගැනීමේ ක්‍රමය තමයි අපේ රටේ වර්තමානයේ ක්‍රියාත්මක වෙන්නේ.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ගුරු සහායකයන් බඳවා ගැනීමට ඔබතුමන්ලා තීන්දු කර තිබෙනවාද? එසේ බඳවා ගන්නවා නම්, තරග විභාගයකින් බඳවා ගැනීමට කටයුතු කරනවාද, එසේත් නැත්නම් වෙනත් ක්‍රමවේදයක් පාවිච්චි කරන්න බලාපොරොත්තුවෙන් සිටිනවාද කියන කාරණය මම දැනගන්න කැමැතියි.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු කථානායකතුමනි, මම මුලින් සඳහන් කළේ පිරිවෙන් ආචාර්යවරුන් බඳවා ගැනීම සඳහා වූ වැඩ පිළිවෙළ ගැනයි. ගුරු සහායකයන් බඳවා ගැනීම සඳහා වූ වැඩ පිළිවෙළ අපි සකස් කරගෙන යනවා. ඒක බොහෝ විට විනිවිදභාවයෙන් යුතු වැඩ පිළිවෙළක්.

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
තරග විභාගයකින් බඳවා ගන්නවාද නැත්නම්,-

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
අපි තවම ඒ පිළිබඳ අවසාන නිගමනයකට පැමිණ නැහැ. නමුත් අපි බලාපොරොත්තු වෙනවා, ගුරුවරුන් බඳවා ගැනීමේ ක්‍රමවේදය නිසි පරිදි විනිවිදභාවයෙන් යුතුව ක්‍රියාත්මක කරන්න.

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මගේ අතුරු ප්‍රශ්නය වුණේ තරග විභාගයක් නැතිව බඳවා ගැනීමේ ක්‍රමයක් දැනට තිබෙනවාද යන්නයි.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
පිරිවෙන් ආචාර්යවරුන් බඳවා ගැනීමේදී තරග විභාග පැවැත්වූයේ නැහැ.

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
තරග විභාගයකින් පිට ඔබතුමන්ලා ගුරුවරුන් බඳවා ගන්නා ක්‍රමවේදයක් ඇති කරනවාද නැද්ද කියන කාරණයයි මට දැන ගන්න ඕනෑ.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
නැහැ. එහෙම වෙන්නේ නැහැ.

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
රාජ්‍ය අමාත්‍යතුමා කියන්නේ තරග විභාගයකින් ගුරුවරුන් බඳවා ගන්නවා කියලායි.

ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්නයට අදාළ දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා අහනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නයෙන් ගරු අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යතුමාගෙන් කරුණු දෙකක් ගැන දැන ගන්න කැමැතියි. එක් කරුණක් තමයි, දරුවන්ගේ නිල ඇඳුම් වවුචරයේ මුදල් කප්පාදු කිරීමක් ගැන දැන් මාධ්‍යවල සාකච්ඡා වන එක. දෙවන කරුණ හැටියට මා ඔබතුමාගේ හදිසි අවධානය යොමු කරන්න කැමතියි, පොළොන්නරුව අධ්‍යාපන විද්‍යා පීඨයේ ගුරු ශිෂ්‍ය ශිෂ්‍යාවන් මුහුණ දෙන බරපතළ ගැටලු කිහිපයක් පිළිබඳව. එයින් එකක් තමයි එහි වතුර නැහැ. ඒ වාගේම සියලු වැසිකිළි උතුරා ගිහිල්ලා තිබෙනවා. ගුරු ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඉගෙන ගන්නේ hall එකක. ඇඳුම් පැළඳුම් පවා තියා ගන්න තැනක් නැති නිසා ඉතා විශාල පීඩාවකට ඔවුන් මුහුණ දීලා තිබෙනවාය කියලා ඒ දෙමව්පියන් අපට දැනුම් දීලා තිබෙනවා. ඒ සඳහා ඉක්මන් මැදිහත්වීමක් කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන අතර, පාසල් ළමුන්ට නිල ඇඳුම් සඳහා ලබා දුන් වවුචරයේ මුදල් අඩුවෙලා තිබෙනවාද, ඒ විධියට මුදල් අඩුවෙලා තිබෙනවා නම් ඒ ඇයි කියන කාරණය මම දැනගන්න කැමැතියි.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු කථානායකතුමනි, නිල ඇඳුම් වවුචරයේ මුදල් කිසිසේත්ම අඩුවෙලා නැහැ. සියයට 17ක් වැට් බද්ද සහ ජාතිය ගොඩනැඟීමේ බද්ද ඒ තුළ තිබුණා. දැන් තිබෙන්නේ බදු හැටියට තිබෙන්නේ සියයට 8යි. එහි වාසියත් මේ දරුවන්ට මේ තරගකාරී තත්ත්වය තුළ යා යුතුයි කියන මතයේ තමයි අපි ඉන්නේ.

ගරු මන්ත්‍රීතුමා ඇසූ පොළොන්නරුවේ අධ්‍යාපන විද්‍යා පීඨයේ ප්‍රශ්නය පිළිබඳවත් අපි දැඩි අවධානය යොමු කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 - 2/2020 - (1), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 - 42/2020 - (1), ගරු චමින්ද විජේසිරි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දහම් පාසල් ගුරුවරුන්: රජයෙන් ලබන ප්‍රතිලාභ
அறநெறிப் பாடசாலை ஆசிரியர்கள்: அரசாங்கத்தினால் வழங்கப்படும் நன்மைகள்
DHAMMA SCHOOL TEACHERS: BENEFITS PROVIDED BY GOVERNMENT

70/2020

6. ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාව තුළ මේ වනවිට ලියාපදිංචි කර ඇති දහම් පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) දහම් පාසල් ගුරුවරුන්ට රජය විසින් ලබාදෙන ප්‍රතිලාභ කවරේද;

(iii) දහම් අධ්‍යාපනය නංවාලීම සඳහා මෙම ස්වේච්ඡා දහම් පාසල් ගුරුවරුන් වෙනුවෙන් ඉදිරියට සැලසුම් කර ඇති වැඩසටහන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் புத்தசாசன, கலாசார மற்றும் சமய அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்டவினா:

(அ) (i) இலங்கையில் இது வரை பதிவுசெய்யப்பட்டுள்ள அறநெறிப் பாடசாலைகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) அறநெறிப் பாடசாலை ஆசிரியர்களுக்கு அரசாங்கத்தினால் வழங்கப்படுகின்ற பிரதி பயன்கள் யாவை என்பதையும்;

(iii) அறநெறிக் கல்வியை மேம்படுத்த மேற்படி தன்னார்வ அறநெறிப் பாடசாலை ஆசிரியர் களுக்காக திட்டமிடப்பட்டுள்ள எதிர்கால வேலைத்திட்டங்கள் யாவை என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddhasasana, Cultural and Religious Affairs:

(a) Will he inform this House-

(i) the number of Dhamma Schools registered within Sri Lanka at present;

(ii) the benefits provided to Dhamma School Teachers by the Government; and

(iii) the programmes planned for these volunteer Dhamma School Teachers in order to uplift the Dhamma education?

(b) If not, why?

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ශ්‍රී ලංකාව තුළ මේ වන විට ලියාපදිංචි කර ඇති බෞද්ධ දහම් පාසල් සංඛ්‍යාව 11,032කි.

(ii) වර්ෂයකට එක් වරක් එක් ගුරුභවතෙකුට රුපියල් 5000 බැගින් දහම් පාසල් ගුරු දීමනා ලබාදීම.

වාර්ෂිකව දහම් පාසල් ගුරු නිල ඇඳුම් ප්‍රදානය කිරීම.

දහම් පාසල් ගුරු පුහුණු වැඩමුළු පැවැත්වීම.

සාමදාන විනිශ්චයකාර පදවි පිරිනැමීම.

බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය එක්ව දහම් සරසවිය බුද්ධ ධර්ම ඩිප්ලෝමා වැඩසටහන තුළින් ඩිප්ලෝමා ලබාදීම.

පාලි භාෂා ප්‍රවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම.

වසර 50ක දහම් පාසල් සේවා කාලය සම්පූර්ණ වූ ගුරුභවතුන් සඳහා වෛද්‍ය ආධාර ලබාදීම.

(iii) ඉදිරියට ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර ඇති වැඩසටහන්

දහම් පාසල් ගුරුභවතුන් සඳහා දේශීය හා විදේශීය වශයෙන් වන්දනා වැඩසටහන් සංවිධානය.

දහම් පාසල් ගුරුභවතුන් රක්ෂණය කිරීම සඳහා ව්‍යාපෘතියක් සැලසුම් කර තිබීම.

දහම් පාසල් ගුරුවරුන්ගේ සේවා කාලය ඇගයීම සඳහා ගුරු උපහාර වැඩසටහන් පැවැත්වීම.

මාසිකව රුපියල් 2000/-ක ගමන් වියදම් දීමනාවක් ලබාදීමට යෝජනා කර තිබීම.

(ආ) අදාළ නොවේ.

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු ඇමතිතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබාදීම සම්බන්ධව ඔබතුමාට බොහොම ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, මේ රටේ බෞද්ධ ජනතාව වෙනුවෙන් වැඩ කරන නායකයකු විධියට ඔබතුමාත් දන්නවා ඇති කියා මා හිතනවා, මේ රටේ බෞද්ධ ආගම විතරක් නොව සියලු ආගම් නඟා සිටුවීම වෙනුවෙන් දහම් අධ්‍යාපන ආයතන විශාල සේවයක් කරන බව. දහම් පාසල් පවත්වාගෙන යෑම සඳහා, දහම් අධ්‍යාපනය නැංවීම සඳහා පළාත් සභාවලින් පමණක් නොවෙයි, මධ්‍යම ආණ්ඩුවෙනුත් තීන්දු තීරණ අරගෙන වැඩසටහන් සකස් කර තිබෙනවා. නමුත් දහම් අධ්‍යාපනය ලබාදෙන ගුරුවරුන් පිළිබඳ ඇගැයීමක් සිදුවන්නේ ඉතාම අඩු ප්‍රමාණයකින්. අපේ ඇමතිතුමාට අමාත්‍යාංශයෙන් එවා තිබෙන පිළිතුරේ සඳහන් වෙනවා, අවුරුදු 50ක දහම් පාසල් සේවා කාලය සම්පූර්ණ වූ ගුරුභවතුන් සඳහා වෛද්‍යාධාරයක් දෙනවා කියලා. අපි හිතමු ගුරුවරයකු විධියට දහම් අධ්‍යාපනය ලබාදෙන්න අවුරුදු 18දී ආවොත්, අවුරුදු 68කට එහා ගියාම, ඒ කියන්නේ අවුරුදු 70ක් වන ගුරුවරයකුට විතරයි වෛද්‍යාධාරයක් හෝ ලබාදෙන්න ඉතිහාසය පුරාම සියලු ආණ්ඩු කටයුතු කරලා තිබෙන්නේ. මම හිතනවා මේක බේදනීය තත්ත්වයක් කියලා. දහම් පාසල් ගුරුවරු නඟා සිටුවන්න යම් යම් කටයුතු කරනවා කියලා සමහර දේශපාලන අවශ්‍යතා වෙනුවෙන් මැතිවරණ කාලයේ පොරොන්දු පත්‍රිකාවලට දහම් පාසල් ගුරුවරයා ඇතුළත් කරනවා. නමුත් අපි දකිනවා කිසිදු රජයක් තුළින් ඒ සඳහා සාධනීය වැඩසටහනක් ක්‍රියාත්මක වෙලා නැහැ කියලා. එම නිසා මම ගරු ඇමතිතුමාගෙන් අහනවා, ඇත්තටම වර්තමාන රජය තුළ හෝ

දහම් පාසල් ගුරුවරුන්ට ශක්තියක් -හයියක්- ලබා දෙන්න යම් කිසි තීරණාත්මක වැඩසටහනක් පිළිබඳ අදහසක් තිබෙනවාද කියලා.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා දීර්ඝ අතුරු ප්‍රශ්නයක් ඇහුවා.

2008 අවුරුද්දේ ගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුවෙන් තමයි, පළමුවන වතාවට දහම් පාසල් ගුරුවරුන්ට රුපියල් 2,000ක දීමනාවක් දෙන්න යෝජනා වුණේ. ඊට පසුව හැම මාසයකටම රුපියල් 200 ගණනේ අවුරුද්දකට රුපියල් 2,400ක ගමන් වියදමක් ලබා දුන්නා. රුපියල් 2,000යි, රුපියල් 2,400යි එකතු වුණාම රුපියල් 4,400ක්. අද වෙන කොට දහම් පාසල් ගුරුවරයෙකුට රුපියල් 5,000ක් ගෙවනවා. ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් අවුරුදු පහටම රුපියල් 600ක් තමයි වැඩි කරලා තිබෙන්නේ. ඒ කාරණය ඔබතුමන්ලා මතක් කිරීම හොඳයි. මේවා පසුගිය අවුරුදු පහක කාලය තුළ ඔබතුමන්ලාට කරන්න තිබුණු දේවල්. අපි රුපියල් 2,000ක මුදලක් විතරක් නොවෙයි, තවත් දීමනා ගණනාවක්ම දෙන්න යෝජනා කර තිබෙනවා. අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රට හදන "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයේත් යෝජනා ගණනාවක් එතුමා ඉදිරිපත් කර තිබෙනවා. මහ මැතිවරණය ජයග්‍රහණය කරලා අපේ රජයක් යටතේ ඉදිරිපත් කරන පළමුවැනි අය වැය ලේඛනයේදී දහම් පාසල් ගුරුවරුන්ට ලබා දෙන්න පුළුවන් උපරිම සහනය ලබා දෙන බව කියන්න ඕනෑ. මේ කාරණය දිහා බැලුවාම සියයට අනූවක්ම සහන ලබා දී තිබෙන්නේ අපේ රජයෙන් බව පෙනෙනවා. ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමාට මම මේ කාරණය කියන්න කැමැතියි. අඩු ගණනේ, 2018 අවුරුද්දේදී දහම් පාසල් ගුරුවරුන්ට නිල ඇඳුම් ටික ලබා දෙන්න ආණ්ඩුව මුදල් වෙන් කරලා නැහැ. අපි දැනට රුපියල් මිලියන පනහක් ඒ සඳහා වෙන් කර තිබෙනවා. ගුරුවරුන්ට අවුරුදු දෙකක නිල ඇඳුම් ලබාදීමේ arrears එකක් තිබෙනවා. පසුගිය රජය දහම් පාසල් ගුරුවරුන්ට නිල ඇඳුමවත් දුන්නේ නැති ආණ්ඩුවක්. ඒකයි ඇත්ත තත්ත්වය. එම නිසා තමයි බහුතරයක් ජනතාව පසු ගිය රජය වෙනස් කරන්න අලුත් ජනාධිපතිවරයෙක් බලයට පත් කළේ. ඔබතුමාගේ යෝජනාව හොඳයි. අපේ රජය යටතේ ඔබතුමාගේ යෝජනාවත් ඉදිරියේදී ක්‍රියාත්මක කරන්න අපි වග බලා ගන්නවාය කියන කාරණය මතක් කරන්න කැමැතියි.

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු කථානායකතුමනි, මම දෙවැනි අතුරු ප්‍රශ්නය අහනවා.

මේ ආණ්ඩුව යටතේ හොඳ වැඩසටහනක් ක්‍රියාත්මක කරනවා කියලා එතුමා කිව්වා. අපි කියනවා, අලුත් ආණ්ඩුව පත් වනතුරු ඉන්නේ නැතුව ඒක දැන්ම ක්‍රියාවට නංවන එක වැදගත් කියලා. ඒ පිළිබඳව අපි ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා. පසුගිය ආණ්ඩුව මොකුත් කළේ නැහැ කියලා කියන්න බැහැ. රාජ්‍ය සේවකයන්ගේ වැටුප රුපියල් 10,000කින් වැඩි කරලා ඒ ආණ්ඩුව වැඩ කළා කියලා මේ රටේ ජනතාවට පෙන්වා දී තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා වග කියන ඇමතිවරයකු නිසා මම උත්තරයක් දෙන්න කැමැතියි. මේ කාරණය දැන් මෙතැනදී මතු වුණා. ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමාත් ඒ ගැන විමසීමක් කළා. වර්තමානයේ සාකච්ඡාවට බඳුන් වන ප්‍රශ්නයක් නිසා ඔබතුමාට මේ සඳහා උත්තරයක් දෙන්න පුළුවන් නම් වැදගත්.

රුපියල් 750ක්ව තිබුණු පාසල් නිල ඇඳුම් වවුචරය ඔබතුමන්ලා රුපියල් 525 දක්වා අඩු කරලා තිබෙනවා. එම වවුචරයේ වටිනාකම අඩු කළේ නැහැ කියලා දැන් මේ ගරු සභාවේදී කියැවුණා. ඒක අසත්‍යයක්. ඒක එහෙම වුණේ ඇයි කියන කාරණය ගරු ඇමතිතුමාට සඳහන් කරන්න පුළුවන් නම් වැදගත්.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, එතුමාගේ එක් අතුරු ප්‍රශ්නයක් මූලික ප්‍රශ්නයට අදාළ වෙන්නේ නැහැ. එම නිසා ඒ ප්‍රශ්නය අදාළ ඇමතිවරයාගෙන් අහන එක හොඳයි.

ඊළඟ ප්‍රශ්නයට උත්තර දෙන්නම්. ඒ සඳහා අලුතින් ගන්න පුළුවන් හැම ක්‍රියාමාර්ගයක්ම අපි අරගෙන තිබෙනවා. අපි බදු අඩු කරලා තිබෙනවා, සහන දීලා තිබෙනවා. මේ කෙටි කාලය තුළ මුළු රටම සුද්ද කරලා පිරිසිදු රටක් බවට පරිවර්තනය කළා. රටේ ආරක්ෂාව සම්බන්ධයෙන් ලොකු ප්‍රශ්නයක් තිබුණා. අපි රටේ ආරක්ෂාව ඇති කළා. එම නිසා මේ රටේ තිබුණු විවිධ ප්‍රශ්නවලට මේ කෙටි කාලය තුළ නිසි විසඳුම් දීලා තිබෙනවා. රටේ ආරක්ෂාව තමයි පළමුවැනි ප්‍රශ්නය වන්නේ. ඒ ප්‍රශ්නයට අපි විසඳුම් දීලා තිබෙනවා. ගරු අග්‍රාමාත්‍යතුමා යටතේ තමයි මේ අමාත්‍යාංශය ක්‍රියාත්මක වෙන්නේ. එම නිසා එතුමා 2008දී, -මේ රටේ කිසිම නායකයෙක් දහම් පාසල් ගුරුවරුන්ට කිසිදු දීමනාවක් දීලා තිබුණේ නැහැ- එතුමා ඒ වැඩසටහනත් ආරම්භ කරලා තිබෙනවා. එම නිසා එතුමාගේ නායකත්වය යටතේ දහම් පාසල් ගුරුවරුන්ට අනිවාර්යයෙන්ම හොඳ අනාගතයක් උදාවෙයි කියලා අපි විශ්වාස කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවැනි වටය.

සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම: විස්තර
மிஹின் லங்கா (தனியார்) கம்பனி: விபரம்
MIHIN LANKA (PVT.) LIMITED: DETAILS

41/2020

2. ගරු හේෂා විතානගේ මහතා (ගරු චමින්ද විජේසිරි මහතා වෙනුවට)
(மாண்புமிகு ஹேசா விதானகே - மாண்புமிகு சமிந்த விஜேசிறி சார்பாக)
(The Hon. Hesha Withanage on behalf of the Hon. Chaminda Wijesiri)
සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ස්ථාපනය කරන ලද වර්ෂය කවරේද;

(ii) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගමේ ආරම්භක අරමුණු කවරේද;

(iii) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ස්ථාපිත කළ දින සිට අවසන් අධ්‍යක්ෂ මණ්ඩලය දක්වා එහි අධ්‍යක්ෂ මණ්ඩලවල සිටි පුද්ගලයන්ගේ නම්, ලිපිනයන්, අධ්‍යාපන සුදුසුකම් සහ ලැබූ වැටුප් හා අනෙකුත් ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

[ගරු හේෂා විතානගේ මහතා]

(iv) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ආරම්භයේ සිට ලැබූ අලාභය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ණය ලබාගත් රාජ්‍ය ආයතන, ණය ගෙවීමට ඇති රාජ්‍ය ආයතන හා එම ණය ප්‍රමාණයන් කවරේද;

(vi) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගමේ අනාගතය සම්බන්ධයෙන් රජය ගැනීමට බලාපොරොත්තු වන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றுலா மற்றும் விமானச் சேவைகள் அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) வரையறுக்கப்பட்ட மிஹின் லங்கா (தனியார்) கம்பனி தாபிக்கப்பட்ட வருடம் யாதென் பதையும்;

(ii) வரையறுக்கப்பட்ட மிஹின் லங்கா (தனியார்) கம்பனியின் ஆரம்ப நோக்கங்கள் யாவை யென்பதையும்;

(iii) வரையறுக்கப்பட்ட மிஹின் லங்கா (தனியார்) கம்பனி தாபிக்கப்பட்ட திகதி தொடக்கம் இறுதி பணிப்பாளர் சபை வரை அதன் பணிப்பாளர் சபையிலிருந்த ஆட்களின் பெயர்கள், முகவரிகள், கல்வித் தகைமைகள் மற்றும் பெற்றுள்ள சம்பளங்கள் மற்றும் ஏனைய அனுகூலங்கள் தனித்தனியாக யாவை என்பதையும்;

(iv) வரையறுக்கப்பட்ட மிஹின் லங்கா (தனியார்) கம்பனி ஆரம்பம் தொடக்கம் அடைந்துள்ள நட்டமானது வருடாந்தம் தனித்தனியாக எவ்வளவென்பதையும்;

(v) வரையறுக்கப்பட்ட மிஹின் லங்கா (தனியார்) கம்பனியானது கடன் பெற்றுள்ள அரச நிறுவனங்கள் மற்றும் கடன் செலுத்தவுள்ள அரச நிறுவனங்கள் மற்றும் அக்கடன் தொகைகள் யாவை என்பதையும்;

(vi) வரையறுக்கப்பட்ட மிஹின் லங்கா (தனியார்) கம்பனியின் எதிர்காலம் தொடர்பாக அரசாங்கம் மேற்கொள்வதற்கு எதிர்பார்க்கும் நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Tourism and Civil Aviation:

(a) Will he inform this House -

(i) the date on which the Mihin Lanka (Pvt) Limited was established;

(ii) the initial objectives of the Mihin Lanka (Pvt) Limited;

(iii) separately, the names, addresses and educational qualifications of the persons who were members of the Board of Directors of the Mihin Lanka (Pvt) Ltd. from its establishment to its last Board of Directors along with salaries and other benefits received by them;

(iv) separately, the annual loss incurred by the Mihin Lanka (Pvt) Limited from its beginning;

(v) the names of government institutions from which loans were obtained by the Mihin Lanka (Pvt) Limited and the names of government institutions to which it has to settle loans along with the amounts obtained as loans; and

(vi) the steps that will be taken by the Government regarding the future of the Mihin Lanka (Pvt) Limited?

(b) If not, why?

ගරු ප්‍රසන්න රණතුංග මහතා (කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය සහ සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යතුමා)
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - கைத்தொழில் ஏற்றுமதி மற்றும் முதலீட்டு மேம்பாடு அமைச்சரும் சுற்றுலா மற்றும் விமானச் சேவைகள் அமைச்சரும்)
(The Hon. Prasanna Ranatunga - Minister of Industrial Export and Investment Promotion and Minister of Tourism and Civil Aviation)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2006 ඔක්තෝබර් 27වන දින සමාගමක් ලෙස ස්ථාපනය කරන ලදී.

(ii) සමාගම් සංස්ථාපිත ලියවිල්ලෙහි සඳහන් පරිදි "මගීන් සහ භාණ්ඩ සඳහා ගුවන් ප්‍රවාහන සේවා ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය හා ජාත්‍යන්තර ගුවන් සමාගම් හෝ ගුවන් ප්‍රවාහන ආයතනයක් ලෙස ව්‍යාපාරය කිරීම."

(iii) අධ්‍යක්ෂ මණ්ඩලවල සිටි පුද්ගලයන්ගේ නම් සහ ලිපිනයන් **ඇමුණුම A*** වශයෙන් දක්වා ඇත.

අධ්‍යාපන සුදුසුකම් - සමාගම සතුව ඒ පිළිබඳව වාර්තා නොමැත.

ලැබූ වැටුප් හා අනෙකුත් ප්‍රතිලාභ **ඇමුණුම B*** වශයෙන් දක්වා ඇත.

(iv) **ඇමුණුම C*** වශයෙන් දක්වා ඇත.

(v) **ඇමුණුම D*** වශයෙන් දක්වා ඇත.

(vi) මේ වන විට කොළඹ වෙළෙඳ මහාධිකරණයේ අධීක්ෂණය යටතේ ඈවර කරන ලද සමාගමක් ලෙස පවතී. අංක 17/2383/735/026-I හා 2017 ඔක්තෝබර් මස 31වන දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මත මෙම තීරණය ගෙන ඇත.

(ආ) අදාළ නොවේ.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඌව පළාතේ ඇති දේශීය කිරිපිටි කර්මාන්තශාලා: විස්තර

ஊவா மாகாணத்திலுள்ள பால்மா தொழிற்சாலைகள்:விபரம்

LOCAL MILK POWDER FACTORIES IN UVA PROVINCE: DETAILS

42/2020

5. ගරු හේෂා විතානගේ මහතා (ගරු චමින්ද විජේසිරි මහතා වෙනුවට)

(மாண்புமிகு ஹேசா விதானகே - மாண்புமிகு சமிந்த விஜேசிறி சார்பாக)

(The Hon. Hesha Withanage on behalf of the Hon. Chaminda Wijesiri)

මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ඌව පළාත තුළ පිහිටි දේශීය කිරිපිටි කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) එම කර්මාන්තශාලාවල නම් හා ලිපිනයන් කවරේද;

(iii) 2015 වර්ෂයේ සිට මේ දක්වා එම කර්මාන්තශාලාවල නිෂ්පාදන ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iv) වර්තමානයේදී ඌව පළාත් දේශීය කිරිපිටි කර්මාන්තශාලා මුහුණ දී ඇති ගැටලු විසඳීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மகாவலி, கமத்தொழில், நீர்ப்பாசனம் மற்றும் கிராமிய அபிவிருத்தி அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) ஊவா மாகாணத்தில் அமைந்துள்ள உள்நாட்டுப் பால்மா தொழிற்சாலைகளின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) அந்தத் தொழிற்சாலைகளின் பெயர்கள் மற்றும் முகவரிகள் யாவையென்பதையும்,

(iii) 2015 ஆம் ஆண்டிலிருந்து இன்று வரை அந்த தொழிற்சாலைகளின் உற்பத்தி அளவு ஒவ்வொரு வருடத்திற்கமைய எவ்வளவென்பதையும்;

(iv) தற்போது ஊவா மாகாணத்தின் உள்நாட்டுப் பால்மா உற்பத்தித் தொழிற்சாலைகள் எதிர்நோக்கியுள்ள பிரச்சினைகளைத் தீர்ப்பதற்கு அமைச்சு எடுக்கும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Mahaweli, Agriculture, Irrigation and Rural Development:

(a) Will he inform this House-

(i) the number of local milk powder factories in the Uva Province;

(ii) names and addresses of the said factories;

(iii) the output of these factories in respect of each year since the year 2015 up to now; and

(iv) the measures to be taken by the Ministry to solve the problems faced at present by the local milk powder factories in the Uva province?

(b) If not, why?

ගරු චමල් රාජපක්ෂ මහතා

(மாண்புமிகு சமல் ராஜபக்ஷ)

(The Hon. Chamal Rajapaksa)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා සභාගත* කරනවා.

* සභාමේසය මත තබන ලද පිළිතුර:
சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :
Answer tabled:

(අ) (i) 01 කි.

(ii) නම - පැල්වත්ත ඩේරි ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ්

ලිපිනය - පැල්වත්ත, බුත්තල.

(iii)

වර්ෂය	කිරිපිටි නිෂ්පාදන ප්‍රමාණය (මෙට්‍රික් ටොන්)
2015	2456.10
2016	2876.30
2017	4256.54
2018	2829.42
2019 ජනවාරි මස සිට මැයි මස දක්වා	1317.10

(iv) 2 016 වර්ෂයේ අය වැය යෝජනා අනුව දේශීයව නිෂ්පාදනය කරනු ලබන කිරිපිටි කිලෝග්රෑම් එකක විකුණුම් මිල රුපියල් 735.00 දක්වා පහත හෙළීම හේතුවෙන් පැල්වත්ත ඩේරි ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ් වෙත සිදුවූ පාඩුව පිරිමැසීම සඳහා එම සමාගම විසින් 2015 වර්ෂයේ දෙසැම්බර් මස සිට 2018 වර්ෂයේ සැප්තැම්බර් මස දක්වා දේශීය වෙළඳ පොළ වෙත නිකුත් කරන ලද කිරිපිටි කිලෝග්රෑම් එකක් සඳහා හානිපූර්ණ දීමනාවක් ලෙස රුපියල් 75.00 බැගින් ලබාදීමට කටයුතු කරන ලදී.

2015 වර්ෂයේ දෙසැම්බර් මාසය	රුපියල් මිලියන	26.31
2016 වර්ෂය	රුපියල් මිලියන	215.48
2017 වර්ෂය	රුපියල් මිලියන	305.74
2018 සැප්තැම්බර් මාසය දක්වා	රුපියල් මිලියන	165.61
ගෙවනු ලැබූ මුළු මුදල	රුපියල් මිලියන	713.14

(ආ) අදාළ නොවේ.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

රැකියා විරහිත උපාධිධාරින් රජයේ සේවයට බඳවා ගැනීම
வேலையற்ற பட்டதாரிகளை அரச சேவைக்கு ஆட்சேர்ப்புச் செய்தல்
RECRUITMENT OF UNEMPLOYED GRADUATES TO PUBLIC SERVICE

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, රැකියා විරහිත උපාධිධාරින් පිළිබඳ ගැටලුව, පැවති සෑම රජයක්ම මුහුණ දුන් ගැටලුවක් වූ අතර, පැවති එක්සත් ජාතික පෙරමුණු රජය සමයේ රැකියා විරහිත උපාධිධාරින් 20,000ක් පමණ සෘජුවම රාජ්‍ය සේවයට බඳවා ගන්නා ලදී. මීට අමතරව රජයේ දීප ව්‍යාප්ත සේවා හා අනෙකුත් සංවෘත සේවා සඳහා වන බඳවා ගැනීමේ තරග විභාග කලට වේලාවට පවත්වමින් එම තනතුරු සඳහා ද අඛණ්ඩව උපාධිධාරින් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබීය. අනෙකුත් රැකියා විරහිත උපාධිධාරින් සියලුදෙනාම රැකියාවලට බඳවා ගැනීමට ද සැලසුම් කොට තිබූ අතර, මැතිවරණය හේතුවෙන් එම කටයුතු තාවකාලිකව අත්හිටුවීමට සිදු විය. එසේම, පෞද්ගලික අංශයේ රැකියා අවස්ථා පුළුල් කිරීමටද අවධානය යොමු කරන ලදී.

මින් අනතුරුව, පසුගිය ජනාධිපතිවරණ සමයේදී සියලු රැකියා විරහිත උපාධිධාරින්ට මෙම වසරේ ජනවාරි මස 01 දින වන විට රජයේ රැකියා ලබා දෙන බවට පොදුජන පෙරමුණ මැතිවරණ වේදිකාවේදී පොරොන්දු ලබා දෙනු ලැබුවා. එසේම, මෙම වසරේ මාර්තු මස 01වැනි දිනට පෙර දැනට සිටින සියලු රැකියා විරහිත අභ්‍යන්තර හා බාහිර උපාධිධාරින්ට රජයේ රැකියා ලබා දෙන බවටත්, එහිදී අවුරුදු 35 උපරිම වයස් සීමාව නොසලකා හරින බවටත් අධ්‍යාපන අමාත්‍ය සහ ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මැතිතුමා විසින් පසුගිය 13වැනි දා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු පක්ෂ මූලස්ථානයේ පැවති මාධ්‍ය හමුවකදී ප්‍රකාශ කරනු ලැබුවා. මෙය ජාතික වැදගත්කමකින් යුත් කරුණක් බැවින්, මේ පිළිබඳව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පිළිතුරු හා පැහැදිලි කිරීම් රජයෙන් බලාපොරොත්තු වෙමි.

01. අභ්‍යන්තර හා බාහිර උපාධිධාරින් ද ඇතුළත්ව දැනට සිටින මුළු රැකියා විරහිත උපාධිධාරින් සංඛ්‍යාව කොපමණද?

02. ඉහත සඳහන් සියලු රැකියා විරහිත උපාධිධාරින් 2020 මාර්තු මස 01වැනි දින වන විට රජයේ රැකියා සඳහා බඳවා ගැනීමට සැලසුමක් රජය විසින් සකස් කොට තිබේද? ඒ සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර ගැනීමට කටයුතු කරන්නේ කෙසේද?

03. මෙම උපාධිධාරින් බඳවා ගනු ලබන්නේ රජයේ කුමන තනතුරුවලටද යන්නත්, ස්ථිර හෝ තාවකාලික පදනමින්ද යන්නත්, ඔවුන්ට ලබා දීමට නියමිත වැටුප් පරිමාණ මොනවාද යන්නත් සඳහන් කරන්නේද?

04. "සෞභාග්‍යයේ දැක්ම" ජනාධිපතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශයේ 29වැනි පිටුවේ සඳහන් වන පරිදි සෑම රාජ්‍ය සේවකයකුටම විශ්‍රාම වැටුප් ලබා දීමේ ප්‍රතිපත්තිය යටතේ මෙම උපාධිධාරින්ට විශ්‍රාම වැටුප් ලබා දීමට රජය කටයුතු කරන්නේද?

05. වයස අවුරුදු 35ට වැඩි උපාධිධාරින් රාජ්‍ය සේවයට සේවයට බඳවා ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන තිබේද?

06. මෙම උපාධිධාරින් රාජ්‍ය සේවයට බඳවා ගැනීමෙන් අනතුරුව ඔවුන්ගේ සේවය ඵලදායී ලෙස රජයට ලබා ගැනීම සඳහා වැඩ පිළිවෙළක් සකස්කොට තිබේද?

07. රැකියා විරහිත උපාධිධාරින් හැරුණුකොට උසස් පෙළ විභාගය සමත්, සාමාන්‍ය පෙළ විභාගය සමත් හා සාමාන්‍ය පෙළ විභාගය අසමත් පිරිස් සඳහා රැකියා ලබා දීමට යම් සැලසුමක් රජය විසින් සකස්කොට තිබේද?

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා (ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன - பொருளாதார மற்றும் கொள்கைகள் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. W.D.J. Senewiratne - State Minister of Economy and Policy Development)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මම ගරු විපක්ෂ නායකතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමට බලාපොරොත්තු වෙනවා.

01. 2016.12.31 දින වන විට උපාධිය සපුරා ඇති සංඛ්‍යාව අතරින් 2018 වසරේදී පළමු අදියර ලෙස 3,060ක්ද, 2019 අගෝස්තු හා සැප්තැම්බර් මාසවලදී දෙවන හා තෙවන අදියර ලෙස 16,800ක්ද වශයෙන් උපාධිධාරින් 20,000ක් ඔබතුමන්ලාගේ ආණ්ඩුව යටතේ අභ්‍යාසලාභීන් ලෙස පුහුණුවට අනුයුක්ත කර ඇත.

ඒ අනුව දැනට රැකියා විරහිත උපාධාධාරින් සංඛ්‍යාව අභ්‍යන්තර සහ බාහිර යන දෙඅංශයෙන්ම 44,000ක් පමණ වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

02. අතිගරු ජනාධිපතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව උපාධාධාරින් බඳවා ගැනීම සඳහා දැනට සැලසුම් සකස් කරමින් පවතී.

03. සංවර්ධන නිලධාරින් බඳවා ගැනීමේ සේවා ව්‍යවස්ථාවට අනුව ඔවුන් බඳවා ගැනේ.

04. රජයේ විශ්‍රාම වැටුප් ලබා දීමේ ප්‍රතිපත්තිය අනුව ඒ සඳහා කටයුතු කෙරෙන අතර, විශ්‍රාම වැටුප් පිළිබඳව ගැටලුවක් ඇති නොවේ.

05. රාජ්‍ය සේවයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ උපරිම වයස් සීමාව අවුරුදු 45 ලෙස සඳහන් වුවද, සේවා අවශ්‍යතාව හා සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් කොන්දේසි අනුව එම උපරිම වයස් සීමාව වෙනස් වේ. ඒ අනුව අවස්ථානුකූලව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනේ.

06. උපාධිධාරින්ගේ සේවාව ඵලදායී ලෙස රාජ්‍ය සේවයට ලබා ගැනීමට සැලසුම් හා ඒ සඳහා වැඩ පිළිවෙළ සකස් කර ඇත.

07. එමෙන්ම සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ සමත් අය රාජ්‍ය සේවයේ අවශ්‍යතා අනුව ඉදිරියේදීත් බඳවා ගැනේ. එපමණක් නොවෙයි, සාමාන්‍ය පෙළ සමත් නැති අයගෙන් ලක්ෂයකට රැකියා ලබා දීමේ කඩිනම් වැඩ පිළිවෙළක් දැනට මේ රජය ආරම්භ කර තිබෙන බවත් මා ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර දිසානායක මැතිතුමා, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ඊට පෙර මා මේ කාරණය කියන්න කැමැතියි. ව්‍යවහාරික විගණන වාර්තා පිළිබඳ විවාදයක් පවත්වන දිනය සම්බන්ධයෙන් පක්ෂ නායක රැස්වීමේදී තීරණය කරනවා කියලා ඔබතුමා සඳහන් කළා. නමුත් පක්ෂ නායක රැස්වීමක් පවත්වන්න තවම තීරණය කරලා නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද මම ඒ ගැන කථා කරනවා. ඒ සඳහා මේ සතියේ දිනයක් ගන්න මම බලාපොරොත්තු වනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, පක්ෂ නායකයන්ගේ රැස්වීමක් කැඳවලා, ඒ විවාදය පවත්වන දිනය තීන්දු කරනවා කියලා තමයි තීරණය කරලා තිබුණේ. නමුත් අපට තවම දැනුම් දීලා නැහැ, පක්ෂ නායක රැස්වීමක් අද පවත්වනවාද නැද්ද කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද පක්ෂ නායක රැස්වීමක් පවත්වන්න අමාරුයි. නමුත් හෙට හෝ පක්ෂ නායක රැස්වීමක් පවත්වන්න බලාපොරොත්තු වනවා, ගරු මන්ත්‍රීතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හැබැයි, අපි මේ සතියේ ඒ විවාදය බලාපොරොත්තු වනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඒ ගැන කථා කරමු. මා ඒ ගැන යෝජනා කරන්නම්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නීතිපතිවරයා මේ වාර්තා එළියට ඒම වැළැක්වීම සඳහා කටයුතු කර තිබියදී පාර්ලිමේන්තුවේ ගරුත්වය ආරක්ෂා කරමින් එම වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම පිළිබඳව ඔබතුමාට මම ස්තුතිවන්ත වනවා. හැබැයි, ඔබතුමා ඒ වාර්තා පාර්ලිමේන්තුවේ සභා මේසය මත නිකම්ම තබන්නේ නැතිව, පක්ෂ නායක රැස්වීමක් විගස කැඳවා මේ සතියේම ඒ පිළිබඳ විවාද කරන්න දිනයක් ලබා දෙන්න කියලා තමයි ඔබතුමාගෙන් මා ඉල්ලා සිටින්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඒ ඉල්ලීම ආණ්ඩු පක්ෂයට හා විපක්ෂයට ඉදිරිපත් කරන්නම්. ඔබතුමාගේ යෝජනාව ගැන එදාට කථා කරමු.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අද පක්ෂ නායක රැස්වීමක් පවත්වනවා නේද ගරු කථානායකතුමනි?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද පක්ෂ නායක රැස්වීම පවත්වන්නේ කමිටු පත් කිරීම සම්බන්ධවයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මේ වාර්තා - Reports - ගැන? ඔබතුමා දැන් තීරණය කළා,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඒ වාර්තා Library එකේ තබනවා. ඒ වාර්තා මන්ත්‍රීවරුන්ට ලබා දෙන්න දවස් දෙක තුනක් ගත වේවි. අද release කරන්න පුළුවන් වේවි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අද Library එකේ තියලා, ඊට පස්සේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊට පස්සේ දවස් දෙකක්, තුනක්, හතරක් ගත වේවි මන්ත්‍රීවරුන්ට ලබා දෙන්න. මන්ත්‍රීවරුන්ට ඒ පිටපත් ලබා දෙන්න මම පියවර ගන්නවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ කියන්නේ, පිටපත් ලබා දෙන්න කාලයක් ගත වෙනවා?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පිටපත් ලබා දෙන්න ටික කාලයක් ගත වේවි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
Library එකේ පිටපත් කීයක් විතර තබනවාද, ගරු කථානායකතුමනි?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එක පිටපතයි අපට තිබෙන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අපට අද දවස ඇතුළත පිටපත් දෙකක්වත් ලබා ගන්න බැරිද? ගරු කථානායකතුමනි, කවුරු හෝ ඒ වාර්තා අරගෙන දවසම කියවන්න පටන් ගත්තොත් වෙනත් කාටවත් ඒ වාර්තා බලන්න ලැබෙන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ සම්බන්ධයෙන් කළ යුතු දෙයක් ගැන කතා කරමු.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ වාගේ දේවල් වෙන්න පුළුවන්, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, හොඳයි. අපි ඒකට මොනවා හෝ දෙයක් කරමු.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ගොඩක් අය ඉන්න නිසා -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මට පැය 48ක් දෙන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, කවුරුන් හෝ මෙම වාර්තාව පැය ගණනාවක් පෙරළා පෙරළා හිටියොත් එහෙම -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ක්ෂණිකව නොවෙයි. අප කොහොම හරි පිටපත් කීපයක් ලබා දෙන්නම්. ප්‍රශ්න එකින් එක විසඳා ගනිමු.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ස්ථාවර නියෝග 27/2 යටතේ ප්‍රශ්නය අහනවාද?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අහනවා, ගරු කථානායකතුමනි.

II

එම්සීසී ගිවිසුමේ වත්මන් තත්ත්වය
எம்.சி.சி. உடன்படிக்கையின் தற்போதைய நிலைமை
CURRENT STATUS OF THE MCC AGREEMENT

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මෙම ප්‍රකාශ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මා ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. එක්සත් ජනපද රජයේ Millennium Challenge Corporation ආයතනය සමඟ ගිවිසුමක් අත්සන් කිරීමට ආණ්ඩුව සූදානම්ව සිටින බවට වන පුවත් හේතුවෙන් පැන නැඟී ඇති ගැටලුසහගත තත්ත්වය පිළිබඳව මෙම සභාවේ අවධානය යොමු කරවනු කැමැතියි. ගරු (පූජ්‍ය) අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කර තිබෙනවා මම දැක්කා, "මෙම ගිවිසුම උඩරට ගිවිසුම හා සමානයි. මෙය එවැනි පාවා දීමේ ගිවිසුමක්" කියලා. අපේ ගෞරවනීය හාමුරුවන් වහන්සේගේ අදහස එයයි. ගරු කථානායකතුමනි, මේ කාරණය පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දීම පිළිබඳව මම ඔබතුමාට නැවත වරක් ස්තුතිවන්ත වෙනවා.

ශ්‍රී ලංකා රජය එක්සත් ජනපද රජයේ Millennium Challenge Corporation ආයතනය සමඟ ගිවිසුමක් අත්සන් කරන්නට යෑම පිළිබඳව මතභේදාත්මක තත්ත්වයක් පසු ගිය වසර මැද භාගයේ සිට රට තුළ දක්නට ලැබුණා. එය බරපතළ ලෙස කරළියට පැමිණියේ 2019 ඔක්තෝබර් මස අගදී පැවැති ආණ්ඩුව විසින් එම ගිවිසුම්ගත වීම සඳහා කැබිනට් අනුමැතියක් ලබා ගත් බව වාර්තා වීමත් සමඟයි. නොවැම්බර් පළමුවැනි දාට පෙර එය අත්සන් තබනු ඇති බවට වාර්තා පළ වුණද, ඒ සමඟ පැන නැඟුණු විරෝධතා හේතුවෙන් එය අත්සන් තැබීම කල් තැබුණා.

අපට මතකයි, හිටපු මුදල් අමාත්‍ය මංගල සමරවීර මහත්මයා පුන-පුනා, දිවුරා ප්‍රකාශ කරමින් සිටියා, එය අත්සන් කරන බවට. ගරු කථානායකතුමනි, නමුත් රටේ පැවැති විරෝධතාව නිසා එය අත්සන් කර ගැනීමට නොහැකි වුණා. කෙසේ වුවද, එළැඹෙමින් තිබුණු ජනාධිපතිවරණයේ ප්‍රධානතම මාතෘකාවලින් එකක් බවට මෙම ගිවිසුම පත්ව තිබුණා. මේ අතර ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපති කාර්යාලය නොවැම්බර් 06වැනි දින නිවේදනය කළේ, එය නොවැම්බර් 16වන දිනට පසුව, එනම් ජනාධිපතිවරණයෙන් පසුව අත්සන් තබනු ඇති බවයි.

ජනාධිපතිවරණයෙන් පසුව වත්මන් ආණ්ඩුව විසින් Millennium Challenge Corporation ආයතනය සමඟ අත්සන් කිරීමට නියමිත ගිවිසුම නැවත සලකා බැලීමට සූදානම් වන බවත්, ගිවිසුම අධ්‍යයනය කිරීම සඳහා කැබිනට් අනුමැතියක් අනුව කමිටුවක් පත් කරන ලද බවත් පසුගිය දෙසැම්බර් මාසයේ දී ජනමාධ්‍ය වාර්තා කළා. ගරු කථානායකතුමනි, එය ඉතාම වැදගත්. මෙම ගිවිසුම අධ්‍යයනය කිරීම සඳහා කමිටුවක් පත් කරන්න ඕනෑ කියලා වර්තමාන ආණ්ඩුව තීරණය කළා. ගරු කථානායකතුමනි, ජනාධිපතිවරණය කාලයේ මැතිවරණ වේදිකාවේ කරන ලද ප්‍රකාශ අනුව මේ ගිවිසුම අධ්‍යයනය කරලා පමණක් නොවෙයි, මෙය ඇති තරමට පරීක්ෂාවට භාජන කරලා තිබෙනවා -චීකලාත් තිබෙනවා- කියායි අපට දැනුණේ. මෙම ගිවිසුම පිළිබඳව ඒ තරමටම විශාල ආන්දෝලනයක් ඇති වුණු බව ගරු ස්වාමීන් වහන්සේත් දන්නවා. හැබැයි, අද කියන්නේ මොකක්ද? මෙම ගිවිසුම නැවත අධ්‍යයනය කරන්න ඕනෑ කියලා අද කියනවා. මා දන්නේ නැහැ, ජනාධිපතිවරණ වේදිකාවේදී ඒ පිළිබඳව කරුණු ඉදිරිපත් කළේ අධ්‍යයනයකින් තොරවද කියලා. ඒ කෙසේ වුවත් ආණ්ඩුව දැන් තීරණයක් ගෙන තිබෙනවා, මේ පිළිබඳව අධ්‍යයනය කරන්න. එම කමිටුව අගමැතිවරයා ඇතුළු විවිධ පිරිස් හමුවී ඇති බවත්, කරුණු අධ්‍යයනය කරමින් සිටින බවත් වාර්තා වුණා.

මේ තත්ත්වය තුළ පැන නඟින පහත ගැටලුවලට පිළිතුරු ලබා දෙනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

1. මිලේනියම් චැලේන්ජ් කෝපරේෂන් ගිවිසුම අධ්‍යයනය කිරීම සඳහා කමිටුවක් පත් කරන ලද්දේ කවදාද?

2. එම කමිටුවට නම් කරන ලද සාමාජිකයන් කවුරුන්ද? කාගේ සභාපතිත්වයෙන් එය රැස් වන්නේද?

3. එම කමිටුවට අදාළ අධ්‍යයන වාර්තාව ඉදිරිපත් කිරීම සඳහා යම් කාල රාමුවක් ලබා දී තිබේද? ඔවුන් විසින් එය ඉදිරිපත් කරනු ලබන්නේ කවදාද?

4. එම වාර්තාව ලැබුණු පසුව සභාවට ඉදිරිපත් කරන්න කටයුතු කරන්නේද?

ගරු කථානායකතුමනි, මට මෙම අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (විදේශ සබඳතා අමාත්‍ය, නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - வெளிநாட்டு உறவுகள் அமைச்சரும் திறன்கள் அபிவிருத்தி, தொழில்துறை மற்றும் தொழில் உறவுகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Foreign Relations, Minister of Skills Development, Employment and Labour Relations and Leader of the House of Parliament)

1. ගරු කථානායකතුමනි, එක්සත් ජාතික පක්ෂ රජයේ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද, ජනතාවගේ විරෝධයට ලක් වූ Millennium Challenge Corporation ගිවිසුම අපේ රටට හානිකර නිසා එදා විරුද්ධ පක්ෂයේ හිටපු අපි ඉතා පැහැදිලිව ඒ පිළිබඳව හෙළිදරව් කළා.

   එක්සත් ජාතික පක්ෂ රජය බලයට ආවේ පිටි පස දොරෙන් නොවෙයි. එක්සත් ජාතික පක්ෂ රජය බලයට ආවේ යහ පාලනය කියන මිථ්‍යාවක් යටතේ අටවා ගන්නා ලද දේශපාලන ගිවිසුමක් යටතේයි. ඒ දේශපාලන ගිවිසුම විසින් රටට කරන ලද හානි එකින් එක නිවැරදි කිරීමට ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ප්‍රධාන අපි ජනාධිපතිවරණයේදී රටේ ජනතාවට ඉතා පැහැදිලිව ප්‍රතිඥා දී ජන අනුමැතිය ලබාගෙන තිබුණා. ගරු අනුර දිසානායක මැතිතුමා විසින් සඳහන් කරන ලද ගිවිසුම අධ්‍යයනය කර, ඒ පිළිබඳව කරුණු විස්තරාත්මකව තීරණය කිරීමට 2019 දෙසැම්බර් 18වන දින පැවැති අප අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අදාළ කමිටුව පත් කර තිබෙනවා.

2. අපේ රටේ කොළඹ විශ්වවිද්‍යාලයේ සුප්‍රසිද්ධ මහාචාර්යවරයෙකු වන ලලිතසිරි ගුණරුවන් මහතා එහි සභාපති; ඩී.එස්. ජයවීර මහතා, සාමාජික; ජනාධිපති නීතිඥ නිහාල් ජයවර්ධන මහතා, සාමාජික; නාලක ජයවීර මහතා, සාමාජික.

3. ඉතා පැහැදිලිව අපේ රජය කාල රාමුවක් දීලා, ඒ කාල රාමුව තුළ එය අවසන් කරන්න තීරණයක් ගෙන තිබෙනවා. එම කමිටුවට දෙන ලද කාල රාමුව අනුව අදාළ වාර්තාව ඉදිරිපත් කිරීම සඳහා මාස හතරක කාලයක් ලබා දී තිබෙනවා.

4. වාර්තාව ලැබුණු පසුව රජය ඒ පිළිබඳව සභාව දැනුවත් කිරීමට පියවර ගන්නවා.

අපේ රටට හානිකර කිසිවක් අප ඉදිරියට ගෙන යන්න බලාපොරොත්තු වන්නේ නැති බව යළිත් මෙම සභාවට ප්‍රකාශ කරන්න මා කැමැතියි, ගරු කථානායකතුමනි.

ඔබතුමාගේ අවසරය මත මාගේ වගකීමක් සඳහන් කරන්නත් මා කැමැතියි. අද දින තමයි ඔබතුමා Committee of Selection ප්‍රකාශයට පත් කළේ. Committee of Selection එකට තමයි පාර්ලිමේන්තුවේ ඉතිරි කමිටු සියල්ල පත් කිරීමේ බලය තිබෙන්නේ. එම කමිටු පත් කිරීමෙන් පසුව තමයි අපේ ඒ කමිටුවලට ඊළඟ තීරණවලට ගමන් කරන්න පුළුවන් වන්නේ. අද පස්වරු 3.00ට ඔබතුමා Committee of Selection කැඳවා තිබෙනවා. ඉන් පසුව අදාළ කමිටු සියල්ල පත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා රජය අවශ්‍ය සහයෝගය ඔබතුමාට ලබා දෙනවා, ගරු කථානායකතුමනි. ඉන් අනතුරුව එම කමිටුවලට ස්ථාවර නියෝග අනුව කටයුතු කිරීමට හැකියාව ලැබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, එම ප්‍රකාශය පිළිබඳව නොවෙයි මා මේ කියන්නේ. ගරු සභානායකතුමා දැන් කිව්වා, අද සවස 3.00ට තේරීම් කාරක සභාව - Committee of Selection - කැඳවා තිබෙනවා, ඒකෙන් තමයි Committee on Parliamentary Business පත් කරන්නත් සිදු වන්නේ කියලා. ගරු කථානායකතුමනි, ඒ අනුව විශාල අපභ්‍රංශයක් වෙනවා. ගරු දිනේෂ් ගුණවර්ධන සභානායකතුමා මේ ප්‍රකාශ කරන්නේ, එය පත් කරන තෙක් අපට පක්ෂ නායක රැස්වීම කැඳවලා, මේ වාර්තාව ගැන විවාද කරන්නේ කවදාද කියලා තීරණයක් ගන්න බැරි බවයි. අපට පක්ෂ නායක රැස්වීමක් කැඳවීමේ හැකියාවකුත් නැත්නම්, මේ වාර්තාව ගැන විවාදයක් පවත්වන්න ක්‍රමයකුත් නැත්නම් ඒ ගැන අපි මේ සභාවෙන් තීරණයක් ගත යුතුයි කියලා මා හිතනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අද සවස 3.00ට අපට මේ ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන්. අද තේරීම් කාරක සභාව පත්කර ගන්නවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

තේරීම් කාරක සභාව පත් කිරීමෙන් පසුව, හෙට මේ වාර්තාව විවාදයට ගන්න පුළුවන් වේවි කියලා ඔබතුමා හිතනවාද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පෙබරවාරි මාසයේ දින හයයි පාර්ලිමේන්තුව පැවැත්වෙන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඒක නේ. ඒ නිසාම තමයි මේ උනන්දුව, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අපට අද ඒ ගැන සාකච්ඡා කරලා තීරණයක් ගන්න පුළුවන්. ඔබතුමා එන්න, අද රැස්වීමේ දී අපි කථා කරමු.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

පෙබරවාරි මාසයේ දින හයයි, මේ මාසයේ දින තුනයි, ඔක්කෝම තව දින නවයයි පාර්ලිමේන්තුව පැවැත්වෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අද අපි බලාපොරොත්තු වෙනවා තේරීම් කාරක සභාව පත් කරලා අවසන් කරන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මෙතැනසඳහන් වෙනවා තවම Committee on Parliamentary Business පත් කරලා නැති නිසා අපට මේ විවාදය ගැන සාකච්ඡාවක් කරන්න අවස්ථාවක් නැහැ කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අපි අද Committee on Parliamentary Business පත් කරන්න බලාපොරොත්තු වනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඒක හොඳයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ ආකාරයට Committee of Selection හෝ Committee on Parliamentary Business නැතිව තමයි ජනාධිපතිවරණයෙන් පසුව මෙතෙක් කාලයක් අපි මේ පාර්ලිමේන්තු රැස්වීම් පවත්වා තිබෙන්නේ. එහිදී ඔබතුමා අප දැනුවත් කරලා, ඔබතුමා විසින් පක්ෂ නායක කාරකාදීන් සියලුදෙනාම කැඳවා ඒ න්‍යාය පත්‍රය තීන්දු කළා. මම හිතන්නේ නැහැ, Committee on Parliamentary Business හෝ Committee of Selection පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය සකස් කරන්නට අත්‍යවශ්‍යමයි කියලා. දැන් මේ සතියේ දින හතරක පාර්ලිමේන්තු වැඩ කටයුතු තීන්දු කළේත්, Committee on Parliamentary Business හෝ Committee of Selection තියාගෙන නොවෙයි. ඒ නිසා Committee on Parliamentary Business සහ Committee of Selection අපට පත් කර ගන්න පුළුවන්. එයට යටත් නොවී, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කියපු ආකාරයට අපට පක්ෂ නායක රැස්වීමක් පැවැත්වීමේ බාධාවක් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒ ගැන අපි කථා කරමු. බාධාවක් නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග හා පාර්ලිමේන්තු සම්ප්‍රදාය ගැන ගරු විපක්ෂ නායකතුමාට සිහිපත් කරන්න අවශ්‍ය නැහැ කියලා මා හිතනවා. එතුමා හොඳින් දන්නවා, පාර්ලිමේන්තු කටයුතු කරගෙන යන්න තමයි Committee on Parliamentary Business පත් කරන්නේ කියලා. Committee on Parliamentary Business පත් කිරීම සඳහා තමයි ඔබතුමා, අප සමඟ සාකච්ඡා කොට අද දින තේරීම් කාරක සභාවේ සාමාජිකයන් ප්‍රකාශයට පත් කළේ. එහි සාමාජිකයන් ප්‍රකාශයට පත් කළාට පස්සේ එය රැස්විය යුතුයි. ඔබතුමා අද සවස 3.00ට ඒ කමිටුව කැඳවා තිබෙනවා. ඒ නිසා එයට බාහිරව කටයුතු කරන්නට දැන් බැහැ. ඔබතුමා සවස 3.00ට තේරීම් කාරක සභාව කැඳෙව්වාට පස්සේ ඒ කමිටුව විසින් Committee on Parliamentary Business පත් කරනවා.

මේ පාර්ලිමේන්තුවේ කිසිම විවාදයක් වළක්වන්න අපි සූදානම් නැහැ. මොකද, මේ ගැටලුවලට වග උත්තරකාරයෝ ඉන්නේ ඔය පැත්තේ. වංචාකාරයෝ ටික ඉන්නේ එහා පැත්තේ. ජනතාව තීන්දුවක් දීලා ගෙදර යැව්වේ ඒකයි. [බාධා කිරීම්] ඒ අයගේ මඟුල් ගෙවල්වල ගියේ තමුන්නාන්සේලායි. මෙය කථා කරන්න අවශ්‍ය නැහැ. [බාධා කිරීම්] මොකද, අවුරුදු ගණනාවක් සුදු හුනු ගාලා වහලා දමපු මහ බැංකු වංචාවේ වගඋත්තරකාරයෝ කවුද කියන එක මුළු රටම දන්නවා. ඒ නිසා මම සභානායකවරයා හැටියට විපක්ෂනායකතුමාට යළිත් කියනවා, අපි පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුගමනය කරමින් ඉක්මනින් වැඩ කරමු කියලා. එච්චරයි කරන්න තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, ගරු සභානායකතුමනි. මේ ගැන ලොකු ගැටලුවක් නැහැ. අපට කථා කරලා මේ කාරණය විසඳා ගන්න පුළුවන්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, ඇත්තටම මම ගරු සභානායකතුමාට කියන්න අදහස් කළේ මෙතෙක් පාර්ලිමේන්තු රැස්වීම් පවත්වපු ආකාරය ගැනයි. එතැනදී ඒ ක්‍රමවේදය අනුගමනය කළේ මේ රටේ සුබ සිද්ධිය උදෙසා, ප්‍රජාතන්ත්‍රවාදයේ සුබ සිද්ධිය උදෙසා මේ වාද විවාද පැවැත්වීම තුළ, ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග සියල්ලක්ම සම්පූර්ණ වන නිසායි. ඒ නිසා මම කියන්නේ, අපේ ඉදිරි Parliamentary Business තීන්දු කරන්නට Committee of Selection and Committee on Parliamentary Business බාධාවක් කර ගන්නට අවශ්‍ය නැහැ කියන කාරණයයි. මොකද, ඒ සඳහා පූර්වාදර්ශයක් තිබෙනවා.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ගරු කථානායකතුමනි, MCC ගිවිසුම සම්බන්ධයෙන් අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා සඳහන් කළා. එම ප්‍රශ්නය මතු කිරීම ගැන මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම පසුගිය රජයේ කැබිනට් මණ්ඩලයෙන් තමයි මේ ගිවිසුම අනුමත කළේ. හැබැයි, අද විපක්ෂනායකතුමා මේ ගිවිසුමට විරුද්ධත්වය පළ කරලා තිබෙනවා. ගරු විපක්ෂනායකතුමනි, මම හිතන හැටියට මන්ත්‍රී කණ්ඩායම හැටියට වෙන්න පුළුවන් ඔබතුමා එම විරුද්ධත්වය පළ කරලා තිබෙන්නේ . අපි ඒ ගැන ස්තුතිය පළ කරනවා. ඒ වාගේම මම දෙමළ ජාතික සන්ධානයටත්, අනෙකුත් ද්‍රවිඩ දේශපාලන පක්ෂවලටත් කියා සිටිනවා, මෙය ජාතික වැදගත්කමකින් යුතු ප්‍රශ්නයක් බව.

පසුගිය ආණ්ඩුව කාලයේ සුළු කල්ලියක් විසින් තමයි මෙය අනුමත කළේ. කැබිනට් මණ්ඩලය පාවිච්චි කරලා මේක අනුමත කරලා තිබෙනවා. ඒක අසීරු තත්ත්වයක්. නමුත් අද අපි ස්තුතිවන්ත වෙනවා,- [බාධා කිරීමක්] ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, මම කථා කළාට පස්සේ ඔබතුමාගේ අදහස් කියන්න. ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය අද ජාතික වැදගත්කමකින් යුත් ප්‍රශ්නයක්. මොකද, අපි මේ ගිවිසුම අත්සන් කරන්න යන්නේ යෝධ රටක් එක්කයි. ඒ නිසා උපායමාර්ගික ලෙස මෙයින් එළියට යෑම ඉතා වැදගත්.

විශේෂයෙන්ම ජනාධිපති අපේක්ෂකයා ජයග්‍රහණය කරවීමේදී අපි මේ MCC ගිවිසුම ප්‍රධාන මාතෘකාවක් බවට පත් කළා. ඒක සම්පූර්ණයෙන් ඇත්තක්. ඒ වාගේම මේ ගැන අධ්‍යයනය කරන්න පත් කරපු කමිටුව නියෝජනය කළ මහාචාර්ය ලලිතසිරි ගුණරුවන් මහතා සහ නාලක ජයවීර මහතා මේ මතවාදය ගොඩ නැඟීමේදී ඉතාම ශක්තිමත්ව පෙනී සිටි දෙදෙනෙකු බවත් මේ අවස්ථාවේ දී සඳහන් කරන්නට ඕනෑ. එම නිසා මේ කමිටුව පත් කිරීමේ වරදක් අපි දකින්නේ නැහැ. මේ ගිවිසුම ගැන අපට දිනේෂ් ගුණවර්ධන මැතිතුමාත් පැහැදිලි කළා. MCC ගිවිසුම කියන්නේ කිසිසේත්ම වර්තමාන රජයට පිළිගන්න පුළුවන් ගිවිසුමක් නොවෙයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, මේ ගැන විවාදයක් කර ගෙන යන්න අවශ්‍ය නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේ දී මම ගෞරවනීය අතුරලියේ රතන ස්වාමීන් වහන්සේට මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්නට ඕනෑ. කැබිනට් මණ්ඩලයේ දී මේ MCC සහ SOFA කියන ගිවිසුම් ගැන කථා වනකොට මම ඊට විරුද්ධ වුණා. ඒක මම පැහැදිලි කරන්න ඕනෑ. එපමණක් නොවෙයි, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වෙනුවට ප්‍රතිත්‍රස්ත පනතක් ගෙන එන්න ඕනෑය කියන අවස්ථාවේ දීත් මම එයට විරුද්ධ වුණා. එම නිසා මම පැහැදිලිව කියන්න කැමැතියි, මේක අද-ඊයේ ඇති කර ගත් මතයක් නොවෙයි කියන එක. කැබිනට් මණ්ඩලයේ දී මම ඒකට විරුද්ධ වුණා.

ඒ වාගේම ගරු කථානායකතුමාට මම කියන්නට ඕනෑ, MCC ගිවිසුම කියන්නේ විශේෂයෙන්ම ජනාධිපතිවරණයේ දී දැඩි විවාදයකට ලක් වූ කාරණාවක් බව. මේ සම්බන්ධයෙන් කථා කරන කොට රට ලේ විලක් වෙනවා කිව්වා, දළ දා හාමුදුරුවෝ වන්දනාමාන කරන්නට යනකොට සහ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ වන්දනාමාන කරන්න යනකොට ඒ පාරේ එක පැත්තක් ලංකාවට අයිතියි, අනෙක් පැත්ත අයිති වන්නේ ඇමෙරිකාවට කිව්වා. ඒ වාගේම ඒ හැම දේකටම ලංකාවේ තානාපති කාර්යාලයෙන් අවසරපත්‍ර සහ බලපත්‍ර ගන්න සිද්ධ වෙයි කිව්වා, මේ MCC ගිවිසුම නිසා. එවැනි අදහස් ඉදිරිපත් කළ අය දැන් කියාගෙන එනවා, මේ ගිවිසුමේ 70ක් හොඳයි ලු, 30යි ලු හොඳ නැත්තේ කියලා.

ගරු ගාමිණී ලොකුගේ මහතා (නාගරික සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி லொக்குகே - நகர அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Gamini Lokuge - State Minister of Urban Development)
එහෙම කිව්වේ කවුද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම මේ අවස්ථාවේ දී පැහැදිලිවම කියන්න කැමැතියි, අපි හැමෝම හැම අවස්ථාවක දීම එක ස්ථාවරයක ඉන්න එක බොහොම වැදගත් වන බව. එම නිසා මගේ ස්ථාවරයේ කිසි වෙනසක් වුණේ නැහැ. MCC ගිවිසුමට වාගේම ප්‍රතිත්‍රස්ත පනතටත් මම පැහැදිලිවම විරුද්ධ වුණා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන ජනතා නියෝජිතයන් හැටියට අපි බහුතරයේ කැමැත්තට ඉඩ දෙනවා. එම නිසා හැටනව ලක්ෂයක ජනතාවක් MCC ගිවිසුම හොඳ නැහැයි කියලා අප පරදවා තිබෙන නිසා MCC ගිවිසුම හොඳ නැහැ; ඒක අනුමත කරන්න බැහැ. හැබැයි, පසුගිය ජනාධිපතිවරණයට කලින් ඒක මාරකයක් වෙන්නත්, දැන් ඒක විමර්ශනය කරන්න කමිටුවක් දමන එකත් අතර පරස්පර විරෝධී තත්ත්වයක් තිබෙනවා. එම නිසා MCC ගිවිසුම ඕනෑ නැත්නම් කමිටු දමන්න ඕනෑත් නැහැ; සියයට 70ක් හොඳයි කියලා නිකම් අතගාලා බලන්න ඕනෑත් නැහැ. මොකද, මේ රටේ හැටනව ලක්ෂයක් ජනතාව කියා තිබෙනවා, MCC ගිවිසුම එපා කියලා. දැන් ඉතින් ඔය දිව දෙකෙන් කථා කරන්නේ, දිව දෙකේ හැසිරීම තිබෙන්නේ අපේ නොවෙයි, ඒ ගොල්ලන්ගේයි. ඒ නිසා MCC ගිවිසුම එපා. බහුතරයේ කැමැත්තට ඉඩ දෙන්න. මේකට අපි විරුද්ධයි.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු කථානායකතුමනි, අපේ ගරු ස්වාමීන් වහන්සේ පැවසූ පරිදි විපක්ෂ නායකතුමා ඉතා පැහැදිලිව මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කරලා තිබෙනවා. ඔබවහන්සේ දැන් ආණ්ඩුවත් එක්ක ඉන්නවා. නමුත්, ගරු ජනාධිපතිතුමා හෝ අගමැතිතුමා මේ සම්බන්ධයෙන් කිසිම ප්‍රකාශයක් කරලා නැහැ, මේක අල්ල අල්ලා ඉන්නවා. ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට ඇමෙරිකාවත් සමඟ හොඳ සම්බන්ධකම් තිබෙන නිසා එතුමාට පුළුවන්, මේ ගිවිසුම හොඳට අධ්‍යයනය කරලා අවලංගු කිරීමට කටයුතු කර ගන්න.

ගරු කථානායකතුමනි, පොලිසිය භාර අමාත්‍යවරයාත් සභාවේ සිටින නිසා මම මේ කාරණය එතුමාට මතක් කරන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, MSD එකේ හැට ගණනක් දේශපාලන හේතු මත මාරු කරලා තිබුණා. අද වෙනකොට තව 55ක් මාරු කරන්න තීන්දුවක් ගෙන තිබෙනවා. ඔබතුමා සාමාන්‍යයෙන් සාධාරණය ගරු කරන ඇමතිවරයකු වශයෙන් මම මේ කාරණය ඔබතුමාගේ අවධානයට යොමු කරවනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, එතුමා ඒ ගැන අවධානය යොමු කරයි.

මීළඟට, අමාත්‍යාංශ නිවේදන - ගරු නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යතුමා.

දේශපාලන පළිගැනීම් : නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යතුමාගේ ප්‍රකාශය
அரசியல் பழிவாங்கல்: திறன்கள் அபிவிருத்தி, தொழில்துறை மற்றும் தொழில் உறவுகள் அமைச்சரினது கூற்று
POLITICAL VICTIMIZATION: STATEMENT BY MINISTER OF SKILLS DEVELOPMENT, EMPLOYMENT AND LABOUR RELATIONS

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (විදේශ සබඳතා අමාත්‍ය, නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - வெளிநாட்டு உறவுகள் அமைச்சரும் திறன்கள் அபிவிருத்தி, தொழில்துறை மற்றும் தொழில் உறவுகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Foreign Relations, Minister of Skills Development, Employment and Labour Relations and Leader of the House of Parliament)
ගරු විපක්ෂ නායකතුමා පසුගිය 08වැනි දා දේශපාලන පළිගැනීම් වශයෙන් සේවකයන් ඉවත් කිරීම ගැන අසන ලද ප්‍රශ්නයට මා පිළිතුර සපයනවා.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ ඉදිරිපත් කරන ලද ප්‍රශ්නයේ සඳහන් ආයතන අතුරින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට පමණක් අදාළ පැමිණිල්ලක් 2019.11.19වෙනි දින කම්කරු දෙපාර්තමේන්තුවට ලැබී ඇති අතර, එහි පැමිණිලිකරු වන්නේ ජාතික සේවක සංගමයයි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ දෛනික පදනමින් සේවයේ යොදවා සිටි සේවකයන් 167දෙනෙකු හට සේවයට වාර්තා කිරීම සඳහා සංස්ථා පරිශ්‍රයට ඇතුළු වීමට අවසර ලබා නොදීම පිළිබඳව එම පැමිණිල්ලේ සඳහන්ව ඇත. එම පැමිණිල්ල පිළිබඳව කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්මික සබඳතා අංශය විසින් දෙපාර්ශ්වයම කැඳවා සාකච්ඡාවක් පවත්වා ඇත. එම සාකච්ඡාවට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙනුවෙන් ඉදිරිපත් වූ නිලධාරි මහතා ප්‍රකාශ කර ඇත්තේ මෙම සේවකයන්ගේ සේවය අවසන් කර නොමැති බවත්, තාවකාලිකව සේවය නවතා ඇති බවත්ය. මෙම කාර්මික ආරවුල පිළිබඳව පරීක්ෂණ කටයුතු තවදුරටත් ක්‍රියාත්මක වෙමින් පවතී.

එමෙන්ම, ගරු විපක්ෂ නායකතුමා අසන ලද ප්‍රශ්නයේ සඳහන් ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය හරහා නිසි ක්‍රියා පටිපාටියකට අනුව බඳවාගත් ව්‍යාපෘති සහකාර තනතුරේ සේවකයන් යැයි කියා සිටි අය සම්බන්ධවද, අධ්‍යාපන අමාත්‍යාංශය හරහා බඳවාගත්තා යැයි කියා සිටි පාසල් සෞඛ්‍ය සහකාර සේවකයන් ගැනද, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කම්කරු සේවකයන්, නිවාස සංවර්ධන අධිකාරියට බඳවාගත් සේවකයන්, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ක්‍රමවේදයක් හරහා උසස්වීම් ලබා දුන් වැඩි පිරිසකගේ උසස්වීම් අත් හිටුවා ඔවුන් නැවත පෙර තනතුරට පත් කළාය කියන කාරණය පිළිබඳවද, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඩෙංගු මර්දන වැඩසටහන සඳහා බඳවාගත් ක්ෂේත්‍ර මදුරු මර්දන සහායකවරුන් පිළිබඳවද කිසිදු පැමිණිල්ලක් අද දින දක්වා කම්කරු දෙපාර්තමේන්තුව වෙත ලැබී නොමැති බව මා වග කීමෙන් ප්‍රකාශ කරනවා.

කම්කරු දෙපාර්තමේන්තුව වෙත කිසියම් පැමිණිල්ලක් ලැබෙන්නේ නම්, ඒ පිළිබඳව සාධාරණව පරීක්ෂා කර අවශ්‍ය කටයුතු කළ හැකි බව මා කරුණාවෙන් දන්වා සිටීමට කැමැතියි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, හදිසි නීතිය අපේ රටේ සාමාන්‍ය නීතිය බවට පත් කරන්න එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ඉතාම හිතුවක්කාර ලෙස ප්‍රතිත්‍රස්ත පනත් කෙටුම්පත ඉදිරිපත් කළා. එය ඉදිරිපත් කළ හිටපු ගරු ඇමතිතුමා දැන් මේ ගරු සභාවේ ඉන්නවා. එතුමා පාර්ලිමේන්තුවට එම පනත් කෙටුම්පත ඉදිරිපත් කළා. එය සම්මත කර ගන්න මාස ගණනාවක් උත්සාහ දැරුවා; ඒ ගැන කරුණු කිව්වා. මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රමුඛ විරුද්ධ පක්ෂය හැටියට අපි මේ රටේ මහ ජනතාවට, ආගමික නායකයන්ට ඒ ගැන කරුණු කිව්වා. නමුත්, මර්දනය ගෙනෙන්න තිබුණු ඕනෑකම නිසා ප්‍රජාතන්ත්‍ර විරෝධී වැඩ පිළිවෙළක් ගෙන ගිය එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ඒ කිසිවක් තඹ දොයිතුවකට ගණන් ගත්තේ නැහැ. මර්දනය නිසාම ඔවුන්ට දේශපාලන වශයෙන් පරාජය කරා ගමන් කරන්න සිද්ධ වුණා.

එම කමිටුවේ සභාපතිවරයා හැටියට කටයුතු කළ ගරු මයන්ත දිසානායක මැතිතුමාට මම විශේෂයෙන් ස්තුතිවන්ත වනවා. එතුමා අපි සඳහන් කළ කරුණුවලට සවන් දීලා, එම දරුණු, මර්දනකාරී පනතේ වගන්තියෙන් වගන්තිය පරීක්ෂා කළා. අපි එම කමිටුවේ සාමාජිකයන් හැටියට ඒ පනත ගැන කරුණු කියන්න අවස්ථාව සලසා ගත්තා. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ හා අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් අපේ අමාත්‍ය මණ්ඩලය තීරණය කළා, ඒ මර්දනකාරී, මෘග පනත ඉල්ලා අස් කර ගන්න. ඔබතුමාට ඉල්ලා අස් කරගන්න බැරි වුණු දේ, නීති පොතට යන්න ඉඩ නොදී අපි ඉල්ලා අස් කරගෙන තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ ක්‍රියාව කරන්න පුළුවන් වුණේ, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා විශිෂ්ට ජයග්‍රහණයක් ලබමින් ජනාධිපති වූ නිසායි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මේ රජය බලයට පත්වීමත් සමඟ මම සඳහන් කළ ඒ ආයතන සියල්ලේම සේවක මර්දනය, රැකියාවලින් එළියට දැමීම, දීමනා සහ වැටුප් නොගෙවීම, උසස්වීම් නතර කිරීම වැනි ක්‍රියාදාම හරහා එම සේවක ප්‍රජාව බරපතළ අසහනයකට, පීඩනයකට ලක් කර තිබෙනවා. මම ඒ ගැන කනගාටු වෙනවා. අපේ ගරු සභානායකතුමා කම්කරු දෙපාර්තමේන්තුවේ පැමිණිලි අංශයේ ප්‍රධාන විමර්ශන නිලධාරියා බවට පත්වෙලා සිටිනවාද කියන ප්‍රශ්නය අපට මතු වෙනවා. මොකද, මේක කම්කරු දෙපාර්තමේන්තුව හරහා කෙරෙන දෙයක් නොවෙයි. එතුමාට තිබුණා, අදාළ රේඛීය අමාත්‍යාංශවලින්, ආයතනවලින් ඒ තොරතුරු විමසා බලා, මේ වාගේ දෙයක් සිදු වෙනවාද, නැද්ද කියලා මීට වඩා ක්‍රමවත්ව, විධිමත්ව සොයා බලා මේ උත්තරීතර සභාවට පිළිතුරු සපයන්න. කම්කරු දෙපාර්තමේන්තුවේ පැමිණිලි තිබුණාද, නැද්ද කියන කාරණාව නොවෙයි, අපේ පැමිණිල්ලේ ප්‍රධාන පදනම. දස දහස් ගණනකගේ ජීවිත අද අනාථ වෙලා. ඔවුන් අද මහ පාරට ඇද දමලා. ඒක තමයි, සත්‍ය කථාව.

මම කනගාටු වෙනවා, අපේ උගත් සභානායකතුමා පරිණත දේශපාලනඥයකු හැටියට මේ කරුණු කාරණා පිළිබඳව මේ සභාව විධිමත්ව දැනුවත් නොකිරීම පිළිබඳව. ඒ නිසා මම ගරු සභානායකතුමාගෙන් නැවතත් බොහොම කාරුණිකව ඉල්ලා සිටිනවා, අදාළ රේඛීය අමාත්‍යාංශවලින්, ඒ විවිධ රාජ්‍ය දෙපාර්තමේන්තුවලින් තොරතුරු විමසලා, කරුණාකර මේ සභාවට සත්‍යවාදී පිළිතුරක් - [බාධා කිරීමක්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මට තව කරුණු කීපයක් කියන්න තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සභානායකතුමනි, ඔබතුමා කථා කළාට පසුව අපි අද දවසේ ප්‍රධාන වැඩ කටයුතුවලට යොමු වෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

සමාවෙන්න, ගරු කථානායකතුමනි, මම කථා කරලා ඉවර නැහැ. මම ගරු සභානායකතුමාගේ අදහස්වලට සවන් දුන්නා. විශේෂයෙන්ම මම එතුමාගෙන් ඉල්ලීමක් කරනවා, හෙට හෝ අනිද්දා, එහෙම නැත්නම් ඊළඟ රැස්වීම් සතියේදී මේ සම්බන්ධයෙන් විධිමත් පිළිතුරක් ලබා දෙන්න කියලා. ඒ වාගේම - [බාධා කිරීමක්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, එතුමා කථාවක් පවත්වනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා කරුණු ඉදිරිපත් කරලා අවසානද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, ගරු කථානායකතුමනි. මම මේ කථාවක් පවත්වනවා නොවෙයි. එතුමා ඉදිරිපත් කළ ඒ වැදගත් අදහස්වලට තමයි මම මේ ප්‍රතිචාර දක්වන්නේ. [බාධා කිරීමක්] ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයක් ඉදිරිපත් කළාම, එතුමා ප්‍රතිත්‍රස්ත පනත ගැන කථා කළා. ඒ නිසා මටත් අයිතියක් තිබෙනවා ඒකට උත්තරයක් දෙන්න.

විශේෂයෙන්ම මේ කාරණය සම්බන්ධයෙන් මම එතුමා දැනුවත් කරන්න කැමැතියි. එතුමාගේ පාර්ශ්වයෙන් ප්‍රතිත්‍රස්ත පනතට විරුද්ධව කටයුතු කරන්න ඇති. එහෙම නැහැ කියලා මම කියන්නේ නැහැ. නමුත්, මම පැහැදිලිවම කියන්න ඕනෑ, ප්‍රතිත්‍රස්ත පනත සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලය තුළ පැහැදිලි විරෝධතාවක් මතු වූ බව. මා පමණක් නොවෙයි, කැබිනට් මණ්ඩලයේ තවත් සාමාජික සාමාජිකාවන් ගණනාවක් එයට විරුද්ධව කථා කිරීම නිසා තමයි ඒ පනත යථාර්ථයක් නොවුණේ. ඒකයි සත්‍ය කථාව. ඒ කාරණාව කෙරෙහිත් මේ අවස්ථාවේ ගරු සභානායකතුමාගේත්, මේ වැදගත් සභාවේත් අවධානය යොමු කරවන්න මා කැමැතියි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, සත්‍යය ජය ගන්නා නිසා තමයි, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජයග්‍රහණය කළේ. අපි දැකපු සත්‍යය තමයි, යූඑන්පී ආණ්ඩුවක් යටතේ ප්‍රතිත්‍රස්ත පනත නීතිගත වෙනවා කියන කාරණය. එය නීති පොතට ඇතුළත් නොවී ඉවත් කරන්න හේතු වූ සත්‍යය වන්නේ, ජනතාව ලබා දුන් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ජයග්‍රහණයයි. තවත් එවැනි ජයග්‍රහණ රාශියක් අත්කර ගැනීමට අපට හැකියාව තිබෙනවා.

හිටපු ඇමතිතුමා -වර්තමාන විපක්ෂ නායකතුමා- කැබිනට් මණ්ඩලයේදී තනිවම එයට විරුද්ධ වුණාද, නැද්ද කියන කාරණය අපි දන්නේ නැහැ. නමුත්, එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කර ගන්න යූඑන්පී ආණ්ඩුව අන්තිම දවස දක්වාම උත්සාහයක යෙදුණා. හිටපු ආණ්ඩුව හැටියට ඔබතුමන්ලා ඒ වගකීම භාර ගන්න ඕනෑ. වැරැද්දක් නම් ඒක වැරැද්දක්ම තමයි. සත්‍යය එයයි.

ගරු කථානායකතුමනි, විපක්ෂ නායකතුමා සඳහන් කළ ආකාරයට, යම් ආයතනයකට සම්බන්ධ සේවකයන් යම් අසාධාරණයකට ලක් වුණාම, නැත්නම් සේවකයෙකුගේ වැඩ නැවැත්වූවාම ඒ සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්තුමාට පැමිණිලි කරන බව ඔබතුමාත් දන්නවා. ගරු විපක්ෂ නායකතුමා ඔය ප්‍රශ්නය අහලා දැන් සති දෙකකට වැඩියි. නමුත් අද දක්වා මේ සම්බන්ධයෙන් පැමිණිල්ලක් ලැබිලා නැහැ. That is the normal procedure under which we can intervene. ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවකයන් සම්බන්ධයෙන් දැනට ලැබුණු එක පැමිණිල්ලකට අපි මැදිහත් වී තිබෙනවා. මේ වෙනුවෙන් අනුගමනය කළ හැකි නීතිරීති අනුවයි ක්‍රියා කළ හැක්කේ. සුදුසුකම් නැති අය ගෙනැල්ලා රස්සාවලට දැම්මාට අපි කිපෙන්නේ නැහැ; කනගාටු වෙන්නේත් නැහැ. යමෙක් රැකියාවෙන් අස් කරලා තිබෙනවා නම් අපි ඒ ගැන සොයා බලනවා. හැබැයි, සුදුසුකම් නැති අය ගැනත් පරීක්ෂණයක් කරන්න අපි ලෑස්තියි. ඒ වාගේම, ඒ අයට පඩි ගෙව්වේ කොහොමද කියන කාරණය ගැනත් අපි වෙනම පරීක්ෂණ පවත්වාගෙන යනවා.

ස්ථාවර නියෝග 27 (2) යටතේ අසන ප්‍රශ්නයකදී, මේ පාර්ලිමේන්තුවේ කටයුතු කරගෙන යෑමට හැකිවන ආකාරයට, නිවැරැදිව ක්‍රමයට එය අහන්න කියලා මම විපක්ෂ නායකතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා සඳහන් කරපු එක් අදහසක් පිළිබඳ මගේ ප්‍රතිචාරය දක්වන්න කැමතියි. එතුමා සඳහන් කළා, "සත්‍යය ජයග්‍රහණය කළා" කියලා. බෝංචි මිල, අර්තාපල් මිල, හාල් මිල, ලූනු මිල දිහා බැලුවාම අපට පෙනෙනවා සත්‍යය ද අසත්‍යය ද ජයග්‍රහණය කළේ කියලා. මිනිස්සුන්ට අද ජීවත් වෙන්න බැරි තත්ත්වයක් තිබෙන මොහොතක, වේදිකාව උඩ ප්‍රකාශ කරපු සත්‍යය ජයග්‍රහණය කරවන්නට කාරුණිකව කටයුතු කරන්න කියලා මම එතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි දැන් ප්‍රධාන කටයුතුවලට යමු. [බාධා කිරීම්] ගරු විපක්ෂ නායකතුමා ඔබතුමා කථාව අවසන් කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මේ කාගේ උපදෙස් ද කියලා මම දන්නේ නැහැ. වෙනදා නම් - ඒ කාලයේ - හිටපු විපක්ෂ නායකතුමාගේ mike එක off වෙන්නේ නැහැ සම්ප්‍රදායයක් හැටියට. මේ කාලයේ තමයි mike එක off වෙන්නේ. ඒක වැරදියි. මම කියන්න කැමතියි, වේදිකාවක් වේදිකාවක් පාසා ඉදිරිපත් කරපු ඒ සත්‍යය ජයග්‍රහණය කරවන්න; ඒක යථාර්ථයක් බවට පත් කරවන්න කියලා.

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට මොකක්ද කියන්න තිබෙන්නේ?

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා කිව්වා කම්කරු දෙපාර්තමේන්තුවට පැමිණිලි ලැබිලා නැහැ කියලා. දෙසැම්බර් 31 වෙනි දා වෙනකොට ජේතවනාරාම ව්‍යාපෘතියේ වැඩ කළ කම්කරුවන් 60 දෙනෙකුගේ සේවය අවසන් කරලා තිබෙනවා. ඒ

[ගරු චන්දිම ගමගේ මහතා]

වාගේම පෙබරවාරි මාසය අවසාන වන විට ඩෙංගු මර්දන නිලධාරින්ගේ රැකියා නවත්වනවා කියලා දැනුම් දීලා තිබෙනවා. කම්කරු දෙපාර්තමේන්තුව ඒ පැමිණිල්ලක්වත් භාර ගන්නේ නැහැ. එවැනි තත්ත්වයක් තමයි දැන් තිබෙන්නේ. සභානායකතුමා කියනවා කම්කරු දෙපාර්තමේන්තුවට පැමිණිලි කරන්න ලු. කම්කරු දෙපාර්තමේන්තුව පැමිණිල්ල භාර ගන්නේ නැති නිසා තමයි පාර්ලිමේන්තුවට කරුණු ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා,-

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා (නිවාස රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத் - வீடமைப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Indika Anuruddha Herath - State Minister of Housing)
ගරු කථානායකතුමනි, මේ සේවකයන් සම්බන්ධයෙන් ගරු විපක්ෂ නායකතුමා සඳහන් කළා. එතුමාගේ කාලය තුළ බඳවා ගත් සියලු සේවකයන් බඳවා ගත්තේ එතුමාගේ වුවමනාවට නොවෙයි, නිලධාරින්ට අනුවයි කියලා එතුමා එදා කර ඇරියා. ඒ සේවකයන් සියලුදෙනා පෝස්ටර් ගහන්නයි, දේශපාලන වැඩ කරන්නයි තමයි කටයුතු කළේ. කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගත් කිසිම කෙනෙක්ගේ වග කීම එතුමා ගත්තේ නැහැ. එතුමා මේ වග කීම අරගන්නවා නම් හෙට වුණත් ඒ සේවකයන්ට රැකියා ලබා දෙන්න රජය සූදානම්. එතුමා ඒ වග කීම ගන්නේ නැති නිසා තමයි මේ ගොල්ලන් නැවත සේවයේ පිහිටුවන්න බැරි. එතුමාගේ කාලයේම තමයි ඔය සේවකයන් සියලුදෙනාගේ රැකියා අවසන් වෙලා තිබුණේ. ඒ නිසා එතුමාට ඒ වග කීම ගන්න කියන්න. එතකොට අපි ඒ කටයුතු කරන්නම්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, අපේ ගරු රාජ්‍ය ඇමතිතුමා මේ අවස්ථාවේ මේ උත්තරීතර සභාවට සාවද්‍ය ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම ගැන මා කනගාටු වෙනවා. ඒ නිසා මගේ අවධානය එතුමාට යොමු කරන්නේ නැහැ. අපේ සභානායකතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා, විධිමත්ව තොරතුරු ටික හොයලා බලලා, සත්‍ය තොරතුරු මත මේ ගැන සත්‍ය පිළිතුරක් මේ සභාවට ඉදිරිපත් කරන්න කියලා. [බාධා කිරීමක්] අවිධිමත් විධියට ඒ කර්තව්‍ය සිදු වුණාය කියන එක මම කිසිසේත්ම පිළිගන්නේ නැහැ. ඒ නිසා මම අපේ ගරු සභානායකතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මම ඉදිරිපත් කරපු ස්ථාවර නියෝග 27(2) ප්‍රශ්නයට විධිමත්, සත්‍යවාදී පිළිතුරක් ලබා දෙන්න කියලා. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ගරු සභාවෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා, අද මේ ගැන විවාද නොකර ප්‍රධාන වැඩ කටයුතුවලට යමු කියලා.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු කථානායකතුමනි, legal point එකක් තිබෙනවා.

ඔබතුමා මතක් කළ ආකාරයට, ඉන්දියානු ධීවරයන්ගේ ප්‍රශ්නය ඔබතුමා නියෝජනය කරන උතුරුකරයේ අපේ ධීවර ජනතාවට විශාල ලෙස බලපෑවා. මේ ප්‍රශ්නයට ස්ථිර විසඳුමක් අවශ්‍යයි. අපි මේ පාර්ලිමේන්තුවේත් දැන් අවුරුදු ගණනාවක් තිස්සේ ඒ ගැන කථා කරනවා. ඉන්දියාවේ ධීවරයෝ අපේ මත්ස්‍ය සම්පත අල්ලා ගන්න අපේ මුහුදු තීරයට එනවා. අපි ඒ අය අල්ලාගෙන නැවත නිදහස් කරනවා. මේ ප්‍රශ්නයටත් ස්ථිර විසඳුමක් තිබෙන්න ඕනෑ. ඒක ඔබතුමාට තනිවම කරන්න බැහැ. ගරු ජනාධිපතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා, ඉන්දියානු රජයත් සමඟ සාකච්ඡා කරලා, මේ ප්‍රශ්නයට ස්ථිර විසඳුමක් ලබා දෙන්න කටයුතු කරන්න කියලා. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු සනත් නිශාන්ත පෙරේරා රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා (ධීවර හා මිරිදිය මත්ස්‍ය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சனத் நிசாந்த பெரேரா - கடற்றொழில் மற்றும் நன்னீர் மீன்பிடிக் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Sanath Nishantha Perera -State Minister of Fisheries and Inland Fisheries Industry)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තව පොඩ්ඩක් ප්‍රමාදවෙලා මට කථා කරන්න අවස්ථාව ලබා දෙන්න පුළුවන් නම් හොඳයි. එතකොට අපේ ගරු මන්ත්‍රීතුමන්ලා ඉදිරිපත් කරන කාරණාවලට මට උත්තර දෙන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි.

ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.12]

ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා (නියෝජ්‍ය කාරක සභාපතිතුමා)
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன் - குழுக்களின் பிரதித் தவிசாளர்)
(The Hon. Selvam Adaikkalanathan - Deputy Chairman of Committees)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நன்றி.

கடற்றொழில் அமைச்சு சார்பாகப் பேசுவதற்கு முன்னர் ஒரு விடயத்தைச் சொல்ல விரும்புகின்றேன். அமைச்சர் விமல் வீரவங்ச அவர்கள் மன்னாருக்கு விஜயம் செய்திருந்தபோது, மன்னார் - தலைமன்னார் பிரதான வீதியிலே செல்வாரி என்ற கிராமத்திலே அமைக்கப்பட்ட பனந்தும்பு உற்பத்தி நிலையத்தின் திறப்பு விழாவிலே, முதலிலே தமிழிலும் இரண்டாவதாகச் சிங்களத்திலும் மூன்றாவதாக ஆங்கிலத்திலும் எழுதப்பட்டிருந்த பெயர்ப் பலகையை மிகச் சந்தோஷமாகத் திறந்துவைத்துவிட்டுக் கொழும்புக்கு வந்த பின்பு ஓர் அறிவித்தலை விட்டிருக்கின்றார். அதாவது, முதலில் சிங்களமும் இரண்டாவதாகத் தமிழும் மூன்றாவதாக ஆங்கிலமும் வரக்கூடியவாறு அந்தப் பெயர்ப் பலகையை மாற்றவேண்டும் என்று அறிவித்திருக்கின்றார். அந்தப் பெயர்ப்பலகை தற்போது அவ்வாறு மாற்றப்பட்டிருக்கின்றது. ஏன் இந்த ஓர வஞ்சனை? தமிழ் மக்கள், சிங்கள மக்கள் என்ற பாகுபாட்டை இந்த நாட்டிலே மறக்க வேண்டும், எல்லோரும் ஒன்றாக வாழ்கின்ற நிலையை ஏற்படுத்த வேண்டும் என்று நினைக்கின்ற இந்தச் சூழலிலே, மீண்டும் மீண்டும் இனங்களுக்கெதிரான ஒரு செயற்பாடாக இந்த விடயங் களைக் கையாள்வது இனங்களுக்கிடையில் ஒற்றுமையை ஏற்படுத்துவதற்கான நல்ல வாய்ப்பை ஏற்படுத்தாது என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். ஆகவே, அமைச்சர் அவர்கள் நன்கு யோசித்து உடனடியாக அந்தப் பெயர்ப்பலகையை முன்னர் இருந்ததுபோல் மாற்றுவதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். வழமையாக எங்களுடைய வடக்கு, கிழக்கிலே, தமிழர்கள் கூடுதலாக இருக்கின்ற பிரதேசங்களிலே தமிழ் முதலில் இருக்கத்தக்கவாறுதான் பெயர்ப்பலகைகள் அமைக்கப்படுகின்றன. சிங்களம், தமிழ் ஆகிய இரண்டும் அரசகரும மொழிகள். இரண்டும் ஒரே அந்தஸ்தைப் பெற்ற மொழிகள். தமிழர்கள் கூடுதலாக வாழ்கின்ற இடங்களிலே ஏன் தமிழை முதன்மைப்படுத்தி குறித்த பெயர்ப் பலகைகளை அமைக்கக்கூடாது? அவ்வாறு பெயர்ப் பலகைகளை அமைத்தால் என்ன நட்டம் ஏற்படப் போகின்றது? இப்படியான செயற்பாடுகள்தான் தமிழ் மக்களையும் சிங்கள மக்களையும் பிரிப்பதற்கான ஒரு வாய்ப்பை ஏற்படுத்துகின்றது. ஆகவே, அதனைக் கவனத்திற் கொள்ள வேண்டுமென்று மீண்டும் கேட்டுக்கொண்டு, கடற்றொழில் அமைச்சு சம்மந்தமாகச் சில ஆலோசனை களையும் கருத்துக்களையும் சொல்ல விரும்புகின்றேன்.

உண்மையிலே, எங்களுடைய அமைச்சர் டக்ளஸ் தேவானந்தா அவர்கள் தனது கடமையைப் பொறுப்பேற்று,

எங்களுடைய பிரதேசத்தில் மட்டுமல்லாமல், சிங்களப் பிரதேசத்திலும் முழுமூச்சாகச் செயற்படுவதை நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது. இது நல்லொரு விடயம். அமைச்சர் அவர்கள் அந்தச் செயற்பாட்டைத் தொடர்ந்து முன்னெடுக்க வேண்டும்.

எங்களுடைய மீனவர் சமூகத்தைப் பொறுத்தமட்டிலே, குறித்த பல விடயங்களிலே வழங்கப்படுகின்ற மானியங்கள், ஏனைய சலுகைகள் அவர்களுக்குக் கிடைப்பதில்லை. உதாரணமாக, கடலிலே மீன்பிடிக்கச் செல்லும்போது மீனவர் ஒருவர் இறந்தால் அதற்கான இழப்பீட்டைப் பெற்றுக் கொள்ளக்கூடியதாக insuranceஐ செயற்படுத்துவதற்கான வாய்ப்பை அவர்களுக்கும் ஏற்படுத்த வேண்டும். அதேபோல அவர்களுடைய உடைமைகளுக்கும் இழப்பீடுகளைப் பெற்றுக்கொள்ள வாய்ப்புகளை ஏற்படுத்த வேண்டும். மேலும், இந்திய ரோலர்களின் வருகையாலும் எமது மீனவர்கள் பாதிக்கப்படுகின்றார்கள். இவ்வாறு கடற்றொழிலில் ஈடுபடுகின்ற எங்களுடைய மக்கள் பாதிக்கப்படுகின்றபோது, அவர்கள் மீண்டும் கடன்படுகின்ற ஒரு சூழ்நிலை ஏற்படுகின்றது.

இதைவிட முக்கியமான ஒரு விடயம் பற்றியும் குறிப்பிட வேண்டும். எங்களுடைய நாட்டுக்கு வருமானத்தைப் பெற்றுக் கொடுக்கின்ற மூன்று பிரதான தொழில்கள் இருக்கின்றன. அவையாவன, மலையகத்திலே மேற்கொள்ளப்படுகின்ற தேயிலைப் பயிர்ச்செய்கை, விவசாயம், மீன்பிடி முதலியன வாகும். மீன்பிடி, விவசாயம் என்பவற்றைப் பொறுத்தமட்டிலே அவற்றுக்கான உற்பத்திப் பொருட்களுக்கான விலை நிர்ணயம் செய்யப்படாமல் இருக்கின்றது. அதாவது, நெல்லுக்கு விலை நிர்ணயம் செய்யப்படவில்லை. அதேபோல, மீன்களுக்கும் விலைகள் நிர்ணயிக்கப்படவில்லை. இவற்றுக்கான விலைகள் நிர்ணயிக்கப்படுகின்றபோதுதான் எங்களுடைய மீனவர் சமூகமும் மற்றும் விவசாயிகளும் நன்மை பெறுவார்கள். இல்லையேல், நெல்லைக் கொள்முதல் செய்கின்ற முதலாளிகள் இந்த நிலைமையைப் பயன்படுத்திக்கொண்டு நெல்லைக் கொள்ளையடித்துக் கொள்வார்கள். முதலாளிகள், முதலிலே பணத்தைக் கொடுத்து எங்களுடைய மீனவ சமூகத்தைத் தங்களுடைய கட்டுப்பாட்டிலே வைத்துக்கொண்டு நெல்லைக் குறைந்த விலையில் வாங்குகின்ற துர்ப்பாக்கிய நிலை காணப்படுகின்றது. அதேபோல எங்களுடைய மீனவர் சமூகத்தையும் தங்களுடைய கட்டுப்பாட்டிலே வைத்துக் கொண்டு, அந்த மீனவர்கள் பிடிக்கின்ற மீனைக் குறைந்த விலையிலே வாங்கிச் செயற்படுகின்ற ஒரு துர்ப்பாக்கிய நிலையும் இருக்கின்றது.

அடுத்து, எங்களுடைய மீனவக் கிராமங்களிலே காணப்படுகின்ற உள் வீதிகள், பாடசாலைகள் மற்றும் சிறுவர் பாடசாலைகள் போன்ற விடயங்களிலும் அமைச்சர் அவர்கள் கூடுதல் கவனம் செலுத்த வேண்டும். கடந்த அரசில்கூட கடற்றொழில் அமைச்சர் எங்களுடைய பிரதேசத்திலே எந்தக் கவனமும் செலுத்தவில்லையென்பதை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். நாங்கள் பல கோரிக்கைகளை முன்வைத்தும் கூட, அவை நடைமுறைப்படுத்தப்படவில்லை. ஆகவே, இதனை நீங்கள் கவனத்தில் எடுக்க வேண்டும். இன்று எனக்கு 5 நிமிடங்கள்தான் ஒதுக்கப்பட்டிருக்கின்றன. அதனால் இந்த விடயம் சம்பந்தமாக நான் அதிகம் உரையாற்ற முடியாதுள்ளது. உங்களுடைய செயற்பாடுகள் எங்களுடைய மீனவர் சமூகத்திற்கு நல்ல ஓர் எடுத்துக்காட்டாக இருக்க வேண்டுமென்று நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன்.

மேலும், அதிக மழை காரணமாக எங்களுடைய விவசாயிகளின் செய்கை அழிந்துபோயிருக்கின்றது. அதற்கான நஷ்டஈட்டை விவசாயத் திணைக்களம் வழங்குகின்றபோதும் கூட, insurance செய்தவர்களுக்கு மட்டும்தான் அந்த நஷ்டஈடு வழங்கப்படுவதாக அறியக்கிடைக்கின்றது. உண்மையிலே insurance பண்ணமுடியாத அப்பாவி விவசாயிகளும் இருக்கிறார்கள். இன்றைய விடயத்திற்குச் சம்பந்தமில்லாத ஒரு விடயத்தை நான் இப்பொழுது இங்கு சொல்லிக் கொண்டிருக்கின்றேன். ஏனென்றால், அமைச்சர் அவர்களுக்கு இது தெரிய வேண்டும். ஆகவே, அவ்வாறான விவசாயிகளுக்கும் நஷ்டஈட்டை வழங்க வேண்டும் என்று கேட்டுக் கொள்கின்றேன். நெல்லுக்கான விலை நிர்ணயம் செய்யப்படாத காரணத்தால் அன்றாடம் எங்களுடைய விவசாயிகள் முதலாளிகளின் கைக்குள் சிக்கித் திண்டாடு கிறார்கள். விவசாயத்தினூடாகப் பெறுகின்ற ஊதியத்தின் மூலமாக தாங்கள் அடைமானம் வைத்த பொருட்களை மட்டும்தான் அவர்களால் மீட்கக்கூடியதாக இருக்கின்றதே தவிர, முன்னேற்றகரமான செயற்பாடுகளில் அவர்களால் ஈடுபட முடியவில்லை. ஆகவே, விவசாய அழிவுகளுக்கும் நிவாரணம் வழங்கும் வகையில் அரசாங்கம் நல்ல ஒரு தீர்மானத்தையெடுக்க வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

எதிர்க்கட்சித் தலைவர் அவர்கள் முன்பு வீடமைப்பு அமைச்சராக இருந்தார். அந்த ரீதியிலே அவர் வடக்கு, கிழக்கிலே வீட்டுத்திட்டங்களை வழங்கியிருந்தார். சம்பந்தப் பட்டவர்கள் வீடு கட்ட அனுமதி வழங்கிய பின்பு, அதற்காகச் சிறுதொகைப் பணம்தான் அவர்களுக்கு வழங்கப்பட்டது. அந்தப் பணம் முழுமையாகக் கொடுக்கப்படவில்லை. இருந்தபோதிலும் எங்களுடைய மக்கள் நம்பிக்கையோடு கடன்களைப் பெற்றுக் குறித்த வீடுகளைக் கட்டினார்கள். இப்பொழுது வாங்கிய கடனைத் திருப்பிக் கொடுக்க முடியாத சூழல் அவர்களுக்கு ஏற்பட்டிருக்கின்றது. இப்பொழுது மழை காலம். அங்கு கூரையில்லாத வீடுகள் இருக்கின்றன. இவ்வாறாக அந்த வீட்டுத்திட்டப் பயனாளிகள் மிகவும் துன்பத்திற்குள்ளாகியிருக்கிறார்கள். வீடமைப்பு வசதிகள் பற்றிய அமைச்சு கௌரவ பிரதமர் அவர்களுக்குக் கீழ் வருவதால் அவர் இது குறித்துக் கவனத்தில் எடுக்கவேண்டும். தற்போதைய எதிர்க்கட்சித் தலைவர் வீடமைப்பு அமைச்சராக இருக்கும்போது மேற்கொண்ட வீடமைப்பு விடயங்களில் தற்போதைய அமைச்சர் கவனம் செலுத்தக்கூடாது என்ற நிலைமை இருக்கக்கூடாது. ஏனென்றால், இவை அரசாங்கம் கொடுத்த வீட்டுத்திட்டங்களாகும். எங்களுடைய மக்கள் மிகவும் துன்பத்துக்கு உள்ளாக்கப்பட்டிருக்கிறார்கள். மழை காலத்திலே அவர்கள் குறித்த வீடுகளில் இருப்பதற்கான வாய்ப்பில்லை. அதைவிட, கடனாளிகள் மிகவும் கஷ்டப்பட்டுக் கொண்டிருக்கிறார்கள். அவர்கள் மேலும் கடன் வாங்குகின்ற நிலைமை காணப்படுகின்றது. எனவே, இந்த விடயத்தையும் கவனத்திலெடுக்க வேண்டும் என்று கேட்டுக் கொள்கின்றேன்.

இறுதியாக, அமைச்சர் அவர்கள் நிச்சயமாக குறித்த 03 மாதங்களிலே எங்களுடைய மீனவச் சமூகத்துக்கு நல்ல எதிர்காலத்துக்கான சரியான வழியைக் காட்டவேண்டுமென்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

Sir, give me a few seconds to reply to the Hon. Member.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
We are running short of time.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
உங்களுடைய நம்பிக்கை எந்தவகையிலும் வீண்போகாது. இந்த அரசாங்கம் 03 மாத காலத்திற்கு - Vote on Account - கணக்கு வாக்குப் பணத்தினூடகத்தான் செலவுகளை மேற்கொள்ள வேண்டியிருக்கின்றது. ஆகையால், இந்த 03 மாத காலத்துக்குள் இதற்குக் காசை ஒதுக்குவதற்கு அரசாங்கத்திடம் எந்தளவு காசு இருக்குமோ தெரியாது. இவ்வீட்டுத் திட்டம் சம்பந்தமாக நான் பிரதமருடன் ஏற்கெனவே கலந்துரையாடி இருக்கின்றேன். அவர் குறித்த கோரிக்கையை நிறைவேற்றுவதற்கு முயற்சி செய்வதற்காகச் சொல்லியிருக்கின்றார்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු රන්ජන් රාමනායක මැතිතුමා. ඔබතුමාට විනාඩි 22ක කාලයක් තිබෙනවා.

ඊට ප්‍රථම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Ranjan Ramanayake, please start your speech.

[අ.භා.3.22]

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ධීවර හා ජලජ සම්පත් පනත යටතේ ඉදිරිපත් කර තිබෙන නියෝග සම්බන්ධයෙන් වචනයක් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. නමුත් මට ලැබී තිබෙන කාලය ඉතා සීමිත නිසා මා මුලින් ගරු කථානායකතුමාගෙන් ඉල්ලූ වරය පිළිබඳ පැහැදිලි කරන්නට මේ අවස්ථාව යොදා ගන්නා බව මුලින්ම සඳහන් කරනවා. ලංකාවේ ජනතාවට පැහැදිලි කිරීමට විශාල, දීර්ඝ විස්තරයක් මට තිබෙනවා. මා සමඟ සංවාදයේ යෙදුණා යැයි කියන ඔත්තුකරුවන්, තොරතුරු සපයන්නන්, උපාය දූතයන්, දේශපාලනඥයන්, දේශපාලන පක්ෂවල නායකයන්, විනිසුරුවරුන්, ආගමික නායකයන්, ආගමික නියෝජිතයන්, ව්‍යවසායකයන්, අධිකරණයට සම්බන්ධ ක්‍රියාකාරින්, වින්දිත විරී ගණිකාවන්, කලාකරුවන්, ආරක්ෂක අංශයේ නිලධාරින් සමඟ මා කළ සංවාදවල සංස්කරණය කළ, සංස්කරණය නොකළ, විකෘති කළ, විකෘති නොකළ, වෙනස් කළ, වෙනස් නොකළ, සංවාද පසුගිය දිනවල ලංකාවේ සහ ලෝකයේ ජනතාව පක්ෂ, විපක්ෂ නාලිකා හරහා, කඩේ යන නාලිකා හරහා, ජනමාධ්‍ය හරහා පක්ෂ භේදයෙන් තොරව ශ්‍රවණය කළා. පසුගිය කාලයේ මේවා සම්බන්ධව මේ පාර්ලිමේන්තුවේ මගේ නම කියමින් කරපු කථා මම remand එකට වෙලා අහගෙන හිටියා. මට ඒ ගැන උත්තර බඳින්න අවස්ථාවක් තිබුණේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මම ඒ සියලු පුවත් පත් වාර්තා, සංවාද, විවාද, සජීවී සාකච්ඡා ආදී සියලු දෙය දෙස උපේක්ෂාවෙන් බලාගෙන හිටියා. පාළු ගෙයි වළං බිඳිනවා වාගේ ඒවා කිව්වා මිස ඒකට සම්බන්ධ වූ පාර්ශ්වයට -මට- උත්තර බඳින්න අවස්ථාවක් ලැබුණේ නැහැ. ඒ නිසා මම මේ අවස්ථාව ඒ සඳහා යොදා ගන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස මා හට හිමි වරප්‍රසාද කඩ කරමින් පසුගිය හතරවැනි දින රාත්‍රී එක්වරම පොලිසියෙන් ගෙදරට පැමිණ මගේ දුරකථනය, මගේ ගෙදර තිබුණු laptop එක, hard disk එක ඇතුළු සියලු උපාංග අත්අඩංගුවට ගත්තා. මේ සභාවේ සිටින කාට හෝ ඒ දේ වුණා නම්, මම එයට විරුද්ධව නැඟී සිටිනවා. මේ සභාවේ ඉන්න අයගේ දුරකථනවල පෞද්ගලික සංවාද ඇති; ජායාරූප ඇති; තමන්ගේ පෙම්වතියන් සමඟ කරපු සංවාද ඇති; නොයෙකුත් දේවල් ඇති. මේ ලෝකයේ පෙම්වතියන් සමඟ සංවාද කළේ මා පමණක් නොවෙයි. මගේ මේ සියලු උපකරණ එකවර පොලිසියෙන් අරගෙන ගියා. ඒවා අරගෙන අවසරයකින් තොරව -[බාධා කිරීමක්] ඔබතුමාගේ සංවාදයත් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පොදු ජනතාවටයි මම මේ කථාව කියන්නේ. දූෂණ හෙළිදරව් කිරීමේ සටනේදී, මේ හඬපට ජාතියට හෙළිදරව් කිරීම නිසා පෞද්ගලිකව හානි වූ සෑම මනුෂ්‍යයෙකුගෙන්ම මම මුළු හදවතින්ම, අවංකවම සමාව ඉල්ලනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක වන හිරුනිකා ප්‍රේමචන්ද්‍ර ඇතුළු සියලුදෙනාගෙන්ම මම සමාව ඉල්ලනවා. මම හිතාමතා මෙම කරුණු හෙළිදරව් කළේ නැහැ. මේවා, වචන වෙනස් කරන ජනතාවක් සිටින නිසා මගේ ආරක්ෂාවට මගේ ගෙදර තියාගෙන සිටියා පමණයි. කාගේවත් පවුල් ජීවිත අවුල් කිරීමට, කාගේවත් සාමය නැති කිරීමට මම කිසිම දෙයක් හෙළිදරව් කළේ නැහැ. එහෙම හෙළිදරව් කරන්නේ ලංකාවේ ප්‍රසිද්ධ කුඩු ව්‍යාපාරිකයකුගේ කුඩු නාලිකාවක් කියන එක මම මේ අවස්ථාවේදී ලංකාවේ ජනතාවට පැහැදිලි කරලා කියනවා. ඒ වාගේම මම කියනවා, හිරගෙදරදී කථා කරන්න මට වෙනත් දුරකථනයක් නැහැ කියලා. මා සමඟ සංවාද කළ ඔත්තුකරුවන්ට, මා සමඟ කථා කළාය කියන විනිසුරුවරුන්ට, රජයේ සේවකයන්ට, CID එකේ මහත්වරුන්ට මා කියනවා, අපි මේ සේරම කළේ මේ රටේ අහිංසක දුප්පත් මිනිසුන්ගේ සල්ලි හොරකම් කරපු හොරුන් ඇතුළට දමන්න මිසක් හොරුන් නිදහස් කරන්න නොවෙයි කියලා. ඒ නිසා අපි සියලුදෙනා එකතු වෙලා මේ සටන ජයග්‍රහණය කරමු. අපි සටන පාවා දෙන්නේ නැහැ. අපි එකතු වෙලා මේ සටන දිගටම ගෙනියනවා කියන එකත් මම මේ අවස්ථාවේදී කියනවා. ඒ වාගේම, මා ළඟ තිබෙන මේ රටට අනාවරණ නොවුණු සියලු සංවාද සහ ආණ්ඩුව හංගන සංවාද නිර්භීතව අද මා **සභාගත*** කරනවා.

** හඬපට ඉදිරිපත් නොකරන ලදී.*
ஒலிப்பதிவுகள் சமர்ப்பிக்கப்படவில்லை.
Voice recordings not tendered.

ඒ සංවාදවලදී මා සමඟ කථා කළ විනිසුරුවරු ඉන්නවා, අගවිනිසුරුවරු ඉන්නවා, රාජ්‍ය නායකයෝ ඉන්නවා. ඒ අය කියපු කථා ජනතාවට දැනගන්න අයිතියක් තිබෙනවා. ඒ රාජ්‍ය නායකයන්ගේ හඬින්ම ඒවා තිබෙනවා. ඒවායේ කැබිනට් ඇමතිවරු ඉන්නවා, කැබිනට් ඇමතිවරුන්ගේ නෝනලා ඉන්නවා, ඒ අයගේ දරුවන් ඉන්නවා. ඒ අය මට දුක කියලා තිබෙනවා. ඒ සියලුදෙනාගේම හඬපට භය නැතිව, නිර්භීතව රන්ජන් රාමනායක අද සභාගත කරනවා. ඒවා හැන්සාඩ් දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට මගෙන් ලබා ගන්න පුළුවන්. මම ඒවා අද පාර්ලිමේන්තුවට ලබා දෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රන්ජන් රාමනායක වන මම ඇයි මේ වාගේ දෙයක් කළේ කියලා සමහරු අහනවා, මේ රටේ ජනතාව මගෙන් අහනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම COPE එකේ සාමාජිකයෙක්. COPE එක තිබෙන්නේ දූෂණ වංචා ගැන, හොරකම් ගැන හොයන්නයි. ඒ වාගේම මම නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජිකයෙක්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම පසුගිය කාලයේ ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාත් එක්ක COPE එකේ සියලු වැටලීම්වලට සක්‍රියව දායක වෙච්ච පුද්ගලයෙක්. ඒ වැටලීම්වලට යද්දී ඒ අයටත් හොරෙන්, මාධ්‍යවේදීන්ටත් හොරෙන් මගේ වීඩියෝ කැමරාවක් වෙනම අරගෙන ගියා. එහෙම අරගෙන යන්නේ මොකටද, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි? ලංකාවේ මිනිසුන් වාගේ වචනය වෙනස් කරන, කිව්ව දේ "නැහැ" කියන, "මතක නැහැ" කියන, "දන්නේ නැහැ" කියන ජනතාවක් මම ලෝකයේ කොහේවත් දැකලා නැහැ. සමහර අය කියනවා, "මම කිව්වේ නැහැ" කියලා. කිව්වේ නැහැ කියලා කිව්වොත් පෙන්වන්න ඒක මා ළඟ තිබෙනවා. "මම දන්නේ නැහැ" කියලා කිව්වොත්, ඒක පෙන්වන්නත් මා ළඟ සාක්ෂි තිබෙනවා. මේ වාගේ දේවල් පහුගිය ටිකේ වුණා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එක්තරා දවසක පාලිත රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමාට එස්.බී. දිසානායක මන්ත්‍රීතුමා කථා කළා. කථා කරලා කිව්වා, "රංගෙ ඔයා එනවාද? දැන් ආවොත් ඔබට කැබිනට් ඇමතිකමක් ගන්න පුළුවන්" කියලා. ඒ සංවාදය Facebook එකේ ගියා. රංගෙ බණ්ඩාර ඇවිල්ලා මේ කාරණය ජනමාධ්‍ය ඉදිරිපිට කිව්වා නම් ජන මාධ්‍යවේදීන් කියයි, "බොරු බයිලා කියන්න එපා. අපට recordings පෙන්වන්න" කියලා. පාර්ලිමේන්තුවේ මා හැම දාම හොරෙකු ගැන අනාවරණ කරද්දී, හැමදෙනාම කිව්වේ, "recordings පෙන්වන්න. සාක්ෂි පෙන්වන්න" කියලායි. අපි දන්නවා, ඔහු ලෝක හොරෙක් කියලා. අපි දන්නවා සුනාමි වංචාව, කතරගම නිවස සම්බන්ධ වංචාව, Avant Garde fraud එක, මහ බැංකු බැඳුම්කර වංචාව ආදිය පිළිබඳව කියද්දී ජනතාව මොනවාද කිව්වේ කියලා. "සාක්ෂි කෝ, බොරු මඩ ගහන්න එපා. බයිලා කියන්න එපා. පව

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

"එපා" කියලායි කිව්වේ. ඒ නිසා තමයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ හැම දෙයටම අවශ්‍ය සාක්ෂි, දත්ත - data -, වෛද්‍ය වාර්තා, certified copies සියල්ලම තබා ගත්තේ කියලා මේ කථාව අහගෙන ඉන්න ජනතාවට මා කියනවා. එහෙම කළේ හොරුන් අල්ලන්න, හොරුන් කූඩු කරන්න, හොරුන් ඇතුළට දමන්න මිසක් හොරුන් නිදහස් කරන්න නොවෙයි. මේ සංවාදවල එක තැනකවත් කියලා නැහැ, "අර හොරා ගෙදර යවන්න. අර හොරා නිදහස් කරන්න" කියලා. මේවායේ කියලා තිබෙන්නේම, "ඇයි මේ අය ඇතුළට දමන්නේ නැත්තේ? මේ අය ලෝක හොරු. මේ අය ලංකාවේ ජනතාවගේ සල්ලි හොරකම් කළා. මේ අය ඇතුළට දමන්න. මේ අයට දඬුවම් දෙන්න" කියලායි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ නිසා කාගෙන්වත් චරිත සහතික මට ඕනෑ නැහැ. මෙතැන ඉන්න දූෂිතයන්ගෙන් චරිත සහතික මට ඕනෑ නැහැ. මගේ හදවත දන්නවා, මා මේවා record කළේ මොකටද කියලා. මේවා පටිගත කළේ මොකටද කියලා. මේ සියල්ලම ඔප්පු කරන්න අද මට හඬ පටවල් වාගේම වීඩියෝ පටත් තිබෙනවා. ඒ නිසා කාටවත් සෙල්ලම් කරන්න, විවාද කරන්න බැහැ. මා මේ සියලු දේවල් අද දින සභාගත කරන්නේ බොහොම නිර්භීතවයි. මොකද, මා දන්නවා, ඒ අයට මෙයට උත්තර බඳින්න බැහැයි කියන එක.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසුගිය දවස්වල , සාක්ෂිකරුවන් මිලදී ගැනීම සම්බන්ධයෙන් මා දැක්කා. මේ කාරණය මට කිව්වේ හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මැතිනියයි. එතුමියගේ පියා ළඟ වැඩ කළා, "බෝලේ" කියලා ඩ්‍රයිවර් කෙනෙක්. මේ ඩ්‍රයිවර් දුමින්ද සිල්වාගේ පළමුවන නඩුවේදී භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර පැත්තේ සිටියා. අන්තිමට රුපියල් ලක්ෂ 70ක් දීලා ඒ පුද්ගලයා ගත්තා. ඊට පස්සේ ඒ පුද්ගලයා වෙන සාක්ෂියක් දුන්නා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මැතිතුමාගේ නඩුවේ - මා කාටවත් අපහාස කරනවා නොවෙයි. - ඒ සාක්ෂිකාරියට මොකද වුණේ? FCID එකේ නඩුව දැම්මා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් අලුත් ක්‍රමය තමයි විත්තිකාරයායි, පැමිණිලිකාරයායි සෙට්t වන එක. එහෙම සෙට්වෙලා කියනවා, "අපි දමමු, දුර්වල නඩුවක්" කියලා. දුර්වල නඩුවක් දැම්මාම මහදී හැලෙනවා. FCID එකේ රවි විද්‍යාලංකාර අහනවා, "දුර්වල නඩුවක් දැම්මොත් තමුන්නාන්සේ මට කීයක් දෙනවාද? මහදී නඩුව හැලෙන්න මම දෙන්නම් වැඩේ. මට කෝටි කීයක් දෙනවාද?" කියලා. එතකොට සල්ලි ගත්තා; සාක්ෂිකාරිය කූඩුවට නැගලා, "FCID එක මට බලපෑම් කළා" කිව්වා; නඩුව අහක ගියා. පසුගිය දවස් ටිකේම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ පවරපු නඩු සියල්ලම ඉවත් වුණේ එහෙමයි. පසුගිය ටිකේම නීතිපති දෙපාර්තමේන්තුවෙන් පවරපු නඩු බොහොමයක් ඉවත් වුණේ එහෙමයි. මොකක්ද වුණේ? හොරු අල්ලන එක්කෙනායි, හොරායි දෙන්නා සෙට් වෙලා, එකතුවෙලා ඩීල් එක දමලා, මහදී නඩුව හලනවා. ජනතාව බලාගෙන ඉන්නවා. මෙහෙම දේවල් තමයි වුණේ. ඒ නිසා තමයි මා විනිසුරුවරුන්ගේ කථා, අධිකරණ නිලධාරින්ගේ කථා, හොරාගේ කථා, පැමිණිලිකාරයාගේ කථා, විත්තිකරුවාගේ කථා සියල්ලම record කළේ. දැන් බේරෙන්න හම්බවෙන්නේ නැහැ.

එදා ආණ්ඩුව බලයට ආවේ හොරු අල්ලනවා කියලායි. 2015 ජනවාරි 08 වන දා රෑ 12.00ට Airport එක වහලා හොරු අල්ලනවා කියලායි බලයට ආවේ. නමුත් ඒ ආණ්ඩුව මොකද කළේ? එදා රෑ හොරුන්ට පැනලා යන්න choppers දෙකක් දුන්නා. ඒක තමයි තිත්ත ඇත්ත. මා මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට ගරු කරනවා. එතුමා මුල් කාලයේ හොරුන් අල්ලන්න හැදුවා. මොකක්ද වුණේ? ඊට පස්සේ බැඳුම්කර වංචාව සිද්ධ වුණා. බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් ඇලෝසියස් මට කථා කරපු phone call එකත් මා ළඟ තිබෙනවා. මට සල්ලි දෙන්න හදපු call එකත් මා ළඟ තිබෙනවා. ඒකයි මා භය නැතුව ඉන්නේ. මොකද, ඔහුට කියන්න බැහැ, මට කථා කළේ නැහැයි කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ගෙදරට සජීවී සාකච්ඡාවකට හිරු, දෙරණ, සියත යන කුමන නාලිකාවකින් කවුරුන් ආවොත් මගේ කථාව විකෘති කරලා දමන නිසා මා මගේ පෞද්ගලික cameraman කෙනෙක් තබා ගන්නවා. මගේ පෞද්ගලික cameraman කෙනෙක් මුළු කථාවම පටිගත කරනවා. මොකද? හිරු නාළිකාවේ විකාශනය වන්නේ රේනට ඕනෑ කෑල්ල. "දෙරණ" නාළිකාවේ විකාශනය වන්නේ මා මිත්‍ර දිලිත් ජයවීරට ඕනෑ කෑල්ල. "සියත" නාළිකාවේ විකාශනය වන්නේ ඒ

[ගරු රන්ජන් රාමනායක මහතා]

අයට ඕනෑ කැල්ල. ඒවා වෙනස් නොකරන්න තමයි මා සිටින සජීවී සාකච්ඡා වෙනම camera එකකින් record කළේ. එහි ප්‍රතිඵල මා අද භුක්ති විඳිනවා. මා භය නැහැ. මොකද, මම කථා කරපු ඒවා මා ළඟ තිබෙන නිසා. පසුගිය ටිකේ මේ දේවල් සිද්ධ වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සරත් අඹේපිටිය මහත්මයා ආන්දෝලනාත්මක නඩු තීන්දුවක් දුන්නාය කියලා පොට්ට නවුෆර් විසින් ඔහු ඝාතනය කරනු ලැබුවා. පොට්ට නවුෆර්ගේ ගෝලයෙක් එළියේ වමනේ දැම්මා. ඒ වමනේ sample එකක් අරගෙන තමයි කරුණු සොයා ගත්තේ. සරත් අඹේපිටිය මහත්මයා කුඩු කාරයකුට මරණ දඬුවම දුන්නු නිසා ගෙදර පෝටිකෝව තුළදී වෙඩි කාලා මැරුණා. ඒ භය, දැන් ඉන්න කුඩුකාරයෙකුට මරණ දඬුවම දීපු පද්මිණී එන්. රණවක ගුණතිලකටත් තිබුණා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒක තමයි තිත්ත ඇත්ත. ඒ නඩු තීන්දුව දුන් හිටපු විනිසුරු මොරායස් මහත්මයා නඩු තීන්දුව දීලා භය නිසා තහිටියට පැනලා ගියා. පද්මිණී එන්. රණවක ගුණතිලකගේ දරුවාට ඉස්කෝලේ - රෝයල් එකට- යන්න විධියක් තිබුණේ නැහැ. එතුමිය මට කථා කරලා කිව්වා, "මේ මදාවි කුඩුකාරයෝ මගේ පුතාට ඇසිඩ් ගහන්න ඉන්නවා, එම නිසා එයාට පොලිස් ආරක්ෂාව දෙන්න" කියලා. මම පූජිත් ජයසුන්දරට කථා කළා; ඒකෙත් recording එක තිබෙනවා. හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනට කථා කළා; ඒකෙත් recording එක තිබෙනවා. මම පොලිස් නිලධාරියෙක් එක්ක වාහනයක් යැව්වා, ඒ විනිසුරුවරියගේ පුතාට ඇසිඩ් ගහනවා කියලා කියපු නිසා. ඒක වැරදිද? ඒක තමයි තිත්ත ඇත්ත. මෙතැන කිසිම බලපෑමක් කළේ නැහැ. ඔය කුඩුකාරයාගේ නඩුව ත්‍රිපුද්ගල විනිසුරු මඬුල්ලක් ඉදිරියේ අහලා, නැවත බුවනෙක අලුවිහාරේ, මලල්ගොඩ, ප්‍රියසාද් ඩෙප් ඇතුළු පංච පුද්ගල විනිසුරු මඬුල්ලක් විසින් මරණ දඬුවම දුන් නඩුවක්; තීන්දුවක්. අද

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කුඩුකාරයා වෙනුවෙන් කථා කරනවා. සමහර ස්වාමීන් වහන්සේලාත් කුඩුකාරයා වෙනුවෙන් කථා කරනවා. ඒ සියලු දෙනාගේම හදවත දන්නවා, මේ "කුඩ්ඩෙක්" කියලා. අපේ සරත් විජේසේකර මහත්මයා කිව්වා වාගේ, පාලම් තුන හන්දියේ නිම් ආහාර විකුණපු, restaurant එකක හිටපු cashier කෙනෙක් අද කොහොමද කෝටි ගණන් හොයලා තිබෙන්නේ? කියලා මම ආදරණීය ජනතාවගෙන් අහනවා. මේ කුඩු සල්ලි. මේ අය

වෙනුවෙන් පෙනී ඉන්නේ කුඩ්ඩෝ. කුඩ්ඩන්ගෙන් සල්ලි ගත්ත ස්වාමීන් වහන්සේලා ඉන්නවා. කුඩ්ඩන්ගෙන් සල්ලි ගත්ත, හිරු එකට භය දේශපාලනඥයන් ඉන්නවා. ඒ ගොල්ලන් කථා කරන්නේ නැහැ. නමුත් මම ඉතිහාසයේ ඉඳලා හැම දාම ගත්තේ වින්දිතයාගේ පැත්ත. ඒක මේ රටේ හැමෝම දන්නවා. පොහොසතාගේ, බලවන්තයාගේ පැත්ත මම ගත්තේ නැහැ.

පස් මාෆියාව ආවා. මම පස් ව්‍යාපාරිකයන්ගේ පැත්ත ගත්තේ නැහැ. මම ගත්තේ පස් මාෆියාව නිසා දිවුලපිටියේ ළිංවල වතුර නැති වූ ජනතාවගේ පැත්ත. මැද පෙරදිග ප්‍රශ්නය ආවාම කුය ලොකු ව්‍යාපාරික ඒජන්සිකාරයන්ගේ පැත්ත මම ගත්තේ නැහැ. මම ගත්තේ අබුඩාබි, ඩුබායි, කුවේට්වල ඉන්න අපේ අහිංසක දුප්පත් අම්මලා, අක්කලා, නංගිලාගේ පැත්ත. එතකොට ඒජන්සිකාරයෝ මා මරන්න ආවා.

භාරත ලක්ෂ්මන්ගේ ප්‍රශ්නයේදී මම ඇයි භාරත ලක්ෂ්මන්ගේ පැත්ත ගත්තේ? මම "හිරු" එකේ පැත්ත ගත්තා නම් අදත් "කොපි වැට්" එකේ හැම දාම ඉන්නේ මම; ඒ ගොල්ලන්ගේ සම්මාන උළෙලේ ජනප්‍රිය නළුවා මම; මධුරි ඩික්සිත් ළඟ වාඩි කළේ මම; අනිල් කපූර් ළඟ වාඩි කළේ මම. ඒ සියලු දේවල් අමතක කරලා මම ගත්තේ, හඬක් නැති - voiceless - මනුස්සයාගේ පැත්ත. මම ඒ ගැන සන්තෝෂ වෙනවා. මම සන්තෝෂ වෙනවා, ඒ පැත්ත අරගෙන මට එක දිගට හිරේ යන්න වුණත් ප්‍රශ්නයක් නැහැ කියලා. මම හැම දාම ගත්තේ පීඩිතයාගේ පැත්ත. මම ඒක පසුගිය ටිකේම කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසුගිය දවස්වල අපේ ගෙදරට වැඩම කළා, පොඩි අහිංසක ස්වාමීන් වහන්සේලා දෙනමක්. ඒ අම්මයි තාත්තයි මට කථා කරලා කිව්වා, "අනේ රන්ජන් ඇමතිතුමා, මේ අහිංසක ස්වාමීන් වහන්සේලා දෙනම දූෂණය කරලා, මේ වෙනුවෙන් පෙනී සිටින්න" කියලා. මගේ staff එකම කිව්වා, "පිස්සු නටන්න එපා, මේ රටේ සියයට 76ක් බුද්ධාගමේ, කළු ගලේ ඔළුව ගහ ගන්න එපා, මේකට involve වෙන්න එපා, මේකට අත තියන්න එපා" කියලා. ඔළුවේ අත ගහගෙන කිව්වා. මම කිව්වා, "අනේ පව් නේ. මේ ස්වාමීන් වහන්සේලා අඬනවා, දූෂණය වෙලා, අපි මේකට පෙනී සිටිමු" කියලා. "ඒක නම් කරන්න එපා, ඒක කළොත් ඉවරයි, කට්ටිය වට කරලා ගහනවා, ආගමට අත තියන්න එපා" කිව්වා. මම හිතුවා, කමක් නැහැ කියලා. මම ඒ අම්මා තාත්තාගෙන් ඇහුවා, "ඇයි මගේ ළඟටම ආවේ" කියලා. කිව්වා, "ඔබතුමා විතරයි වෙන අය කථා කරන්න භය ඒවා කථා කරන්නේ, අපට වෙන යන්න තැනක් නැහැ" කියලා. මම ඇහුවා, "ඇයි, නායක ස්වාමීන් වහන්සේලා ළඟට යන්නේ නැත්තේ?" කියලා. මට කියන්න දුකයි. එතකොට ඒ තාත්තා - ඒ තාත්තා බුලත්සිංහල- කිව්වා, ඒ ගොල්ලන් අතිනුත් ඒ වරද වෙලා තිබෙනවා කියලා. යන්න තැනක් නැහැ කිව්වා. බෙල්ල ගහලා ගියත් කමක් නැහැ කියලා හිතලා මම කිව්වා, "රයිට්, මම මේකට ඉදිරිපත් වෙන්නම්" කියලා.

ඊට පස්සේ කැලණියේ ඔය ප්‍රශ්නය එද්දී මොනවාද ඒ අය කිව්වේ? "ජනේලයෙන් එළිය බැලුවා, කැලණි ගඟ දෙබෑ වුණා, කපුවා පිහිනාගෙන ගියා, නයෙක් හිටියා, ඇමෙරිකන් වෝටර් වතුර බෝතලයක ඌ දමා ගත්තා" කියලා. මේවා ගැන මම එක දිගටම සටන් කළේ, ඡන්ද බලාගෙන නොවෙයි. අදත් මම කථා කරන්නේ ඡන්ද බලාගෙන නොවෙයි. මම ස්වාධීනව ඉල්ලනවා. තමුන්නාන්සේලාට ඕනෑ නම් ඇප නැතුව මම ගෙදර යවන්න. ඒකට කිසි ප්‍රශ්නයක් නැහැ. ඇත්ත කථා කරලා හිරේ ඉන්නවා; බොරු කියලා, මිනිසුන් රවටලා එළියේ ඉන්නේ නැහැ. මම ඒක නම්බුකාරව විඳිනවා. මම නම්බුකාරව විඳිනවා. මම කරපු හැම ප්‍රකාශයකම වගකීම මම ගන්නවා.

පසුගිය ටිකේ දේශපාලන වේදිකාවේදී මම ඉස්සරහ හිටපු ජනතාව කිව්වා, "රන්ජන් අයියා, ගෝඨාභය මහත්මයා සඤ්ඤාරයක් හොරකම් කළා කියලා කියන්න" කියලා. මම කිව්වා, "මම එහෙම කියන්නේ නැහැ. මම ඒ විධියේ එක බොරුවක් කිව්වොත්, කියපු සේරම ඇත්ත නැති වෙනවා" කියලා. මම කිව්වා, ඒ සඤ්ඤාරය "ආලෝකෝ උදපාදි" චිත්‍රපටයේ නිෂ්පාදකවරයා වන Kandy City Centre නිර්මාතෘවරයා දීලා තිබෙනවා කියලා. ඒ විහාරයේ විහාරාධිපති කිව්වා, සඤ්ඤාරය තිබෙනවා කියලා. ඒ නිසා මම බොරු කියන්නේ නැහැ. මගේ දේශපාලනයේ බොරුව නැහැ.

තමුන්නාන්සේලා දකින්න ඇති, මම පසුගිය කාලයේ කිව්වා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කොකේන් බොනවා කියලා. මට ඒක ඔප්පු කරගන්න බැරිව අසරණ වෙලා ඉන්දැද්දී මම කථා කළා, තමුන්නාන්සේලා අද මා සම්බන්ධව විහිළු කරන එක්තරා කෙනෙකුට. පියුමි හංසමාලි. එයා තමයි හරියටම විස්තර ඇතිව කිව්වේ කොකේන් ගහන මන්ත්‍රීවරුන්ගේ නම් ටික. Night clubsවල කොකේන් ගහන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නම් ටික අන්න තිබෙනවා. එතකොට උපාය දූතයෙක් විධියට මම ඒ වැඩේ කරලා තිබෙනවා. දැන් සියල්ල හෙළි වෙලා තිබෙනවා.

මැක්ඩොනල්ඩ්ස් බෑග් එකේ 'වාලි' අරගෙන ආවේ කවුද, 'අයිස්' අරගෙන ආවේ කවුද, සල්ලි බෙදන්නේ කවුද කියලා අද හෙළි වෙලා තිබෙනවා. මේ සේරම හෙළි කර ගන්නට නොයෙකුත් උපක්‍රම පාවිච්චි කරන්න වෙනවා.

මම කරපු වැඩේ ගැන මට කාගෙන්වත් සදාචාරාත්මක certificates ඕනෑ නැහැ. මම දන්නවා, මම කළේ හරි වැඩක් කියලා. ඒක කළේ මගේ ජීවිතය පරදුවට තියලා. මගේ ජීවිතය නැති වෙයි කියන අවදානම තිබියදීත් මම ඒ දේ කළේ, මේ රටේ ජනතාව වෙනුවෙන්ය කියන ඒ සතුට මට තිබෙනවා. මටත් පුළුවන්, දෙන දෙයක් කාලා, වෙන දෙයක් බලාගෙන ඉන්න. මටත් පුළුවන්, හැමෝටම අත වනලා, හිනා වෙලා, අයිස් ක්‍රීම් විකුණන මිනිහෙක් වාගේ ඉන්න. කිසි ප්‍රශ්නයක් නැහැ. කවුරුත් යාළුයි. "හලෝ මචං", "හලෝ මචං" කියලා සේරම එක්ක යාළු වෙලා ඉන්න පුළුවන්. නමුත් දෙකෝටි විසිලක්ෂයක ජනතාව අප පාර්ලිමේන්තුවට එවන්නේ එහෙම කරන්නද? ඒ අය නියෝජනය කරන්නයි අප එවන්නේ. අද මේ කුඩු සල්ලි නිසා, කුඩු නාලිකා නිසා මුළු රටම විනාශ වෙලායි තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
Sir, give me a couple of minutes more.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
කාගේ වේලාවෙන්ද දෙන්නේ? නම කියන්නකෝ.

ගරු රංජිත් අලුවිහාරේ මහතා
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluwihare)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ වේලාවෙන් විනාඩි පහක කාලයක් දෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ඔබතුමාට වේලාවක් වෙන් කරලා තිබෙනවාද?

ගරු රංජිත් අලුවිහාරේ මහතා
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluwihare)
ඔව්, තිබෙනවා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම දැක්කා, මේ ගැන කොමිසමක් පත් කරන්න කියලා ගරු අගමැතිතුමා කියා තිබෙනවා. එතුමාට මගෙන් double salute එකක්. පුළුවන් නම් පත් කරන්න කියලා මම ආණ්ඩුවට අභියෝග කරනවා. ඒ කොමිසම පත් කරද්දී files පිටින් අරගෙන මම එනවා, ඒ කොමිසමට. මා ළඟ තිබෙනවා, එතුමාත් කථා කරපු හඬ පට. 2005දී "වන්ෂොට්" කියන film එක කරද්දී, මම ඒ නඩුවෙන් නිදොස් වුණාම, "රන්ජන් ඔයා අද එළියේ ඉන්නේ මම හින්දා. ඔයාට කළ ගුණ නැහැ" යි කියපු හඬ මා ළඟ තිබෙනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කවුද ඒ?

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
රාජ්‍ය නායකයෙක්.

එතුමාට පසුගිය කාලයේ ඕනෑ වුණා, මගේ "වන්ෂොට්" කියන film එක බලන්න. ඒ කාලය මම චන්ද්‍රිකා මැතිනියට විරුද්ධව ක්‍රියා කළ කාලය. එතුමාත් එක්ක film එක බලන්න ආවේ කවුද? මේ පාර්ලිමේන්තුවේ ඉන්න මුතුහෙට්ටි. අපි ඒක බැලුවේ කොහේදීද? Cine City එකේ. කවුරු එක්කද? සංගීතාගේ මනුස්සයා ප්‍රියන්ත කාරියප්පෙරුම එක්කයි. මම මේ තිත්ත ඇත්ත කථා කරන්නේ. ඒ film එක බලපු දවසේ තමයි හරියටම ලක්ෂ්මන් කදිර්ගාමර් මැතිතුමා මැරුණේ. මම මහින්ද මහත්තයා එක්ක තමයි "වන්ෂොට්" film එක බැලුවේ.

මගේ සියලු සංවාද පටිගත කිරීම් මගේ ළඟ තිබෙනවා. මා මැරුවත් ප්‍රශ්නයක් නැහැ. ඒවා hard disksවල දාලා අවශ්‍ය තැන්වල lockersවල දාලයි තිබෙන්නේ. මේ රටින් පිටත් තිබෙනවා. ඒ නිසා මම කිසිම ප්‍රශ්නයක් නැතිව මේ වැඩේට මුහුණ දෙනවා. මට ලොකුම වුවමනාව වුණේ මොකක්ද? රජය ආවේ හොරු අල්ලන්නයි. නමුත්, රජය හොරු ඇල්ලුවේ නැහැ. හොරු විසින් රජය අල්ලා ගත්තා.

මේ බොරුවට ඇප පිට ඉන්න අයගේ හිත දන්නවා, හදවත දන්නවා, ඒ ගොල්ලන් හොරු කියලා. ඒ ගොල්ලන් මෙච්චර පොහොසත් වුණේ කොහොමද? මේ කුඩු ව්‍යාපාර කළේ කොහොමද? මේ සේරම ජනතාව දන්නවා. හැම දෙයකදීම අහන්නේ මොකක්ද? "කුඩ්ඩෝ" කියන්නේ මොකක්ද? "සාක්ෂි පෙන්වපන්" කියලායි. කෝ, සාක්ෂි කියලායි. "සාක්ෂි කෝ" කියලා අහනවා! දැන් සාක්ෂි තිබෙනවා; හඬ පට තිබෙනවා; වෛද්‍ය වාර්තා තිබෙනවා; certified copies තිබෙනවා; 'B' වාර්තා තිබෙනවා. සමහරු කියනවා, මම ගිහිල්ලා ශානිගෙන් වාර්තා ගත්තාලු. ඇත්ත. මම විවාදවලට යන්න ඉස්සෙල්ලා පෑනක්, කොළයක් අරගෙන ගිහින් ශානිගෙන් අහනවා, "අද විවාදයට එන්නේ රොෂන් රණසිංහ. මට කියන්න, අතුරුදන් වෙලා තිබෙන්නේ කී දෙනෙක්ද, නේවි සම්පත් ඉන්නේ කොහෙද?" කියලා. ඒ වාගේ දේවල් මම අහනවා. ඒ සියලු දේවල් මම ලියා ගන්නවා. මගේ මාමා, කාලෝ ෆොන්සේකා මහත්තයා භය නැතිව කියනවා, "පුතා, මම කියන එක record කර ගන්න" කියලා. අපි, ඒ වාගේ ජානවලින් එන මිනිස්සු. විජය කුමාරණතුංග මහත්තයා - මගේ මාමා- ඇත්ත කථා කරලා පොල්හේන්ගොඩ එතුමාගේ නිවස ඉදිරිපිටදී වෙඩි කාලා මැරුණා. එතුමා අදත් අමරණීයයි. මොකද, එතුමා හොරකම් කළේ නැහැ; වංචාව, දූෂණය නැහැ. මගේ මාමා, කාලෝ ෆොන්සේකා තමයි ලංකාවේ හිටපු එකම වෛද්‍යවරයා තමන්ගේ පඩිය වැඩියි කියලා වෛද්‍ය සභාවට ලියුමක් දුන්න. ඒවා කොපි කරලා තමයි රන්ජන් රාමනායක කටයුතු කරන්නේ.

පසුගිය කාලයේ මේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට රුපියල් ලක්ෂයක් පඩි වැඩි වුණා. මට තවම ඉන්න හිටින්න ගෙයක් නැහැ. මම කිව්වා, ඒ රුපියල් ලක්ෂය එපා කියලා. අවුරුදු තුනක් තිස්සේ ඒ රුපියල් ලක්ෂය නොගන්න මේ පාර්ලිමේන්තුවේ ඉන්න එකම මන්ත්‍රීවරයා මම. පැමිණීමේ දීමනාව නොගන්නා එකම මන්ත්‍රීවරයා මම. ඇයි, අපි එහෙම කරන්නේ? ඔවා දෙනු පරහට තමා සම්මතෙහි පිහිටා සිට. අනුන්ට "හොරා" කියනවා නම්,

[ගරු රන්ජන් රාමනායක මහතා]

හොරු අල්ලන්න යනවා නම්, ඉස්සෙල්ලා තමුන් හොරකම් නොකර ඉන්න ඕනෑ. අද හොරු ගැන කථා කරන අය ලෝක හොරු නේ දෙයියනේ! මේ ලෝක හොරු කියනවා, "අනුන් හොරු" කියලා. තමුන් හොරු ගැන කථා කරනවා නම්, තමුන් හොරෙක් නොවී ඉන්න ඕනෑ. අමද්‍යප ව්‍යාපාරයේ සභාපති කන පැළෙන්න බීලා අනික් අයට බොන්න එපා කියලා හරි යන්නේ නැහැනේ. ඒක තමයි තිත්ත ඇත්ත. ඒ නිසා මම නැවත නැවතත් මහින්ද රාජපක්ෂ මහත්මයාටයි, ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මහත්මයාටයි කියනවා, මේ ගැන හොයන්න කොමිසමක් දාන්න කියලා. දෙයියනේ, කොමිසමක් දාන්න; මම files අරගෙන එන්නම්. හැබැයි, ගෝඨාභය මහත්තයාගේ හඬ පට නම් මා ළඟ නැහැ. මම හැම දාම ඇත්ත කියනවා. මහින්ද මහත්මයාගේ හඬ පට හයක් හතක් තියෙනවා. රිසානා නෆීක් මරපු වෙලාවේ මම මහින්ද මහත්තයාට කථා කළා. එතුමාට මම කිව්වා, "සර් රිසානා නෆීක්ගේ බෙල්ල කපලා" කියලා. ඩිලාන් පෙරේරා මැතිතුමා මෙතැනට ඇවිල්ලා කිව්වා, "අන්න සමාව හම්බවෙලා. අපි ඇය සුමාන දෙකෙන් ගෙන්වනවා." කියලා. "සමාව දුන්නා කිව්වත් ඒ කෙල්ලගේ බෙල්ල කපලා ඉවරයි. එහෙම කිව්වාම මහින්ද මහත්තයා මට බැන්නා, "ඔයා විතරද වැඩ කළේ, අපි වැඩ කළේ නැද්ද? Housemaidsලා මෙච්චර ගාණක් වැඩ කරනවා. ඒකෙන් ඩොලර් බිලියන අටක් එනවා. ඔයා කියන විධියටද වැඩ කරන්න කියන්නේ?" කියලා. ඒ හඬ පටයත් තියෙනවා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

අධිකරණයට බලපෑම් කරපු ඒවා-

දැන් කියනවා නේ, මම අධිකරණයට බලපෑම් කළා කියලා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

පද්මිණී රණවක ගුණතිලකට කථා කරලා වාසුදේව එවලා, අපේ බුද්ධිකගේ මාමණ්ඩිය වන මිය ගිය හේමන්ත වර්ණකුලසූරිය එවලා මා බේරගත් එකත්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කියලා තිබෙනවා. "රන්ජා උඹට කළ ගුණ නැහැ, උඹ බේරුවේ මම, උඹ අද එළියේ ඉන්නේ මම හින්දා." කියන එකත් කියලා තිබෙනවා. ඒකත් මම **සභාගත*** කරනවා. කමක් නැහැ නේද? ඒවාත් අපි සභාගත කරමු.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කමක් නැහැ.

** හඬපට ඉදිරිපත් නොකරන ලදී.*
ஒலிப்பதிவுகள் சமர்ப்பிக்கப்படவில்லை.
Voice recordings not tendered.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ඇයි, වෙන ඒවා විතරක් දාන්නේ? ඇයි, ඒ ගොල්ලන්ට අවාසි ඒවා දමන්නේ නැත්තේ? මෙතැන ඉන්න කැබිනට් ඇමතිවරු මට බැන්නා. ඒ ඇමතිවරුන්ගේ නෝනලා මට කථා කරපු ඒවාත් තිබෙනවා. නෝනා කෙනෙක් කිව්වා, "අනේ! අයියේ ගෙදර එන්න. ඇවිල්ලා මේවා රටට කියන්න. මගේ මහත්තයාට අගමැති සිහිනයක් තියෙනවා. තවත් කැබිනට් ඇමතිවරයෙකුගේ නෝනාගේ හඳහනේ තියෙනවා, එයා බැන්ද කෙනෙක් අගමැති වෙනවා කියලා. මෙයා මා divorce කරලා ගිහින් එයා බැන්දා." කියලා. දන්නවාද කවුද කියලා? [බාධාකිරීම්]

ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
අපි නම් දන්නවා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
"එතකොට අයියේ, මෙයා මා ඇතහැරලා ඒ කැබිනට් ඇමතිවරයාගේ නෝනා බැන්දේ හඳහනේ තියෙන විධියට අගමැති වෙන්න ඕනෑ නිසා. අයියේ, මේවා පාර්ලිමේන්තුවේ කියන්න" කියලා ඇය කිව්වා. එහෙම කියපු videos මා ළඟ තියෙනවා. ගෙදර යද්දී කැමරාවක් හංගාගෙන ගියා. අනේ, mini-swimming pool එකකුයි, ලොකු swimming pool එකකුයි තියෙනවා. කොහොමද එහෙම වෙන්නේ? එහෙම වෙන්න බැහැ. අපි කණ්ණාඩිය ඉස්සරහට ගිහිල්ලා කථා කරමු. ඇය සිංගර් එකේ වැඩ කරපු කෙල්ලෙක්. The Finance Company PLC එකේ sales representative කෙනෙක්. අනේ මහත්වරුනි, කොහොමද කෝටි ගණන් සල්ලි තියෙන්නේ? මම පසුගිය ටිකේ ඒ අයට තියෙන, එංගලන්තයේ ගෙයක් ගැන කිව්වා. මා මරාගෙන කන්න පැන්නා. "ඔප්පු කරපන්; ඔප්පු කරපන්" කිව්වා. මම Land Registry එකට කථා කරලා අර චන්දිමාල් හරහා ඔප්පු කොපිය ගෙන්නුවා. ඔප්පු කොපිය පෙන්නුවාම ඇමතිතුමා කිව්වා, "ඔව් ගෙයක් තියෙනවා; මගේ දරුවන්ට ඉස්කෝලේ යන්න ගේ ගත්තා" කියලා. මෙහෙමයි අපි හොරු ඇල්ලුවේ. හොරු අල්ලද්දී unethical වෙන්න ඕනෑ. හොරුන් එක්ක discipline නැහැ; හොරුන් එක්ක වාරයක් නැහැ. හොරුන්ට වාරයක් නැත්නම් මොකටද අපි වාරවත් වෙලා. හොරුන්ට discipline නැත්නම්, අපි මොකටද disciplined වෙලා? හොරු ඉස්සරහපිට අපි මොකටද gentlemenලා වෙන්නේ? ඒ නිසා මම කියනවා, මහින්ද මහත්තයෝ, ගෝඨාභය මහත්තයෝ පුළුවන් නම්-

"The New York Times" පත්තරේට නඩු දානවා කියලා මග ඇරියා. අර "The New York Times" එකේ කර්තෘ මයිකල් තවම නඩු වැටෙනතුරු බලාගෙන ඉන්නවා. එයා තමයි කිව්වේ, පුෂ්පා රාජපක්ෂගේ ගිණුමට මෙච්චර ආවා; ඇල්ලේ ගුණවංශ ස්වාමීන්වහන්සේ ඩොලර් තිස්අටදහසක් ගත්තා කියලජ. ඒවා කිව්වේ "The New York Times" පත්තරේ මරියා අබිහබීබ්. නඩු දානවා කිව්වා. දැම්මාද? අවුරුදු දෙකක් ගත වුණා. මේකත් ඒ වාගේම තමයි. මම මේ පාර්ලිමේන්තුවේ ඉඳන් දැන් කියන්නම්. පුතා, මේකට නඩු දාන්නේ නැහැ; දැම්මොත් උන්ටම

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මේකට කොමිසම් ගේන්නේ නැහැ. මොකද, ඒ අයගේ හඬ තිබෙනවා; ඒ අයගේ රූප තිබෙනවා. මා මේ සේරම කළේ 2015 ජනවාරි 08වන දා හොරු අල්ලනවා කියලා ආපු ආණ්ඩුවේ

යුතුකමක් ඉෂ්ට කරන්න මිසක් මගේ පෞද්ගලික දේකට නොවෙයි කියන එක මම බොහොම අවංකව කියනවා. අම්මාපල්ලා! ජේසු පල්ලා! බුදුන් පල්ලා! විශ්වාස කරනවා නම්, විශ්වාස කරන්න. විශ්වාස කළත් නොකළත් මට වැඩක් නැහැ. මොකද, මම ඒවා කළේ හොඳ හිතින් කියලා මම දන්නවා. මට හොරුන්ගෙන් චරිත සහතික මොකටද? චරිත සහතික දෙන්න පුළුවන් කට්ටිය මෙතැන ඉන්නවාද? එහෙම කවුද ඉන්නේ මෙතැන? වැලි permits තියෙන 75ක් ඉන්නවා; bar permits තිබෙන 100ක් ඉන්නවා; එතනෝල් ගෙන්වන හතරදෙනෙක් ඉන්නවා;

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ගෙන්වන දෙන්නෙක් ඉන්නවා; race-by-race කරන එක්කෙනෙක් ඉන්නවා. ඒ අයගෙන්ද මම චරිත සහතික ඉල්ලන්නේ?

මම තරග කළ හැම ආසනයකම, හැම දිස්ත්‍රික්කයකම මට බොහෝ ඡන්ද ලැබුණා. ගම්පහ දිස්ත්‍රික්කයෙන් ඉල්ලුවා; ඡන්ද 216,000ක් ලැබුණා. රත්නපුරය දිස්ත්‍රික්කයෙන් ඉල්ලුවා; ඡන්ද 119,000ක් ලැබුණා. මිනිස්සු ඇත්ත කථා කරන කෙනාගේ body language එක දකිනවා. මෙයා ඇත්ත ද කථා කරන්නේ, මේ කරන්නේ බොරුවක්ද, රඟපෑමක්ද කියලා මිනිසුන්ට තේරෙනවා.

මේ දේශපාලනය මට හරියන්නේ නැත්නම් මම යන්නම් ගෙදර. මගේ පක්ෂ සාමාජිකත්වය අහිමි කළා, ගිය සුමානයේ. කමක් නැහැ. මට මගේ ආසනය අහිමි කළා. මගේ සංවිධායක ධුරය අහිමි කළා. මගේ මාමාට වුණා වාගේ ඉදිරියේදී මගේ ජීවිතයත් අහිමි වෙන්න පුළුවන්. නමුත්, මම කවදාවත් ඒවායෙන් සැලෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි දෙකක් තිබෙනවා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මම නැවත නැවතත් කියන්නේ, මේක නිකම්ම යන්න දෙන්න එපා කියලායි. මේ සම්බන්ධයෙන් අනිවාර්යයෙන්ම කොමිසමක් පත් කරන්න. ඒ කොමිසමට මම එනවා. මම නැවත නැවතත් ඒ කාරණය කියනවා. මේ හඬපටවල තිබෙන, ජනතාව දැනගතයුතු දේවල list එකක් මම ලියාගෙන ආවා.

අපේ කාංචන මල්ලි ඉන්නවාද දන්නේ නැහැ. කාංචන මල්ලිත් මගේ ඔත්තුකරුවෙක්. ඔන්න දවසක් කාංචන මල්ලි ගියා, penthouse එකට. Penthouse එකට ගිහිල්ලා දොරට තට්ටුවක් දැම්මා. අනේ, දොර ඇරියේ අනිකා විජේසූරිය නොවෙයි, වෙන කෙනෙක්. ඒකෙන් තමයි බැඳුම්කර වංචාව හසුවුණේ. ඒක තමයි ඇත්ත කථාව. නහිල් විජේසූරියගේ දුව තමයි අන්තිමට ඇවිල්ලා කිව්වේ penthouse එකේ ගෙවල් ගත්තේ කවුද කියලා. ඒක කළේ කාංචන. මම ඒක record කළ හින්දා, 'නැහැ' කියන්න දැන් බැහැ. ඒකත් තිබෙනවා. කාංචන මල්ලිට බැහැ, එහෙම කළේ නැහැ කියන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
බැඳුම්කර වංචාවේ අර්ජුන් ඇලෝසියස් මට කථා කරපු recordings තිබෙනවා. එයා මට සල්ලි දෙන්න හදපු බව සඳහන් එකත් තිබෙනවා. ක්‍රිකට් ක්‍රීඩාවේ මහා වංචාවලට අදාළ ඒවාත් තිබෙනවා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මහත්මයා ගැන, match-fixing ගැන, ක්‍රිකට් ක්‍රීඩකයෝ සල්ලි ගත්ත හැටි ඒවායේ තිබෙනවා. ඒ සේරම තිබෙනවා.

තව එක දෙයක් කියන්න තිබෙනවා. ඒ, තමුන්නාන්සේලා කවුරුත් දන්නේ නැති දෙයක්. ෂාරුක් ඛාන්ට ලංකාවේදී බෝම්බ ගැහුවේ කවුද? සෝම හාමුදුරුවන්ගේ පළමුවෙනි ගුණානුස්මරණ දවසේ ෂාරුක් ඛාන්ට බෝම්බ ගැහුවේ කවුද? ඒක මට මිත්‍රයෙක් චීනයේදී කිව්වා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
වෙලාව නැහැ.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ඔහු ඒක කියද්දි මම හොරෙන් record කර ගත්තා. අන්තිමට ආයෙත් ගිහිල්ලා ඒකත් telephone එකේ- හෙළ උරුමයේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මහත්තයා දන්නවා. එතුමාගෙන් අහන්න. එතැනදී දෙදෙනෙක් මැරුණා. බැරි වෙලාවත් ෂාරුක් ඛාන් මැරුණා නම්, තවම ලංකාවට ගහනවා. මෙන්න මෙහෙමයි දේවල් වුණේ.

තවත් ඒවා ගැනත් -දේශපාලනයේ අල්ලස් ගැනත්, අලි හොරකම ගැනත්- තිබෙනවා. උඩුවේ ධම්මාලෝක හාමුදුරුවන්ගේ පන්සලේ උදේ වෙද්දි අලියෙක් ආලා ගියේ කවුද? රාජ්‍ය නායකයෙක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, වෙලාව ඉවරයි.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
එයා ඒක කියන හඬපටය තිබෙනවා. තවත් ඒවා තිබෙනවා-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Nimal Lanza.

[අ.භා. 3.53]

ගරු නිමල් ලාන්සා මහතා (ප්‍රජා සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிமல் லான்சா - சமுதாய அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Nimal Lanza - State Minister of Community Development)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාගේ කථාවෙන් පස්සේ මට කථා කරන්න ලැබීම පිළිබඳව සතුටු වෙනවා. එතුමාගේ හඬපට පිළිබඳව, එතුමාගේ සංවාද පිළිබඳව එතුමා ඉතාම හොඳ පැහැදිලි කිරීමක් කළා. හැබැයි, ඒ කථාව තුළ එතුමා හිතා මතා අමතක කරපු දේවල් ගොඩක් තිබෙනවා. එතුමා කිව්වා, මේ සියල්ල කළේ හොරු අල්ලන්න කියලා. එතුමා කිව්වා, මේ සියල්ල කළේ මේ රටේ තිබෙන වංචා සොයන්න කියලා. එතුමා කිව්වා, එතුමා පාර්ලිමේන්තුවේ නැති වෙලාවලදීයි එක එක් කෙනා මේවා ගැන කථා කළේ කියලා.

මම ගරු රන්ජන් රාමනායක මහත්තයාගෙන් ප්‍රශ්නයක් අහනවා. ඔබතුමාගේ ජනප්‍රියභාවය නිසා, ඔබතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු නිසා, එදා ඔබතුමා ඇමතිවරයකු නිසා රැකියා ලබා ගන්න කාන්තාවෝ ආවා. එහෙම ආපු කාන්තාවක් තමුන් ළඟට එවලා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ඉටු කරන්න පුළුවන්ද කියලා ඔය කියපු පියුමි හංසමාලි එක්ක තමුන්නාන්සේ දුරකථනයෙන් සාකච්ඡා කළා කියන එක තමුන්නාන්සේ පිළිගන්නවාද, එහෙම කරපු එක හරිද කියා පළමුවෙනි ප්‍රශ්නය විධියට මම තමුන්නාන්සේගෙන් අහනවා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
Sir, I rise to a point of Order.

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
ඊළඟට මම තමුන්නාන්සේගෙන් අහන්න ඕනෑ-

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මගේ නම කියැවුණා. රන්ජන් රාමනායක කියන නම කියැවුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
What is your point of Order? කියන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
මගේ වෙලාව මට දෙන්න.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ මිත්‍ර ගරු නිමල් ලාන්සා ඇමතිතුමා කිව්වා,-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
පොඩ්ඩක් ඉන්න. මම තවම උත්තර දුන්නේ නැහැ.

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම අහන්නේ ප්‍රශ්න දෙකයි. රජයේ රැකියාවක් ලබා ගන්න ආ කාන්තාව ගෙදරට එවන්න කිව්වා,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ඉටු කර ගන්න. ඒ ගැන පියුමි හංසමාලිගෙන් ඇහුවා. තමුන්නාන්සේ කියන්නේ, එහෙම කළේ නැහැ කියලාද?

ඊළඟට, අවුරුදු 19ක කාන්තාවක සමඟ කළ දුරකථන සංවාදයකදී තමුන්නාන්සේ අහනවා, ඒ කෙල්ල සුදු ද, ඒ කෙල්ල කළු ද- [බාධා කිරීම්]

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
What is your point of Order?

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මීගමුවේ හිටියා පිලේන්ද්‍රන් කියලා මනුස්සයෙක්. ඒ පිලේන්ද්‍රන් තමයි ගණිකා මඩම් කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order.

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමා හොරු අල්ලන්න ආවා නම් ඇයි අර එවන්න හදන කාන්තාව සුදුද කියලා අහන්නේ? ඒ කාන්තාවන් කළුද කියලා අහන්නේ ඇයි? එතුමා දැන් සිංහල ශබ්ද කෝශයට අලුත් වචන එකතු කරලා තිබෙනවා. දැන් කොල්ලෝ කෙල්ලෝ හම්බ වුණාම ඒ වචන කථා කරන්නේ. මොකක්ද එතුමා අහන්නේ?

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

පුළුවන්ද කියලා අහනවා; ද

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කියලා අහනවා; සමනලයෙක්ද කියලා අහනවා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කර ගන්නවාද කියලා අහනවා. මේවා තමයි කථා කළේ. එතුමා අද මේ සභාවට ඇවිල්ලා නිකම් බෝධිසත්වයෙක් වෙන්න හදනවා. මේ රටේ මිනිස්සු ඉදිරියේ පසුගිය කාලයේ සුදු චරිතයක් විධියට පෙනී සිටිය තමුන්නාන්සේ කළු චරිතයක් කියලා තමුන්නාන්සේගේ recordings තුළින්ම මිනිස්සු අද වටහාගෙන ඉවරයි. ඒ නිසා මෙතැනට ඇවිල්ලා පාර්ලිමේන්තුව නොමඟ යවන්නට, මේ රටේ මිනිස්සු නොමඟ යවන්නට ආයෙත් තමුන්නාන්සේට බැහැ. තමුන්නාන්සේ මේ රටේ මිනිස්සු නොමඟ යැව්වා; පාර්ලිමේන්තුව නොමඟ යැව්වා. මේ පාර්ලිමේන්තුවේ බලය, මන්ත්‍රීවරයකුගේ බලය උපයෝගී කරගෙන අහිංසක දුප්පත් කාන්තාවෝ- [බාධා කිරීමක්]

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

What is your point of Order?

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම අහන්නේ නිමල් ලාන්සා මැතිතුමා රන්ජන් රාමනායක මැතිතුමා එක්ක මෙච්චර තරහා මොකද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

That is not a point of Order.

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ අවස්ථාව දෙන්න, මගේ අවස්ථාව දෙන්න. මගේ mike එක off කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම එතුමාගෙන් අහන්නේ ඉතාම සරල ප්‍රශ්න දෙක තුනක්. දෙවියනේ, හොරු අල්ලන්න ආවා නම් කාන්තාව සුදුද, කළුද,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කරන්න පුළුවන්ද,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

පුළුවන්ද කියලා අහන්න ඕනෑ නැහැ නේ. ලජ්ජා නැති, මොන තරම්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

තිබෙන පුද්ගලයෙක්ද තමුන්නාන්සේ? [බාධා කිරීමක්] ලජ්ජයි, ලජ්ජයි. අපේ මන්ත්‍රීවරුන් තමුන්නාන්සේ හඳුන්වලා දුන්නේ කළු චරිත කියලා. අද තමුන්නාන්සේ තමයි කළු චරිතය. ජනප්‍රියභාවය සඳහා ,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ජනප්‍රිය වෙන්න පුළුවන් නම් ඕනෑ දෙයක් කරන මේ පාර්ලිමේන්තුවේ ඉන්න

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මන්ත්‍රීවරයා විධියට තමයි අද රටේ ජනතාව තමුන්නාන්සේ දකින්නේ කියන එක කියන්නට ඕනෑ. එතුමා හොරු අල්ලනවා කියලා මොකක්ද රඟපාපු චරිතය? පික්පොකට්කාරයෝ පික්පොකට් ගහලා, "හොරා, හොරා, හොරා" කියමින් දුවනවා. දුවලා වෙන අය අල්ලනවා. හැබැයි, හොරා කවුද? පික්පොකට්කාරයා. තමුන්නාන්සේත් ඒ වාගේ තමයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Order, please! Will an Hon. Member propose the Hon. Wijepala Hettiarachchi to the Chair?

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

Sir, I propose that the Hon. Wijepala Hettiarachchi do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. WIJEPALA HETTIARACHCHI *took the Chair.*

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)

මේ රටේ ජනතාවට කළ අපහාසයට තමයි මේ පඩිසන් දීලා තිබෙන්නේ. මේ රටේ ජනතාවට ගහපු මඩ, මේ රටේ පුද්ගලයන්ගේ චරිත ඝාතන කිරීම් තමයි තමුන්නාන්සේට මේ පඩිසන් දීලා තිබෙන්නේ. කළ කළ දේ පලදීලා තිබෙන්නේ. තමුන්නාන්සේ මේ රටේ බෞද්ධ ආගමට අපහාස කළා, කතෝලික ආගමට අපහාස කළා. තමුන්නාන්සේයි, මමයි අදහන අපේ කතෝලික ආගමේ මරියතුමියට තමුන්නාන්සේ අපහාස කළා. ඒ නිසා අපට දුකක් වේදනාවක් තිබෙනවා. අපට දුක, තමුන්නාන්සේ ඒ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කථාව කළේ කාන්තාවක් එක්ක, ගණිකාවක් එක්ක. මරියතුමිය ගැන කථා කරන්න තමුන්නාන්සේට තිබෙන අයිතිය මොකක්ද? තමුන්නාන්සේ මට මේ පාර්ලිමේන්තුව තුළ උත්තර දෙන්න. කතෝලිකයෝ ඉතාම උතුම් ලෙස අදහන මරියතුමියට අපහාස කිරීම පිළිබඳව අපේ දැඩි විරුද්ධතාව මේ පාර්ලිමේන්තුව තුළ තමුන්නාන්සේට ප්‍රකාශ කරන්න ඕනෑ.

ඊළඟට, මේ දේශයට බුදුන් වැඩිය තැන තමයි කැලණිය. තමුන්නාන්සේ අදත් කැලණිය පන්සලේ නායක හාමුදුරුවන්ට අපහාස කළා. තමුන්නාන්සේ තවම පාඩමක් ඉගෙන ගෙන නැහැ. තමුන්නාන්සේට මේ උදාවෙලා තිබෙන්නේ ඒ කළ පව් පඩිසන් දෙන කාලයක්.

තමුන්නාන්සේ එක එක්කෙනාගේ ජාතකය සොයන්න එපා. එක එක්කෙනාගේ ජාතකය සොයන්න ඉස්සෙල්ලා තමුන්නාන්සේගේ ජාතකය සොයන්න. නීතිය නමලා, නීතිය වළලලා, නීතිය අවනීතිය කරලා, අද විනිශ්චයකාරවරුන්ගේ වැඩ තහනම්වෙලා, පොලීසියේ අයගේ වැඩ තහනම්වෙලා. විනිශ්චයකාරවරුන්ට පරීක්ෂණවලට මුහුණ දෙන්න සිදුවෙලා තිබෙනවා. තමුන්නාන්සේ තමයි මේ සියලුදෙනා අමාරුවේ දාලා තිබෙන්නේ.

මේ පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරයකු වන රන්ජන් රාමනායක මැතිතුමා කියනවා, එතුමා ඇමතිවරුන්ගේ නෝනලාට කථා කරලා තිබෙනවා ලු, මන්ත්‍රීවරුන්ගේ නෝනලාට කථා කරලා තිබෙනවා ලු. ඒ හඬ පට තිබෙනවා කියලා blackmail කරනවා. කාටද මේ blackmail කරන්නේ? එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් blackmail කරනවා, මට සහයෝගය දෙන්න, ඔය සියලු දෙනාගේ නෝනලාගේ හඬ පට මා සතුව තිබෙනවා කියලා. නෝනලා එක්ක මෙතුමා මොනවාද කථා කළේ? රටේ ආර්ථික වර්ධනය වැඩි කරන්නද, එහෙම නැත්නම් තමන්ගේ අමාත්‍යාංශවල කරන කාර්ය භාරය පිළිබඳවද එතුමා කථා කළේ? නැහැ. එතුමා ඇම්ඩන්ගේ මැක්කා වාගේ කැරකිලා කැරකිලා ආපු තැන අපි දැක්කා. කැරකිලා කැරකිලා කොහේටද ආවේ කියලා අපි දැක්කා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

එකටමයි එන්නේ. අපි දැක්කා නේ අර කාන්තාව- [බාධා කිරීම්] ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය ඒ ගැන කථා කරන්නේ නැහැ. හැබැයි, මෙතුමා කැරකිලා, කැරකිලා එතැනටම එනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තිබෙන්නේ තව විනාඩි දෙකක් පමණයි.

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)

මගේ වෙලාව දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

තව තිබෙන්නේ විනාඩි දෙකයි.

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බෞද්ධයන්ට කරපු ඒ නිගාවට, කතෝලිකයන්ට කරපු ඒ නිගාවට තමයි එතුමාට පඩිසන් දුන්නේ. මට හරි ලජ්ජයි. එතුමා අද කියනවා, ජේසු පල්ලා ලු. ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ කොහොමද ජේසු පල්ලා කියන්නේ? තමුන්නාන්සේ කිව්වා නේ, "මම කතෝලික ආගම අදහන්නේ නැහැ" කියලා. එහෙම නම් කොහොමද ජේසු පල්ලා කියන්නේ? [බාධා කිරීම්] අදත් තමුන්නාන්සේ කිව්වේ අසත්‍ය නේ. ගරු රන්ජන් රාමනායක මහත්මයාට මා කියනවා, පාස්කු ප්‍රහාරයට- [බාධා කිරීම්] පාස්කු ප්‍රහාරය සිද්ධ වුණෙත්-

[බාධා කිරීම්] තමුන්නාන්සේගෙයි, ශානිගෙයි හඬ පටයේ තිබෙනවා, අපේ බුද්ධි අංශයේ හිටපු සුරේෂ් සලෙයි මාරු කරන්න කියලා. ඒ නිසා එදා මිය ගිය 300ටත් තමුන්නාන්සේ පැහැදිලිවම වග කියන්න ඕනෑ. මොකද, සුරේෂ් සලෙයි බුද්ධි අංශයෙන් මාරු කළාට පස්සේ තමයි බුද්ධි අංශය අඩ පණ වුණේ. ඒ නිසා තමයි කතෝලික ජනතාව 300ක් මැරුණේ. ඒකට වග කියන්න ඕනෑ කවුරුත් නොවෙයි, රන්ජන් රාමනායකයි, ශානියි කියන එක මේ පාර්ලිමේන්තුවේ දී අපි පැහැදිලිවම කියන්න ඕනෑ.

අද බලන්න සමාජයේ සිද්ධ වෙලා තිබෙන දේවල්. සමහර මාධ්‍යවේදීන්ට තමන් සේවය කළ මාධ්‍ය ආයතනවලින් අයින් වෙන්න සිද්ධ වෙලා. සමහර පවුල් divorce වෙලා. සමහර කාන්තාවන් වහ බොන තත්ත්වයට පත් වෙලා. අද බොහෝ දෙනෙකුට එළියට බැහැලා යන්න බැරි තත්ත්වයකට පත් කරලා තිබෙන්නේ අපිද? අපි, තමුන්නාන්සේලා උසාවියට අල්ලලා දුන්නාද, පොලීසියට අල්ලලා දුන්නාද? නැහැ. තමුන්නාන්සේ විසින් අනෙක් අයට නොදන්වා කරපු ඒ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

record කෙරිල්ල තමයි මේ තමුන්නාන්සේට පඩිසන් දීලා තිබෙන්නේ. ඒ නිසා ගරු මන්ත්‍රීතුමාට අද මම පාර්ලිමේන්තුවේ ඉඳලා කියනවා, යම් යම් පුද්ගලයන්ට බොරුවට මඩ ගහන්න එපා; චරිත ඝාතනය කරන්න එපා කියලා. තමුන්නාන්සේ කරපු දේවල් තමයි මේ ඇස් පනා පිට තමුන්නාන්සේට පඩිසන් දීලා තිබෙන්නේ. ඒ නිසා අද සිට හෝ තමුන්නාන්සේ මේ පාර්ලිමේන්තුව තුළ වැදගත් විධියට කථා කරන්න කියලා, මම තමුන්නාන්සේට මතක් කරනවා. තමුන්නාන්සේ නැවත නැවතත් ඒ විධියට කටයුතු කළොත්, තමුන්නාන්සේ මීගමුව තුළ කරපු ක්‍රියාදාම සියල්ල මම හෙළි කරනවා කියන එකත් ප්‍රකාශ කරනවා. [බාධා කිරීමක්] හොරු අල්ලන්න පොලීසිය තිබෙනවා. හොරු අල්ලපුවාම නීතිය ක්‍රියාත්මක කරන්න උසාවිය තිබෙනවා. ඒ නිසා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විධියට තමුන්නාන්සේට බැහැ- [බාධා කිරීම්]

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා දිගින් දිගටම කියනවා ඒ හඬ පට මම මාධ්‍යයට දුන්නා කියලා. ඒ හඬ පට මම මාධ්‍යයට දුන්නේ නැහැ. ඒවා මගේ පෞද්ගලික ගබඩාවේ තිබුණේ. ඒ හඬ පට සියල්ලම මාධ්‍යයට දුන්නේ පොලීසිය විසින්. ඒ හඬ පට මම මාධ්‍යයට දීලා නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, බොහොම ස්තුතියි. ගරු නිමල් ලාන්සා රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
යහ පාලන ආණ්ඩුවක් බලයට ගෙනාවත්, යහ පාලන ආණ්ඩුව හොරු අල්ලපු නැති නිසා ලු එතුමා විවිධ කුමන්ත්‍රණ කරලා හොරු ඇල්ලුවේ. එහෙම නම් මොකටද ලජ්ජා නැතුව ඔය ආණ්ඩුවේ හිටියේ? හොරු අල්ලන්නේ නැත්නම් අයින් වෙලා යන්න තිබුණා නේ. තමුන්නාන්සේට පොලීසිය වෙන්න බැහැ. තමුන්නාන්සේ පොලිස්පති නොවෙයි. තමුන්නාන්සේ අග විනිසුරු නොවෙයි. තමුන්නාන්සේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්. COPE එකේ ඉඳගෙන- [බාධා කිරීම්] සම්පූර්ණයෙන්- [බාධා කිරීම්] කටයුතු කරපු මන්ත්‍රීවරයෙක්.

ගරු කංචන විජේසේකර මහතා (තේ කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கஞ்சன விஜேசேகர - தேயிலைக் கைத்தொழில் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Kanchana Wijesekera- State Minister of Tea Industry Development)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම සභාවේ නැති වෙලාවක අපේ රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාගේ කථාවේ දී මගේ නම සඳහන් වෙලා තිබෙනවා. එතුමාට මා ස්තුතිවන්ත වනවා. බැඳුම්කර වංචාව පිළිබඳව, විශේෂයෙන්ම එයට සම්බන්ධ ඇමතිවරයෙක් ගෙයක් මිලදී ගැනීම සම්බන්ධයෙන් අපි මේ පාර්ලිමේන්තුව තුළ කරුණු අනාවරණ කරලා, නීති කටයුත්තකට ගෙනිච්චා. [බාධා කිරීම්] එතුමා කියපු දේ වැරදි නැහැ. මගෙන් ඒ අනාවරණය කර ගැනීම පිළිබඳවයි කිව්වේ. නමුත් ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා, ඔබතුමාගේ ඔත්තුකරුවකු හැටියට මම කටයුතු කළා කියලා. ඔබතුමාගේ ඔත්තුකරුවකු හැටියට මම කටයුතු කළේ නැහැ. ඔබතුමා මට එක වතාවක් කථා කළා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හරි, අවසන් කරන්න. Point of Order එක ඉවරයි.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
කථා කරලා-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කංචන විජේසේකර රාජ්‍ය ඇමතිතුමනි, වැඩිය කාලය දෙන්න අමාරුයි.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
පොඩි වෙලාවක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමනි, ඔබතුමා මගෙන් ඇහුවා, "කොහොමද හොරා අල්ල ගත්තේ?" කියලා. ඔබතුමා එක වතාවක් මට කථා කරලා ඒ ගැන අහලා තිබෙනවා. ඒ කරුණු නිවැරදි කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාට මම කිසි අපහාසයක් කළේ නැහැ. ඇත්තටම සිද්ධිය වුණාද කියලා, එතුමා හරහා මා දැනුවත් වුණා. එතුමාට මගේ ගෞරවය පුද කරනවා. එතුමා මගේ ඔත්තුකරුවකු නොවෙයි. එතුමා මගේ මිතුරෙක්; ගෞරවනීය මිතුරෙක්. ඒ වාගේම එතුමා සමඟ මම- [බාධා කිරීම්]

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට පෙර කථා කරපු කථිකයා මේ හඬ පට ජවනිකාවේ කොටස් හැටියට මේ පාර්ලිමේන්තුවේ නොකිව යුතු සමහර වචන පාවිච්චි කළා. කරුණාකර එම වචන හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනමෙන් මම බැගෑපත්ව ඉල්ලා සිටිනවා. මොකද, මේක- [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභා ගර්භය තුළ ප්‍රකාශ නොකළ යුතු යම් යම් වචන කියැවුණා. ඒවා හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන ලෙස මා දන්වා සිටිනවා.

මීළඟට, ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 18ක් තිබෙනවා.

[අ.භා.4.04]

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වර්තමාන ආණ්ඩුවේ ධීවර හා ජලජ සම්පත් අමාත්‍යවරයා විසින් අද දින මෙම ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන, ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ වූ නියෝග සම්බන්ධයෙන් මා විශේෂයෙන්ම එතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. වගකීම් දරන මොන ආණ්ඩුවක්, මොන ඇමතිවරයෙක් වුණත් කමක් නැහැ, යම් ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් යම් ආකාරයක විධිවිධාන හා රෙගුලාසි ඉදිරිපත් කරනවා නම්, විශේෂයෙන්ම එම කර්මාන්තය ආරක්ෂා කරගන්න, එම කර්මාන්තය සංවර්ධනය කරන්න, එම කර්මාන්තයේ ප්‍රගතිය ඉදිරියට ගෙනයන්න වාගේම, එම කර්මාන්තයෙන් යැපෙන සහ කර්මාන්තය කරගෙන යන ජනතාව ආරක්ෂා කිරීම පිණිස, ඒ අයගේ යහපත පිණිස තමයි ඒ සෑම දෙයක්ම ගෙන ආ යුත්තේ කියන එකයි අපි විශ්වාස කරන්නේ. ඒ නිසා මා විශේෂයෙන්ම මේ මොහොතේදී වර්තමාන ඇමතිතුමාගේ අවධානය ඒ සඳහා යොමු කරවනවා. විශේෂයෙන්ම ඉදිරියේදී මෙම ක්‍රියාමාර්ග ගන්නකොට, ඒ සම්බන්ධයෙන් විධිමත් ලෙස සාකච්ඡා කර, සොයා බලා අදාළ නිලධාරින් සමඟ තවදුරටත් සංවාදයක යෙදී, ඒවා ධීවරයාගේ සහ ධීවර කර්මාන්තයේ ප්‍රගතියට හේතුවන ආකාරයට, වාසි ලැබෙන විධියට කළ යුතුයි කියලා මා ඔබතුමාට කියා සිටිනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා අද දින ඉදිරිපත් කර තිබෙන නියෝග අතර විශේෂයෙන්ම ජලජ තීරයට අපද්‍රව්‍ය එකතු කිරීම වැළැක්වීම සම්බන්ධයෙන් වූ නියෝගයක් තිබෙනවා. මම විශ්වාස කරන විධියට, එම නියෝගය ඉතාම යහපත් එකක්; හොඳ එකක්. එම නියෝගය අනුව ක්‍රියා කළොත්, ජලජ තීරය ආරක්ෂා වෙනවා. ජලජ තීරයේ තිබෙන කඩොලාන වැනි ජලාශ්‍රිත ශාක -වෘක්ෂ ලතා - විනාශ කිරීම නිසා එම ජලජ තීරය විනාශ වෙනවා. ඒ වාගේම, ඒ තුළ සිටින ඉස්සන් ඇතුළු මත්ස්‍ය සම්පතත් මුළුමනින්ම විනාශ වෙනවා.

ඇත්තෙන්ම කවුද, මේ දේවල් කියන එක ගැන මම මේ මොහොතේ ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ඔබතුමා මේ ගැන සොයා බලන්න. මේ විධියට -කළපු වේවා, දෙදිය ජලාශ කළපු වේවා, වෙරළ තීරය වේවා- අපේ ජලජ තීරය ආශ්‍රිතව තිබෙන වෘක්ෂලතා සම්පූර්ණයෙන් නැති කරලා, සාගරය ගොඩ කරලා, කළපු ගොඩ කරලා ඒවා මත වාසස්ථාන හදන්නේ, restaurants, සංචාරක නිකේතන හදන්නේ, ඒවායේ තවත් නොයෙක් ආකාරයේ ව්‍යාපාර බිහි කරන්නේ කවුද? ඒ, මේ රටේ දේශපාලනඥයෝ. ඉහළ සිට පහළ මට්ටම දක්වා සිටින -ජනාධිපතිවරයාගේ සිට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් දක්වා වූ- මේ රටේ දේශපාලනඥයන් සහ ඒ අයගේ හෙංචයියන් තමයි මේ කටයුත්ත කරන්නේ. අපි කියනවා නේ, "වැටත් නියරත් ගොයම් කා නම්, කාට පවසම් ඒ අමාරුව?" කියලා. මේකත් හරියට ඒ වාගේ වැඩක්. ගරු ඇමතිතුමනි, මේ නියෝග ඉතාම හොඳයි. නමුත් මේ නියෝග ක්‍රියාත්මක කිරීමේදී ඒවාට විරුද්ධ වෙන, ඒවාට අභියෝග කරන, එම කටයුතුවල නිරත වෙලා ජලජ තීරය විනාශ කරන පුද්ගලයන් ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මා ඉල්ලීමක් කරනවා.

ගරු ඇමතිතුමනි, 2019.10.23 වන දින ඉදිරිපත් කර ඇති, ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 අප්‍රේල් 05 දිනැති අංක 2065/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද මාදැල් කර්මාන්තය සම්බන්ධ නියෝග ගැනත් සලකා බලන්න කියලා මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු ඇමතිතුමනි, උතුර, නැඟෙනහිර, වයඹ, ගිනිකොන, නිරිත, ඊසාන, බටහිර කියන මේ හැම වෙරළකම මාදැල් කර්මාන්තය විශාල වශයෙන් සිද්ධ වෙනවා. මාදැල් කර්මාන්තය සිද්ධ වෙන්නේ, අපේ වෙරළ කලාපයේ නොගැඹුරු මුහුදේ. ඒ නිසා මාදැල් මෙහෙය වනකොට අනිවාර්යයෙන්ම එම වෙරළේ, එම මුහුද තුළ ගල්පර තිබෙන්න බැහැ. ඒක එම ධීවර කර්මාන්තයේ යෙදෙන, මාදැල් මෙහෙයවන ධීවරයන් දන්නවා. මොකද, ගල්පර තිබුණොත් මාදැල් ඒවායේ පැටලී විනාශ වෙනවා. ඒ නිසා මේ කර්මාන්තය කරන්න නම්, ගල්පර නැතිව, වැල්ල සම්පූර්ණයෙන් වතුරෙන් වැහිලා තියෙන්න ඕනෑ. මේ මෙහෙයුම් දියඹේ ඉඳලා කරන්නේ. පරව්, කෙළවල්ලෝ වාගේ විශාල මාළු, කුඩා මාළු ග්‍රහණය කරගන්න -ආහාරයට ගන්න- අභිං පිටින් මුහුදේ සිට වෙරළ ප්‍රදේශයට එනවා. ඒක අහම්බෙන් සිදු වෙන්නේ. ඒ වාගේ අවස්ථාවලදී මේ මාදැල්වලට අර මාළුවන් අහුවෙනවා. මාදැල් කර්මාන්තය කරන කාලයට ඒක හරිම අහම්බෙන් සිද්ධ වෙන්නේ. ඒක මොනම ආකාරයකින්වත් වළක්වන්න බැහැ. හැබැයි, දියඹ මුහුදේ මාදැල් දමන්නේ නැහැ. වෙරළ කලාපයේ තමයි මාදැල් දමන්නේ. එම නිසා, මේ නියෝග ක්‍රියාත්මක කිරීමමේදී ඔබතුමන්ලා දෙපාරක්වත් කල්පනා කර බලන්න. මොකද, විශාල පිරිසක් අද මේ මාදැල් කර්මාන්තයෙන් යැපෙන නිසා. ඔවුන්ට ඒකෙන් විශාල ආදායමක් ලැබෙනවා. ඒ වාගේම මේ කර්මාන්තය තුළින් පාරිභෝගිකයාට කුඩා මාළු පරිභෝජනය කරන්න අවස්ථාවක් ලැබෙනවා. මෙවැනි නියෝග ගෙනෙනකොට, ඒ තුළින් ප්‍රායෝගිකව ඇති වන දුෂ්කරතා ගැනත් සලකා බලන්න ඕනෑ. ඒවාට විකල්ප යොදමින් තමයි අපි මේ නීති රීති ක්‍රියාත්මක කළ යුත්තේ. ඒ නිසා, මේ සම්බන්ධයෙන් දෙපාරක් සිතා බලන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් වන 5වන නියෝගය ඉදිරිපත් කරන්නේ නැහැ කියලා. නීති විරෝධී, වාර්තා නොවූ සහ -ඒක හැඳෙන්න ඕනෑ "වාර්තා වූ" කියලා- අවිධිමත් ධීවර කටයුතු වැළැක්වීමට, නතර කිරීමට සහ පිටු දැකීමට වරායන් සහිත රාජ්‍යයන්ගේ පියවර ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් තමයි එම නියෝගය හදලා තිබෙන්නේ.

අපේ මුහුදු සීමාවට පිට ප්‍රදේශවලින් ධීවරයෝ එනවා. අපි හිතමු, ඉන්දියාවේ අය කියලා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කථාවේදී මේ ගැන කිව්වා. උතුරු ප්‍රදේශයේ සිටින කෙනකු විධියට ඔබතුමා මේ ගැන දන්නවා. ඉන්දියානු ධීවරයා ඇවිල්ලා අපේ උතුරු මුහුදෙන් වසරකට රුපියල් කෝටි 5,000ක් අපට අහිමි කළා. දෛනිකව යාත්‍රා 1,500ක්, 2,000ක් වැනි විශාල සංඛ්‍යාවක් ඇවිල්ලා, trawling කියන නීති විරෝධී පන්න ක්‍රමය උපයෝගි කරගෙන අපේ උතුරු මුහුදේ -වෙරළාසන්නයේ පවා- මත්ස්‍ය සම්පත සම්පූර්ණයෙන් අරගෙන යනවා. අපි මේ ගැන ඇති තරම් කථා කළා; Adjournment Debates පැවැත්වූවා. මේ වෙනුවෙන් අපි 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත සංශෝධනය කරලා, ඒ සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියා මාර්ග ගන්න අමාත්‍යාංශයට අවස්ථාව සලසා දුන්නා. නමුත්, අදටත් ඒවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

රාජපක්ෂ ආණ්ඩුව ඉන්දියාවයි, චීනයයි ආරක්ෂා කළා වාගේම, රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුවත් ඉන්දියාවයි, චීනයයි ආරක්ෂා කළා. Indonesian, Chinese, Taiwanese, Korean යාත්‍රා ඇවිල්ලා අපේ උතුරු සහ දකුණු මුහුදේ මත්ස්‍ය සම්පත ඩැහැ ගන්නවා; කොල්ල කනවා. හැබැයි, ඉන්දියානු යාත්‍රා විතරයි අල්ලා ගත්තේ. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහත්මයා පසුගිය දවස්වල ඉන්දියාවට ගිහිල්ලා සාකච්ඡා කරලා, ඒ අගමැතිවරයාට පොරොන්දු වුණා, ඒ අල්ලා ගත් යාත්‍රා 600ත් නිදහස් කරනවා කියලා. නමුත් එතුමාගේ පාර්ශ්වයේ අය විපක්ෂයේ ඉන්නකොට මොනවාද කිව්වේ? කංචන විජේසේකර

මන්ත්‍රීතුමා විපක්ෂයේ ඉන්නකොට පාර්ලිමේන්තුවේදී ඇසූ ප්‍රශ්නයකදී පැහැදිලිවම මේ ගැන කිව්වා; ඉන්දියානු ධීවර යාත්‍රාවලින් කරන ආක්‍රමණය එතුමා එදා හෙළා දැක්කා. නමුත්, අද එතුමන්ලාගේ ආණ්ඩුවේ ජනාධිපතිවරයා ඒ රටට ගිහිල්ලා, නීති විරෝධී විධියට අපේ මත්ස්‍ය සම්පත නෙළාගත්ත ඒ ඉන්දියානු ධීවර යාත්‍රාවලට අභය දානය දෙනවා. මොකක්ද, මේ ප්‍රතිපත්තිය?

ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමාගේ කථාවේදී මේ ගැන කිව්වා. විශේෂයෙන්ම මේ සම්බන්ධයෙන් සැලකිලිමත් වෙන්න ඕනෑ. අණ පනත් ක්‍රියාත්මක කරමින් අපි අපේ ධීවර සම්පත ආරක්ෂා කරනවා වාගේම, පිට රටවල අයට ඒ සම්පත නෙළා ගන්න මෙහාට එන්න නොදී, ඒ නීති ක්‍රියාත්මක කරලා මේ සම්පත ආරක්ෂා කර ගන්නත් ඕනෑ. ඒ වගකීම රජයටත්, එම රජයේ ධීවර අමාත්‍යවරයා විධියට ඔබතුමාටත් තිබෙන බව මම මතක් කරන්න කැමැතියි.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා, විසිතුරු මසුන් සම්බන්ධයෙන් වන නියෝගයට. එහි සඳහන්ව තිබෙනවා, "කිසි තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකා ජල තීරය තුළ speargun එකක් හෝ අතේ රඳවන ලද, උල් කරන ලද කූරු භාවිත කරමින් ධීවර මෙහෙයුම් නොකළ යුතු බවට විධි විධාන ඇතුළත් කර ඇත" කියලා. මෙය ඉතාම යහපත්; ඉතාම හොඳයි. මෙම speargun එකක් භාවිත කරන්නේ කවුද? අපේ සමහර අය දේශීය වශයෙන් විනෝද ක්‍රීඩාවක් හැටියට මසුන් අල්ලන්න, මසුන්ට විදින්න, මසුන්ට හිංසා පීඩා කරලා අල්ලන්න ඒවා අඩුවෙන් යොදා ගන්නවා. ඒක තමුන්නාන්සේලාගේ නීතිරීතිත් එක්ක දැන් අඩු වෙලා තිබෙනවා. දැන් මේ ක්‍රමය ක්‍රියාත්මක කරන්නේ කවුද? විදේශීය සංචාරකයන්. විදේශීය සංචාරකයන් මේ ක්‍රමය ක්‍රියාත්මක කරනවා. මේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම තුළින් ඒ හානිය ඇති වෙනවා. ඒ හානිය වළක්වන්න මෙවැනි නියෝග ගෙනෙන එක ඉතාම හොඳයි.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම විසිතුරු මසුන් සම්බන්ධයෙන් ගැටලුවක් මතු වෙනවා. ගරු ඇමතිතුමනි, ඒ කිමිදුම්කරුවන් විසිතුරු මසුන් අල්ලන්නේ කොහොමද? කිමිදුම්කරුවන් කුඩා දැලක් අරගෙන ගිහිල්ලා මුහුදේ කිමිදිලා කුඩා විසිතුරු මසුන් ඉන්න ප්‍රදේශයේ ඒ දැල වට කරනවා. මේ දැලෙන් ගල්පර වැහෙනවා; කොරල්පර වැහෙනවා. ඊට පස්සෙදී ඒ කොරල්පරවලට තට්ටුවක් දැම්මාට පසුව ඒ මාළු එළියට ඇවිල්ලා මේ දැලට අහුවෙනවා. මේ නියෝග යටතේ විසිතුරු මසුන් ඇල්ලීම තහනම් කළොත් මොකද වෙන්නේ? ඒ විසිතුරු මත්ස්‍යයන් අල්ලන කර්මාන්තයෙන් අපට විශාල විදේශ විනිමයක් **ලැබෙනවා.** ඒ කර්මාන්තයෙන් ජනතාව විශාල පිරිසක් ජීවත් වෙනවා; ධීවරයන් විශාල ප්‍රමාණයක් ජීවත් වෙනවා. ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා මේ විසිතුරු මසුන් ඇල්ලීමේ කර්මාන්තය බිඳ වැටෙන්නේ නැති වෙන්න කටයුතු කරන්න කියලා. මේ ගැන NARA එක දන්නවා; ධීවර දෙපාර්තමේන්තුව දන්නවා; අධ්‍යක්ෂතුමන්ලා, අධ්‍යක්ෂ ජනරාල්තුමන්ලා දන්නවා. මේකට කිසි ගැටලුවකින් තොරව විකල්පයක් දෙන්න පුළුවන්. කොරල්පරවලට හානි නොවන විධියට දැලේ ඇස් ප්‍රමාණය වැඩි කරලා හෝ එහෙම නැත්නම් ඒ කුඩා දැල තවත් කුඩා කරලා හෝ ගැටලුවකින් තොරව මේ මත්ස්‍ය කර්මාන්තය කරගෙන යන්න කිමිදුම්කරුවන්ට පුළුවන්කම තිබෙනවා. ඒ වාගේ විකල්ප හඳුන්වා දීලා මේ කටයුත්ත කළා නම් වඩාත් ඵලදායකයි කියන එකයි අපි විශ්වාස කරන්නේ. ඒ කර්මාන්තය බිඳ වට්ටන්න එපා කියලා අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ඊළඟට ඇමතිතුමා කියලා තිබෙනවා, "මත්ස්‍ය සම්පත සහ ඒ මත්ස්‍ය සම්පතට අදාළ නොවන ධීවර නිෂ්පාදන අපි පිටරට යවනවා - අපනයනය කරනවා- කියලා. ඒ වාගේම අපි ආනයනයත් කරනවා. අපනයනය කරලා අපි ආදායම් හොයා ගන්නවා. අපට වියදම් සිදු වෙනවා" කියලා. ඔබතුමා ඒ ගැන පැහැදිලි කරලා තිබෙනවා. 2017 වාර්ෂික මත්ස්‍ය අපනයන ආදායම රුපියල් මිලියන තිස්නවදහස් දෙසියතිහයි. 2017 වාර්ෂික මත්ස්‍ය ආනයන ප්‍රමාණය දළ වශයෙන් මෙට්‍රික්ටොන් එක්ලක්ෂ දෙදහස් විස්සක්. අපනයන ආදායමට වඩා ආනයන වියදම වැඩියි. ඒ නිසා මේ ගැන විශේෂයෙන්ම සැලකිලිමත් වෙන්න ඕනෑ. ඇමතිතුමනි, වැඩිපුර මත්ස්‍ය ගහණය සිදුවන කාලයට, වැඩිපුර මත්ස්‍ය නිෂ්පාදනය කරන කාලයට අපි පිටරටින් **මාළු**, කරවල, උම්බලකඩ, **ටින්මාළු** ගෙනෙන එක නවත්වන්න ඕනෑ; යම් ප්‍රමාණයක් සීමා කරන්න ඕනෑ. එතකොට තමයි, සප්ත මහා සාගරයට ගිහිල්ලා, දූපත්වලට ගිහිල්ලා අමාරුවෙන් ධීවර කර්මාන්තය කරගෙන අපට සම්පත් ගෙන එන ඒ ධීවරයාට නියමිත මිලක් ලැබෙන්නේ. එහෙම නැත්නම් වී නිෂ්පාදනයට, එළවලු නිෂ්පාදනයට, පලතුරු නිෂ්පාදනයට යන කලම තමයි මෙන්න මේ මසුන් නිෂ්පාදනයටත් සිද්ධ වෙන්නේ. මොන ආණ්ඩු තිබුණත් වසර ගණනාවක් තිස්සේ දිගින් දිගටම මේ කටයුත්ත කරගෙන ගියා. අද වනතුරුත් කිසිම ආණ්ඩුවකට ප්‍රතිපත්තියක් නැහැ, ඒ ධීවරයා අල්ලාගෙන එන මාළුවලට, ඔවුන්ගේ මහන්සියට අදාළව නිශ්චිත මිලක් ලබා දීලා කර්මාන්තය පවත්වාගෙන යන්න. ඔවුන්ගේ ප්‍රශ්න ටික විසඳන්න මැදිහත් වෙන්න අදත් ප්‍රතිපත්තියක් නැහැ. ඒ නිසා මේ නියෝග ගෙනෙන කොට, අපේ අපනයන ආදායම වැඩි කරගන්නත්, ආනයන වියදම අඩු කරගන්නත් කටයුතු කරන්න කියලා අපි ඉල්ලීමක් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

ගරු නිහාල් ගලප්පත්ති මහතා

(மாண்புமிகு நிஹால் கலப்பத்தி)

(The Hon. Nihal Galappaththi)

ගරු ඇමතිතුමනි, ඒ වාගේම බහුදින යාත්‍රාවල මෙහෙයුම් පද්ධතිය පිළිබඳව මම ඔබතුමාට යමක් කියන්න ඕනෑ. අපේ බහුදින යාත්‍රාවල VMS 1,500ක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, මෙයින් 983ක්ම අක්‍රියයි. මේවා repair කරමින් -අලුත්වැඩියා කරමින්- තමයි තිබෙන්නේ. මේ පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්තුමාත්, සහකාර අධ්‍යක්ෂතුමන්ලාත් අනිවාර්යයෙන්ම දන්නවා. ඒ ගැන කථා කරන්න අපි ඔබතුමාගෙන් සාකච්ඡාවක් ඉල්ලුවා. ඔබතුමා අපට සාකච්ඡාවක් දුන්නා. මම ඔබතුමාට ඒ සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. ඒ සාකච්ඡාවේදී ඔබතුමා කිව්වා, ඕස්ට්‍රේලියාවෙන් තවත් VMS උපකරණ 2,000ක් ගෙන්වනවා කියලා. ඒවා අරගෙන ඇවිල්ලා සවි නොකරපු බෝට්ටුවලට ඒවා සවි කරන්න ලබා දෙනවා කිව්වා. ඒ ගැන ගැටලුවක් නැහැ. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ මෙයයි. 1,500ක් වෙච්ච මේ VMS පද්ධතිය ක්‍රියාත්මක වුණත්, නොවුණත් එක මාසයකට දළ වශයෙන් රුපියල් 3,000ක් අය කරනවා. මේවා මුලින් දුන්නේ නොමිලේ. මේවා ක්‍රියාත්මක වෙන කොට මාසයකට රුපියල් 3,000ක් ගත්තා. නමුත් දැන් ක්‍රියාත්මක වුණත්, නොවුණත් ඔවුන් ඒ මුදල අනිවාර්යයෙන්ම ගෙවන්න ඕනෑ. මේවා අක්‍රිය වුණාම තමන්ගේ සල්ලිවලින් තමයි ධීවරයා ඒවා අලුත්වැඩියා කරගන්න ඕනෑ. ඒ නිසා අද මේ VMS පද්ධති ධීවරයන්ට බරපතළ විධියේ ගැටලුවක් වෙලා තිබෙනවා; ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒ නිසා ඔබතුමා මේ සම්බන්ධයෙන් කල්පනා කර බලා ඉතාම හිතකර ක්‍රියාමාර්ගයක් ගන්න කියලා අපි ඉල්ලීමක් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, නියමිත කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ඊළඟට රක්ෂණය ගැන කියන්න ඕනෑ. මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
වෙලාව අවසානයි, ගරු මන්ත්‍රීතුමනි. විනාඩි භාගයක් දෙන්නම්, කථාව අවසන් කරන්න.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
බහුදින ධීවර යාත්‍රාවලට රක්ෂණයක් හඳුන්වා දීලා තිබෙනවා. අපි කියනවා, පෞද්ගලික අංශය වාගේම රාජ්‍ය අංශයත් මෙයට මැදිහත් කර ගන්න කියලා. බෝට්ටු හිමියා විසින් යාත්‍රාව වාගේම ගැණියන්ද රක්ෂණය කරනවා. ඒ ගැණියාට වෙනම රක්ෂණයක් තිබෙනවා. හැබැයි, මේ රක්ෂණ දෙකෙන්ම ප්‍රතිලාභ ලැබෙන්නේ කොහොමද? මේ ගැණියා බෝට්ටුවේදී මැරුණොත් ඒ රක්ෂණය හම්බ වෙන්නේ නැහැ. ආපදාවක් වෙලා බෝට්ටුවේදී මැරුණොත් ගැණියාට රක්ෂණය හම්බ වෙන්නේ නැහැ. ඔහු මුහුදට වැටිලා මැරෙන්නම ඕනෑ, රක්ෂණය ලබාගන්න. බෝට්ටුවත් එහෙමයි. බෝට්ටුව අර්ධහානි වුණාට කවදාවත් රක්ෂණය හම්බ වෙන්නේ නැහැ. ඒ නිසා මේ සම්බන්ධයෙන් ඉතාම ඉක්මනින් ක්‍රියාත්මක වෙලා ඵලදායී ලෙස මේ රක්ෂණය ලබා දීමට කටයුතු කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊළඟට ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.භා.4.23]

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ධීවර කර්මාන්තය ආශ්‍රිතව නව නියෝග කීපයක් ඇතුළත් කරන අවස්ථාවක ධීවර කර්මාන්තය පිළිබඳව කථා කරන්න ලැබීම සතුටක් හැටියට සලකනවා. අපේ සාගරය අපේ රටට තිබෙන විශාල සම්පතක් හැටියට අපි සලකනවා. මේ කාරණය ගැන කථා කිරීමේදී මා මුලින්ම මතක් කරන්න කැමැතියි, සාගරය දූෂිත වෙන ආකාරයට අද කටයුතු රාශියක් සිද්ධ වෙන බව. ඒ නිසා ඒවා අවම කරන්න ඒ වාගේම ඒ තත්ත්වය සම්පූර්ණයෙන්ම නැති කරන්න නව නීති සකස් කිරීමට අවශ්‍ය නියෝග අද මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ගැන අපි සතුටු වෙන්න ඕනෑ.

සංචාරක ව්‍යාපාරය පිළිබඳවත්, මත්ස්‍ය සම්පත ලබා ගැනීම පිළිබඳවත් අප විශේෂ අවධානය යොමු කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට ඔබතුමා ප්‍රායෝගිකව දන්නවා අද හෝටල් විශාල ප්‍රමාණයක් සාගරය ආශ්‍රිතව, ඒ ආසන්නයේ පිහිටා තිබෙන බව. සමහර හෝටල් නියම ලෙස කළමනාකරණය කරගෙන තිබෙනවා. හෝටල් විශාල ප්‍රමාණයක මලාපවහන පද්ධති රාශියක් සාගරයට මුදාහරින තත්ත්වයට පත්කර තිබෙනවා. එසේ මුදාහරින තත්ත්වයට පත් කිරීමත් සමඟ මසුන් වාගේම ජලජ පැළෑටි විශාල ප්‍රමාණයක් විනාශ වෙමින්, අපේ උරුමය හානියට ලක්වෙමින් පවතිනවා. එම නිසා මේවා පොතට පමණක් සීමා නොකර ඒවාට අදාළ අංශ නියමාකාරව දැනුවත් කර, මේ සම්බන්ධව නීති ඉතා තදින් ක්‍රියාත්මක කරන්න. අපි දන්නවා වෙනත් රටවල මේ සම්බන්ධ නීති ඉතා තදින් ක්‍රියාත්මක වන බව. ඒ නිසා ඒ වැරැදි වළක්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුවෙනවා. ඒ නිසා මෙයට අදාළ වන පරිසර අංශ වෙන්න පුළුවන්, සංචාරක කර්මාන්තයට අදාළ අංශ වෙන්න පුළුවන්, අපේ ආරක්ෂක අංශ වෙන්න පුළුවන්, ඒ සියල්ල නිසි පරිදි දැනුවත් කරලා මෙවැනි කටයුතු සිදු නොවන්නට නම් අද අප සම්මත කරගන්නා නියෝග එක්ක ඉදිරියට යා යුතුයි.

ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවරයන් අද ඉතාම දුෂ්කර ජීවිතයක් තමයි ගත කරන්නේ. ධීවර පවුලක් කිව්වාම, ඒ ධීවර පවුල හැමදාම එකම තැනකයි ඉන්නේ. ඉතාම අඩුවෙන් ඔවුන්ගේ ආර්ථික ශක්තිය වර්ධනය වන බව තමයි දකින්නේ. ඒ නිසා රජයක් හැටියට මේ පිළිබඳව යම් මැදිහත් වීමක් ඒ ඒ ප්‍රදේශ මට්ටමින් හෝ සිදුකර, ඔවුන්ගේ ආර්ථිකය නංවන වැඩ පිළිවෙළක්, ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් මට්ටමට ගන්නා වැඩ පිළිවෙළක් අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක විය යුතුව තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එයට හේතුව තමයි විශේෂයෙන්ම ධීවර කර්මාන්තයත් සමඟ එක් කණ්ඩායමක් පමණක් වේගයෙන් ආර්ථික වශයෙන් ශක්තිමත් වීම. නමුත්, මේ වෙනුවෙන් මහන්සි වන, ඇප කැප වන ධීවර පවුල් සඳහා ලැබෙන ප්‍රතිලාභය බොහොම අඩුයි කියන එක ඔවුන් එක්ක සාකච්ඡා කරද්දී බොහොම පැහැදිලිව ප්‍රකාශ කර තිබෙනවා. ඇත්තෙන්ම මේ අයගේ රක්ෂණ ක්‍රම දෙස බැලුවත්, වන්දි ලබාදෙන ක්‍රමවේද දෙස බැලුවත් ඒවා ඉතා මන්දගාමී තත්ත්වයකයි තිබෙන්නේ. අපේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ ධීවර කර්මාන්තය පිළිබඳව හොඳ දැක්මක් බොහොම පැහැදිලිව ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ අනුව ධීවර කර්මාන්තය අපේ රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමට පාවිච්චි කරන්න පුළුවන්. අපි සාගර ආර්ථිකයක් පිළිබඳව බොහෝ කාලයක සිට කථා කළා. හැබැයි, ඒ පිළිබඳව අවශ්‍ය නිසි වැඩ පිළිවෙළ මේ වනතෙක් අපට සූදානම් කරගැනීමට නොහැකි වී තිබෙනවා. මේ කාලපරිච්ඡේදයේදීවත් ධීවර කර්මාන්තය පිළිබඳව හොඳින් අවධානය යොමු කරලා කටයුතු කරන්න ඕනෑ. ධීවර කර්මාන්තය වාගේම අපට සම්පතක් වෙලා තිබෙන මහා සාගරය අපේ රටේ සම්පතක් බවට පත්කර ගෙන ආර්ථිකයට දැවැන්ත ශක්තියක් ඇති කරගන්න අපට පුළුවන්.

විශේෂයෙන්ම මත්ස්‍ය කර්මාන්තය පිළිබඳව GSP Plus සහනය 2023 වර්ෂය දක්වා ලබාගන්න අපට හැකියාව ලැබී තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා, අග්‍රාමාත්‍යතුමා ඇතුළු වත්මන් ආණ්ඩුව ගෙනයන වැඩ පිළිවෙළ පිළිබඳව විදේශ රටවල පවතින පැහැදීම, ඒ වාගේම රට තුළ ඇතිවෙලා තිබෙන දේශපාලන ස්ථාවරභාවය ආදී කරුණු සියල්ල සැලකිල්ලට ගෙන GSP Plus සහනය 2023 වර්ෂය දක්වා ලබාදෙන්න යුරෝපා සංගමය තීරණය කර තිබීම රටක් හැටියට අප ලබාගත් විශාල ජයග්‍රහණයක්. ඒ සහන ලබාගන්නවා වාගේම, ඒ සහන තුළින් අපේ රටේ ජාතික ආර්ථිකය ශක්තිමත් කරන්නට අප වගබලා ගන්නට ඕනෑ. ධීවර කර්මාන්තය හරහා දැනට අපි අපනයනය කරන මත්ස්‍ය ප්‍රමාණයට වඩා ලෝක වෙළෙඳපොළ තුළ අපේ රටේ මත්ස්‍ය සම්පත පිළිබඳව වැඩි අවධානයක් යොමු වෙලා තිබෙනවා. ඒ නිසා ලෝකයේ අනෙක් රටවල් සමඟ තරග කරමින්, අපේ රටේ මත්ස්‍ය ඉල්ලුම ප්‍රයෝජනයට ගනිමින් වැඩිපුර මත්ස්‍ය ප්‍රමාණයක් අපනයනය කරනවා නම් විශාල වශයෙන් විදේශ විනිමය ලබාගන්න අපට පුළුවන්කම ලැබෙනවා. අපේ නව ආණ්ඩුවේ එම විෂයභාර අමාත්‍යතුමන්ලා දෙපළම

විශේෂ අවධානය යොමු කර කටයුතු කරන්නට ඕනෑ කාලවකවානුවක් තමයි තිබෙන්නේ කියා මම හිතනවා.

මත්ස්‍යයන් අපනයනය කරලා අපේ රටට මුදලක් ලබා ගන්නවා. රටේ සාමාන්‍ය ජනතාවත් එක්ක කථා බහ කරන කොට විශාල වශයෙන් මාළු ගණන් බව සාමාන්‍ය ජනතාවගේ අදහස වෙලා තිබෙනවා. මේ හේතුව නිසා ප්‍රෝටීන් බහුල ආහාරයක් වන මාළු පරිභෝජනය කරන්න, -මත්ස්‍ය ආහාර පරිභෝජනය කරන්න - ඒවා දරුවන්ට ලබා දෙන්න තිබෙන අවස්ථාව හුඟක් දුරට ගිලිහී ගිහින් තිබෙනවා. මාළු අපනයනය කරලා විදේශ විනිමය අපේ රටට ගෙන්වා ගන්න ශක්තිය ලබා ගන්නවා වාගේම රට තුළ අපේ අහිංසක ජනතාවට, විශේෂයෙන්ම දරුවන්ට ප්‍රෝටීන් බහුල වූ මාළු ආහාරයට ගන්න පුළුවන් විධියට අඩු මිලකට ලබා දෙන්න නම් ධීවර සංස්ථාව ඇතුළු ආයතන මැදිහත්වෙලා මීට වඩා වැඩි අවධානයක් යොමු කරලා කටයුතු කරන්න ඕනෑ. ඒ සම්බන්ධ මැසිවිලි ගණනාවක් තිබෙන බව අපි දන්නවා. මේ වෙනුවෙන් මොන තරම් අවස්ථා අපට තිබුණත් කරන්න ඕනෑ ක්‍රමවේද මොනවාද කියා අපි සොයා බලන්න යන්නේ නැහැ. අපි සොයා බැලුවාම බෝට්ටු විශාල ප්‍රමාණයක් කැඩී ගිහින් තිබෙනවා. ඒ කටයුතු කරන්න අවශ්‍ය මූලික අවශ්‍යතා ඉතාම හොඳ මට්ටමකට ගෙනෙන්න අපට බැරි වෙලා තිබෙනවා. ඒ නිසා නියම මත්ස්‍ය අස්වැන්න අද අපි ලබා ගන්නේ නැහැ. ගොඩක් වෙලාවට අපි කරන්නේ ලබා ගන්නා මත්ස්‍ය අස්වැන්නෙන් ගුණාත්මකභාවයෙන් හෙබි හොඳම - number one quality එකේ - මත්ස්‍ය ප්‍රමාණය විදේශ රටවලට යවන එකයි. එහෙම නම්, තුන්වැනි පන්තියටත් වඩා පහළ මට්ටමේ මත්ස්‍ය ප්‍රමාණය තමයි අපේ රට අභ්‍යන්තරයට ඇවිත් අපේ රටේ ජනතාව පරිභෝජනය කරන්නේ. ඒ නිසා ධීවර සංස්ථාවට දැවැන්ත වගකීමක් තිබෙනවා, මේ කරුණු දෙකම හොඳින් කළමනාකරණය කරගෙන අපේ රටේ ජාතික ආර්ථිකය ශක්තිමත් කරන්න පුළුවන් විධියට සාගර සම්පත පාවිච්චි කරන්න.

අපි හැම දාම කියනවා වාගේ අපේ කෘෂි කර්මාන්තයට, අධ්‍යාපන ක්ෂේත්‍රයට තවම නිසි ක්‍රමවේදයක් හදාගෙන නැහැ වාගේම, ධීවර කර්මාන්තයටත් නිසි ක්‍රමවේදයක් හදා ගෙන නැහැ. ඒක නිසා තමයි විටින් විට අපට එක එක ප්‍රශ්න මතු වෙන්නේ. මෙය අලුත් ආරම්භයක් ගන්න වෙලාවක්. අලුත් රාජ්‍ය නායකයෙක් පත් වෙලා තිබෙන වෙලාවක්. විශේෂයෙන්ම, ඒ පත් වුණු රාජ්‍ය නායකයා එක් එක් ක්ෂේත්‍රවලට පැහැදිලි ක්‍රමවේද හදන්න ඕනෑය කියමින් පැහැදිලි තත්ත්වයක ඉඳිමින් නායකත්වය දෙන කෙනෙක්. එවැනි වකවානුවක ධීවර කර්මාන්තයත් සැලසුම් සකස් කරලා, රට වටේටම තිබෙන සාගර සම්පත රටේ ආර්ථිකය ශක්තිමත් කරන මෙවලමක් බවට පත් කර ගන්න අපි සියලුදෙනා කැප වෙන්න ඕනෑ. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මැතිතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා.4.32]

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්දියන් සාගරයේ මුතු ඇටය කියලා තමයි අපේ රටට කියන්නේ. මේ මුතු ඇටය වටේටම තිබෙන්නේ ඉන්දියන් සාගරය. ඉන්දියන් සාගරයේ මුතු ඇටයෙන් ලබා ගත්ත සම්පත් මොනවද කියන කාරණය ගැන අදටත් අපි කථා කරනවා. අපි මුහුදෙන් -මුහුදු සම්පතෙන්, සාගරයෙන්- ලබා ගත්ත ප්‍රතිලාභ පිළිබඳව සෑහීමකට පත් වෙන්න පුළුවන්ද කියන කාරණය අපට අදටත් කථා කරන්න සිදු වෙන කාරණයක්.

විශේෂයෙන්ම අද GSP Plus සහනය ගැන කථා කළා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කාලයේ අනුගමනය කළ විදේශ ප්‍රතිපත්තිය සහ ආණ්ඩුවේ ප්‍රතිපත්ති නිසා අපට GSP Plus සහනය අහිමි වෙන තත්ත්වයකට පත් වෙලා තිබුණා. යුරෝපා මත්ස්‍ය තහනම ඉවත් කර ගන්න අපේ ආණ්ඩුවට හැකියාවක් ලැබුණා. අපට GSP Plus සහනය ලබා ගැනීමේ අවස්ථාවක් ලැබුණා. ඒ වාගේ විශාල ජයග්‍රහණ රාශියක් අපට භුක්ති විඳින්න හැකියාව ලැබුණා. මත්ස්‍ය අපනයනයෙන් අපේ රටට අහිමි වී ගොස් තිබුණු විශාල මුදලක් අපේ රටට නැවත ලබා ගැනීමට පසුගිය අපේ රජය කටයුතු කිරීම පිළිබඳව මම විශේෂයෙන් සන්තෝෂයට පත් වෙනවා. මේ අලුත් ආණ්ඩුවට දැන් තිබෙන්නේ ඒ කටයුතු බිඳ වැටෙන්න දෙන්නේ නැතුව අඛණ්ඩව ඉදිරියට අරගෙන යන එකයි. ඒ සඳහා මා ඔබතුමන්ලාට සුබ පතනවා. ඔබතුමන්ලා ඒ සම්බන්ධයෙන් කටයුතු කරයි කියලා මා විශ්වාස කරනවා.

සාගරයේ ඉන්න මාළු නොවෙයි, අද ඇඟේ මාළු නටන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇඟේ මාළු නටන්නේ මොනවා නිසාද? සාගරයෙන් වට වූ, අපේ මහ පොළොවේ වැවෙන එළවලු ටික ගන්න ගියාම තමයි මිනිසුන්ගේ ඇඟේ මාළු නටන්නේ. ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට එළවලු කඩ මංකොල්ලය වාර්තා වුණා. වෙනදා අපේ ආරක්ෂක අංශවලින් මුරකාවල් දැම්මේ බැංකුවලට, එක්කෝ රත්තරන් බඩු කඩවලට. ඒ වාගේ තැන්වලට තමයි වෙනදා අපි මුරකාවල් දැම්මේ. හැබැයි, අද අපේ රටේ එළවලු කඩ කොල්ලකන තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. බොහොම අපූරුයි. වර්තමාන ආණ්ඩුව -අලුත් ආණ්ඩුව- බලයට පත් වුණාට පස්සේ තමයි එළවලු කඩ කොල්ලකන තත්ත්වයට පත් වුණේ. ලෝකෙන් උතුම් රට ලංකාව කියලා කියනවා. මේ මාතෘ භූමිය උලාගෙන, හපාගෙන, බදාගෙන කන්න ආපු කට්ටිය ඉන්නවා. ඒ මහ පොළොවේ හැදුණු, අපේ මාතෘ භූමියේ හැදුණු එළවලු මිල පිළිබඳව කථා කරන කොට, අද අපේ ඇඟේ මාළු නටනවාය කියන එක මම කියන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම පාර්ලිමේන්තුවට එළවලු මල්ලක් ගෙනාවා. මේ එළවලු මල්ලේ බටු තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ මහ පොළොවේ සිටින පුද්ගලයකු හැටියට දන්නවා ඇති, බටු කිලෝ එකක් රුපියල් 400යි; මේ මහ පොළොවේ වැවෙන බටු කිලෝ එකක් රුපියල් 400යි. මේ මහ පොළොවේ බටු වැවෙන්නේ නැත්නම් අපි සාගරයේ හෝ මේවා වවන්න ඕනෑ. තමුන්නාන්සේලාගේ කාලයේ මහ පොළොවේ වැවෙන්නේ නැත්නම් සාගරයේ හෝ වවන්න අපි තාක්ෂණය සකස් කරන්න ඕනෑ.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සභා ගර්භය ඇතුළට ගේන්න පුළුවන් ද්‍රව්‍ය සහ ගේන්න බැරි ද්‍රව්‍ය තිබෙනවා. එතුමා මේ ගරු සභාවම අනාරක්ෂිත කරලා, මේ වාගේ දේවල් සභාවාගෙන ගෙනාවේ කොහොමද කියලා ඔබතුමා පරීක්ෂණයක් කරන්න. ඒ පිළිබඳව වහාම පරීක්ෂණයක් කරන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි. මම ඒ සම්බන්ධයෙන් දැනුම් දෙන්නම්.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
එළවලු ටිකක් ගෙනාවා කියලා මේ සභාව අනාරක්ෂිත වෙන්නේ නැහැ. තමුන්නාන්සේලාට මිරිස් කුඩු ගේන්න පුළුවන්, තමුන්නාන්සේලාට උල් පිහි ගේන්න පුළුවන්. මට බෝංචි කරලකින් මේ සභාවේ අනාරක්ෂිතභාවයක් ඇති කරන්න බැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වෙළෙඳ පොළේ බෝංචි කිලෝ එකක් රුපියල් 350ක් බවට පත්වෙලා තිබෙනවා. ඒ වාගේම මා ළඟ කැරට් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම ඔබතුමාට කියන්නේ, අද විවෘත වෙළෙඳ පොළේ කැරට් කිලෝ එකක් රුපියල් 600යි. ලෝකෙන් උතුම් රට ලංකාවයි. සාගරයක් මැද පුංචි රටක් ඇත. සාගරයක් මැද තිබෙන මේ පුංචි රටේ තමයි අද කැරට් කිලෝ එක රුපියල් 600ක් වෙලා තිබෙන්නේ. ඒ එක්කම, මම අද හීනි මිරිස් ගෙනාවා. හීනි මිරිස් කිලෝ එකක් රුපියල් 550යි. සාගරයක් මැද තිබෙන පුංචි රටේ තමයි මිරිස් කිලෝ එකක් රුපියල් 550ට ගිහිල්ලා තිබෙන්නේ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පරිස්සම් කරගන්න.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ඔව්, ඒක තමයි. මට ආරක්ෂාව අවශ්‍යයි. මේවා සභාවට ගෙනෙන එක අනාරක්ෂිත නැහැ. මගේ ළඟ තිබෙන රත්තරන් වාගේ එළවලු ටික ආපහු අරගෙන යන්න මට ආරක්ෂාව අවශ්‍යයි. ඒ වාගේම මා ළඟ ලීක්ස් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වන විට ලීක්ස් කිලෝග්‍රෑම් එකක් රුපියල් 750යි.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මොනවා?

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ඉතින් කොහොමද? මේ සාගරයක් මැද, සාගර සම්පත් ගැනයි කථා කරන්නේ. හැබැයි, සාගරයක් මැද තිබෙන මේ පුංචි රටේ වැවෙන ඒවායේ මිල ගණන් තමයි මේ මාස දෙකට ඉහළ ගිහිල්ලා තිබෙන්නේ. මා ළඟ තව බඩු තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මගේ ළඟ තිබෙනවා තක්කාලි. ඔබතුමා දන්නවා ද, මේ සාගරයක් මැද තිබෙන පුංචි රටේ අද තක්කාලි කිලෝග්‍රෑම් එකක් රුපියල් 470යි කියලා?

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කාලා වරෙන්.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
තක්කාලි කිලෝග්‍රෑම් එක රුපියල් 470යි! මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තමයි මෙතැන තිබෙන වටිනාම භාණ්ඩය. මම බොහොම සුරක්ෂිතව තමයි මේක මෙතැනට අරගෙන ආවේ. මෙන්න මා ළඟ තිබෙනවා රතුලූනු. කොහොමද, සැපද? රතුලූනු ලාභයි ද? මහින්ද රාජපක්ෂ මහත්මයා පසුගිය ජනාධිපතිවරණය වෙලාවේ වේදිකාවල රතුලූනු පෙන්න පෙන්නා "කොහොමද, සැපද? රතුලූනු කෑවා ද?" කියලා අහපු හැටි අපි දැක්කා. එතුමා එහෙම තමයි ඇහුවේ. හැබැයි, මහින්ද රාජපක්ෂ මහත්තයලා,- [බාධා කිරීමක්]- රතුලූනු අස්වැන්න ගන්න පොල් ගස්වලින් පලදාව ගන්නවා වාගේ මාස ගණන් යන්නේ නැහැ. රතුලූනු අස්වැන්න ගන්න යන්නේ දවස් 40යි, 45යි; මාසයයි, දෙකයි. ඒවා කෙටි කාලීන භෝග. තමුන්නාන්සේලා සැලසුම් කරන්න මේවා මහා සාගරේ හෝ යම්කිසි ක්‍රමයකට වවන්න, තමුන්නාන්සේලා බලයට ආවාට පස්සේ මේවා මහ පොළොවේ වැවෙන්නේ නැත්නම්, එහෙම ප්‍රශ්නයක් තිබෙනවා නම්. රතුලූනු කිලෝග්‍රෑම් එකක් අද රුපියල් 600යි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මෙහෙම වෙනකොට අපේ අහිංසක මනුස්සයෙක් ජීවත් වෙන්නේ කොහොමද? ඒ දවස්වල නම් කෑම කඩේකට ගියාම මස් කෑල්ල, මාළු කෑල්ල තමයි ඒ කඩේ ඉන්න සේවකයා අපේ කෑම පිඟානට බෙදුවේ. හැබැයි අද? අද බෝංචිවලින් පටන් ගත්තාම, බටුවලින් පටන් ගත්තාම බෙදාගෙන කන කෑම එකට එළවලු ටික බෙදන්නේ සේවකයෙක්. බැරි වෙලාවත් බෝංචි දෙපාරක් බෙදා ගත්තොත් ඒ කඩේ මුදලාලි දෙපාරක් රවනවා.

හදිසියේ දාන ගෙවල් ඇති වෙනවා. මළගෙවල්, මඟුල් ගෙවල් ඇති වෙනවා. අද මිනිසුන් කන්නේ කොහොමද? අද මිනිසුන් ගස්වල තිබෙන පොළොස් ගැට, විවිධ කොළ වර්ග, කවදාවත් භාවිත නොකරපු දේවල් ආහාරයට ගන්නා තත්ත්වයට පත් වෙලා තිබෙනවා. දැන් අන්තිමට මේ ආණ්ඩුව අපේ රටේ මිනිසුන් තණකොළ කන යුගයකට තමයි පත් කරලා තිබෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට නියමිත කාලය දැන් අවසානයි.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව තත්පර 10ක් දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාලයේ හැටියට ජීවිතයට පවා තර්ජනයක් ඇති විය හැකි බඩු භාණ්ඩ තොගයක් දැන් මා ළඟ තිබෙනවා. මට මේ ටික ආයෙත් සුරක්ෂිතව අරගෙන යන්න අවශ්‍ය ආරක්ෂාව ලබා දෙන්න කියාත් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සනත් නිශාන්ත පෙරේරා රාජ්‍ය අමාත්‍යතුමා කථා කරන්න. ඔබතුමාටත් ලැබෙන කාල වේලාව විනාඩි 12යි.

[අ.භා. 4.42]

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා (ධීවර හා මිරිදිය මත්ස්‍ය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சனத் நிசாந்த பெரேரா - கடற்றொழில் மற்றும் நன்னீர் மீன்பிடிக் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Sanath Nishantha Perera -State Minister of Fisheries and Inland Fisheries Industry)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබාදීම පිළිබඳව මම හදවතින්ම ඔබතුමාට ස්තුතිය පුද කරනවා.

අපි අපේ ධීවර පනත යටතේ ගෙනෙන නියෝග කාලයෙන් කාලයට ගැළපෙන ආකාරයට සංශෝධනය කරනවා. යුගයේ අවශ්‍යතාව අනුව ඒවා සංශෝධනය වෙන වෙලාවේදී ඒ සඳහා අදහස් දැක්වීමට අවස්ථාව ලබාදීම පිළිබඳව මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපේ මේ ගෞරවනීය සභාවේ යම් යම් මන්ත්‍රීවරු මේ ධීවර විෂය සම්බන්ධව සහ අනෙකුත් කාරණා සම්බන්ධව කථා කරපු දේවල් පිළිබඳව උත්තර දෙන්නත් මම මෙය අවස්ථාවක් කර ගන්නවා. මීට කලින් කථා කරපු ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මගේ සහෝදර මන්ත්‍රීතුමා අපේ වයඹ පළාත් සභාවේ මාත් එක්ක එකට හිටපු මන්ත්‍රීවරයෙක්. මම හිතන විධියට එතුමාගේ දැනුමේ, අවබෝධයේ අඩු පාඩුවක් නැහැ. මම දන්නා හැටියට එතුමාට උපාධියකුත් තිබෙනවා. හැබැයි, එතුමාට පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ගැටලුවක් තිබෙනවා ද දන්නේ නැහැ. මේ ආණ්ඩුව ඇවිල්ලා මාස දෙකෙන් එළවලු මිල උඩු යටිකුරු කරන්න, පලතුරු මිල උඩු යටිකුරු කරන්න බැහැ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කාලයේ තමුන්නාන්සේලා පොහොර සහනාධාරය කපලා, සීමාසහිත ලංකා පොහොර සමාගමට බිලියන 600ක් පොල්ල තියලා, සීමාසහිත ලංකා පොහොර සමාගම විනාශ කළා. ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමනි, මේ ගරු සභාවෙන් එළියට යන්න එපා. கொஞ்ச இருங்க. எங்கே போறா? මගේ මේ කථාවත් අහලා යන්න. එහෙම පොල්ල තියපු ආණ්ඩුවක් අද ඇවිල්ලා ලජ්ජා නැතිව කියවනවා.

ඒ වාගේම, අපේ රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා, එතුමාගේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කරුණු කාරණා පිළිබඳ මේ රටේ ජනතාව දැනුවත් කළ වෙලාවේ හතර අතේ ගැවා කියලායි මම කල්පනා කරන්නේ. අපේ සමහර මන්ත්‍රීවරු, සමහර උදවිය හැසිරෙන ආකාරය දැක්කාම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් කියලා කියන්න ලජ්ජා හිතෙන තත්ත්වයට අද පත් වෙලා තිබෙන්නේ.

ගරු නිරෝෂන් පෙරේරා හිටපු රාජ්‍ය ඇමතිතුමා තහනම් පන්න ක්‍රමය පිළිබඳව කථා කළා. එතුමන්ලා ආණ්ඩු කරපු පසුගිය කාලයේ සමහර තහනම් පන්න ක්‍රම නීත්‍යනුකූල කරන්න කියලා අපේ නිලධාරින්ට බලපෑම් කළා; තර්ජනය කළා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව සමහර පන්න ක්‍රම දැල්වල ඇහි ප්‍රමාණය එහාට මෙහාට කරලා ඒ තහනම් පන්න ක්‍රම නීත්‍යනුකූල කරපු ආණ්ඩුවක්; ලයිලා හා සුරුක්කු දැල් පන්න ක්‍රමය නීත්‍යනුකූල කරපු ආණ්ඩුවක්; ලයිලා හා සුරුක්කු දැල් පන්න ක්‍රමය නීත්‍යනුකූල කිරීම සඳහා පගාව ගත්ත ගත්ත ආණ්ඩුවක්. අද ලජ්ජා නැතිව මෙතැනට ඇවිත් තහනම් පන්න ක්‍රම පිළිබඳව කථා කරනවා.

හලාවත ඇන්ටනීගේ මරණය පිළිබඳව කථා කළා. මේ උදවිය හලාවත ඇන්ටනී මැරුණු ගමන් ඔහු එක්සත් ජාතික පාක්ෂිකයෙක් කර ගත්තා. එදා ලෝක වෙළෙඳ පොළේ බොර තෙල් බැරලය ඉහළ යනකොට, ලංකාවේ මිනිසුන්ට දරා ගන්න බැරි තරම් ඉන්ධන මිල ඉහළ යනකොට ඒ අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා එළියට බැහැපු ධීවරයන් අයුතු විධියට පෙළ ගස්වලා සමහර බංකොළොත් දේශපාලන පක්ෂ කරපු දේවල් නිසා තමයි ඇන්ටනී වාගේ තරුණයන්ට මැරෙන්න සිදු වුණේ. එක්සත් ජාතික පක්ෂය ඇන්ටනීගේ මරණය market කරන්න ගියාට, මැරුණු ඇන්ටනී එක්සත් ජාතික පාක්ෂිකයෙක් කරන්න ගියාට ඇන්ටනීගේ දේශපාලන මතය, ඇන්ටනී දරපු දෙශපාලන ස්ථාවරය ඊට වඩා වෙනස් එකක් බව පැහැදිලිව කියන්න ඕනෑ. ඇන්ටනී අයියා අපිත් එක්ක හිටපු කෙනෙක්. ඇන්ටනීගේ බාප්පා වන සේතන් හලාවත, එගොඩවැල්ලේ මගේ කලාප නායකයා. සේතන්ගේ අයියාගේ පුතා තමයි ඇන්ටනී. ඒ ඇන්ටනීගේ මරණය ඉතාම අවාසනාවන්ත මරණයක්. ඒ මරණයට වග කියන්න ඕනෑ වෙන කවුරුවත් නොවෙයි. ජනතාව අතර බංකොලොත් වෙලා තිබුණු දේශපාලන පක්ෂ තමන්ගේ පටු ආකල්ප, පටු අවශ්‍යතා මුදුන් පමුණුවා ගැනීම සඳහා ධීවරයන් පාවිච්චි කිරීමේ ප්‍රතිඵලයක් හැටියට තමයි ඒ සිද්ධිය වුණේ කියන කාරණය මතක් කරන්න ඕනෑ.

ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමාගේ කථාවේදී කිව්වා, උතුරට අඩුවෙන් සැලකුවා කියලා. උතුරට අඩුවෙන් සැලකුවාය කියන්න, ඒ ගැන හඬක් නඟන්න අයිතියක් තිබෙන්නේ උතුරේ සිටින මහජන නියෝජිතයන්ගෙන් අපේ ඩග්ලස් දේවානන්දා මැතිතුමාට පමණයි. එතුමා හැමදාම බෙදුම්වාදයට විරුද්ධව, ත්‍රස්තවාදයට විරුද්ධව කථා කරපු කෙනෙක්. එතුමා මේ රට ඒකීය රටක් විධියට තිබෙන්න ඕනෑය කියලා විශ්වාස කරපු කෙනෙක්. උතුරට සංවර්ධනය ඕනෑ නැහැ කියන උදවිය එදාත් හිටියා, අදත් ඉන්නවා. පළාත් සභා ක්‍රමය හරහා උතුරට ලබා දුන් මුදල්වලින් සියයට 65ක්, 70ක් වසර අවසානයේ ආපසු ඇවිත් තිබෙන බව ඒ පිළිබඳ සොයා බැලුවාම පෙනී යනවා. ඔවුන්ගේ මතය වෙන්නේ රජයකින්, එහෙම නැත්නම් ආණ්ඩුවකින් කරන සංවර්ධන ව්‍යාපෘතිය ගැන නොවෙයි. මෙයට එකම විසඳුම ඊළාම් රාජ්‍ය ලබා දෙන එක කියලායි ඔවුන් සිතන්නේ. ඒ උදවියට අපි අනාගතයේදී වැඩ කරලා පෙන්වන්න බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා අප සතුව හොඳ සැලසුම් තිබෙනවා. මගේ කැබිනට් ඇමතිවරයා වන ඩග්ලස් දේවානන්දා මැතිතුමාට උතුරේ ජනතාවගේ දැවෙන ගැටලු නිරාකරණය කිරීමට ලොකු වුවමනාවක් තිබෙනවා. අපි ඒ සඳහා විශාල වැඩ පිළිවෙළක් නිර්මාණය කරලාත් තිබෙනවා.

කළපු සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 3,000ක, - ඒ කියන්නේ රුපියල් ලක්ෂ 30,000ක- දැවැන්ත මුදලක් වෙන් කරලා තිබෙනවා. මේ මුදල ගෙන ගොස් උතුරට හලද්දී, උතුරු ප්‍රදේශය සංවර්ධනය කරද්දී ඒ පළාත සංවර්ධනය කරන්නේ කොහොමද කියලා උතුරේ මහජන නියෝජිතයන්ගේ ඇස් ඇරෙයි.

අපි මේ වන විට කාන්තා සංවිධාන වැඩ පිළිවෙළ උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ ආරම්භ කරලා තිබෙනවා. ඒ ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් වෙද්දී, දුප්පත් ධීවර කාන්තාවට දෙපයින් නැඟීමට හැකි වැඩ පිළිවෙළ සකස් වෙද්දී උතුරේ මිනිසුන්ගේ ඇස් ඇරෙයි. මේ සංවර්ධන ව්‍යාපෘති උතුරට එද්දී, හැමදාම රාජපක්ෂ විරෝධීව ඡන්දය පාවිච්චි කරපු උදවිය ගත්ත තීන්දුව වැරදියි කියලා හිතේවි කියන කාරණය අපේ අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමාට මතක් කරන්න ඕනෑ.

නිහාල් ගලප්පත්ති සහෝදරයා -අපේ ගරු මන්ත්‍රීතුමා- ඉදිරිපත් කරපු සංඛ්‍යා ලේඛන, තොරතුරු වැරදියි කියලායි මා හිතන්නේ. අපේ මත්ස්‍ය ආනයනය වැඩියි, අපනයනය අඩුයි කියන්න තමයි එතුමා මේ ගරු සභාවට කරුණු ගෙනහැර පෑවේ. ඒ නිසා අපි ඒ පිළිබඳ තොරතුරු හදිසියේ ගෙන්වා ගත්තා.

2019 වසර වනකොට මත්ස්‍යය ආනයන වටිනාකම දළ වශයෙන් රුපියල් මිලියන 36,000යි. මත්ස්‍ය අපනයන වටිනාකම දළ වශයෙන් රුපියල් මිලියන 48,000යි. එහි පරතරය රුපියල් මිලියන 15,000කට ආසන්න ප්‍රමාණයක් වනවා. එම නිසා අපේ රටේ මත්ස්‍ය ආනයනයට වඩා අපනයනය වැඩියි. කොහොම නමුත්, මේ වාගේ කීප ගුණයකින් අපේ මත්ස්‍ය අපනයනය වැඩි කරන්න අපි බලාපොරොත්තු වනවා. ප්‍රධාන වශයෙන්,

[ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා]

අපනයනය මඟින් සල්ලි හම්බ කරද්දී, ඉස්සන් කර්මාන්තය ප්‍රධාන තැනක් ගන්නවා.

මා පළාත් ධීවර ඇමතිවරයා හැටියට වැඩ බාර ගනිද්දී අපේ රට තුළ ඉස්සන් නිෂ්පාදනය තිබුණේ මෙට්‍රික්ටොන් 1,500යි. අපි පාවිච්චි කරපු යම් යම් උපාය මාර්ග නිසා අපට පුළුවන්කම ලැබුණා, එම නිෂ්පාදනය මෙට්‍රික්ටොන් 8,000 දක්වා වැඩි කරන්න. මෙට්‍රික්ටොන් 1,500ක් ලෙස තිබුණු එම නිෂ්පාදනය අපි මෙට්‍රික්ටොන් 8,000 දක්වා වැඩි කළා. අපි මේ වනකොට සැලසුම් කරලා තිබෙනවා, බෝ කිරීම සඳහා ඉස්සන් වර්ග ආනයනය කරන්න. සුදු පුල්ලි වයිරසය නිසා ඉස්සන් කර්මාන්තයේ නිෂ්පාදනය අඩු වෙලා තිබුණා. ඉස්සන් අපනයනය වැඩි කිරීම සඳහා සුදු පුල්ලි වයිරසයට ඔරොත්තු දෙන විශේෂ ඉස්සන් වර්ග - මව් සත්තු- මේ වනවිට ආනයනය කරලා තිබෙනවා. SPF monodon, SPF Vannamei ආදි ඉස්සන් වර්ග ආනයනය කරලා, ඒ හරහා ඉස්සන් නිෂ්පාදනය අදට වඩා දහගුණයකින් වැඩි කිරීමයි අපේ ඉලක්කය වෙලා තිබෙන්නේ. අපේ ඉලක්කය, මේ වසර පහ සම්පූර්ණ වනවිට ඉස්සන් අපනයනය විතරක් මෙට්‍රික්ටොන් 100,000 දක්වා වැඩි කිරීමයි.

මිරිදිය ධීවර කර්මාන්තය දෙස බලද්දී පෙනෙනවා, මිරිදිය ධීවර කර්මාන්තය ආශ්‍රිත වැව් 30,000කට ආසන්න සංඛ්‍යාවක් තිබුණත් ඒවා අතරින් මත්ස්‍ය පැටව් තැන්පත් කරන්න පුළුවන් නිත්‍ය ජලාශ හා කාලීන ජලාශ හැටියට තිබෙන්නේ වැව් 10,000ක් විතරයි කියලා. ඒවායෙන් වැව් 2,000කට සරිලන මාළු පැටව් ටිකවත් අපි තවම දාලා නැහැ. වැව් 10,000ක් තෝරා ගෙන මිරිදිය ඉස්සන් විශාල ප්‍රමාණයක් එම වැව් තුළ බෝ කරන්න අපි ඉලක්ක කරගෙන තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමා, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு சனத் நிசாந்த பெரேரா)
(The Hon. Sanath Nishantha Perera)
අපේ ඉස්සන් නිෂ්පාදනයට විශාල ඉල්ලුමක් තිබෙනවා. චීනය ආදි රටවල් අපෙන් ඉස්සන් විශාල වශයෙන් ඉල්ලනවා. මිරිදිය ඉස්සන් නිෂ්පාදනය කරලා මෙට්‍රික්ටොන් 250ක් තමයි අප දැනට අපනයනය කරන්නේ. අපේ ඉලක්කය, මිරිදිය ඉස්සන් මෙට්‍රික්ටොන් 10,000 දක්වා අපනයනය කිරීමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි තහනම් පන්න ක්‍රම නතර කරලා තිබෙනවා. ඒ වාගේම, පනත්, ප්‍රඥප්ති සංශෝධනය කරලා තිබෙනවා. අපේ රටේ සංචාරය කරන මුවාවෙන් ඇවිල්ලා සමහරු අපේ මත්ස්‍ය සම්පත විනාශ කරනවා. සමහර සංචාරකයන්, සංචාරක විලාසයෙන් අපේ රටට ආවාට ඒ අය ඇත්තටම මහා ලොකු සල්ලිකාරයන් නොවෙයි. එයාලා ටිකට් එක විතරක් හදාගෙන එන්නේ, අපේ රටේ තිබෙන මාළු ටික අල්ලාගෙන යන්නයි. ජනතාවට හිතවාදී විධියට, ධීවර ජනතාවගේ ශක්තිය වැඩි කරන විධියට අපි පනත්, ප්‍රඥප්ති සංශෝධනය කරලා තිබෙන්නේ ඒ නිසායි.

අපේ නිහාල් ගලප්පත්ති සහෝදරයා කිව්වා, අප අල්ලාගෙන තිබෙන බෝට්ටු 600 නිදහස් කරනවා කියලා අපේ අතිගරු ජනාධිපතිතුමා ඉන්දියාවට ගිහිල්ලා කියපු බව. රටවල් දෙක අතර ගනුදෙනු කරන කොට යම් යම් දේවල් කරන්න අපට සිදු වෙනවා. අපේ ධීවරයන් ඒ රටේ මුහුදු සීමාවේදි හසු වනවා. ඒ රටේ ධීවරයන් අපේ මුහුදු සීමාවේදි හසු වනවා. ඒ අවස්ථාවලදී ධීවරයන් නිදහස් කර ගැනීම සඳහා අපි රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් කථා කරනවා. හැබැයි, අපි කුමන හෝ රටක් ඉදිරියේ දණ ගහලා නැහැ; කුමන හෝ රටක් ඉදිරියේ දෙකට නැමිලා නැහැ. ඒ අයගේ කාලයේදී වාගේ බෝට්ටු දහස් ගණනක් ඇවිල්ලා, bottom trawling කරලා, අපේ සාගර සම්පත විනාශ කරන කල්, මුහුදු පතුල විනාශ කරන කල් අපි ඇස්, කන් වහගෙන ඉඳලා නැහැ කියන කාරණය මා ඉතාම පැහැදිලිව කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිය පුද කරමින් මා නිහඬ වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. S. Shritharan. You have 14 minutes.

[பி.ப. 4.53]

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் கடற்றொழில் சம்பந்தமான சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் தொடர்பான விவாதம் நடைபெற்றாலும்கூட, நான் ஒரு விடயத்தை முதலில் முன்வைக்க விரும்புகிறேன். 2020 சனவரி மாதம் 18ஆம் திகதி சனிக்கிழமை சனாதிபதியுடன் இந்த நாட்டுக்கான ஐ. நா. வதிவிடப் பிரதிநிதி ஹன்னா சிங்கர் அவர்கள் உரையாடியதன் அடிப்படையில், காணாமல் போனோர் தொடர்பில் சனாதிபதி அவர்கள் வெளிப்படுத்தியிருக்கின்ற கருத்துத் தொடர்பாக 2020 சனவரி 20ஆந் திகதிய தினக்குரல் பத்திரிகையின் யாழ்ப்பாணப் பதிப்பிலே ஒரு செய்தி வெளிவந்திருந்தது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Sir, I propose that the Hon. Mayantha Dissanayake do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මයන්ත දිසානායක මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு மயந்த திசாநாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. WIJEPALA HETTIARACHCHI *left the Chair, and* THE HON. MAYANTHA DISSANAYAKE *took the Chair.*

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

" காணாமல் போனோர் எல்லோரும் இறந்துவிட்டனர்; அவர்கள் இந்த நாட்டில் இல்லை" என சனாதிபதி, ஹன்னா சிங்கர் அவர்களிடம் குறிப்பிட்டதாக அந்தப் பத்திரிகையிலே மிக விலாவாரியாகச் செய்தி வெளியிடப்பட்டிருக்கின்றது.

இந்த நாட்டிலே 2008 - 2009ஆம் ஆண்டுக் காலப் பகுதியில் ஒரு பாரிய இன அழிப்பு யுத்தம் நடைபெற்றது. கடந்த 30 ஆண்டுகளுக்கு மேலாக இங்கு தமிழ் மக்கள் பாரிய அளவில் கொல்லப்பட்டார்கள், அவர்கள்மீது பல்வேறுபட்ட இடங்களில் இனப் படுகொலைகள் மேற்கொள்ளப்பட்டன என்பது நாடறிந்த, உலகறிந்த விடயம். இதனை யாரும் மறுப்பதற்கும் இல்லை, யாரும் நிராகரிக்கவும் முடியாது. அவ்வாறான ஓர் இறுதி யுத்த காலத்திலே - 2009ஆம் ஆண்டிலே சரணடைந்த பொதுமக்களும் போராளிகளும் இராணுவத்தினரால் கொல்லப்பட்டிருக்கிறார்கள் அல்லது காணாமலாக்கப்பட்டிருக்கிறார்கள். அவர்கள் சரணடைந்த தற்கான ஆதாரங்கள் உள்ளன என்பதைப் பல்வேறுப்பட்ட சாட்சியங்கள் சொல்லியிருக்கின்றன. குறிப்பாக, இப்பொழுது ஒரு புதிய கண்டுபிடிப்பாக இந்த நாட்டினுடைய சனாதிபதி, "காணாமல் போனோர் யாருமில்லை; அவர்கள் எல்லோரும் கொல்லப்பட்டுள்ளார்கள்" என்று சொன்னால், இந்த நாட்டுக்குள்ளே யுத்தம் நடந்தபொழுது, முள்ளிவாய்க்காலிலும் வவுனியாவிலும் ஒப்படைக்கப்பட்டவர்கள் எங்கே என்பதற்கு அவருடைய பதில் என்ன? தாய், தந்தையர்களால் ஒப்படைக்கப்பட்டவர்கள், மனைவிமாரால் ஒப்படைக்கப்பட்ட வர்கள் எங்கே? பிள்ளைகள் தாய், தந்தையர்களை ஒப்படைத்திருக்கிறார்கள்; தாய், தந்தையர்கள் பிள்ளைகளை ஒப்படைத்திருக்கிறார்கள். இவ்வாறானவர்களுக்கு என்ன பதிலை இந்த அரசாங்கம் சொல்ல இருக்கின்றது? குறிப்பாக, வணக்கத்துக்குரிய பிரான்சிஸ் அடிகளார் தலைமையிலே 56க்கும் மேற்பட்ட போராளிகள் சரணடைந்து, அவர்கள் கொண்டு செல்லப்பட்டதற்கான ஆதாரங்கள் உள்ளன. அதே காலப் பகுதியிலேயே விடுதலைப் புலிகளின் மூத்த உறுப்பினராக இருந்த பாலகுமாரன் அவர்களும் அவருடைய மகன் சூரியத்தேவன் அவர்களும் இராணுவத்திடம் சரணடைந் திருந்தபொழுது, இராணுவச் சப்பாத்துக் கால்களோடும் இராணுவ உடுப்புக்களோடும் இருந்த இராணுவத்தினர் சுற்றி நிற்க எடுக்கப்பட்ட புகைப்படங்கள் அந்தக் காலத்திலே "லங்கா காடியன்" பத்திரிகையிலே பிரசுரிக்கப்பட்டிருந்தன. இதனைவிட, அப்பொழுது BBC இனுடைய செய்தியாளராக இருந்த பிரான்சிஸ் கரிசன் அவர்கள் தன்னுடைய டுவிட்டரிலும் இந்தப் படங்களை வெளியிட்டு, இந்த நாட்டிலே அரசாங்கத்திடம் சரணடைந்த இவர்கள் எங்கே என்பதற்கான பல்வேறுபட்ட விடயங்கள் முன்வைக்கப்பட்டன.

இவ்வாறு பல ஆயிரக் கணக்கானவர்கள் சரணடைந்து, இன்று காணாமல் போயிருக்கிறார்கள். இன்று 1,200 நாட்களை எட்டும் நிலையிலே அவர்களுடைய தாய், தந்தையர்கள் வவுனியா, முல்லைத்தீவு, யாழ்ப்பாணம், கிளிநொச்சி, திருகோணமலை, மட்டக்களப்பு என்று பல பிரதேசங்களில் போராடிக் கொண்டிருக்கிறார்கள். இந்த நாட்டினுடைய சனாதிபதிதான் அப்பொழுது பாதுகாப்பு அமைச்சின் செயலாளராக இருந்து அந்த யுத்தத்தை வழி நடாத்தினார். அந்த யுத்தத்திலே இவ்வளவு படுகொலைகள் நடந்திருக்கின்றன. சின்னஞ் சிறார்களுக்கு உணவு வழங்கப் படவில்லை. எத்தனையோ பேர் கைது செய்யப்பட்டதன் பிற்பாடு கொலை செய்யப்பட்டிருக்கிறார்கள். இப்படியான குற்றச்சாட்டுக்கள் இருக்கின்ற நிலையிலே, இவ்வாறானதோர் அடிப்படையற்ற அந்தக் கருத்தை நாங்கள் வன்மையாகக் கண்டிக்கின்றோம். மிக முக்கியமாக, 2015ஆம் ஆண்டிலே இலங்கையினுடைய அப்போதைய வெளிநாட்டலுவல்கள் அமைச்சராக இருந்த மங்கள சமரவீர அவர்களினால் ஐக்கிய நாடுகள் சபையிலே, "காணாமல் போனவர்கள், போர் குற்றங்கள் தொடர்பில் நாங்கள் விசாரணைகளை நடத்துகிறோம். இதற்குச் சர்வதேச நாடுகளுடைய ஒத்தழைப்பைப் பெற்றுக்கொள்கிறோம்" என்றெல்லாம் ஒப்புதல் வழங்கப்பட்டதன் பிற்பாடுதான் இந்தப் போர்க் குற்ற விசாரணைகள் தொடர்பான நடவடிக்கைகள்கூட துரிதப் படுத்தப்பட்டு, நியாயமான முறையிலே நீதியின் அடிப்படையிலே விடயங்கள் முன்கொண்டுவரப்பட்டன. இவையெல்லாம் நாட்டிலே நடந்தது என்று அந்த அரசு ஏற்றுக்கொண்டதன் பிற்பாடு, அந்த அரசைப் பிறகு ஏற்றுக்கொள்கின்ற இன்னொரு தரப்பு அதனை நிராகரிப்பதாகக் குறிப்பிடுவது இந்த நாட்டுக்குப் பாரியளவில் அபகீர்த்தியை ஏற்படுத்தும் என்பதை நான் இந்த இடத்திலே பதிவு செய்ய விரும்புகிறேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ஐக்கிய நாடுகள் சபையின் மனித உரிமைகள் ஆணையாளர் 2014 - 2015 கால கட்டத்திலே தன்னுடைய பிரதிநிதிகளாக Mr. Martti Ahtisaari, Ms. Asma Jahangir, Silvia Cartwright என்ற மூன்று பேரை நியமித்திருந்தார். இவர்களின் மேற்பார்வையில் சன்ட்ரா பெய்னாஸ் அவர்களால் எழுதப்பட்ட ஐ.நா. மனித உரிமை உயர் ஸ்தானிகரின் அறிக்கையானது மிகத் தெளிவாகப் பல்வேறுபட்ட விடயங்களைச் சொல்லி இருந்தது. இவ்வாறு ஜஸ்மின் சூக்கா போன்றவர்களின் அறிக்கைகளிலும் பல்வேறுபட்ட தரப்புக்களுக்குப் பல தடவை சொல்லப்பட்டிருக்கின்றன. ஜஸ்மின் சூக்கா அவர்கள் இங்கிருந்த பல கொலை முகாம்கள், சித்திரவதை முகாம் களைப் படங்களோடும் ஆதாரங்களோடும் வெளியிட்டிருக் கின்றார். இவ்வாறான சம்பவங்கள் நடைபெற்றிருக்கின்றன, பல்வேறுபட்டவர்கள் சரணடைந்ததற்கான ஆதாரங்கள் உண்டு. கண்கண்ட சாட்சியங்களாக அவர்கள் கையளிக்கப் பட்டிருக்கின்றார்கள். அவ்வாறு கையளிக்கப்பட்டவர்கள் இப்பொழுது இல்லையென்றால் இந்த நாட்டினுடைய நீதி எங்கே செல்லப் போகின்றது? இந்த நாட்டினுடைய நியாயம் என்னவாக அமையப் போகிறது? உலக நாடுகள் இதற்கு என்ன பதிலைச் சொல்லப் போகின்றன? விசாரணை நடத்துகிறோம், மனித உரிமைகளைப் பேணுகிறோம், மனித உரிமைகளுக்குப் பதில் சொல்கிறோம் என்று சொன்ன இந்த நாட்டிலே, இப்பொழுது எதுவும் நடக்கவில்லை, யாரும் இங்கே உயிருடன் இல்லை என்று கையை விரித்தால், இதற்கான பதில் என்ன? இதற்கான நீதி, நியாயம் என்ன? இதற்கான பதிலை யார் சொல்லப் போகிறார்கள்?

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ஓர் இனம் அழிக்கப்பட்டிருக்கின்றது. அந்த இனத்தின்மீதான படுகொலை மிக மோசமாகக் கட்டவிழ்த்து விடப்பட்டிருக் கின்றது. 20ஆம் நூற்றாண்டின் இறுதியிலும் 21ஆம் நூற்றாண்டின் ஆரம்பத்திலும் இந்த உலகம் வெட்கித் தலைகுனியக் கூடியளவுக்கு மிகப் பெரிய மனிதப் படுகொலை இந்தப் பூமிப் பந்திலே நடந்திருக்கின்றது. இதற்கான நீதியான விசாரணையைச் சரியான முறையில் செய்யத் தவறினால், நாளை இதைப்போல இன்னுமொரு நாட்டிலே நடக்கும் பிரச்சினைகளுக்கு ஐக்கிய நாடுகள் சபையினால் என்ன செய்ய முடியும்? மனித உரிமைகள் ஆணைக்குழுவினால் என்ன செய்ய முடியும்? யார் இதற்குரிய நீதியைப் பெற்றுத் தரப் போகிறார்கள் அல்லது யார் இதற்குரிய நீதியைச் சொல்லப் போகிறார்கள்? உலக நாடுகள் எல்லாம் திரண்டு,

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

தமிழர்களுடைய தேசிய விடுதலைப் போராட்டத்தையும் அவர்களுடைய தேசிய விடுதலைக்கான ஆணிவேரையும் பிடுங்கி எறிவதற்கு முழுமையான ஒத்துழைப்பைக் கொடுத் திருந்தன. இன்று, மனித உரிமைகள் நிராகரிக்கப்பட்ட நிலையில், காணாமல் போனவர்களுக்குரிய நீதி கிடைக்காத நிலையில், இவர்கள் அதற்காகப் போராடுகின்றபொழுது உலக நாடுகளுடைய பதில் என்னவாக இருக்கப் போகிறது?

எதிர்வரும் பெப்ரவரி மாத இறுதியிலிருந்து மார்ச் மாத இறுதி வரையும் ஜெனிவாவிலே மனித உரிமைகள் மாநாடு நடைபெற இருப்பதாக நான் நினைக்கின்றேன். அதிலே இலங்கைமீது சரியானதோர் அழுத்தம் பிரயோகிக்கத் தவறினால், இந்த உலகப் பந்திலே நீதியற்ற மனிதர்களாக, நீதி கிடைக்காத ஓரினமாக, தமிழினம் நிராகரிக்கப்பட்ட இனமாக மாற்றப்படுமென்பதை உலகத் தலைவர்களுக்கு நான் இந்தச் சபையினூடாகச் சொல்லி வைக்க விரும்புகிறேன். மிக முக்கியமாக, அழிக்கப்பட்ட ஒரு தேசத்திலிருந்து, அழிந்து போன மக்கள் குழாமிலிருந்து, இன அழிப்புச் செய்யப்பட்ட ஒரு தேசத்திலிருந்துதான் எங்களுடைய உரிமைக் குரல்களை நாங்கள் முன்வைக்கிறோம். வெறுமனே அபிவிருத்தி மூலாம் பூசப்பட்ட அல்லது எங்களுடைய மக்களின் உரிமைகள் நிராகரிக்கப்பட்ட ஓர் இனமாக உங்களிடம் நாங்கள் எதையும் கெஞ்சிக் கேட்கவில்லை. நடந்த அநியாயமான சம்பவங் களுக்கு நீதி வேண்டுமென்பதுதான் முக்கியமானது. இந்த நீதி தொலைக்கப்படக்கூடாது. உண்மைகள் கண்டறியப்பட்டு, நீதி நிலைநாட்டப்பட வேண்டும். இந்த நாட்டிலே இவ்வாறான ஓர் அனர்த்தம் மீண்டும் நடைபெறாது என்பதற்கான ஓர் உத்தரவாதம் வழங்கப்படும் வரைக்கும், இந்த நாட்டினுடைய ஜனநாயகம் எவ்வாறு அமையப் போகின்றது என்பதற்கு இலங்கை அரசுகள்தான் பதில் சொல்ல வேண்டும் என்பதை நான் இந்த இடத்திலே பதிவு செய்ய விரும்புகிறேன்.

இலங்கையிலே நடந்த இறுதி யுத்தத்தின்போது மேற் கொள்ளப்பட்ட போர்க்குற்றங்கள் தொடர்பில் Channel 4 நான்கு தடவை ஆதாரங்களை வெளியிட்டிருக்கின்றது. Channel 4 தொலைக்காட்சி ஊடாகக் கொண்டுவரப்பட்ட ஒவ்வோர் உண்மையும் ஒவ்வோர் போர்க்குற்றச் சாட்சியமும், கைது செய்யப்பட்டவர்கள், சரணடைந்தவர்கள் கொல்லப் பட்ட சம்பவங்கள் எவ்வாறெவ்வாறெல்லாம் நடைபெற்றன என்பதற்குப் ஆதாரங்களாக உள்ளன. சரணடைந்தவர் களுடைய விபரப்பட்டியல் உண்டு. சரணடைந்தமைக்கான கண்கண்ட சாட்சியங்கள் உண்டு. இவ்வாறான ஒரு நிலையிலே, நாட்டினுடைய அதியுத்தம ஜனாதிபதி அவர்கள் இவற்றை நிராகரிப்பாரானால், அது அவர் நாட்டினுடைய ஜனாதிபதியென்ற செயற்பாட்டிலே, தன்னுடைய வாக்கிலே அடிப்படையற்ற தன்மையை வெளிப்படுத்துகின்றார், நீதிக்குப் புறம்பாக நடக்கின்றார் என்பதையே வெளிப்படையாகக் காட்டும்.

2000ஆம் ஆண்டு காலப்பகுதியில் மிருசுவில் பகுதியில் எட்டுப் பேர் கொலை செய்யப்பட்டமை தொடர்பாகக் கைது செய்யப்பட்டு மரண தண்டனை விதிக்கப்பட்ட படை வீரர் ஒருவர் எந்தவொரு சத்தம் சந்தடியுமில்லாமல் அண்மையில் ஜனாதிபதியால் பொது மன்னிப்புக் கொடுக்கப்பட்டு விடுதலை செய்யப்பட்டிருக்கின்றார். இது மிக மோசமான ஒரு காரியம். எட்டுப் பேர் கொலை செய்யப்பட்டிருக்கிறார்கள். அவர்களின் குடும்பத்தினருக்கு இதுவரை நீதி கிடைக்கவில்லை. முன்னாள் பாராளுமன்ற உறுப்பினர் ரவிராஜ் அவர்களின் கொலை தொடர்பில் இதுவரை நீதி கிடைக்கவில்லை. ஜோசப் பரராஜசிங்கம் அவர்களின் கொலை தொடர்பில் இதுவரை நீதி கிடைக்கவில்லை. குமார் பொன்னம்பலம் அவர்களின் கொலை தொடர்பில் இதுவரை நீதி கிடைக்கவில்லை. சிவனேசன் அவர்களின் கொலை தொடர்பில் இதுவரை நீதி கிடைக்கவில்லை. ஆனால், குறித்த கொலை செய்தவரை எந்தச் சத்தமுமில்லாமல் இந்த நாட்டின் ஜனாதிபதி விடுதலை செய்திருக்கின்றார். ஜனாதிபதி பல விடயங்களை அறிவிக் கின்றார். மக்களுக்குப் பல செய்திகளைச் சொல்கின்றார். இவ்வாறான ஒரு நிலையில் இந்தச் செய்திகள் இந்த நாட்டிலே மக்களுக்குச் சரியானதாக அமையுமா? இந்த நாட்டிலே வாழ்கின்ற மக்களிலே இரண்டு முக்கியமான தேசிய இனங்கள் உள்ளன. நாங்கள் சிங்களத் தேசிய இனத்தை ஏற்றுக் கொள்கின்றோம். அதேநேரம், தமிழ்த் தேசிய இனம் அழிக்கப்பட்டிருக்கின்றது. அவர்களுடைய தேசிய வாழ்வு அழிக்கப்பட்டிருக்கின்றது. அந்த இனம் திட்டமிட்டு அழிக்கப் பட்டிருக்கின்றது.

அண்மையில், மன்னார் மாவட்டத்திலே உள்ள பனை அபிவிருத்திச் சபைக்குக் கீழ்வரும் தும்புத் தொழிற்சாலை யினுடைய ஆரம்ப விழாவுக்கு வருகை தந்து, அதன் பெயர்ப் பலகையைத் திறந்துவைத்த சிங்கள இனத்தைச் சேர்ந்த அமைச்சர் கௌரவ விமல் வீரவங்ச அவர்கள் சிங்கள இனத்தின் வெறித்தனத்தோடு நடந்திருக்கிறார். முதலாவதாகத் தமிழ்மொழி எழுதப்பட்டிருந்த அந்தப் பெயர்ப் பலகையைச் சிங்கள மொழி முதலாவதாக இடம்பெறும்படி மாற்றி எழுதி, திரும்பவும் நிறுவியிருக்கிறார் என்றால், அவர் சிங்கள இன வெறியை எவ்வாறு ஊட்டுகின்றார் என்பதை கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே நீங்கள் புரிந்துகொள்ளுங்கள்! இந்த நாட்டிலே எங்கெங்கு தமிழர்கள் கூடுதலாக வாழுகின்றார்களோ, அவர்கள் வாழுகின்ற அந்தப் பிரதேசங்களில் அவர்களின் மொழிக்கு முன்னுரிமை வழங்கப்பட வேண்டும் என்பது சட்ட ரீதியாக ஏற்றுக் கொள்ளப்பட்டிருக்கின்றது. கடந்த அரசாங்க காலத்திலே கௌரவ அமைச்சர் மனோ கணேசனுடைய தலைமையிலே இது மிகத் தெளிவாக நடைமுறைப்படுத்தப்பட்டது. அதற்காக கௌரவ அமைச்சர் மனோ கணேசன் அவர்கள் பல தடவை முயற்சி பண்ணியிருந்தார். அந்த முயற்சிகள்கூட இன்று மழுங்கடிக்கப்பட்டு, விமல் வீரவங்ச அவர்களால் அந்தப் பெயர்ப்பலகை மாற்றப்பட்டிருக்கின்றது. இது மிக அபத்தமான ஒரு செயலாகும். நீதிக்குப் புறம்பாக, ஒற்றுமைக்குப் புறம்பாக, இந்த நாட்டிலே வாழுகின்ற ஒரு பகுதி மக்கள் தங்களுக்கு அடிமையாகத்தான் இருக்கவேண்டும் என்று சொல்லுகின்ற வகையில் சிங்கள - பௌத்த மேலாதிக்கச் சிந்தனையோடு விமல் வீரவங்ச அவர்களால் அந்தப் பெயர்ப்பலகை மாற்றப்பட்டிருப்பது மிக மோசமான ஒரு காரியம் என்பதையும் நான் இந்த இடத்திலே பதிவுசெய்ய விரும்புகின்றேன். இந்த நாடு நீதியின் பாதையில், நியாயமான பாதையில் செல்லவேண்டுமானால், சத்தியத்தின் வழியில் இந்த நாடு இருக்கவேண்டும் என்றால், கௌதம புத்தருடைய கொள்கைகளை இந்த நாட்டிலே இருக்கின்ற ஒவ்வொருவரும் பின்பற்றுவதாக இருந்தால், உண்மை, நீதி, கருணை, காருண்யம் உள்ள மனிதர்களாக நீங்கள் இருந்தால், இந்த நாட்டிலே வாழுகின்ற ஏனைய தேசிய இனங்களைக் கௌரவிக்கவும் மதிக்கவும் முதலில் நீங்கள் தயாராக வேண்டும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, குறித்த விடயங்களில் உலக நாடுகளினுடைய குறிப்பாக அமெரிக்க, ஐரோப்பிய, இந்தியா போன்ற நாடுகளுடைய பங்களிப்பு இல்லாத ஒரு நிலைமையில், இந்த நாட்டிலே ஒருபொழுதும் நீதி கிடைக்கப்போவதில்லை. மேதகு ஜனாதிபதி

அவர்களுடைய கருத்தாக இருக்கட்டும், அவரால் வளர்க்கப்படுகின்ற விமல் வீரவங்ச போன்ற அமைச்சர்களுடைய துவேஷமான பேச்சுக்களாக இருக்கட்டும், செயற்பாடுகளாக இருக்கட்டும், அவை இந்த நாட்டுக்கான நீதியாக அமையாது. நாங்கள் நீதிக்காகப் போராடுகின்ற ஓர் இனம். நாங்கள் கொல்லப்பட்டவர்கள்; அழிக்கப்பட்டவர்கள். நாங்கள் சாம்பல் மேட்டிலே இருந்து நிமிர்ந்து நிற்கின்ற ஓர் இனம். அந்தவகையில், எங்களுடைய நீதிக்காக மீண்டும் மீண்டும் நாங்கள் போராடிக் கொண்டேதான் இருக்கின்றோம். அந்த உண்மைகளைப் புரிந்து நீதியை நிலைநாட்டுவதற்கு முதலில் நீங்கள் தயாராகுங்கள். பொருளாதாரம் என்பது இன சௌஜன்யத்திலும் ஓர் இனத்தினுடைய ஒற்றுமையிலும் அந்த இனத்தினுடைய சக வாழ்விலும்தான் தங்கியிருக்கின்றது. வெறுமனே ஓர் இனத்தை அடக்கி, அந்த இனத்தை அழித்துவிட்டு, அந்தச் சாம்பல் சாம்ராஜ்யத்திலே தங்களுடைய பொருளாதாரத்தைக் கட்டி எழுப்பலாம் எனக் கருதுவது பகல் கனவாகவே அமையும் என்பதைக் கூறி, நிறைவு செய்கின்றேன். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

ඊළඟට, ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා.5.08]

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා

(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)

(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම හිටපු ධීවර ඇමතිවරයා හැටියට මම නව ධීවර හා ජලජ සම්පත් ඇමතිවරයාටත්, රාජ්‍ය ඇමතිවරයාටත් ශුභ පතනවා. අපේ ඩග්ලස් දේවානන්දා මැතිතුමාත්, අපිත් බොහොම හිතවත් මිත්‍රයන්. අපි එකතුවෙලා මේ ප්‍රශ්න පිළිබඳව දීර්ඝ කාලයක් සාකච්ඡා කළා. එසේ සාකච්ඡා කරලා අපි සාමූහික තීරණ ගත්තා. උතුරු නැඟෙනහිර පමණක් නොවෙයි, මුළු රටේම සිටින සිංහල, දෙමළ, මුස්ලිම් ධීවර ප්‍රජාවට අපි ඒකාකාරව සැලකුවා. මා කනගාටු වෙනවා, ශ්‍රීතරන් මන්ත්‍රීතුමාගේ කථාවේදී භාෂා ප්‍රශ්නයක් ඇදගෙන කථා කිරීම ගැන. මෙවැනි ප්‍රශ්න ඇදගෙන දෙමළ ජනතාව අන්තවාදයට තල්ලු කරන්න වැඩ කරනවා නම්, එය අපේ රටට ගැළපෙන්නේ නැහැ කියලා මා හිතනවා.

අපි දන්නවා, පැය විසිහතරෙන් රාජ්‍ය භාෂාව සිංහල භාෂාව කරනවා කියලා 1956දී අපි දේශපාලන වශයෙන් ජයග්‍රහණ ලබා ගත් බව. එහෙම කරලා, එයට සාධාරණය ඉෂ්ට කරන්න බණ්ඩාරනායක මැතිතුමා සූදානම් වනකොට එදා මේ රටේ හිටපු සමහර පූජක කාරකාදීන් එයට විරුද්ධ වුණා. අවසානයේදී මොකද වුණේ? සියයට 50, සියයට 100 වුණා. අන්තිමේදී සිංහල අයට සිංහල භාෂාවෙනුත්, දෙමළ අයට දෙමළ භාෂාවෙනුත් වැඩ කරන්න තමයි සිද්ධ වුණේ. "භාෂා දෙකයි එක රටයි, එක භාෂාවයි රටවල් දෙකයි" කියලායි එදා ආචාර්ය එන්.එම්. පෙරේරා, කොල්වින් ආර්. ද සිල්වා වැනි වමේ දේශපාලනඥයෝ කිව්වේ. අද ඒක ඔප්පුවෙලා තිබෙනවා. ඒ නිසා අපි මේවායින් පාඩම් ඉගෙන ගෙන, අපේ රටේ සැබෑ සමාජ පරිවර්තනයක් සඳහා, ජන ජීවිතය දියුණු කිරීම සඳහා සාමූහික ප්‍රයත්නයක් දැරිය යුතුයි. භාෂාවේ අයිතිය, ඔවුන්ගේ ජීවත් වීමේ අයිතිය ලබා දිය යුතුයි; ඒවා තහවුරු කළ යුතුයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක තිබෙන මූලික අයිතිවාසිකම් ඔවුන්ට ලැබිය යුතුයි කියන එක අපි පළමුව විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, කරදිය, මිරිදිය, කිවුල්දිය කියන අංශ තුනේම ධීවර කර්මාන්තය අපේ රටේ සිද්ධ වෙන බව. මේ රටේ ධීවර ජනතාව මේ අංශ තුනෙන් අපේ දළ ජාතික නිෂ්පාදනයට සියයට 1.4ක දායකත්වයක් ලබා දෙනවා. එය මුදලින් ගත්තොත්, ඇමෙරිකානු ඩොලර් මිලියන 1,300ක් පමණ වෙනවා. අපේ මාළු අස්වැන්න ටොන් ලක්ෂ 5කට ආසන්නයි. ඒ වාගේම සමස්ත ශ්‍රම බලකාය සියයට 3.7යි; පුද්ගලයන් 575,000ක් පමණ ඉන්නවා. මෙය රටේ ජාතික නිෂ්පාදනයක්. රටේ මේ නිෂ්පාදනය අපි වැඩි කරන්නේ කොහොමද? නිෂ්පාදනය වැඩි කරන්න ඕනෑ නිකම් නොවෙයි. පරිසරය ආරක්ෂා කරගෙන, ධීවර අපරාධ - fisheries crimes - සිද්ධ වෙන්නේ නැති විධියටයි එය කළ යුත්තේ. ධීවර අපරාධ සිද්ධවන එක ගැන අපි නෝර්වේ රාජ්‍යය සමඟත්, අසල්වැසි රාජ්‍යයන් සමඟත් සාකච්ඡා කරලා ගිවිසුම්වලට එළඹුණා. අපි දන්නවා, ඉන්දියානු ධීවරයන් ආක්‍රමණශීලීව ඇවිල්ලා, bottom trawling කරලා, අපේ මුහුදු පත්ල සම්පූර්ණයෙන්ම විනාශ කර දමා තිබෙන බව. අපි එයට මුහුණ දෙන්න ඕනෑ. අපි එයට මැදිහත්වෙලා, ඒ පිළිබඳව සාකච්ඡා කරලා එකඟතාවලට පැමිණියා. ඒවා ක්‍රියාත්මක විය යුතුයි. ඒවා කල් දමන්න, මඟ හරින්න, පසුබාන්න පුළුවන්කමක් නැහැ.

විශේෂයෙන්ම මේ සාගර පත්ල ගවේෂණය කරන්න නෝර්වේ රාජ්‍යයේ ෆ්‍රිජට් නැන්සන් නෞකාව මීට අවුරුදු 40කට කලින් ආවා. මා ධීවර ඇමති වශයෙන් සිටි කාලයේ ඒ නෞකාව නැවත ඇවිල්ලා මේ රටේ තිබෙන ධීවර සම්පත් ගැන සම්පූර්ණයෙන් ගවේෂණය කළා. ඒ වාර්තාව අපට ලැබුණා. ඒ වාර්තාවේ නිර්දේශ, ඒ වාර්තාවෙන් ලබාගත් දත්ත සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග මොනවාද? මා දැක්කා, ඊයේ පෙරේදා චීන නැවකුත් ඇවිල්ලා ගවේෂණයක් කළ ආකාරය. අපට ප්‍රශ්නයක් තිබෙනවා. මා කියන්නේ නැහැ, චීන නැවක් ඇවිල්ලා ගවේෂණය කළ එකට මා විරුද්ධයි කියලා. නමුත් හැම රටක්ම මේ විධියට ගවේෂණය කරන්නේ මොන හේතුවකටද, මොන කාරණාවකටද? ඒවායෙන් අපේ රටට තිබෙන වැදගත්කම මොකක්ද කියන ප්‍රශ්නය අපි ගරු ඇමතිතුමාගෙන් අහනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ ගැන සොයා බලන්න.

මා මතක් කරන්න කැමැතියි, අපේ කාලයේ ධීවර වරායන් ප්‍රතිසංවිධානය කළ බව. ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, කලමැටිය ධීවර වරාය, ගාල්ල නව ජැටිය, මයිලෙඩ්ඩි වරාය අපි ආරම්භ කළ බව. අපේ ආණ්ඩුව කාලයේ ඒවා විවෘත කළා. අපේ රාජ්‍ය ඇමතිතුමාගේ දිස්ත්‍රික්කයේ වෙල්ලමංකරේ ධීවර වරාය අපි ආරම්භ කළා. ඊළඟට බලපිටිය ධීවර වරාය, මීගමුව කළපුව සංවර්ධනය කළා. මෙය විශේෂ වැඩ පිළිවෙළක්.

අපි දන්නවා, අද සුළු වර්ෂාපතනයක් ඇති වුණත් සමහර ප්‍රදේශ යට වන බව. මුතුරාජවෙල ගොඩ කිරීම නිසා වත්තල ප්‍රදේශය යට වෙනවා. ඒ ප්‍රදේශයේ ජන ජීවිත අවුල් වෙනවා. ඊළඟට කටාන, මීගමුව යන ප්‍රදේශ සියල්ලම යට වෙනවා. එතකොට එම නගරවල වැසියන්ගේ, ගම්වාසීන්ගේ ජන ජීවිතය අවුල් වෙනවා. එය නිවැරදි කිරීම සඳහා තමයි අප මේ කළපු සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කළපු සංවර්ධන ව්‍යාපෘතියේදී අප අවධානය යොමු කළ මූලික කාරණා කිහිපයක් තිබෙනවා. එක්දින යාත්‍රා සහ බහුදින යාත්‍රා ආරක්ෂාකාරීව හා ක්‍රමවත්ව නැවතීමේ පහසුකම් සැලසීම, මත්ස්‍ය වෙන්දේසිය සිදු වන කාලයේදී ලෙල්ලම හා ඒ අවට ප්‍රදේශවල ඇති වන රථ වාහන තදබදය සඳහා විසඳුම් ලබා දීම. මීගමුව කළපුව හා ඒ අවට ප්‍රදේශවල පරිසර සංරක්ෂණය, පරිසරය අලංකාරවත් කිරීම හා ක්‍රමවත්ව පවත්වාගෙන යාම, ජල බස්නා ක්‍රම, ඇළ මාර්ගවල ජලය පහසුවෙන් සංසරණය වීම සඳහා, ඒවායේ පිරී ඇති රොන් මඩ ඉවත් කිරීම, අවශ්‍ය ස්ථානවල

[ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා]

කළපු ගැඹුරු කිරීම කියන කාරණාවලට තමයි අප එහිදී මුල් තැන දුන්නේ. ඒ දේවල් නොකර, එම ව්‍යාපෘතිය සාර්ථකව නිම කරන්න පුළුවන් කියලා මා විශ්වාස කරන්නේ නැහැ,

මීගමුව උසාවිය හැදුවා. අපි තීරණය කළා, ලෙල්ලම මත්ස්‍ය අළෙවි මධ්‍යස්ථානය දියුණු කරන්න. මූලික අවශ්‍යතාව වන්නේ කඩොලාන ආරක්ෂා කිරීමයි. මොකද, කළපුවක් කියන්නේ මත්ස්‍ය සම්පතේ අභිජනන මධ්‍යස්ථානයක්. එහෙම නම්, ඒ අභිජනන මධ්‍යස්ථානයේ තිබෙන ජෛව විවිධත්වය, ශාක ටික අපි ආරක්ෂා කරන්න ඕනෑ. නමුත් අභාග්‍යයකට වාගේ, ඒ කටයුතු හරියාාකාරව සිද්ධ වෙන්නේ නැහැ. අගරදගුරු මැදූරේදී, අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් 2018.08.30වන දා අපි මේ ධීවර ගැටලු ගැන සාකච්ඡා කළා. හලාවත අගරදගුරුතුමාත් එයට සහභාගි වුණා. එහිදි එම කාරණා පිළිබඳව උන්වහන්සේ දීර්ඝ වශයෙන් අප දැනුවත් කළා. අපේ ප්‍රසන්න ගිනිගේ අධ්‍යක්ෂතුමා, අද රාජ්‍ය නිලධාරින්ගේ මැදිරියේ ඇති කියලා මම හිතනවා. සිදු වූ ඒ විනාශය ගැන එතුමා දන්නවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)

සංචාරක ව්‍යාපාරයේ යොදවන යාන්ත්‍රික බෝට්ටුවලින් නිකුත් වන තෙල් ජලයට මුසු වීම නිසා කඩොලාන පරිසරය විනාශ වෙනවා. එම ශාක සහ පරිසරය ආරක්ෂා කිරීමට තමයි කළපු සංවර්ධන ව්‍යාපෘතියේදී මුල් තැන දෙන්න ඕනෑ. කළපු කියන්නේ, මත්ස්‍ය අභිජනනය සඳහා තිබෙන තෝතැන්නක්. එම තෝතැන්න විනාශ කරන්නේ නැතිව එය ආරක්ෂා කිරීම අතිශයින්ම වැදගත් කියලා මා විශ්වාස කරනවා.

ඊළඟට, අපි මිරිදිය ධීවර කර්මාන්තය අරගනිමු. උඩවලව ජලාශයේ අද පිහිනන මාළුවා අරගෙන, ටින් මාළු ලෙස සකස් කරලා හෙට දෙන්න අපට පුළුවන්කම තිබුණා. අපේ කාලයේ අපි ඒක කළා; ඒවා ඉතාම රසයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු ගණන් පල් වුණු, ජරා වුණු, කුණු වුණු, පණුවෝ ගහපු සැමන් පිට රටින් ගෙන්වනවාට වඩා එය හොඳයි. හැබැයි, අපේ වැව්වල මත්ස්‍ය සනත්වය අඩුයි. ඒ කටයුතු දියුණු කරන්න සඳහා රජයෙන් මුදල් වෙන් වෙනවා මදි. ඒ, එක කාරණාවක්.

ගරු ඇමතිතුමනි, වැව් දසදහසක මත්ස්‍ය පැටවු දමන්න ඕනෑ කියලා ඔබතුමා කිව්වා. ඒක ඉතා හොඳයි. මමත් ඒක පටන් ගත්තා. අපිත් වැව්වලට මාළු පැටවුන් දැම්මා. අපි අලුතින් වැව් සිය ගණනක් හැදුවා. ඒවායේ මත්ස්‍ය පැටව් දමන්න පුළුවන්කම තිබෙනවා. හැබැයි, එම වැව්වල මත්ස්‍ය සනත්වය නිසි අයුරින් පවත්වාගෙන යා යුතුයි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාත්, මමත් සහභාගි වුණා නේ, "තැප්‍රොබේන්" එකේ පැවති සමුළුවකට. මේ වැඩ පිළිවෙළ උතුරු, නැඟෙනහිර රැකියා ප්‍රශ්නයට හොඳ විසඳුමක්. ලක්ෂ එකහමාරකට රැකියා දෙන්න පුළුවන්. ඩොලර් බිලියන පහක ආදායමක් ලංකාවට ගෙනෙන්න පුළුවන්. ඒ අයට ඒ අවස්ථාව සලසන්න. එදා අපි ඒ යෝජනා ඉදිරිපත් කළා. මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිතුමාට කිව්වා; ධීවර සම්මේලන පැවැත්වුවා. මාළුවෙක් දෙන්නෙක් අල්ලාගෙන කාලා, කසිප්පු ටිකක් බීලා, අරක්කු ටිකක්, හැලි අරක්කු ටිකක් බීලා නිදා ගන්නා අහිංසක ධීවරයා ගෙන්වලා, ඔවුන්ට මේ සමාජයේ වටිනාකමක්, අගයක් තිබෙනවාය කියන එක අපි ඔප්පු කළා. ඒ අය සමාජයේ වැදගත් පුද්ගලයන් හැටියට හඳුන්වන්න, ඔවුන්ගේ ආර්ථිකය දියුණු කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අපි සියලු සැලසුම් හදලා තිබෙනවා.

මට ගොඩක් දේවල් කථා කරන්න තිබෙනවා. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙලාව අවසන් කියලා කියන්න ඔබතුමා මගේ මුහුණ බලනවා. මම කැමැති නැහැ, ඔබතුමා අපහසුතාවට පත් කරන්න.

ගරු ඇමතිතුමනි, අපි මේ කටයුතුවලට සහාය දෙන්නම්; උදව් කරන්නම්. මේ තිබෙන සමහර අඩුපාඩුකම්, දුර්වලකම් මඟ හරවාගෙන, උතුරේ ඉඳලා දකුණට යනතුරු, කල්පිටියට යනතුරු අපි ධීවර කර්මාන්තය දියුණු කරමු. මුහුදු කූඩැල්ලෝ, කකුළුවෝ, ඉස්සෝ ආදියෙන් රටට විශාල ආදායමක් ලබා ගන්න පුළුවන්. අපට තිබෙන විදේශ විනිමය ප්‍රශ්නයට ඒක ලොකු උත්තරයක් වේවි. ගරු ඇමතිතුමනි, ඒ හැම කටයුත්තකටම අපි ඔබතුමාට සහාය දෙනවා; රාජ්‍ය ඇමතිතුමාට සහාය දෙනවා. මේ නියෝග ටික හොඳයි. මේ නියෝගවල සඳහන් වන තව එක කරුණක් ගැන කියලා මම කථාව අවසන් කරන්නම්. ඔබතුමා මෙන්න මේ කාරණය ගැන පොඩ්ඩක් සාකච්ඡා කරන්න, ගරු ඇමතිතුමනි.

නියෝග අංක 1 සහ 2 සම්බන්ධයෙන් මා ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. අංක 2 නියෝගය මඟින් කියන්නේ දේශීය ධීවර බෝට්ටු තුළ spearguns තබා ගැනීම නොකළ යුතුයි කියන එකයි. රත්මලාන ප්‍රදේශයේත්, තවත් සමහර ප්‍රදේශවලත් විදේශිකයන් ඒවා භාවිතය ක්‍රීඩාවක් - sport එකක් - හැටියට සලකනවා. දැන් ඒ සඳහා යම් කිසි නීති රීති දාලා තිබෙනවා. ඊළඟට, outboard engines සවි කරගෙන තනි බෝට්ටුවේ පන්න ක්‍රමයට යන අය ඉන්නවා. කකුලේ තමයි යොත ගැට ගහ ගන්නේ. තනි අතින් තමයි ක්‍රියා කරවන්නේ. හැබැයි, ඒ වාගේ කෙනකුට ලොකු මාළුවෙක් හසු වුණොත් මාළුවා ගන්න සමහර විට යකඩ කූරක් අවශ්‍ය වෙනවා. ඒක ගෙන්වන එකත් තහනම් කරලා තිබෙනවා. ඒ වාගේ දේවල් නිසා මේ ධීවරයන් අපහසුතාවට පත් වෙලා ඉන්නවා. ඒ නිසා තෙප්පම්, පිටත එන්ජිම - outboard engines - සවි කරපු යාත්‍රා, බහුදින යාත්‍රා, එක්දින යාත්‍රා -මේවා- ගැන සොයා බලා, සාකච්ඡා කර තීරණ ගන්න කියා ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් මම රජයට එක කාරණයක් කියන්න කැමැතියි. අපේ කාලයේ ධීවර ජනතාවට රුපියල් 70ට ලාම්පු තෙල් දුන්නා. දැන් මේ රටේ ධීවර ජනතාවට ලාම්පු තෙල් මිල වැඩි වන ඉඟිය ඇවිත් තිබෙනවා. ලාම්පු තෙල් සහනය ඒ කාලයේ ගත්තේ මමත්, ගරු කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමාත්, මගේ රාජ්‍ය ඇමතිතුමාත් මංගල සමරවීර ඇමතිතුමා එක්ක, මුදල් අමාත්‍යාංශය එක්ක ලොකු අරගළයක් කරලායි. ඒක ධීවර අමාත්‍යාංශයේ නිලධාරින් දන්නවා. කරුණාකර, ඒ ලාම්පු තෙල් සහනාධාරය ධීවර ජනතාවට ඉදිරියටත් පවත්වා ගෙන යන බවට සහතිකයක් අපට රජයෙන් අවශ්‍යයි කියන එක මතක් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මමත් කැමැතියි, dynamite fishing ක්‍රමය සම්බන්ධව ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්න. Dynamite fishing ක්‍රමයත් ලංකාවේ හැම තැනකම තිබෙනවා. ඒක හරි භයානකයි. මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි, ඒ

dynamite fishing ක්‍රමය පිළිබඳවත් යම් කිසි වැඩ පිළිවෙළක් හදන්න කියලා.

මීළඟට, ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.භා.5.19]

ගරු චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වැදගත් විවාදය ආරම්භ කරන්න කලින් මා මතක් කරන්න කැමැතියි, ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමා මේ සභාව නොමඟ යැවීමක් කරන්න උත්සාහ ගත් බව. එතුමා මේ අවස්ථාවේ සභාවේ නොසිටියත් මම ඒ ගැන පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. කිසිදු ආකාරයකින් උතුරු ප්‍රදේශයේ සිංහල භාෂාවෙන් පමණක් කටයුතු කිරීමට උත්සාහයක් අරගෙන නැහැ. පැහැදිලිවම භාෂා තුනෙන්ම ඒ boards සවි කර තිබෙනවා. උතුරු නැඟෙනහිර පමණක් නොවෙයි, සියයට 98ක් සිංහල බෞද්ධ ජනතාව ජීවත් වන අපේ ප්‍රදේශවලත් භාෂා තුනෙන්ම කටයුතු කිරීමට රජය කටයුතු කරනවාය කියන එක පැහැදිලිව කියන්න ඕනෑ. ඒ නිසා ජනතාව නොමඟ යවන්න එපා කියා ඉල්ලා සිටිනවා.

ඒ විතරක් නොවෙයි. එදා ත්‍රස්තවාදය නැති කරන්න කටයුතු කරපු, අසාධාරණකම් සිදු වුණු රණ විරුවන්ට නිදහස ලබා දෙනවා කියන එක අතිගරු ජනාධිපතිතුමා එතුමාගේ මැතිවරණ සමයේදීම ප්‍රකාශ කළා. එවන් එක් අවස්ථාවක් අරගෙන, අසාධාරණයක් වුණු රණ විරුවකුට සාධාරණය ඉටු වුණු වෙලාවක ඒ පිළිබඳව විවේචනාත්මකව කථා කරන්න එපා, මේ රටින් පිට උදවියට වෙනත් අදහස් දෙන ආකාරයට. අපි ත්‍රස්තවාදය නැති කරලා ඉවරයි. අද සිංහල වේවා, දෙමළ වේවා, මුස්ලිම් වේවා, ඒ සියලුදෙනාටම එක ආකාරයට සලකන රජයක්, පාලන ක්‍රමයක් තමයි උදා වෙලා තිබෙන්නේ.

අද දින ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමා විසින් මෙම නියෝග ඉදිරිපත් කිරීම සම්බන්ධව මා ස්තුතිවන්ත වෙනවා. මේ බොහොමයක් නියෝග ඉතාම වැදගත්. අපද්‍රව්‍ය බැහැර කිරීම වැළැක්වීම සඳහා වූ නියෝග ධීවර රැකියාවට වාගේම සංචාරක කටයුතුවලට ඉතාම වැදගත් වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ නියෝග ක්‍රියාත්මක වන්නේදැයි සොයා බැලීම සඳහා වැඩ පිළිවෙළක්, යන්ත්‍රණයක් ක්‍රියාත්මක විය යුතුයි. එහෙම නැත්නම් මොන නියෝග පැනෙව්වත්, මොන නීති දැම්මත් මේ තිබෙන තත්ත්වය නවතින්නේ නැහැ. අද මේ නියෝග පැනවීම තුළින් අපද්‍රව්‍ය මුහුදට බැහැර කිරීම බොහෝ දුරට නවතීවි කියා අප විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මන්ත්‍රීතුමා සභාවේ අවධානයට යොමු කළා, spearguns භාවිත කිරීම සම්බන්ධව; තඹුවා මත්ස්‍යයා මැරීම සම්බන්ධව. එතුමා ඉන්න කාලයේද දන්නේ නැහැ, මේ කියන ගැසට් එක නිකුත් කළේ, මේ නීතිය ගෙනාවේ. තඹුවා මත්ස්‍යා ආරක්ෂා කිරීම අත්‍යවශ්‍යයි. තඹුවා මත්ස්‍යයා පමණක් නොවෙයි, ගිරවා වැනි මත්ස්‍යයන් පවා ආරක්ෂා කිරීම සඳහා නීති සම්පාදනය විය යුතුයි. කෙසේ වෙතත්, අපි සංචාරක කර්මාන්තයෙන් වාගේම, ධීවර කර්මාන්තයෙන් ජීවත් වන රටක්. ඒ නිසා සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා හානි නොවන ආකාරයට මේ නියෝග පැනවිය යුතුයි කියලා මා විශ්වාස කරනවා. විශේෂයෙන්ම අපේ ප්‍රදේශවලටත් සංචාරකයන් විශාල ප්‍රමාණයක් පැමිණෙනවා spearguns භාවිතයෙන් මාළුන් ඇල්ලීම සඳහා. මේ අයට තඹුවා නොවන, ගිරවා නොවන, අනෙකුත් ආරක්ෂිත මසුන් නොවන මසුන්ට විදීම සඳහා වූ අවසරය ලබා දිය යුතුයි කියලා මම යෝජනා කරනවා. ඒ සම්බන්ධව අපේ රජය කටයුතු කරයි කියා අපි විශ්වාස කරනවා.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම අපේ අවධානය යොමු කරන්න ඕනෑ, කිමිදිලා මාළු අල්ලන, පොකිරිස්සන් අල්ලන ප්‍රජාවට තිබෙන ප්‍රශ්න ගැන. පරම්පරා ගණනක එවැනි ධීවර ප්‍රජාවක් අද මේ රටේ සිටිනවා. තමන් තනියම කිමිදිලා පොකිරිස්සන් ඇතුළු මාළු අතින් අල්ලාගෙන එන ජනතාවක් ඉන්නවා. මේ කර්මාන්තය කරන්න පුළුවන් වන්නේ වසරේ මාස කිහිපයක් පමණයි. ඒ අයට මාස ගණනාවක් ඒ කර්මාන්තය කිරීම තහනම් කරලා තිබෙනවා. ඒ තහනම නැති මාසවලත් රාත්‍රී කාලයේ එකී කර්මාන්තයේ නියැළෙන උදවියට තහනමක් පනවලා තිබෙනවා. මම ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරවනවා, ඒ තහනම පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරලා වර්ෂයේ මසුන් මැරීමට අවසර දී ඇති කාලසීමාව තුළ ඒ ආකාරයට මසුන් ඇල්ලීම සඳහා, විශේෂයෙන්ම පොකිරිස්සන් ඇල්ලීම සඳහා අවස්ථාව ලබා දෙන්න කියලා.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම බෝට්ටුවක් දියඹට යනකොට, ඒ වාගේම බෝට්ටුව දියඹේ ගමන් කරන විට බලපත්‍රයක් ඔවුන් සතුව තිබිය යුතුයි කියලා නියෝගයක් යෝජනා කරලා තියෙනවා. ඒක හොඳයි. හැබැයි, අපි ප්‍රායෝගිකව දැක්කා, බොහෝ බෝට්ටු දියඹට ගෙනයන්න කලින් පුරවන්න තියෙන application එක බොහොම ව්‍යාකූල බව. අපි ඉල්ලා සිටිනවා, බොහොම සරල, ඕනෑම ධීවරයකුට පුරවන්න පුළුවන් ආකාරයේ පෝරමයක් හඳුන්වා දෙන්න කියලා. එහෙම නැත්නම් ඒ හැම කෙනෙකුටම පෝරමය පිරවීම සඳහා අවශ්‍ය කරන සහාය ලබා දීමට නිලධාරියෙකු පත් කරන්න කියලා. අපි දන්නවා ධීවරයන්ට තාක්ෂණය හඳුන්වාදීමට කටයුතු කරනවා කියන කාරණය. නමුත් තවමත් අපේ ධීවරයන්ට ඒ තාක්ෂණයට අනුව iPad එක පාවිච්චි කරලා ඒ කටයුතු කිරීමට හැකියාව නැති ප්‍රශ්නයක් තිබෙනවා. ඒ සාක්ෂරතාව දැනට නොමැතිවීම තුළ ඒ අය ප්‍රශ්නවලට මුහුණ දීලා තිබෙනවාය කියන එකත් අපි දන්නවා. ඒ නිසා ඒ අය සම්බන්ධව කටයුතු කිරීම පිළිබඳ කාරණය ඔබතුමාගේ අවධානයට අපි යොමු කරනවා.

ඊළඟට අප ප්‍රදේශයට අදාළ ඒ වාගේම අමාත්‍යාංශයටම අයිති කාරණයක් සම්බන්ධව ඔබතුමාගේ අවධානයට යොමු කරවනවා. ගරු ඇමතිතුමනි, පසුගිය කාලයේ දොඩන්දූව ධීවර වරායේ වැලි ඉවත් කිරීමට කටයුතු නොකිරීම තුළ මේ වනවිට වැලිවලින් පිරිලායි තිබෙන්නේ. පැරැලිය ධීවර වරාය අද වෙනකොට වැලිබිමක් පමණයි. එතැන වරායක් පෙනෙන්නත් නැහැ. ඒ නිසා මේ වරායන් සංවර්ධනය කිරීමේ කටයුතු පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

අනෙක් ප්‍රශ්නය තමයි මේ කාලයේ බොහෝ ප්‍රදේශවල පැතිර යන ඩෙංගු ප්‍රශ්නය. අද ඩෙංගු මදුරුවන් ජනනය කරන ප්‍රධාන මධ්‍යස්ථාන බවට ධීවර වරායන් පත්වෙලා තිබෙනවා. මොකද, බොහෝ බෝට්ටු අතහැර දාලා තියෙනවා. ඒ නිසා ධීවර අමාත්‍යාංශයේ බලධාරීන්ගෙන් අපි ඉල්ලා සිටිනවා, ඒ පරිශ්‍රය භාර උදවියට ඩෙංගු මර්දනය සඳහා අවශ්‍ය අවධානය යොමු කරන්න කියලා පැහැදිලි උපදෙස් ලබා දෙන්න කියලා.

ධීවර ක්ෂේත්‍රය මේ රටේ ආදායම වැඩි කිරීම සඳහා, විදේශ විනිමය ගෙන ඒම සඳහා විශාල ලෙස ප්‍රචලිත කළ යුතු අංශයක් වනවා. මෑත ඉතිහාසය ගත්තොත්, වර්තමාන අගමැතිවරයා තමයි එදා ධීවර ඇමතිවරයා හැටියට මේ ක්ෂේත්‍රයට වැඩිම සේවයක් කරපු, ඒ වාගේම විශාලම දායකත්වයක් ලබා දීපු ධීවර

[ගරු චන්දිම වීරක්කොඩි මහතා]

අමාත්‍යවරයා වන්නේ. එතුමාගේ උපදෙස්, අවවාද අනුශාසනා සහිතව අපේ රජයට ඉදිරියේදී හැකියාව ලැබෙයි, මෙරට මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම සඳහා වූ තාක්ෂණය හඳුන්වාදීමට. ඒ වාගේම කුඩා ධීවර බෝට්ටු, විශාල ධීවර බෝට්ටු, බහුදින යාත්‍රා, ඒ වාගේම තාක්ෂණය සහිත යාත්‍රා සඳහා ධීවර කාර්මිකයන් පුහුණු කරලා ඒ සඳහා අවශ්‍ය කරන සහයෝගය, දායකත්වය ලබා දෙනු ඇතැයි අපි බලාපොරොත්තු වනවා.

මෙය ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයට අදාළ කරුණක් නිසා ඇමතිතුමාගෙන් මම අද තවත් ඉල්ලීමක් කරන්න කැමැතියි. ගාල්ල, රත්ගම වැල්ලෙන් සුළු පන්න ධීවර කර්මාන්තය සඳහා විශාල පිරිසක් රැකියාවට යනවා. ඒ අය ගාල්ල කොටුවට ඇතුළු වන තැන තමයි රත්ගම වැල්ල තිබෙන්නේ, ගරු ඇමතිතුමනි. ඒ ස්ථානයට කිසිදු පහසුකමක් නැහැ. ඒ අයට තමන්ගේ නිෂ්පාදන විකුණා ගැනීම සඳහා පහසුකමක් නැහැ. ඒ ස්ථානයේ සිටින ධීවර ප්‍රජාව වාගේම ප්‍රදේශයේ ජනතාවත්, පාරිභෝගිකයිනුත් විශාල අපහසුතාවලට පත්වනවා. එම නිසා ඒ පිළිබඳව ඔබතුමාගේ පෞද්ගලික අවධානය යොමු කර ඒ අයට අවශ්‍ය සහන ලබා දෙන්න, ඒ ස්ථානය සංවර්ධනය කර දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු ඇමතිතුමනි, අප ඉදිරිපත් කරන කරුණු සම්බන්ධයෙන් ඔබතුමා සටහන් දමා ගන්න නිසා මම නැවත මේ කරුණ කියනවා. අලුත් ධීවර වරායක් හදන්න උත්සාහ කරපු පැරැලිය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කර ඔබතුමා සොයා බලන්න. අද ධීවර ක්ෂේත්‍රයටම අදාළ වෙලා තිබෙන ප්‍රශ්නයක් තමයි, වරායවල වැලි හිරවීම. වරාය නිසා පාරේ වැලි පිරිලා කියලා ඊයේත් අපේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී ප්‍රශ්නයක් මතු වුණා. වැලි සුද්ධ කිරීම සඳහා වූ යාන්ත්‍රණයක් මෙන්ම ක්‍රමවේදයක් අවශ්‍යයි. මම හිතන්නේ මේ කටයුත්ත භාර ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවටයි. එම නිසා ඒ සඳහා වැඩ පිළිවෙළක් ඇති කරන්න කියන ඉල්ලීම මම ඔබතුමාට කරනවා.

ධීවර ක්ෂේත්‍රය ඉදිරියට ගෙන යෑම සඳහා දැක්මක් සහ වැඩ පිළිවෙළක් සහිතව මේ ආකාරයට නියෝග පැනවීමට කටයුතු කිරීම තුළින් ධීවර ක්ෂේත්‍රය විධිමත් වෙලා විනයක් සහිතව ඒ තුළින් අපේ ධීවරයා ධීවර වෘත්තිකයෙකු බවට පත් වෙලා වැඩි ලාභයක් ලබන ධීවර ව්‍යාපාරිකයකු බවට පත් වෙයි.

තවත් ඉල්ලීමක් කරන්න මම කැමැතියි. එනම්, ධීවරයා සඳහා බැංකු ක්‍රමයක් ඇති කිරීම. ධීවරයා මොන ආකාරයට කොපමණ මුදල් හෙව්වත් හැම දාම දුප්පත්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ අයට ඉතිරිකිරීම පිළිබඳව, ආයෝජනය කිරීම පිළිබඳව දැනුමක් තවම ලබා දීලා නැහැ. එම නිසා ධීවර ප්‍රජාව ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීම සඳහා බැංකු පද්ධතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීම සහ ඊට ඔවුන් සම්බන්ධ කිරීම සඳහා වූ වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න කියන ඉල්ලීමත් මම මේ අවස්ථාවේදී කරනවා.

මට කථා කිරීමට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව මගේ ස්තුතිය පුද කරමින්, මේ කටයුතු සාර්ථක වේවා කියා ප්‍රාර්ථනා කරනවා. එසේම, කිමිදුම් කරමින් තනිව spearfishing gun මඟින් පොකිරිස්සන් ඇල්ලීමට කටයුතු කරන ධීවරයන් සඳහා, මේ දිනවල රාත්‍රි කාලයට පනවා තිබෙන තහනම පිළිබඳව අවධානය යොමු කරන්න කියලා මා නැවතත් ඉල්ලා සිටිනවා. ඒ පිළිබඳව මම අමාත්‍යාංශයේ ලේකම්තුමිය සමඟ කථා කළා. එතුමිය හොඳ ප්‍රතිචාරයක් දැක්වූවා. ඔබතුමාත් අද අපේ කණ්ඩායම් රැස්වීමේදී ඒ සඳහා හොඳ ප්‍රතිචාරයක් දැක්වූවා. ඒ පිළිබඳව කඩිනමින් කටයුතු කරන්න කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ධීවර හා මිරිදිය මත්ස්‍ය කර්මාන්ත රාජ්‍ය ඇමතිතුමා යම් අදහසක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දෙන්න කියා ඉල්ලීමක් කර තිබෙනවා.

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு சனத் நிசாந்த பெரேரா)
(The Hon. Sanath Nishantha Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථා කරන්න සුළු වේලාවක් ඉල්ලුවේ මෙතැන මතු කළ කාරණයක් සම්බන්ධයෙන් අදහසක් ප්‍රකාශ කරන්නයි. අද ප්‍රධාන වශයෙන් කිව්වා, ඩයිනමයිට් භාවිත කර මත්ස්‍යයින් මැරීම පිළිබඳව. ලයිලා සහ සුරුක්කු දැල් භාවිතය කියලා පන්න ක්‍රමයක් තිබුණා. මේක තහනම් කරපු පන්න ක්‍රමයක්. මේ සම්බන්ධයෙන් වහන්න දෙයක් නැහැ. පසුගිය ආණ්ඩුවේ සිටි සමහර බලධාරීන් මේකට මැදිහත් වෙලා අපේ නිලධාරීන්ට බලපෑම් කරලා වෙන වෙන නම්වලින් මේ පන්න ක්‍රම කරන්න කියලා බලපෑම් කළා. ඒකේ ප්‍රතිඵලයක් හැටියට නැවත වතාවක් වෙන වෙන නම්වලින් ඒ තහනම් පන්න ක්‍රම ක්‍රියාත්මක කළා. නමුත් අපි තීරණය කර තිබෙනවා, ජනවාරි පළමුවැනි දා සිට ඒ සියල්ලම තහනම් කරන්න.

මම විශේෂයෙන්ම අපේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ස්තුතිය පුද කරනවා. අද දවසේත් කල්පිටිය ප්‍රදේශයේ ඩයිනමයිට් පාවිච්චි කරලා මත්ස්‍යයන් විනාශ කරන්න ගත් උත්සාහයක් ඔවුන් ව්‍යර්ථ කර තිබෙනවා. ඒ අනුව මත්ස්‍යයන් සමඟ විශාල පිරිසක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඒ අය අධිකරණයට ඉදිරිපත් කරනවා.

මීට කලින් කථා කළ මන්ත්‍රීතුමා කිව්වා, forms set එක පුරවන එක කරදරයි කියලා. ඉතාම සංකීර්ණව තිබුණු ඉල්ලුම්පත්‍රය අපි දැන් සරල කරලා තිබෙනවා. ඒ වාගේම මසුන් මැරීමට මුහුදට යනකොට ලියකියවිලි පුරවන්න ගියාම වතුරත් එක්ක -තෙතත් එක්ක- මේ දේ කරන්න බැරි නිසා ඇඟිලි සලකුණු තබා මුහුදට යන්නත්, ඇඟිලි සලකුණු තබා ආපහු රටට ඇතුළු වන්නත් අපි ක්‍රමයක් හදලා තිබෙනවා. ඒ වාගේම ධීවරයන්ට ජලයේදී පාවිච්චි කරන්න පුළුවන් විද්‍යුත් හැඳුනුම්පතක් අපි හඳුන්වා දී තිබෙනවාය කියන කාරණයත් මම මතක් කරන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මැතිනිය.

[අ.භා.5.33]

ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින විවාදයට ලක් වෙන මාතෘකාව පිළිබඳව නොවෙයි මම කථා කරන්න හදන්නේ. මොකද, රන්ජන් රාමනායක මැතිතුමා විසින් පටිගත කර, මේ දවස්වල තිරගත වන අලුත්ම නාට්‍ය, "Prison Break 2". එක්තරා සහෝදරයකු විසින් හිරේ ඉන්න තමන්ගේ සහෝදරයා බේරා ගන්න මේ දවස්වල හඬපට කරළියට ගෙනැල්ලා තිබෙනවා. සංස්කරණය කරපු හඬ පට, හඬ වෙනස් කරපු හඬ පට කියන ඒ හඬ පට පිළිබඳව මම අද කථා කරනවා. මොකද, මේ සම්බන්ධයෙන් අද වෙනකොට කුඩුකාරයන්, මාධ්‍ය ඇතුළු මුළු

ලංකාවටම හිරුනිකා ප්‍රේමචන්ද්‍ර පිළිබඳව වැරදි මතයක් ගෙනගොස් තිබෙනවා. මම නැවත දේශපාලනය කළත් එකයි, නැතත් එකයි. මේක කරන්නේ කොතැනින්ද, මේ හඬ පට සංස්කරණය කරන්නේ කොතැන ඉඳලා ද ආදී වූ හැම දේම පැහැදිලි කරලා ජනතාවට කියලා, මේ වෙලාවේ මම වෙනුවෙන් කවුරුත් පෙනී සිටින්නේ නැත්නම්, කාන්තාවක් විදියට මා වෙනුවෙන් පෙනී සිටින්න මට සිද්ධ වෙනවා. අද සියලුදෙනා එකතු වෙලා මට ගල් ගහනවා. රෑට බීගෙන ඇවිල්ලා, තමන්ගේ බිරිඳට නොසෑහෙන්න ගහන, ඔළුව බිත්තිවල හප්පන සමහර සැමියන් කියනවා, "මගේ මහත්තයා මගේ දත් දෙකක් කුඩුවෙන්න මට ගහලා, මුහුණ විකෘති කරලා" කියලා. තමන්ගේ මහත්තයාගේ ලිංගික සම්බන්ධතා පිළිබඳව පවා තවත් කාන්තාවන් සහ පිරිමින් එක්ක ඕපාදූප කථා කරන කාන්තාවන් කියනවා, "මම මගේ මහත්තයාව රවට්ටලා" කියලා. යහළුවන් සමඟ එකට එකතු වෙලා විහිළු කරනකොට, ඒ විහිළුවලට හයියෙන් කොක් හඬලා සිනාවෙන කාන්තාවන් කියනවා, "මම රන්ජන් රාමනායකත් එක්ක විහිළු කරනවා. ඔහුත් එක්ක සම්බන්ධතාවක් පවත්වලා" කියලා. මම කියන්න කැමතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සියලුදෙනා අද ශුද්ධවන්තයෝ. අද මේ සියලු කළු චරිත එකතු වෙලා, අනෙක් මිනිසුන්ගේ ජීවිතවල සුදු තිබෙනවාද කියලා හොයනවා. අනන්ත කළු තිබෙන මිනිසුන් අද ශුද්ධවන්තයන් වෙලා තිබෙනවා. මේ සියලුදෙනාම එකතු වෙලා එක කාන්තාවක් වට කරගෙන ගල් ගහනවා. මම ඒ හැමදෙනාටම කියනවා ඔහොම නොවෙයි, හඬ පට සියයක් ආවත්, ගල් සියයක් විසි කළත් මගේ කට වහන්නේ මම මැරුණු දවසට විතරයි කියලා. ඔය කුඩුකාරයන්ට විරුද්ධව, මේ ආණ්ඩුවේ වැරදිකරුවන්ට විරුද්ධව, සිර ගෙදරින් එළියට ගන්න හදන දුමින්ද සිල්වාට විරුද්ධව, ඔහුගේ සහෝදරයා වන රේන ද සිල්වාට විරුද්ධව එදා බලයක් නැතිව කථා කරපු මට, එදා මහින්ද රාජපක්ෂලාත් එක්ක හැප්පුණු මට, එදා බලයක් නැතුව දුමින්ද සිල්වා හිර ගෙදරට යවන්න සටන් කරන්න මට පුළුවන් නම් ඒ කොන්ද, ඒ හයිය ඒ විදියටම තවමත් මට තිබෙනවා. දැන් මට මඩ ගහන්නේ ඇයි? මම හොරකම් කරලාද? මම ගැන එක මූල්‍යා චෝදනාවක් තිබෙනවා නම් කියන්න. මම කුඩු විකුණලාද, පස් කපලාද, ගණිකා මඩම් දමලාද, මොකක් කරලාද මට මඩ ගහන්නේ? මගේ සමකාලීන මිත්‍රයකු එක්ක මම දුරකථනයෙන් සාකච්ඡාවක් කරනවා. ඒකේ හඬ සංස්කරණය කරලා, සංවාදය සංස්කරණය කරලා තිබෙනවා. යහළුවන් දෙදෙනෙකු එක්ක කථා කරන ඕපාදූපයක් සමාජ මාධ්‍ය හරහා පළ කරලා, මට මඩ ගහනවා. නැතුව මම හොරකම් කරලාවත්, මිනී මරලාවත්, කුඩු විකුණලාවත් නොවෙයි එහෙම කරන්නේ. මේ රටේ මිනිසුන්ට අද කන්න බොන්න නැතුව සිටින වෙලාවක රටේ මිනිස්සු රස කර කර හඬ පට අහනවා. හඬ පට අහලා, බඩගින්න නිවා ගන්නවා. මම ඊයේ මේ සම්බන්ධයෙන් CID එකට complain කළා. ලංකාවේ නීතිය අනුව, 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනතේ 07වැනි වගන්තියේ තිබෙනවා, "දෙදෙනෙකු අතර හුවමාරු වන දුරකථන සාකච්ඡාවක් ඒ දෙදෙනාගේ කැමැත්තකින් තොරව කා ළඟ හෝ තියා ගන්නත් බැහැ, පටිගත කරන්නත් බැහැ, විකුණන්නත් බැහැ, ප්‍රදර්ශනය කරන්නත් බැහැ" කියලා. අද Hiru TV නාලිකාව, දෙරණ නාලිකාව, ජාතික රූපවාහිනිය, ITN නාලිකාව කියන නාලිකා හතරට විරුද්ධව මම CID එකට පැමිණිලි කර තිබෙනවා. ඒ වාගේම මම හෙට අනිද්දා ඉතාම ඉක්මනින් රුපියල් බිලියනයක් ඉල්ලලා, මේ channels හතරටම විරුද්ධව වන්දි නඩුවක් දමනවා. පුළුවන් නම් මාත් එක්ක හැප්පෙන්න. අපි බලමු, කවුද දිනන්නේ කියලා. මේ සියලු හඬ පට සංස්කරණය කරපු ඒවා කියලා මම ඔප්පු කරලා පෙන්වනවා. මම රුපියල් බිලියනයක් ඉල්ලනවා, හිරු නාලිකාවෙන්. හිරු එක අද ඔතැන ඉන්නේ මිනිසුන්ට කුඩු විකුණලා. ඒ කුඩු සල්ලි මම නැවත අරගෙන අහිංසක දුප්පත් මිනිසුන්ට බෙදලා දෙනවා. මට ශත පහක්වත් ඕනෑ නැහැ, ඔය කුඩු සල්ලි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්නම් කොහොමද මේක වෙන්නේ කියලා. පොලිසියෙන් දුන්නා මේක රේනට. රේනට විකුණුවා පොලිසියෙන්. දැන් ඉන්නවා, අපතයෙක්! මේ ළඟදී සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමට කියලා 'ඉරාජ්' කියලා අපතයෙකුට දුන්නා, Director කමක්. රේන මේ හඬ පට ටික ඉරාජ්ට දෙනවා. ඉරාජ් තව පහළොස් දෙනෙකු පමණ එක්ක එකතුවෙලා ඉරාජ්ගේ Noize TV හි පටිගත කිරීම් කාමරවල හැමදාම -මේ අවස්ථාවේදීත්, පැය 24ම- මේ හඬ පට සංස්කරණය කරලා සමාජ මාධ්‍යවලට මුදා හරිනවා. රන්ජන් රාමනායක කථා කරලා තිබෙන්නේ මාත් එක්ක විතරක් නොවෙයි, මේ මන්ත්‍රීවරුන් 225න් භාගයකට වඩා පිරිසක් එක්ක කථා කරලා තිබෙනවා. හැබැයි, එළියට එන්නේ මගේ ඒවා; එළියට එන්නේ ශානිගේ ඒවා; එළියට එන්නේ පද්මිණී රණවකගේ ඒවා. ඇයි ඒ? මේ වෙලාවේ යන "Prison Break 2" කියන නාටකයේ ප්‍රධාන චරිත තමයි මේ ඉන්නේ. මේවා එළියට දාලා මිනිසුන් තුළ මතයක් හදනවා, "දුමින්ද බබා. දුමින්ද අහිංසකයි. දුමින්ද නිකම් යන අතරතුර හිරුනිකාගේ තාත්තා ඔළුවට වෙඩි තියාගෙන" කියලා. එහෙම මේ ගොල්ලන් කථාවක් හදනවා. ඒ කථාවට අදාළ ප්‍රධාන චරිත තමයි මේවා. උත්සාහ කරලා බැලුවා, මට මොනවා හෝ නඩු තිබෙනවාද කියලා සොයා ගන්න. මොකුත් නැහැ. අත් අඩංගුවට ගන්න හේතු නැහැ. කාන්තාවකට ගහන්නට පුළුවන් අන්තිම දේ තමයි චරිතයට ගහන එක. දැන් කට්ටියම එක්කහුවෙලා මගේ චරිතය ඝාතනය කරන්න හදනවා.

ඔබතුමන්ලා දන්නවා ඇති, මම දේශපාලනය පටන් ගත්ත දවසේ ඉඳන් නාමල් එක්ක යාළුයි කියලාත් කථා ගිය බව. මේ පාර්ලිමේන්තුවේ ඉන්න පුළුවන් තරම් පිරිමින්ට මගේ නම සම්බන්ධ කරලා කථා හැදුවා. සැලුණාද? නාමල්ගෙන් ගිහින් අහන්න, මාත් එක්ක යාළුවෙලා හිටියාද කියලා එක දවසක්වත්. මම එයාට girlfriendsලා සෙට් කරන්න නම් උදවු කරලා තිබෙනවා. ගිහින් අහන්න, යාළුවා නේ. එක දවසක්වත් යාළුවෙලා ඉඳලා තිබෙනවාද කියලා අහන්න. හැබැයි, ඒ ගැනත් මට කථා හදලා තිබෙනවා. කාන්තාවක් පාර්ලිමේන්තුව නියෝජනය කරනකොට එන ප්‍රශ්න මේවා. හැබැයි, මම ඒවාට සැලෙන්නේ නැහැ. ඒවාට මුහුණ දෙන්නට මට හයිය දෙන්න ශක්තිමත් කොන්දක් තිබෙන, හොඳ පිරිමියෙක්, හොඳ මනුස්සයෙක් මට ඉන්නවා. කට්ටියක් එකතුවෙලා මඩ ගහන මේ වෙලාවේ ශක්තිමත්ව නැඟී සිටින්න ඒ මනුස්සයා මට සම්පූර්ණ ශක්තිය දෙනවා.

Noize TV එක ඇතුළේ කරන සංස්කරණයක් මේක. මොකක් හෝ කථාවකදී රන්ජන් "hello" කියනවා. ඒකෙන් "hello" එක ගන්නවා, තවත් තැනක කථා කරන එකක් මේකට dub කරනවා. මේ ගරු සභාවේ මේ අවස්ථාවේ රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා ඉන්නවා. මේ රටට දිලිත් කුඩු ගේනවා කියලා මම එතුමා එක්ක කිසිම දවසක කථා කරලා තිබෙනවාද? නැහැ. මේ රටට කුඩු ගේන්නේ දිලිත්ද කියන එක මම දන්නේ නැහැ. හැබැයි මේ රටට කුඩු ගෙන්නේ දුමින්ද සිල්වාගේ අයියයි, දුමින්ද සිල්වායි කියන එක මම දන්නවා. ඒක මේ මුළු රටම දන්නවා. දිලිත් කුඩු ගේනවාද කියලා මම දන්නේ නැහැ. රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා කවදාවත් මාත් එක්ක දිලිත් ගැන කථා කරලා නැහැ. හැබැයි අපි දෙන්නා කුඩු ගැන, රේන ගැන, දුමින්ද ගැන කථා කරලා තිබෙනවා. ඇයි ඒවා එළියට එන්නේ නැත්තේ? එක කථාවක තිබෙනවා, අපි කථා කරපු දෙයින් ඒ ගොල්ලන්ට වාසිවෙන ටික විතරක් දාලා, අවාසිවෙන ටික කපා හැරලා. ඒ වාගේ ඒවා ගොඩක් තිබෙනවා. තව ඉස්සරහටත් ඒ වාගේ ඒවා එයි.

[ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය මහතා]

ඔබතුමන්ලා මේකේ බරපතළකම තේරුම් ගන්න. ඒ දවස්වල- මගේ තාත්තා මැරිච්ච මුල් කාලයේ-

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

දුමින්දට පලු යන්න බැන්නා, "කුඩුකාරයා" කියලා. අද

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කියනවා, "දුමින්ද කුඩු වික්කේ නැහැ" කියලා. අද

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කියනවා, "දුමින්ද අහිංසකයෙක්, ඒ නිසා එළියට ගන්න ඕනෑ" කියලා. ඇයි මේ? අද මේ රටේ ප්‍රධානියා, අද මේ රට කරන්නේ ගෝඨාභය රාජපක්ෂ නොවෙයි. අද මේ රටේ බලය තිබෙන්නේ මහින්ද රාජපක්ෂට නොවෙයි. අද මේ මුළු ලංකාවම හොල්ලන්නේ රේන. රේන අතේ තමයි මේ සියලුදෙනාගේ සාක්ෂි තිබෙන්නේ. හෙට අනිද්දා වෙනකොට රේනට පොඩි වැඩයි කරන්න තිබෙන්නේ. රේනගේ මල්ලි වෙනුවෙන් කථා කළේ නැත්නම්, මේ සභාවේ ඉන්න එක් කෙනෙකුගේ හෝ පොඩි clip එකක් එළියට දානවා. එකක් දාපු ගමන්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

යනවා රේන ගාවට. අද මේ මුළු ලංකාවම රේන අතට අරගෙන තිබෙන්නේ. නිකම් කල්පනා කරලා බලන්න. හෙට අනිද්දාට රේනට හිතෙනවා, "මම යනවා, පාර්ලිමේන්තුවට" කියලා. රේනට මහ ලොකු දෙයක් කරන්නට නැහැ. මහින්ද ගාවට ගිහින් කියන්න තිබෙන්නේ, "මට දෙන්න ටිකට් එක. නැත්නම් දන්නවා නේ, මම ළඟ තිබෙන බඩු. ඒවා එළියට දානවා " කියලායි. මහින්ද රාජපක්ෂ අනිවාර්යයෙන් ටිකට් එක දෙනවා. විමල් වීරවංශලාට, ගම්මන්පිලලාට කියනවා, "තමුන්නාන්සේලා පැතත්කටවෙලා ඉන්න, මට කොළඹ දිස්ත්‍රික්කයෙන් පළමුවෙනියා වෙන්න ඕනෑ" කියලා. පැත්තකටවෙලා ඉන්නවා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ඊළඟට, රේන පාර්ලිමේන්තු එනවා. රේනට අවශ්‍ය නම් මේ පාර්ලිමේන්තුවේ බහුතරය අරගෙන මේ රටේ අගමැති වෙන්නත් පුළුවන්. ඇයි? රේන ගාව තමයි බඩු ටික තිබෙන්නේ. මේ සභාවේ ඉන්න සියලු දෙනා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

වාගේ ගිහිල්ලා රේනව මේ රටේ අගමැති කරනවා. ඒ කියන්නේ මේ රටේ ප්‍රධාන කුඩුකාරයෙක් මේ රටේ අගමැති වෙනවා. ඒ ඇයි? මේ වෙලාවේ බලය තිබෙන්නේ රේන අතේ හින්දා. ලජ්ජා වෙන්න ඕනෑ, මේ සභාවේ ඉන්න සියලුදෙනා. ලජ්ජා වෙන්න ඕනෑ, මේ සභාවේ ඉන්න සියලුදෙනා මේ වාගේ තත්ත්වයකට පත්වීම පිළිබඳව.

මට හරි කනගාටුයි. මගේ පියා මැරුණු වෙලාවේ මේ සභාවේ ඉන්න සියලුදෙනා මොනවාද කිව්වේ? "එයා කුඩුකාරයා නංගි, එයා කුඩුකාරයා දුව, හොඳ වැඩේ එයාට වෙච්ච දේ. ඔයාගේ තාත්තාට මේ වෙච්ච දේ ගැන අපි කනගාටු වෙනවා, දුමින්ද සිල්වාට ඔහොම වෙලා මදි. ඔය කුඩුකාරයාට ඔහොම වෙලා මදි. එයා හිර ගෙදරට අනිවාර්යයෙන්ම යවන්න ඕනෑ. අපි ඔය සටන පිටුපස ඉන්නවා " කිව්වා. එදා එලෙස කියපු කට්ටිය අද කියනවා, "දුමින්ද සිල්වා අහිංසකයි" කියලා. දුමින්ද සිල්වා අහිංසක නැහැ. මම කිසි තැනක කියලා නැහැ, " දුමින්ද සිල්වා අපේ තාත්තාට වෙඩි තිබ්බා" කියලා. ශානි එහෙම කියලාත් නැහැ. ශානිගේ සාක්ෂිවල තිබෙන්නේ, "දුමින්ද සිල්වාට පළමුවැනි වරටම වෙඩි වැදුණා" කියලා. ඒකත් ඇත්ත. හැබැයි, ඒ වාගේ තත්ත්වයක් ඇති කරන්න දුමින්ද සිල්වා උදේ ඉඳන් සියලුදේ plan කළා; කට්ටියම උසි ගැන්වූවා. ඒක අනිවාර්යයෙන් plan කරලා කරපු මිනී මැරුමක්. ඒ මිනී මැරුම සඳහා ඕනෑ අවි ආයුධ වාහනයකින් තව වාහනයකට දා ගත්තා. ඒවාට අණ දුන්නා. ඒවා සියල්ලම කළේ දුමින්ද සිල්වා. එතැන ඝාතනයක් සිද්ධ වෙන්නේ. ඝාතනයක් සිදු කිරීම සඳහා සම්පූර්ණයෙන් සංවිධානය කිරීමේ වැරැද්දට තමයි ඔහුට මරණ දඬුවම නියම වෙලා තිබෙන්නේ. මොකද, ඒ සංවිධානයේ අවසානය වුවමනාව වන්නේ ඝාතනය. ඒක තමයි ඇත්ත. අපට හංගන්න දෙයක් නැහැ.

එහෙම නම් මේ දුමින්ද සිල්වා බබාද? අපේ තාත්තා ඇතුළු තව තුන් දෙනෙක් ඔළුවට වෙඩි තියා ගත්තාද? මේ සියලුදෙනා සත්‍යය දන්නවා. ලජ්ජයි කියන්න, දැනගෙන මේ ගොල්ලන්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

හංගාගෙන ඔහේ පැත්තකට වෙලා ඉන්නවා. මොකද, මේ ගොල්ලන්ගේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ගැන, මේ ගොල්ලෝ කොහේද ගිහින් තිබෙන්නේ, රට රටවලට ගිහිල්ලා කාත් එක්කද හිටියේ, කොයි විධියටද මිනිසුන්ගේ සල්ලි ගසා කැවේ ඒ හැම දේම රේන දන්නවා. කාවද මැරුවේ, ඒවාට orders දුන්නේ කවුද, ඒ හැම දේම අද රේන දන්නවා. ඇත්තටම කනගාටුයි. ඇත්තටම භය වෙන්න ඕනෑ, විපක්ෂයේ ඉන්න අපි නොවෙයි. චරිත ඝාතනය හැරෙන්න අපට ගහන්න කිසිම ආයුධයක් ඔබතුමන්ලා ළඟ නැහැ. අපට මඩ ගහන වෙලාවේ රේන ඔබතුමන්ලාට ඔබතුමන්ලාගේ ඇත්ත පෙන්වනවා. ඒ නිසා ඔබතුමන්ලාට සිද්ධ වනවා, රේන කියන කියන පදයට නටන්න. ගිහින්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මහත්තයාට කියන්න, වැඩි කල් යන්න කලින්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මහත්තයාත් අල්ලේ නටවන්න රේනට පුළුවන් බව. ඒක දැනටමත් කරනවා. නැත්නම්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මහත්මයා ඊයේ කියයිද, "දුමින්දට මරණ දඬුවම ලබා දෙන්න ලෑස්ති වෙච්ච කට්ටියවත් එල්ලන්න ඕනෑ" කියලා. ඒක නිසා අද පද්මිණී රණවක මැතිනියට විරුද්ධව පෝස්ටර් ගහලා තිබෙනවා. "මිනීමරු පද්මිණී රණවක එල්ලා මරනු" කියලා ඔන්න කොළඹ දිස්ත්‍රික්කයේම පෝස්ටර් ගහලා. එතුමිය මොනවා කළාටද? එතුමිය සත්‍යවාදීව තීන්දුවක් දීලා තිබෙනවා. රන්ජන් රාමනායක කොතැන හෝ පද්මිණී රණවකට කියලා තිබෙනවාද, "අර වැඩේ මේ විධියට කරන්න" කියලා. නැහැ. රන්ජන් රාමනායක අහන්නේ, මොකද වෙන්නේ කියන එක විතරයි. ඒ නිසා ඔය "Prison Break 2"වලට මේ රටේ මිනිසුන් අන්දන්න බැහැ. මේ රටේ මිනිසුන් දන්නවා, හෙට-අනිද්දා දුමින්ද සිල්වා එළියට ගන්න තමයි මේ හදන්නේ කියලා. ඒ වෙනුවෙන් කෑ ගහන්න ඉන්නේ මම විතරයි. නැති වුණේ, මගේ තාත්තා. මේ එක් කෙනෙකුගේවත් නොවෙයි, මගේ තාත්තායි නැති වුණේ. වේදනාව තිබෙන්නේ, මට. දුමින්ද සිල්වා එළියට ගන්න හදනකොට මගේ තාත්තා වෙනුවෙන් කෑ ගහන්න ඉන්නේ මම විතරයි. මම මහ වනචර, මහ ජරා ගෑනියෙක් බව මිනිසුන්ට කියලා, මගේ කට වහලා, මා එළියට දැම්මාට පස්සේ මේ ගොල්ලන්ට මේ ගොල්ලන්ගේ වැඩේ කර ගන්න බොහොම ලේසියි. හැබැයි මම කියන්න කැමැතියි, ඔය කිසි දේකින් මා වට්ටන්න බැරි බව. "මේ ගෑනි මෙහෙමයි. මෙයාගේ චරිතේ මෙහෙමයි. මෙයා මෙයත් එක්ක යාළුයි" යනාදි කතන්දර කියලා මා වට්ටන්න පුළුවන් කියලා කවුරු හෝ හිතාගෙන ඉන්නවා නම් ඒ අයට මම මේ දේ කියන්න ඕනෑ. මීට වඩා ප්‍රශ්න මට ඇවිල්ලා තිබෙනවා. ඒවාට මම මුහුණ දීලා තිබෙනවා. මට ඔය හඬ පට මොනවාද? මම හැප්පුණේ කුඩුකාරයොත් එක්ක, මිනී මරුවොත් එක්ක, රටේ ජනාධිපතිවරු එක්ක. ඒ ගොල්ලන් එක්ක හැප්පිච්ච මට මේ හඬ පට මොනවාද? මට රේන කවුද?

මට ඉරාජ් කියන්නේ කවුද? මහ ලොකුවට සංස්කෘතිය ගැන කථා කරනවා. ඒ වාගේම ආගම, ජාතිය ගැන කථා කරනවා. මහ ලොකුවට සංස්කෘතිය, ආගම හා ජාතිය ගැන කථා කරන එක්කෙනා පසුගිය දවස්වල රණ විරුවෝ ගැන කථා කළා. ආබාධිත රණ විරුවන් උපවාස කරන තැනට ගිහිල්ලා, වාඩි වෙලා ඉරාජ් මොනවාද කිව්වේ? පසුගිය ආණ්ඩුව ඒ ආබාධිත රණ විරුවන් වෙනුවෙන් කථා කළේ නැහැ කිව්වා. ඇත්තටම ඉරාජ් රණ විරුවන් වෙනුවෙන් කථා කළේ කොහොමද කියන එකට මම පොඩි කථාවක් කියන්නද? බ්‍රිගේඩියර් කෙනෙක් ඉන්නවා, රවීන්ද්‍ර මීගමආරච්චි කියලා.

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு சனத் நிசாந்த பெரேரா)
(The Hon. Sanath Nishantha Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සාකච්ඡා වන්නේ ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ ගෙනෙන නියෝග සම්බන්ධයෙන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතුමියගේ නම සඳහන් වුණ නිසා මම ඉඩ දෙනවා.

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு சனத் நிசாந்த பெரேரா)
(The Hon. Sanath Nishantha Perera)
මේක ඉවරයක් නැහැ. එතුමියගේ පෞද්ගලික කාරණා මේ ගරු සභාවේ- [බාධා කිරීම්] මෙතැන නැති අයගේ නම් කිය කියා- [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, එතුමියගේ නම සඳහන් වුණ නිසා මම ඉඩ දෙනවා.

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு சனத் நிசாந்த பெரேரா)
(The Hon. Sanath Nishantha Perera)
එක එක පුද්ගලයන්ගේ නම් කිය කිය අපහාස කරනවා. එතුමියගේ නම සඳහන් වුණා නම්, වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරන්න තිබුණා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතුමියගේ නම සඳහන් වුණ නිසා මූලාසනයෙන් ඒ අවසරය දෙනවා.

ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
මට පුළුවන්. මට ඒ අයිතිය තිබෙනවා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

තුවක්කු පෙන්නපුවා, ගැනු හය කරපුවා තිබෙනවා වයිබර් එකේ. [බාධා කිරීම්] ඒවා අපි ළඟ තිබෙනවා. ඔබතුමා පොඩ්ඩක් ඔහොම ඉන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය, දැන් ඔබතුමියගේ කථාව කරන්න.

ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
මට කියන්න තිබෙන්නේ මේකයි. රවීන්ද්‍ර මීගමආරච්චි කියන්නේ බ්‍රිගේඩියර් කෙනෙක්, ගෝඨාභය රාජපක්ෂ මහත්මයා වෙනුවෙන් හැම වෙලාවේම කථා කරපු. ඉරාජ් කියන්නේ පක්ෂයකට අයිති මිනිහෙක් නොවෙයි. යහ පාලන ආණ්ඩුව බලයට ආපු ගමන් ඉරාජ් තමන්ගේ laptops ටික අරගෙන රස්සාවක් ඉල්ලා ගෙන පළමුවෙන්ම මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ළඟට ගියා, තිබෙන වැඩ ටික කරලා දෙන්නම් කියලා. එයා මොකක්ද කළේ? ගෝඨාභය මහත්මයාත් එක්ක හිටපු රණ විරුවකු වන, රවීන්ද්‍ර මීගමආරච්චිව එතැනින් - Defence Ministry එකෙන් - මාරු කරවනවා, කිලිනොච්චියට. ඔන්න, ඉරාජ්ගේ වැඩ. හැබැයි, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා හොඳ දෙයක් කළා. එතුමා මිනිහා වැඩට ගත්තේ නැහැ. අන්න, එතැනින් තමයි එයාට යහ පාලනයත් එපා වෙන්නේ. එහෙම නැතිව, මේ රටට ආදරය නිසා නොවෙයි එහෙම වෙන්නේ. එයාට මොකවත් බිස්නස් එකක් කරගන්න බැරි වෙනවා, ඒ ආණ්ඩුවට ගිහිල්ලා. ඒ නිසා තමයි එයා ආයෙත් සැරයක් ගෝඨාභය ළඟට ගියේ. එහෙම නැතිව, ඉරාජ් රටට ආදරය නිසා නොවෙයි එහෙම ගියේ. ඉරාජ්ගේ කටින්ම කියා තිබෙනවා, "මම සංස්කෘතිය විනාශ කරනවා. මට මේ සංස්කෘතියෙන් ඇති වැඩක් නැහැ." කියලා. අපේ රටේ මිනිස්සු හරිම දූපත් මානසිකත්වයේ ඉන්නා වහලුන් ලු. ඉරාජ් විසින්ම බයියන්ට පහරක් ගහනවා. මේ, ඔබතුමන්ලාම උඩ තියාගෙන සිටින, සංචාරක ව්‍යාපෘති ප්‍රවර්ධනය කරන මහා ලොකු අධ්‍යක්ෂවරයා.

ඉරාජ් විසින් මේ රටේ කාන්තාවන්ගේ නිරුවත කොච්චර නම් පෙන්වා තිබෙනවාද, YouTube එකේ. සමලිංගික කතන්දරත්

[ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය]

පෙන්වා තිබෙනවා. අපි අපේ ඇස් දෙක පියාගෙන, නිහඬව වික්ටර් රත්නායක මහත්මයාගේ සින්දු කොච්චර රස වින්දනය කරනවාද? ඔහු එතුමාගේ පෞද්ගලික ජීවිතය යොදාගෙන YouTube එකට වීඩියෝ එකක් හදලා දැම්මා. එහෙම නම් ඔහු මේ රටට, ජාතියට, සංස්කෘතියට ආදරය කරන මනුස්සයෙක්ද? ඔහු හැම දාම තමන්ගේ වුවමනාවලට, තමන්ට සල්ලි කීයක් හරි හම්බ කරගන්න වීඩියෝ හදපු කෙනෙක්. මේ වාගේ මිනිස්සු දමාගෙන ද, අපේ ලංකාවේ සංචාරක ව්‍යාපෘති, සංචාරක කර්මාන්තය වැඩි දියුණු කරන්න හදන්නේ? ඉරාජ් ගැන කියන්න, තව දේවල් තිබෙනවා.

දැන් හඬ පට සංස්කරණය කර කර අපට මඩ ගහනවා. මම ඉරාජ් කොල්ලාට දෙයක් කියන්න කැමැතියි. ඉරාජ්ගේ අම්මායි, නංගියි ක්ලබ් ගිහිල්ලා ගෙදර එන්නේ රෑ එකට දෙකට. ඒ අයට අඩුම ගණනේ රෑ දහයටවත් ගෙදර එන්න කියන්න. මොනවා වුණත්, ගැහැනු නේ. අම්මාටයි, නංගිටයි එහෙම කියන්න කියලා ඉරාජ්ට කියන්න. ඒ වාගේම, හේතුව මොකක්ද දන්නේ නැහැ, ඉරාජ්ගේ තාත්තා, ප්‍රීතිරාජ් වීරරත්නයි, මල්රාජ් වීරරත්නයි එංගලන්තයේදී - [බාධා කිරීමක්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමිය, please wind up your speech now.

ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
Give me just one minute, Sir.

මොනවා වෙලාද දන්නේ නැහැ, එංගලන්තයේදී මල්රාජ් වීරරත්න අත් අඩංගුවට ගත්තේ? ඒ කතන්දර ඔක්කෝම අපි දන්නවා. අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මේකයි. මට කුඩ්ඩා එළියට දැම්මත් එකයි; නැතත් එකයි. ලජ්ජා වෙන්න ඕනෑ, හෙට අනිද්දා වෙනකොට මෙතැන සිටින කට්ටියට රේනගේ අල්ලේ නටන්න වෙන එක ගැන. මම දුවක විධියට මගේ රාජකාරිය කරලා ඉවරයි.

මම මේ රටේ මිනිසුන්ට දෙයක් කියනවා. යාළුවෝ දෙදෙනෙකු කථා කරපු ඕපා දූපයක් මහා ලොකුවට අරගෙන මා චරිතයක් නැති ගැහැනියක විධියට හංවඩු ගහන්න හදනවා නම්, මෙතැන සිටින සියලුදෙනා නැවතත් ගිහිල්ලා කණ්ණාඩියෙන් මුහුණ බලන්න. සල්ලිවලට, Hiru TV එකේ පොඩි airtime එකකට මේ විධියට තමන්ගේ ආත්මය පාවා දෙන්න එපා, මිනීමරුවන් වෙනුවෙන්. කවදා හෝ දවසක කණ්ණාඩිය ඉස්සරහට ගියාට පසුව තමන්ගේ නිරුවත තමන්ට පෙනේවි කියනවා.

අන්තිමට තව පොඩි දෙයක් කියන්න ඕනෑ. රන්ජන් රාමනායක මැතිතුමනි, ඔබතුමා වැරදි වැඩක් කළා. ඔබතුමා අපේ දුරකථන සංවාද මගෙන් අහන්නේ නැතිව, රෙකෝඩ් කරලා තිබෙනවා. මිනිසුන් අතර වැරදි මතයක් තිබෙනවා. රන්ජන් රාමනායක මැතිතුමා මගේ සහෝදරයෙක් වාගේ. අපි හොඳ යාළුවෝ. අපි ඕනෑ දෙයක් කථා කරනවා. මෙතැන සිටින හැම දෙනාම මගේ සහෝදරයෝ, මගේ යාළුවෝ. අපි කාන්තාවන් විධියට දේශපාලනය කරන උදවිය. අපි පිරිමි තමයි ආශ්‍රය කරන්නේ. එහෙම නැතිව, මෙතැන ගැහැනු ගොඩක් ඉන්නවායැ? පිරිමි තමයි ආශ්‍රය කරන්න වෙන්නේ. අපි කථා කරන්නේ පිරිමි එක්ක. අපි ඒ ගොල්ලන් එක්ක විනෝද වෙනවා; සතුටු වෙනවා; කථා කරනවා. වෙන දේවල් කරන්න යන්නේ නැහැ. අපි අපේ පවුල් ජීවිතයත් ගත කරනවා, ඉතාම හොඳට. ඒ නිසා මම රන්ජන් රාමනායක මැතිතුමාගෙන් පොඩි ඉල්ලීමක් කරනවා. මෙතැන මේ අය කටවල් ඇරගෙන බලාගෙන ඉන්නවා නේ, රන්ජන් රාමනායක මැතිතුමායි, මමයි අතර මොකක්ද තිබ්බේ කියලා දැනගන්න. පොඩ්ඩක් ඔබතුමාගේ කටින්ම කියන්න, ඇත්තටම අපි දෙදෙනා අතර තිබුණේ මොකක්ද, අපි දෙදෙනා ඇත්තටම කථා කරලා තිබෙන්නේ මොනවාද කියලා.

ඔය විධියට හඬ පට සංස්කරණය කරලා අපේ ජීවිත විනාශ කරන්න හිතාගෙන ඉන්නවා නම්, මම ඉතාම වුවමනාවෙන් ඒ අයට කියන්න කැමැතියි, මම නම් මගේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

දීලා තිබෙන්නේ මගේ මහත්තයාට විතරයි කියන එක. හැබැයි, කනගාටුවට කාරණාව නම්, මෙතැන ඉන්නා කට්ටිය ඔක්කෝම

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

දෙන්නේ රේන සිල්වාට විමයි. මට ඒක ගැන නම් තිබෙන්නේ පුදුමාකාර කනගාටුවක්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි, ගරු මන්ත්‍රීතුමිය.

මීළඟට, ගරු සුසන්ත පුංචිනිලමේ රාජ්‍ය අමාත්‍යතුමා.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - சிறிய மற்றும் நடுத்தர அளவிலான தொழில்முயற்சி அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Susantha Punchinilame - State Minister of Small and Medium Enterprise Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, - [බාධා කිරීමක්]

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුසන්ත පුංචිනිලමේ රාජ්‍ය ඇමතිතුමනි, පොඩ්ඩක් ඉන්න.

ගරු කංචන විජේසේකර රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා කථා කරන වේලාවේ, මේ සභාවේ විවිධ මන්ත්‍රීවරුන්ගේ නම් පාවිච්චි කරලා කිව්වා, හඬ පට සභාගත කරනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, මේ වනවිට කිසිම හඬ පටයක් හෝ එතුමා කියපු සාක්ෂි කිසිවක් සභාගත කරලා තිබෙනවාද කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මට ඒ ගැන ගරු කථානායකතුමාගෙන් අහන්න වෙනවා. [බාධා කිරීම්]

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
සභාගත කරලා නැහැ කියලායි කියන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒ ගැන මම දන්නේ නැහැ. මම ඒ ගැන දැනුවත් නැහැ. [බාධා කිරීමක්] මා දැනුවත්ව දීලා නැහැ.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
අපි එතුමාගෙන් ඉල්ලීමක් කරනවා, එහෙම දෙයක් තිබෙනවා නම්, සභාගත කරන්න කියලා. [බාධා කිරීමක්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුසන්ත පුංචිනිලමේ රාජ්‍ය ඇමතිතුමනි, දැන් ඔබතුමා කථා කරන්න.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, - [බාධා කිරීමක්]

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රන්ජන් රාමනායක මැතිතුමනි, ඔබතුමා වාඩි වෙන්න. ගරු කථානායකතුමා හෙට හෝ අනිද්දා ඔබතුමාට විශේෂ කාලයක් වෙන් කරලා දෙයි.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා අතේ තිබෙන හඬපට ටික සභාගත කරනවා නම්, අර මන්ත්‍රීතුමිය කියපු කථා ගැන දැනගන්න එතුමියටත් ඒවා ඉවහල් වෙයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක point of Order එකක් නොවෙයි, ගරු රාජ්‍ය අමාත්‍යතුමනි. වාඩි වෙන්න.

ගරු සුසන්ත පුංචිනිලමේ රාජ්‍ය අමාත්‍යතුමා.

[අ.භා.5.53]

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද විවාද කරන මාතෘකාව එකක්; කථාවට ලක් වුණේ තවත් එකක්. අපේ හිතවත් මන්ත්‍රීතුමිය ප්‍රකාශ කළා, එක එක මාධ්‍යවලට ඕනෑ විධියට අපි නැටවෙනවා කියලා. ගරු මන්ත්‍රීතුමියනි, එහෙම නැටවෙන උදවියත් ඇති, නැටවෙන්නේ නැති කට්ටියත් ගොඩක් ඇති. එහෙම නැටවෙන අය නටපුවාවේ. නටන්නේ නැති අයට අපහාස කරන්නට එපා කියන විශේෂ ඉල්ලීම කරන්න මා කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ සොයිසා මන්ත්‍රීතුමා, ඒ වාගේම අපේ චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමා කිව්වා, තඹුවා මත්ස්‍යයා- [බාධා කිරීමක්]

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවට තෝරා එවා තිබෙන මහජන නියෝජිතයන් හැටියට අප ඇවිල්ලා ඉන්නේ මහ ජනතාවගේ දුක් කඳුළු ගැන කථා කරන්නයි. අද මේ පාර්ලිමේන්තුවේ වෙනත් විවාදයක් තිබියදී, පෞද්ගලිකව - [බාධා කිරීමක්] මට තත්පරයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි මේ සභාවේ වාඩි වෙලා ඉන්නේ මිනිසුන්ගේ ඡන්දයෙන් ඇවිල්ලායි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
That is not a point of Order.

ගරු සුසන්ත පුංචිනිලමේ රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට නියමිත කාලය ගෙවී යනවා.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
අපි කියන්නේ මෙකයි. Spearguns පාවිච්චිය මඟින්, උල් කරන ලද කූරු පාවිච්චිය මඟින් කරන මත්ස්‍ය දඩයම විනෝදාංශයක් වශයෙන් කළාට කිසිම ප්‍රශ්නයක් නැහැ. නමුත්,- [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! ගරු මන්ත්‍රීවරු වාඩි වෙන්න. [බාධා කිරීම්] ගරු ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා, කරුණාකර වාඩි වෙන්න. [බාධා කිරීම්] කරුණාකර වාඩි වෙන්න. [බාධා කිරීම්]

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
මා ගරු අමාත්‍යතුමාට මතක් කරන්න කැමැතියි, ඒ කටයුත්ත ලංකාවේ වෙනත් ඕනෑම මුහුදු තීරයක කරන්න පුළුවන්- [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා,- [බාධා කිරීම්]

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

නමුත්, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, මුහුදු තීරයේ තඹුවන් හෝ ගිරා මත්ස්‍යයන් හෝ [බාධා කිරීම්]-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මැතිනිය, වාඩි වෙන්න. [බාධා කිරීම්] කරුණාකර වාඩි වෙන්න.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

එම ප්‍රදේශයේ මුහුදු තීරයේ කුමන මත්ස්‍යයකුවත් speargun එකෙන් මරන්න ඉඩ දෙන්න එපා. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මුහුදුබඩ ප්‍රදේශයේ මත්ස්‍යයන් එසේ මරණ එක සීමා කරන්න; සම්පූර්ණයෙන් තහනම් කරන්න. ලංකාවේ අනෙකුත් ප්‍රදේශවල සංචාරක කර්මාන්තයට ඒ ක්‍රමය ඉවහල් වෙනවා නම්, ඒ සඳහා අවසර දුන්නාට කමක් නැහැ. මොකද, රටට විදේශ විනිමය එන්න ඕනෑ, සංචාරකයෝ එන්න ඕනෑ නිසා. නමුත්, අපේ දිස්ත්‍රික්කයේ විශාල වශයෙන් සුරතල් මසුන් ඇල්ලීමේ ව්‍යාපාරය කෙරෙනවා. එහෙම නැත්නම්, මුහුදු ඉස්සන් ඇතුළු මුහුදු මසුන් අල්ලා පිට රට යවන උදවිය ගොඩක් ඉන්නවා. ඒ අයට,- [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා, කරුණාකර නිශ්ශබ්ද වෙන්න. [බාධා කිරීම්]

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

එම මසුන්- [බාධා කිරීම්] රතු ඉස්සා නමැති මත්ස්‍යයා විනාශ වුණේ තඹුවා කියන මත්ස්‍යයා සම්පූර්ණයෙන් මිනිස්සු විසින් උල් කරන ලද කූරු මාර්ගයෙන්, එහෙම නැත්නම් spearguns මාර්ගයෙන් දඩයම් කරන නිසායි. ඒ නිසායි එය නතර කරන්න කියලා අප කියන්නේ. ඒක ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය සංචාරක කර්මාන්තයටත් වැදගත්. ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා, ඒ ප්‍රදේශයේ පමණක් spearguns භාවිතයට ඉඩ දෙන්න එපා කියලා. සංචාරක කර්මාන්තයට අවශ්‍ය විධියට අනෙක් පළාත්වල එය සිදු කළාට කමක් නැහැ.

මම කැමැතියි, මේ කාරණයත් තමුන්නාන්සේට මතක් කර දෙන්න. ත්‍රිකුණාමල නගරාසන්න ප්‍රදේශයේ Black Bay කියලා ස්ථානයක් තිබෙනවා. ඒක සම්පූර්ණයෙන්ම පාවිච්චි කරන්නේ එදිනෙදා ධීවර කර්මාන්තය කරන සුළුපන්න ධීවරයන්. එහි මුළුමනින් සුළුපන්න ධීවරයන් ජීවත් වුණා. නමුත්, එහි දමා තිබූ බෝයා ටික පසු කාලීනව කිසියම් පිරිසක් ඉවත් කර තිබෙනවා. ඒ නිසා ඒ ගොල්ලන්ට ඒ කටයුත්ත කර ගැනීමේ අපහසුතාවක් ඇති වෙලා තිබෙනවා. මම ධීවර නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් සිටියදී පෞද්ගලිකව කෙනෙකුගෙන් ආධාර අරගෙන එවැනි බෝයා පහක් ස්ථාපිත කළා. නමුත්, දැන් වෙනකොට ඒවා නැහැ. Black Bay ධීවර වරායේ සිංහල, දමිළ, මුස්ලිම් යන සියලුදෙනා ධීවර කටයුතුවල යෙදෙන නිසා ඒ පිළිබඳ අවධානය යොමු කරන්න කියා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

කින්නියා ප්‍රදේශයේ සුළුපන්න ධීවර වරායක් තිබෙනවා. එහි ඉන්න ධීවරයෝ කරන්නේ බෝල්ලන්, අලගොඩුවන් අහල් එකහමාරේ දැල් දමා ඇල්ලීමයි. එම ධීවරයන්ට සැතපුම් 7ක් දුරට ගිහින් දැල් දැමිය හැකි වුණත්, ධීවර දෙපාර්තමේන්තුව ඔවුන්ට දී තිබෙන GPS දත්ත වැරදි නිසා කිලෝමීටර 15ක් හෝ 20ක් දුරට ගිහිල්ලා ඒ රස්සාව කරන්න අද සිදු වෙලා තිබෙනවා. ඒ මිනිස්සුන්ට එච්චර දුර ගිහිල්ලා ඒ ව්‍යාපාරය, එහෙම නැත්නම් අලගොඩුවන් අල්ලන එක කරන්න බැරි නිසා ධීවර ව්‍යාපාරයේ යෙදී සිටින ඒ මුස්ලිම් ජාතිකයන්ට, සිංහල ජාතිකයන්ට, දමිළ ජාතිකයන්ගේ ධීවර රැකියාව අහිමි වෙලා තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ අවධානය ඒ කෙරෙහි යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා. ඒ පිළිබඳව දැනුවත් කිරීම සඳහා දැනටමත් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, ත්‍රිකුණාමලය කාර්යාලයෙන් ඔබතුමාගේ අමාත්‍යාංශයට ලිපියක් එවලා තිබෙනවා. ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි.

මෙම ධීවර සහ ජලජ සම්පත් පනතේ නියෝග යටතේ ඔබතුමා ඉතා වැදගත් කරුණු කාරණා කිහිපයක් ඉදිරිපත් කර තිබෙනවා. ත්‍රිකුණාමල මහ රෝහලේ සියලු අපද්‍රව්‍ය, කානු පද්ධති මුහුදට හරවා තිබෙනවා. මේ හේතුවෙන් මුහුදු ජලය අපිරිසිදු වෙනවා. දේශීය විදේශීය සංචාරකයන් ඇවිල්ලා මුහුදේ කිමිදෙනවා. එහි මසුන් ඇල්ලීම, එහෙම නැත්නම් වෙනත් ක්‍රියාදාමවලට මෙය බලවත් පහරක් වෙලා තිබෙනවා. මේ පිළිබඳව අවධානය යොමු කරලා, ඒ පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡා කරලා, මේ අපද්‍රව්‍ය පිරිසිදු කරලා මුහුදට මුදා හරින්න කටයුතු කරන්නය කියලා ඉල්ලීමක් කරන්න කැමැතියි.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් මීට අවුරුදු කීපයකට කලින් මච් යාත්‍රා දෙකක් මිලදී ගන්න ඩොලර් මිලියන ගණනක මුදලක් චීනයට ගෙවලා තිබෙනවා. අද වනතුරු ඒ මච් යාත්‍රා දෙක ආවේ නැහැ. ඒ මච් යාත්‍රා දෙක ආවේ නැති එක පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරලා, ඒ සල්ලිවලට මොකද වුණේ, මච් යාත්‍රා දෙකට මොකද වුණේ කියලා හොයා බලන්න කියලා මා විශේෂයෙන්ම ඉල්ලීමක් කරන්න කැමැතියි.

ඒ වාගේම පසුගිය කාල සීමාව තුළ කෝකිලායි සිට ලංකාපටුන දක්වා මුහුදේ ඩයිනමයිට් භාවිතය විශාල වශයෙන් සිදුවෙමින් පැවතුණා. ඒ කටයුත්ත නතර කිරීමට නාවික හමුදාව, ධීවර දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව මොන තරම් උත්සාහ කළත්, ඒ ගොල්ලන්ට ලැබෙන තොරතුරු ප්‍රමාණවත් නොවීම නිසා ඒ කටයුතු කර ගැනීමට අපහසුතා රාශියක් ආවා. ඒ වාගේම ඩයිනමයිට් යොදා මසුන් මරන ව්‍යාපාරය නතර කරන්න නම්, ධීවර පනත යටතේ නඩු දාලා හරියන්නේ නැහැ. පුපුරණ ද්‍රව්‍ය ආඥා පනත යටතේ නඩු දැම්මොත් තමයි ඒ ක්‍රියාදාමය නතර කරන්න පුළුවන් වන්නේ කියලා මම මතක් කරන්න කැමැතියි. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඒ පිළිබඳව දැනුවත් කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම අද වනවිට ජනතාවට අහිතකර කේරළ ගංජා, විෂ මත්ද්‍රව්‍ය වැනි දේවල් මෙම මුහුදු තීරයෙන් ගොඩබිමට ඇවිල්ලා තිබෙනවා. පොලීසිය, ත්‍රිවිධ හමුදාව, නාවික හමුදාව මේවා අල්ලාගෙන තිබෙනවා. ගරු ඇමතිතුමනි, අද නව තාක්ෂණය තිබෙනවා. ඩ්‍රෝන යාත්‍රා භාවිත කරලා මේ කටයුතු නිරීක්ෂණය කර ඒවා වළක්වා ගැනීමට හැකියාව තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට තවත් මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ගරු ඇමතිතුමනි, මේ කරුණු පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම අපේ ත්‍රිකුණාමල මුහුදු තීරයේ තමයි ලොකුම නැව් ගමන් මාර්ගය තිබෙන්නේ. ඒ නැව්වල යන මිනිස්සු විශාල ලෙස මුහුදට කුණු දමනවා. ඒවා ඔක්කෝම එන්නේ ත්‍රිකුණාමලය, කෝකිලායි, ලංකාපටුන වෙරළ තීරයට. එහෙම නැත්නම් මුලතිව් වෙරළ තීරයට. මේ පිළිබඳව වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සහ නාවික හමුදාව දැනුවත් කරලා, කුමන හෝ ක්‍රමවේදයකින් මේ නැව්වලින් අපද්‍රව්‍ය පිටතට දැමීම නවත්වන්න ඕනෑ.

අපේ වෙරළ තීරයේ සංචාරක කර්මාන්තය විශාල වශයෙන් ප්‍රචලිත කරන්න පුළුවන්. අතිගරු ජනාධිපතිතුමා අනාගතයේ දී අපේ රටේ සංචාරක කර්මාන්තය ව්‍යාප්ත කරන්න යන ස්ථානයක් වන පොතුවිල් දක්වා වෙරළ තීරය පිරිසිදු කිරීම සඳහා අදාළ අනෙකුත් සියලු අමාත්‍යාංශත් එකතු කරගෙන කටයුතු කරන්න කියලා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. ඒ වාගේම ධීවර ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වමින්, ඒ ගොල්ලන් ලබා ගන්නා මත්ස්‍ය සම්පතින් උපරිම ප්‍රයෝජන ගන්න කටයුතු සලසන්න කියලාත් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මන්ත්‍රීතුමියට හිත් රිදීමක් ඇති වෙලා, අද සාකච්ඡාවට බඳුන්වන මාතෘකාව වෙනස් කරමින් එතුමිය කථා කළා. මම විශේෂයෙන්ම කියන්න කැමැතියි, අපි මේ ගරු සභාවේ දී කථා කරන දේ පිළිබඳව මේ රටේ ලක්ෂ සංඛ්‍යාත ජනතාව බලාගෙන ඉන්න බව. අපි ඔවුන්ට ආදර්ශයක් දෙන්න ඕනෑ. අපේ ගෙදර තිබෙන ප්‍රශ්න මේ ගරු සභාවට ගෙනැල්ලා හරි යන්නේ නැහැ. මේ ගරු සභාවේ දී කථා වෙච්ච වචන මොනවාද? ඉස්සරහයි, පස්සයි ගැන තමයි කථා කළේ. මිනිස්සු ඡන්දය දීලා අප පාර්ලිමේන්තුවට එවන්නේ මේකටද? මිනිස්සු ඡන්දය දීලා අප පාර්ලිමේන්තුවට එවන්නේ මේ රටේ මිනිසුන්ගේ ප්‍රශ්න ගැන කථා කරන්නයි. ඒ නිසා ගරු මන්ත්‍රීතුමිය, කරුණාකරලා කථා කරනකොට ආදර්ශවත් විධියට කථා කරන්නට කටයුතු කළොත් හොඳයි. "ජම්මෙට වඩා පුරුද්ද ලොකුයි" කියලා කියමනක් තිබෙනවා. ඒක නැති කර ගන්න කියලා ඉල්ලීමක් කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

[பி.ப. 6.02]

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

கௌரவ தலைமை தாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய இந்த விவாதத்திலே உரையாற்றுவதற்கு நேரம் வழங்கியமைக்காக முதலில் எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். திருகோணமலை மாவட்டத்தைப் பொறுத்த வரையில், குறிப்பாக கிண்ணியா, மூதூர், தோப்பூர் அதேபோன்று வெருகல், குச்சவெளி, புல்மோட்டை போன்ற பகுதிகளிலே மீன்பிடித்தொழிலை நம்பித் தமது அன்றாட வாழ்க்கையினை நடாத்திக் கொண்டிருக்கின்ற கூடுதலான மக்கள் இருக்கின்றார்கள். புதிய தொழில்நுட்பம் அல்லது புதிய வசதிகள் செய்து கொடுக்கப்படாமையினால் எங்களுடைய பிரதேசத்திலே இருக்கின்ற மீனவர்கள் வள்ளம், தோணி, தூண்டில், வலை போன்ற உபகரணங்களைப் பயன்படுத்தியே மீன் பிடிப்பவர்களாக இருக்கின்றார்கள். கௌரவ அமைச்சர் அவர்களே, ஏனைய நாடுகளில் மீனவத் தொழிலில் முன்னெடுக்கப்படுகின்ற நவீன தொழில்நுட்ப முறைகளை எதிர்காலத்தில் எங்களுடைய மீனவர்களும் கடைப்பிடிக்கும் வகையிலான ஒரு திட்டத்தைக் கொண்டுவர வேண்டும் என்பதை இந்த இடத்திலே நான் கேட்டுக்கொள்கின்றேன்.

இந்திய மீனவர்கள் நமது நாட்டுக் கடல் எல்லைக்குள் வந்து மீன்பிடிப்பதன்மூலமாக நம் நாட்டு மீனவர்களுக்கு ஏற்படுகின்ற பாதிப்பைப்போன்று, திருகோணமலை மாவட்டக் கடல் எல்லைக்குள் வெளி மாவட்ட மீனவர்கள் வந்து மீன் பிடிக்கின்ற காரணத்தினால், பல்வேறுபட்ட பிரச்சினைகள் இன்று எங்களுடைய மாவட்டத்திலே ஏற்பட்டுக் கொண்டிருக்கின்றன. கடற்றொழிலை மாத்திரம் நம்பியிருக்கின்ற மீனவர்கள் அநாதைகளாக்கப்படுகின்ற ஒரு நிலைமையும் அவர்களுக்கிடையில் சண்டை அல்லது முறுகல் ஏற்படுகின்ற ஒரு நிலைமையும் இன்று எங்களுடைய மாவட்டத்திலே ஏற்பட்டுக் கொண்டிருக்கின்றது. குறிப்பாக, குச்சவெளி, புல்மோட்டைப் பிரதேசங்களிலே அதிகூடுதலான அளவிலே இந்த நிலைமை காணப்படுகின்றது. இவ்வாறான பிரச்சினைகள் காரணமாக சம்பந்தப்பட்டவர்கள் பொலிஸ் நிலையங்களில் முறையிடுகின்ற, ஆர்ப்பாட்டங்களில் ஈடுபடுகின்ற செயற்பாடுகள் இடம்பெறுகின்றன. இவ்வாறு வெளி மீனவர்கள் எங்களுடைய பிரதேசத்திலே வந்து மீன் பிடிக்கின்ற செயற்பாட்டினால், இன்று எத்தனையோ படகுகள் கொளுத்தப்பட்டு, சொத்துக்களும் நாசமடைந்திருக்கின்றன. ஆகையால், இந்தப் பிரச்சினைக்கான ஒரு சரியான தீர்வைக் கௌரவ அமைச்சர் அவர்கள் வழங்கவேண்டும் என்பதையும் இந்த இடத்திலே வேண்டிக்கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, குறிப்பாக, நாங்கள் பிரதிநிதித்துவப்படுத்துகின்ற திருகோணமலை மாவட்டத்தில் பலராலும் பேசப்படுகின்ற சுருக்குவலைப் பிரச்சினைக்கான சரியான ஒரு தீர்வை அமைச்சினூடான ஒரு சுற்றுநிருபம் மூலமாக நீங்கள் அமுல்படுத்த வேண்டுமென்ற விடயத்தை நான் இந்த இடத்திலே கூறிக்கொள்ள விரும்புகின்றேன். 1970ஆம் ஆண்டு முதல் சுதந்திரமாகச் சுருக்குவலையைப் பயன்படுத்தி மீன்பிடித்தவர்களுக்கு 2011ஆம் ஆண்டிலிருந்து அனுமதிப்பத்திரம் வழங்குகின்ற ஒரு நடைமுறை கொண்டுவரப்பட்டிருக்கின்றது. இந்த நடைமுறையைக் கொண்டுவந்ததற்குப் பின்னர் எங்களுடைய பிரதேசத்திலே 7 கிலோமீற்றருக்கு அப்பால் சென்று மீன்பிடிக்க வேண்டுமென்ற ஒரு விடயமும் அதன்மூலமாகக் கொண்டு வரப்பட்டிருக்கின்றது. கிண்ணியா, மூதூர், ஜமாலியா போன்ற பிரதேசங்களிலே சிறிய படகுகள்மூலமாக மீன்பிடிக்கின்ற மீனவர்கள்தான் இருக்கிறார்கள். கடலிலே 7 கிலோமீற்றருக்கு அப்பால் சென்று மீன் பிடிக்கின்ற வசதி இவர்களிடம் இல்லை. ஆகையால், இதிலும் நீங்கள் கவனம் செலுத்த வேண்டும். அத்துடன், இந்த 7 கிலோமீற்றருக்கு அப்பால் சென்றுதான் மீன்பிடிக்க வேண்டுமென்ற கட்டுப்பாடு திருகோணமலை மாவட்டத்திற்கு மாத்திரமா இருக்கின்றது? என்ற கேள்வி இன்று எல்லா மீனவர்களிடமும் எழுந்திருக்கின்றது. ஏனென்றால் சில மாவட்டங்களில் அவ்வாறான கட்டுப் பாடுகள் தளர்த்தப்பட்டிருக்கின்றனவா? அல்லது இருந்தும் இல்லாதது போன்று இருக்கின்றதா? என்ற கேள்விகள் எங்களுடைய மீனவர்களால் கேட்கப்படுகின்றன. சுருக்கு வலை அனுமதிப்பத்திரம் வழங்குவதிலே முறையான ஓர் ஒழுங்குமுறை இல்லாத ஒரு நிலைமை காணப்படுகின்றது.

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

குறிப்பாக, சில வருடங்களில் 8 மாதங்களுக்கும் சில வருடங்களில் 10 மாதங்கள் அல்லது 6 மாதங்களுக்கு அந்த அனுமதி வழங்கப்படுகின்ற காரணத்தால் மீனவர்கள் பல இன்னல்களை - கஷ்டங்களை அனுபவிக்கின்றார்கள். ஆகையால், இவற்றையும் கருத்திற்கொண்டு இதற்கான சரியான ஒரு தீர்வையும் வழங்கவேண்டுமென்று இந்த இடத்திலே கேட்டுக்கொள்கின்றேன்.

அண்மைக்காலமாக கடும் மழை பெய்து வருவதன் காரணமாக மீனவர்கள் மாதக் கணக்கில் கடலுக்குச் செல்லமுடியாத சூழ்நிலை ஏற்பட்டிருக்கின்றது. அதனால் அவர்களின் இயல்பு வாழ்க்கை பாதிக்கப்பட்டிருக்கின்றது. ஆகையால், அவர்கள் தங்களுடைய வாழ்வாதாரத்தை ஈட்டிக் கொள்வதற்கான உதவியை அரசாங்கம் மேற்கொள்ள வேண்டுமென்ற விடயத்தையும் இந்த இடத்திலே கூறிக் கொள்கின்றேன். அத்துடன், எரிபொருள் மானியத்தையும் அவர்களுக்கு நியாயமான முறையிலே வழங்கவேண்டுமென்று கேட்டு, எனது உரையை முடித்துக்கொள்கின்றேன்.

[අ.භා. 6.08]

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ධීවර කර්මාන්තය කියන්නේ මේ රට පොහොසත් රටක් කරන්න අපට යොදා ගන්න පුළුවන් කර්මාන්තයක්. එම කර්මාන්තය ගැන සාකච්ඡා කරන මේ මොහොතේ, මටත් අදහස් දක්වන්න අවස්ථාවක් ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඊට ප්‍රථම, අද මේ පාර්ලිමේන්තුවේ ඇති වුණු තත්ත්වය ගැන මම විනාඩියක් කථා කරන්න ඕනෑ. කාන්තා මන්ත්‍රීවරියක විධියට හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මියට යම් අපහාසයක් වෙලා තිබෙනවා නම් අවංකවම මා ඒ ගැන කනගාටු වෙනවා. හැබැයි, ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියත් මවක්. මාත් මවක්. අපි මීට වඩා ආදර්ශවත්ව කටයුතු කරන්න ඕනෑ. යම් යම් වචන පාවිච්චි කරද්දී අපට හිත්වේදනා ඇති වෙන්න පුළුවන්. මමත් මගේ ජීවිත කාලය තුළදී අබමල් රේණුවක තරම්වත් හොරකමක් කරලා නැහැ; අනුන්ගේ දෙයක් අරගෙන නැහැ. හැබැයි, අපි දේශපාලනයට ඇවිල්ලා ගොඩක් අපහාස විඳලා තිබෙනවා. කාන්තාවන් විධියට අපි ඒ වාගේ ප්‍රශ්නවලට මුහුණ දෙද්දී බුද්ධිමත්ව කටයුතු කරන්නට ඕනෑ. එහෙම නැති වුණොත්, කාන්තා දේශපාලනයේ තත්ත්වයම කඩා වැටෙනවා.

මේ හඬ පට පිළිබඳ සිද්ධිය අද අපේ පාර්ලිමේන්තුවේ විවාදයට ලක් වෙලා තිබෙන කාරණයක්. මිනිසුන්ට ඕනෑම දෙයක් කථා කරන්න පුළුවන්. නමුත් යහළුවෝ අතර කථා කරන දේවල් පටිගත කිරීම හොඳ නැහැ. මම නම් කවදාවත් කුණුහරුප කථා කරන්නේ නැහැ. හැබැයි, ඒවා කථා කරන මිනිස්සු ඉන්නවා. ඒ කථා පටිගත කිරීම තමයි මෙතැන තිබෙන පළමු වැරැද්ද.

ඊළඟට, අධිකරණ ක්ෂේත්‍රයට දේශපාලනඥයන් අත ගැසීමත් වැරැදියි. මම නීතිඥවරියක්. වැඩබලන මහේස්ත්‍රාත්වරියක විධියටත් මම කටයුතු කර තිබෙනවා. 2008 වර්ෂයේදී මම දේශපාලනයට පා තබන තුරු -1998 සිට අවුරුදු 10ක කාලයක්- වැඩ බලන මහේස්ත්‍රාත්වරියක විධියට කටයුතු කළ කාලයේවත් මම මගේ සේවාදායකයෝ පෞද්ගලිකව හම්බ වෙලා නැහැ. විනිසුරුවරුන් සමඟ කළ සංවාද ඇතුළත් හඬ පටවලින් අද සත්‍යය සොයා ගෙන තිබෙනවා. අධිකරණ ක්ෂේත්‍රයේ මේ කඩා වැටීම ගැන අප තුළ ලොකු කනගාටුවක් තිබෙනවා. මේ රට තුළ ඇති වුණු ඒ මතවාදය ඒ තරම් හොඳ දෙයක් නොවෙයි. දේශපාලනඥයන් පිළිබඳවත් නරක මතවාදයක් අද රටේ ඇති වෙලා තිබෙනවා.

අධිකරණ ක්ෂේත්‍රය මේ විධියට කඩා වැටුණාම මොකද වෙන්නේ? මේ සඳහා වග කිව යුතු පාර්ශ්ව මේ රට විනාශයට තමයි මේ අරගෙන ගිහිල්ලා තිබෙන්නේ. මේ රටේ ජීවත් වන වග කිව යුතු පුරවැසියන් විධියට හැම කෙනෙකුටම මේ වග කීම භාර ගන්න වෙනවා. විශේෂයෙන්ම, මේ රටට ආදර්ශවත් පුරවැසියන් විධියට පාර්ලිමේන්තුවෙන් අපි එය පටන් ගන්න ඕනෑ. පාර්ලිමේන්තුව ඒ ආදර්ශවත්භාවය පෙන්නුවොත්, රටත් ආදර්ශවත් වෙනවා.

රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා විනිශ්චයකාරවරුන්ට කථා නොකර හිටියා නම්, මේ ප්‍රශ්නය ඇති වෙන්නේ නැහැ. විනිශ්චයකාරවරු කියන්නේ අපට වඩා ඉහළ අයයි. විනිශ්චයකාරවරු තමන්ගේ ආචාර ධර්ම රැක්කා නම් මේ කඩා වැටීම රටේ සිද්ධ වෙන්නේ නැහැ. අපේ වග කිව යුතු පිරිස් අතර තමයි මේ කඩා වැටීම, මේ අපරාධය සිදු වෙලා තිබෙන්නේ. අධිකරණයේ කටයුතුවලට මැදිහත් වීම, ඇඟිලි ගැසීම අධිකරණයට අපහාස කිරීමක්. නීතිය පැත්තෙන් බැලුවොත්, මේ සම්බන්ධයෙන් ගොඩක් ක්‍රියා මාර්ග ගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ අපි සාකච්ඡා කරන මාතෘකාව ගැනත් මම පොඩ්ඩක් කථා කරන්න ඕනෑ. ධීවර කර්මාන්තයේ උන්නතිය වෙනුවෙන් අපි ධීවරයන්ට ලාම්පු තෙල් සහනාධාරයක් ලබා දුන්නා. ඒ සහනාධාරය තවදුරටත් පවත්වාගෙන යන්නට ඕනෑ. ධීවර කර්මාන්තයේ දියුණුව වෙනුවෙන් අද අපි මේ නියෝග සම්මත කරනවා. මේ නියෝග මඟින්, විශේෂයෙන්ම ජාතික උද්‍යාන කිහිපයක්, අභයභූමි කිහිපයක් නම් කරලා, වෙරළ සංරක්ෂණය කිරීමේ වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, මත්ස්‍ය අපරාධ, ධීවරයන් සම්බන්ධ අපරාධ ගැනත් නීති රීති මේ නියෝග තුළ අඩංගු වෙලා තිබෙනවා. දුර්ලභ මසුන්ගේ ජීවිත ආරක්ෂා කිරීමට, ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමට, කොරල්පර ආරක්ෂා කිරීමටත් මේ තුළ ප්‍රතිපාදන සලසා තිබෙනවා. ඒ අනුව, මේ නීති රීති තුළින් රටේ ස්වාභාවික සම්පත් ආරක්ෂා කරගනිමින්, ධීවර කර්මාන්තය ඉදිරියට ගෙන යැමට අපට පුළුවන්කම ලැබෙනවා.

අද ඉදිරිපත් කර තිබෙන මේ නියෝග ගැන අපේ මැති ඇමතිතුමන්ලා කථා කළා. ඒ කාරණා එකින් එක අරගෙන කථා කරන්න මට වෙලාව මදි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙය, ඉතා වැදගත් නීති සමූහයක් ක්‍රියාවට නංවන්න අවශ්‍ය නියෝග සම්මත කරගන්නා අවස්ථාවක්. මේ නීති රීති මඟින් ධීවර කර්මාන්තය දියුණු වෙනවා වාගේම, ධීවරයාගේ වෘත්තීය ආරක්ෂාවත් සැලසෙනවා.

අතිගරු ජනාධිපතිතුමාගේ, "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළත් විශේෂයෙන්ම ධීවරයන් සම්බන්ධයෙන් කථා කර තිබෙනවා. ඔවුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් විශේෂ වැඩ පිළිවෙළක් සකස් කරන්න තමයි අතිගරු ජනාධිපතිතුමා අද මේ රට භාරගෙන තිබෙන්නේ.

අපි විශේෂයෙන්ම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදීත් මෙන්න මේ කාරණය සාකච්ඡා කළා. අම්පාර දිස්ත්‍රික්කයේ ධීවරයන් විශාල පිරිසක් ඉන්නවා. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව

විධියට පසුගිය කාලසීමාවේ අපි යෝජනාවක් අනුමත කර ගත්තා. පසුගිය කාලයේ අම්පාර දිස්ත්‍රික්කයේ ධීවරයන්ගේ ඒ ජීවනෝපාය අහිමි වුණා. කුඹුරු ගොවිතැන් කරන ජනතාවගේත් ජීවනෝපාය අහිමි වුණා. මේ අයට යම් කිසි සහනයක් දෙන්න අපි ආණ්ඩුවක් විධියට මැදිහත් වෙන්න ඕනෑය කියන යෝජනාව අපි එම කමිටුවේදී සම්මත කරලා එව්වා. සේනානායක සමුද්‍රයෙන් පටන් ගත්තාම, දැවැන්ත මිරිදිය වැව් රාශියක් තිබෙන දිස්ත්‍රික්කයක් තමයි, අපේ දිස්ත්‍රික්කය.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
මට තව විනාඩියක් ලබාදෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඔලුවිල් වරාය වහන්න කියලා මේ වෙනකොට සමහර අය යෝජනා කරනවා. විශාල වියදමක් දරලා අපේ දිස්ත්‍රික්කයේ හදලා තිබෙන මේ වරාය අපි රැකගන්න ඕනෑ. මෙම වරාය සෑදීමෙන් මුහුදු ඛාදනය සිද්ධ වෙලා, ඔලුවිල්, නින්දවූර් කියන ගම්මානවලට හානියක් වෙනවා කියලා කියනවා. මේ ඔලුවිල් වරාය හදන්න ගෙනාපු ගල් තිබෙනවා. ඒ ගල් දමලා මුහුදු ඛාදනය නවත්වන්න පුළුවන්, ගරු ඇමතිතුමනි.

අපේ දිස්ත්‍රික්කයේ මිරිදිය ධීවර කර්මාන්තය වැඩි දියුණු කරන්න, ඒ වැව්වල මත්ස්‍ය වගාව වැඩි කරන්න කටයුතු කරන්න ඕනෑ. ඒ වාගේම, තිස්දහසක විතර පවුල් සංඛ්‍යාවක් ඔලුවිල් වරාය ආශ්‍රිතව ධීවර කර්මාන්තයේ යෙදෙනවා. ඒ නිසා එම ධීවර වරායත් ආරක්ෂා කරමින්, ඉදිරියේදී මේ රටේ ධීවර කර්මාන්තය දියුණු කරන්න ඕනෑ. අපට විදේශ විනිමය උපයන්න පුළුවන්, මහා ධනස්කන්ධයක් හොයන්න පුළුවන් කර්මාන්තයක් තමයි, මේ ධීවර කර්මාන්තය. රත්නපුරයේ මැණික් තිබෙනවා වාගේම, රට වටේම තිබෙන මේ මුහුදත් අපේ රටට මහා සම්පතක්. ඒ නිසා මේ සම්පත ආරක්ෂා කරගන්න කටයුතු කරන්න කියා ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

[பி.ப. 6.18]

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(மாண்புமிகு அப்துல்லா மஹரூப்)
(The Hon. Abdullah Mahrooff)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நடைபெறும் மிக முக்கியமான ஓர் அமைச்சின் மீதான விவாதத்தில் கலந்து கொண்டு பேசுவதற்குச் சந்தர்ப்பம் தந்தமைக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

இந்த அமைச்சைப் பொறுப்பேற்றிருக்கின்ற ஒரு தமிழ் பேசும் மகனாகிய கௌரவ அமைச்சர் டக்ளஸ் தேவானந்தா அவர்களை நான் கடந்த வாரம் சந்தித்துப் பேசியபோது, எமது மாவட்டத்திலுள்ள மீனவர்களுடைய பிரச்சினையைத் தீர்த்து வைப்பதற்கு உடனடியாக நடவடிக்கை எடுப்பதாகக் கூறினார். அதாவது, அந்த மீனவர் சங்கங்களை அழைத்து வந்து அவர்களுடைய பிரச்சினைகளைத் தான் நேரடியாகக் கேட்டறிந்து தீர்த்து வைப்பதாகக் கூறியிருக்கின்றார். அதுமட்டுமல்லாமல், எமது பிரதேசத்திற்கு நேரடியாக வருகைதருவதாகவும் எனக்கு வாக்குறுதியளித்திருக்கின்றார். அதற்காக நான் கௌரவ அமைச்சர் அவர்களுக்கு முதலிலே நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

இந்த நாட்டிலேயிருக்கின்ற கடல் வளத்தைப் பொறுத்த வரையிலே, சுமார் 517,000 சதுர கிலோமீற்றர் கடற்பரப்பினைக் கொண்டதாக எமது கடல் வளம் அமைந்துள்ளது. அதேபோன்று, உலர் வலயமானது சுமார் 489,000 சதுர கிலோமீற்றர் பரப்பளவுள்ள நன்னீர் வளத்தைக் கொண்டுள்ளது. இந்த நாட்டினுடைய சுற்றளவிலே மன்னார், யாழ்ப்பாணம், முல்லைத்தீவு, திருகோணமலை, மட்டக்களப்பு, பொத்துவில் வரையிலான பிரதேசம் கிட்டத்தட்ட 889 கடல் மைல் நீளத்தைக் கொண்டது. அதேநேரத்தில், மன்னாருக்கு அப்பால், அம்பாந்தோட்டை தொடக்கம் கொழும்பு வரையான பகுதி 459 கிலோமீற்றராக இருக்கின்றது.

எமது வடக்கு, கிழக்குக் கரையோரப் பகுதி ஒரு வளமிக்க பகுதியாகத் திகழ்கின்றது. இந்த நாட்டின் மீனுற்பத்தியில் மூன்றில் இரண்டு பகுதி அங்கிருந்து கிடைக்கின்றது. மன்னாரிலிருந்து முல்லைத்தீவு வரையான பிரதேசத்திலேயே கூடுதலான அதாவது 40 சதவீதமான மீனுற்பத்தி செய்யப்படுகின்றமை உங்களுக்குத் தெரியும். அங்கேயே மீனின் பிறப்பும் வளர்ச்சியும் காணப்படுகின்றது. கடல் அடித்தளமேடை எனக் கூறப்படுகின்ற continental shelf அந்தப் பிரதேசத்திலே அமைந்திருக்கின்றது. அதற்கு அண்மையில் இருக்கின்ற இந்தியா மற்றும் மாலைத்தீவு போன்ற நாட்டு மீனவர்களுடைய ரோலர் படகுகளால் அங்குள்ள மீன்வளம் கொள்ளையடிக்கப்படுவதை இன்று நாங்கள் காண்கின்றோம்.

அன்று மீன்பிடித் துறைக்குப் பொறுப்பாக இருந்த அமைச்சர்களிடம் அதாவது ஜோசப் மைக்கல் பெரேரா தொடக்கம் மஹிந்த விஜேசேகர வரை பதவி வகித்த அமைச்சர்களிடம் எங்களுடைய மீனவர்களுடைய பிரச்சினை களைப் பற்றி நாங்கள் சொல்லி வந்திருக்கின்றோம். குறித்த 30 வருட காலத்தில் தீர்க்கப்படாத இந்தப் பிரச்சினைகள் இன்றைய அமைச்சர் அவர்களின் பதவிக் காலத்திலே தீர்க்கப்படும் என்ற நம்பிக்கை எமக்கு உண்டு.

திருகோணமலையிலே இருக்கின்ற inner harbour area இல் 7 கடல் மைல் தூரத்திற்குள் மீன்பிடித்தொழிலை மேற்கொள்ளமுடியாத சூழல் இருக்கின்றது என்பது உங்களுக்குத் தெரியும். கிண்ணியா, மூதூர் பிரதேச மீனவர்கள் 25 கடல் மைல் தூரத்திற்கு அப்பால் சென்றுதான் மீன்பிடிக்க முடியும். அதேநேரம் அவர்களால் சிறிய கண்ணாடிப் படகுகளைக் கடலுக்குக் கொண்டுசெல்ல முடியாதுள்ளது. ஏனென்றால், அதிலே காலித் துறைமுகத்தில் காணப்படுவது போன்று buoy கள் - மிதவைகள் 4 கடல் மைல் தூரத்திற்குள் இடப்பட்டு அடையாளப்படுத்தப்பட்டிருக்கின்றது. ஆகவே, அந்த மீனவர்கள் சிறிய வள்ளங்களிலும் படகுகளிலும் சென்று தங்களுடைய மீன்பிடியைத் தொடர்வதற்கு நீங்கள் அனுமதிக்க வேண்டும்.

அங்கு கரையோரங்களிலே இருக்கின்ற குறித்த முகாம்கள் அவர்கள் மீன்பிடியில் ஈடுபடுவதற்குத் தடையாக இருக் கின்றன. ஆகவே, அது சம்பந்தமாகவும் நடவடிக்கை எடுக்க வேண்டும். கௌரவ அமைச்சர் அவர்களே, உங்களைப் பொறுத்தவரையிலே நீங்கள் சொல்லுகின்றவற்றை செய்கின்ற ஓர் அமைச்சராகக் கடந்த காலங்களில் திகழ்ந்திருக்கின்றீர்கள். அதேநேரம் நீங்கள் இந்த மக்களுடைய மொழியைப்

[ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා]

புரிந்துகொள்கின்றவர் என்ற வகையிலே, கடந்த 30 வருட காலமாக அந்த மீனவர்கள் அனுபவித்துக்கொண்டிருக்கின்ற இந்தத் தடையை நீக்கித் தருவீர்கள் என்ற நம்பிக்கை எனக்கிருக்கின்றது

சிறிமாவோ பண்டாரநாயக்க அவர்களுடைய காலத்திலே, அதாவது 1972 - 1974ஆம் ஆண்டு காலப்பகுதியில்தான் மீன்பிடிக் கூட்டுறவுச் சங்கங்கள் உருவாக்கப்பட்டன. பின்னர் அந்தச் சங்கங்கள் 'நோர்வே' என்கின்ற அமைப்பின்கீழ் வந்தாலும்கூட அதன் தலைவர்கள், நிர்வாக உத்தியோகத்தர்கள் அத்தனை பேரும் எமது சிறுபான்மைச் சமூகத்தைச் சாராதவர்களாக, எங்களுடைய மொழியைப் புரிந்துகொள்ளாதவர்களாகவே இருந்தார்கள். ஆகவே, இந்த விடயத்தில் எங்களுடைய சிறுபான்மைச் சமுகத்தினருக்கு நிவாரணம் வழங்கும் வகையில் நடவடிக்கை எடுக்கப்பட வேண்டும்.

இன்று புல்மோட்டை தொடக்கம் இலங்கைத்துறை வரைக்கும் இருக்கின்ற 105 கடல் மைல் பரப்பிலே எங்களுடைய மீனவர்கள் ஆழ்கடலுக்குச் செல்லக்கூடிய வகையில் அவர்களிடம் வளங்கள் ஒன்றுமேயில்லை. ஆகவே, உங்களுடைய காலப்பகுதியில் அந்தப் பிரதேசத்தில் வாழ்கின்ற 80 சதவீதமான மீனவர்களுக்கு குறித்த உதவித்திட்டங்கள் கிடைக்க வழிசெய்ய வேண்டும் என்று கேட்டுக் கொள்கின்றேன். இந்த விடயத்திலே எங்களுடைய மீனவர்கள் அமைச்சர் அவர்களுடைய உதவியை நாடி நிற்கின்றார்கள்.

இன்று பாராளுமன்றச் சபை முதல்வராகத் தெரிவு செய்யப்பட்டிருக்கின்ற அமைச்சர் கௌரவ தினேஷ் குணவர்தன அவர்கள் சிறந்த பண்புள்ளவர். மனிதாபிமான முள்ள ஓர் அமைச்சராக நான் அவரைக் காண்கின்றேன். அந்த வகையில் கௌரவ அமைச்சர் தினேஷ் குணவர்தன அவர்களுக்கு நான் நன்றி கூறக் கடமைப்பட்டிருக்கின்றேன். கௌரவ அமைச்சர் அவர்களே! எமது கரையோரப் பகுதி மக்களுடைய மீன்பிடித் தொழிலில் இருக்கின்ற குறித்த தடைகளை நீக்கித் தருவதிலே உங்களுடைய ஒத்துழைப்பு எங்களுக்கு அவசியமானதாகும். இன்று எங்களுடைய மீனவர்கள் ஆழ்கடலில் மீன்பிடிக்க முடியாத அளவுக்கு நிலைமை காணப்படுகின்றது. அதாவது, பல வெளிநாடுகள் எங்களுக்குச் சிறிய சிறிய படகுகளை உற்பத்தி செய்து தருகின்றபோதிலும், வெளிநாட்டு 'ரோலர்' படகுகள் எங்களுடைய பிரதேச மீன்வளத்தைக் களவாடிக்கொண்டு செல்கின்ற நிலைமை காணப்படுகின்றது. எனவே, நீங்கள் இந்தச் செயற்பாட்டைத் தடுத்து நிறுத்த வேண்டும், எங்களுடைய மீனவ மக்களது உரிமைகளை வென்று கொடுக்க வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

இன்று தடைசெய்யப்பட்ட மீன்பிடி முறை பற்றி எல்லாம் கூறப்படுகின்ற நிலையில், எமது மீனவர்களுக்குப் பயிற்சிகளை வழங்கி அவர்களுக்கு மத்தியில் புதிய மீன்பிடி முறைகளை அறிமுகப்படுத்த கௌரவ அமைச்சர் அவர்கள் நடவடிக்கை எடுக்க வேண்டும் என்றும் இந்தச் சந்தர்ப்பத்திலே நான் கேட்டுக் கொள்ள விரும்புகின்றேன்.

நான் பிரதி அமைச்சராக இருந்தபோது, எங்களுடைய இயற்கைத் துறைமுகத்திலே கப்பல் கட்டுமான வேலைகளை மேற்கொள்வதற்காகச் சம்பந்தப்பட்ட இரண்டு நிறுவனங் களுக்கு அது சம்பந்தமான விபரங்களைத் தெரியப் படுத்தியிருந்தேன். அங்கு கப்பல் கட்டுமான வேலைகளை மேற்கொள்வதற்கு நடவடிக்கை எடுக்கப்பட வேண்டும். அங்கு புடவைக்கட்டு, புல்மோட்டை, கிண்ணியா போன்ற பிரதேசங்களில் மட்டுமல்ல, தோப்பூரிலும் மீன்பிடித் துறை முகத்தை அமைத்துத் தருவதாக அன்று மஹிந்த அமரவீர அவர்கள் வாக்குறுதி அளித்திருந்தார். 2010இலே சுசந்த புஞ்சிநிலமே அவர்கள்கூட இவ்வாறு வாக்குறுதி அளித்தார். குறித்த வேலைகள் இடம்பெறாத நிலையில், கௌரவ அமைச்சர் அவர்களே, உங்களுடைய காலப் பகுதியிலே அந்த மீன்பிடித் துறைமுகங்கள் அமைக்கப்படுவதற்கு நீங்கள் நடவடிக்கை எடுக்க வேண்டும்.

இறுதியாக, அமைச்சர் ஜோன்ஸ்டன் பர்னாந்து அவர்கள் தனது பதவிக் காலத்திலே எமது பிரதேசத்திலுள்ள துறைமுகத்திலே கப்பல் கட்டுமானப் பணிகளை மேற் கொள்வதற்கு நடவடிக்கை எடுத்து, அந்தத் துறைமுகம் தென் கிழக்காசியாவிலே சிறந்த கப்பல் கட்டும் இடமாக விளங்குவதற்கு ஆவன செய்ய வேண்டும் என்று கேட்டு, விடைபெறுகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, Hon. Muhammad Ibrahim Muhammad Mansoor. We have about three to four minutes left.

[பி.ப. 6.24]

ගරු මුහම්මදු ඉබ්‍රාහිම් මුහම්මදු මන්සූර් මහතා
(மாண்புமிகு முஹம்மது இப்ராஹிம் முஹம்மது மன்சூர்)
(The Hon. Muhammad Ibrahim Muhammad Mansoor)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கடற்றொழில் நீரியல் வளங்கள் சட்டத்தின்கீழ் கொண்டுவரப் பட்டிருக்கின்ற ஒழுங்குவிதிகள் தொடர்பான விவாதத்திலே கலந்துகொள்வதிலே நான் மகிழ்ச்சியடைகின்றேன். எனக்கு ஒதுக்கப்பட்ட நேரம் தாராளமாகக் குறைக்கப்பட்ட நிலையிலே, நான் மிகச் சுருக்கமாகப் பேசவேண்டிய நிர்ப்பந்தத்திலே இருக்கிறேன்.

இந்த விவாதம் ஆரம்பிக்கப்பட்ட நேரத்திலிருந்து குறித்த விவாதம் தொடர்பாக அல்லாமல், வேறு வேறு விடயங்கள் சம்பந்தமாகத்தான் பெரும்பாலான பாராளுமன்ற உறுப்பினர்கள் அதிலும் ஆளும் கட்சியில் இருக்கின்ற உறுப்பினர்கள் பேசினார்கள். அந்த வகையிலே தனிமனிதர் களுடைய அசிங்கங்களையும் அவர்களுடைய இரகசியங் களையும் பற்றிப் பேசுவதற்கு இந்த உயரிய சபை பாவிக்கப்படுவதையிட்டு நான் கவலைப்படுகின்றேன். அதுவும் கடந்த சனாதிபதித் தேர்தலின் பின்னர், அவசரமாக ஆளும் கட்சிக்கு வந்த பாராளுமன்ற உறுப்பினர்கள் மற்றும் அமைச்சர்கள் ஒரு முன்மாதிரியான அமைப்பிலே இந்த ஆட்சியைக் கொண்டுபோவார்கள், இந்த நாட்டை முன்னேற்றுவார்கள் என்று மக்கள் நம்பிக்கொண்டிருந்தார்கள். இவ்வாறான ஒரு சூழலிலேதான், நகைப்புக்குரிய ஒரு சபையாக இந்தப் பாராளுமன்றம் மாறியிருக்கிறது.

சக பாராளுமன்ற உறுப்பினர் ரஞ்ஜன் ராமநாயக்க அவர்கள் சேமித்து வைத்திருந்த தொலைபேசி உரையாடல்கள்

அவரால் வெளிப்படுத்தப்படவில்லை என்றால் அது பெரிய குற்றமான விடயம் அல்ல. ஆனால், குறித்த உரையாடல்கள் மூலமாக அவர் குற்றவாளியாகக் காணப்பட்டால், அவரைத் தண்டிப்பது குறித்து யாருக்கும் ஆட்சேபனை கிடையாது. ஆனால், அந்த உரையாடல் பதிவுகளைக் கைப்பற்றிய பொலிசார் இன்று அவற்றைத் தாராளமாக வெளிப்படுத்தி இருக்கிறார்கள். அவை ஊடகங்களிலும் "YouTube", முகநூல் போன்ற சமூக வலைத்தளங்களிலும் மிகத் தாராளமாகப் பரிமாறப்படுகின்றன. இது மிகவும் அநாகரிகமான விடய மாகும். பொறுப்புவாய்ந்த அரசாங்கம் என்ற வகையிலே அவர்களால் இத்தகைய உரையாடல்கள் வெளிப்படுத்தப் படுவதை மிகக் கேவலமான, அசிங்கமான ஒரு விடயமாகவே நான் பார்க்கிறேன். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எங்களுடைய நேர காலத்தை இந்த நாட்டினுடைய பொருளாதாரத்தை மேம்படுத்துகின்ற விடயங்களுக்குப் பாவிக்காமல், இவ்வாறான விடயங்களில் பாவிப்பதைத் தவிர்த்துக் கொள்ள வேண்டும் என்கின்ற விடயத்தை இந்தச் சபையிலே சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் எதிர்த்தரப்பில் அமர்ந்த பிறகு இந்தப் பாராளுமன்றத்தில் பேசுகின்ற முதலாவது பேச்சு இதுவாகும். இந்தச் சந்தர்ப்பத்தில் மேதகு கோட்டாபய ராஜபக்ஷ அவர்கள் ஜனாதிபதியாகத் தெரிவு செய்யப்பட்டமை குறித்து அவருக்கு என்னுடைய வாழ்த்துக்களைத் தெரிவித்துக் கொள்கின்றேன்.

அடுத்த பொதுத் தேர்தலில் 2/3 பெரும்பான்மையை பெறுவதற்காக மேதகு ஜனாதிபதி கோட்டாபய ராஜபக்ஷ அவர்களின் தலைமையிலான தரப்பு இன்று கடும் முயற்சிகளைச் செய்து கொண்டிருக்கின்றது. எதற்காக அவர்கள் இந்த 2/3 பெரும்பான்மைப் பெற்றுக்கொள்வதற்கு முயற்சிக்கின்றார்கள் என்பது பற்றி எங்களுக்கு வெளிப்படையாகத் தெரியவில்லை. அதேநேரம் அவர்கள் மக்களுக்களித்த வாக்குறுதிகளை அவர்களுடைய பதவிக் காலத்திற்குள்ளே நிறைவேற்றுவதற்காகத் தேவைப்படுகின்ற அனைத்து ஆதரவுகளையும் நாங்கள் எதிர்க்கட்சியில் இருந்தாலும் தாராளமாகத் தருவதற்குத் தயாராக இருக்கின்றோம். அதாவது, மாணவர்களுக்குக் காலணிகளை இலவசமாக வழங்குகின்ற விடயமாக இருந்தாலும் சரி, விவசாயிகளுக்கு உர மானியம் வழங்குகின்ற விடயமாக இருந்தாலும் சரி, குறித்த விடயங்கள் அனைத்தையும் அரசாங்கம் நிறைவேற்றுவதற்கு நாங்கள் எங்களுடைய ஆதரவைத் தரவிருக்கின்றோம் என்பதைத் தெரிவித்துக் கொள்கின்றேன். நன்றி.

[பி.ப. 6.29]

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ சபைக்குத் தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இங்கு என்னுடைய அமைச்சு சார்ந்த முன்மொழிவுகள் பிரேரணைகளாக முன்வைக்கப்பட்டிருக் கின்றன. ஆளும் கட்சி உறுப்பினர்களும் எதிர்க்கட்சி உறுப்பினர்களும் சிறந்த கருத்துக்களையும் ஆலோசனை களையும் முன்வைத்தார்கள். நான் அவர்களுடைய கருத்துக் களையும் ஆலோசனைகளையும் கருத்தில் கொண்டு செயற்படுவேன் என்பதைக் கூறிக்கொள்கின்றேன். நன்றி.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Sir, I move,

"That the Regulations made by the Minister of Fisheries and Aquatic Resources Development under Section 61 of the Fisheries and Aquatic Resources Act, No. 2 of 1996 read with Section 28 of the aforesaid Act relating to Prohibition of Use of Spears in Fishing Operations and published in Gazette Extraordinary No. 2008/31 of 03rd March 2017, which were presented on 23.10.2019, be approved."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

III

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Sir, I move,

"That the Regulations made by the Minister of Fisheries and Aquatic Resources Development under Section 61 of the Fisheries and Aquatic Resources Act, No. 2 of 1996 read with Sections 29 and 61(1)(u) of the aforesaid Act relating to Prohibition of Catching Fish Species Thambuwa and published in Gazette Extraordinary No. 2014/4 of 11th April, 2017, which were presented on 23.10.2019, be approved. "

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

IV

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Sir, I move,

That the Regulations made by the Minister of Fisheries and Aquatic Resources Development and State Minister of Mahaweli Development under Section 61(1)(u) of the Fisheries and Aquatic Resources Act, No. 2 of 1996 relating to Fish and Fishery Products, Import and Re-export Management and published in Gazette Extraordinary No. 2023/51 of 15th June, 2017, which were presented on 23.10.2019, be approved."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

V

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Sir, I move,

"That the Regulations made by the Minister of Fisheries and Aquatic Resources Development under Section 61(1)(b) of the

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

Fisheries and Aquatic Resources Act, No. 2 of 1996 read with Section 64(a) of the aforesaid Act relating to Beach Seine Fishing and published in Gazette Extraordinary No. 2065/33 of 05th April, 2018, which were presented on 23.10.2019, be approved."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

VI

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Sir, I move,

"That the Regulations made by the Minister of Fisheries and Aquatic Resources Development and Rural Economy under Section 61(1) (t) of the Fisheries and Aquatic Resources Act, No. 2 of 1996 relating to Minimum Standards for the citizens of Sri Lanka engaged in fishing operations in foreign flagged fishing boats and published in Gazette Extraordinary No. 2107/50 of 25th January, 2019, which were presented on 23.10.2019, be approved."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

VII

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Sir, I move,

"That the Regulations made by the Minister of Agriculture, Rural Economic Affairs, Livestock Development, Irrigation and Fisheries and Aquatic Resources Development under Section 61 of the Fisheries and Aquatic Resources Act, No. 2 of 1996 read with Sections 6, 7, 8, 9 and 10 of the aforesaid Act relating to Fishing Operations and published in Gazette Extraordinary No. 2115/8 of 18th March, 2019, which were presented on 23.10.2019, be approved."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කිරීමට කලින් ගරු ඩග්ලස් දේවානන්දා ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, දෙවැනි වගන්තිය කෙරෙහි විශේෂ අවධානය යොමු කරලා, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් ඒක ඉදිරිපත් කරලා ඉවරයි, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කරන්න.

දරුවන් පාසල්වලට ඇතුළත් කිරීමේ විධිමත් ක්‍රමවේදයක්
பாடசாலைகளில் மாணவர்களை அனுமதிப்பதற்கான முறையான வேலைத்திட்டம்
PROPER MECHANISM FOR SCHOOL ADMISSIONS

[අ.භා. 6.31]

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේ විවාදය සඳහා මා මෙම යෝජනාව ඉදිරිපත් කරනවා:

"2020 වසර සඳහා පළමු වසරට ළමුන් ඇතුළත් කර ගැනීමේ කටයුතු මේ දිනවල රට පුරා පාසල්වල සිදු වෙමින් පවතී. මේ අතර පාසල් අධ්‍යාපනය ලැබීමට වයස් සම්පූර්ණ කර ඇති නමුදු, අපේක්ෂිත පාසල් නොලද දරුවන් සැලකිය යුතු සංඛ්‍යාවක් සිටින බවද වාර්තා වේ. මෙම දරුවන්ගේ දෙමව්පියන් විසින් එම දරුවන්ද සමඟ එම පාසල් ඉදිරිපිට විරෝධතා දක්වමින් සිටීමේ අවස්ථා ගණනාවක්ද ජනමාධ්‍ය විසින් වාර්තා කරමින් සිටියි. මෙය ඉතා කනගාටුදායක තත්ත්වයකි.

ජීවිතයේ මහත් බලාපොරොත්තු ඇතිව පාසල් අධ්‍යාපනයට ඇතුළත් වීමට සිටින මෙම දරුවන්ට අපේක්ෂිත පාසල් ලබාදීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මේ කාරණය අද ජාතික මට්ටමින් අවධානය යොමු කළ යුතු ඉතාම තීරණාත්මක ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මෙම ප්‍රශ්නය ජාතියේ ඛේදවාචකයක් බවට පත්වෙලා තිබෙනවා. ඔබතුමා දන්නවා, මේ මොහොත වන විට දරුවන්ගේ ළමා කාලය මුළුමනින්ම අහෝසි වෙලා තිබෙන බව. දරුවෙක් පළමුවැනි වසර සඳහා පාසලට ඇතුළත් කරන්න නොහැකි වුණොත්, ඊට ටිකක් දුරින් පිහිටි ජනප්‍රිය පාසලකට ඇතුළත් කරන්න අම්මලා, තාත්තලා යොමු වෙනවා. දරුවා උදේ 5ට විතර නැඟිට්ටවනවා. ඒත් දරුවා නිදි. දරුවාගේ මුහුණ සෝදනවා. ඒත් දරුවා නිදි. දරුවාට uniform එක අන්දවනවා. ඒත් දරුවා නිදි. දරුවාට බත් කවනවා. ඒත් දරුවා නිදි. ඊළඟට දරුවාගේ පොත් බෑග් එක කරට දමනවා. ඒත් දරුවා නිදි. පාසල් වෑන් රථය එනවා. ඒත් දරුවා නිදි. අම්මලා, තාත්තලා දරුවා වාහනය ඇතුළට තල්ලු කරලා දමනවා. දරුවා වාහනයට නැඟලාත් නිදි. දරුවා පාසලට යනවා. පාසලේදීත් දරුවා නිදි. හවසට ගෙදර එනවා. එතකොටත් දරුවා නිදි. මෙන්න මේ

අවිධිමත් තත්ත්වය නිසා දරුවාගේ ළමා කාලය මුළුමනින්ම අහෝසි කරලා තිබෙනවා. අපේ අධ්‍යාපන පද්ධතිය අද මේ තත්ත්වයට බිඳ වැටීම නිසා අම්මලාට, තාත්තලාට සිද්ධ වෙනවා බලධාරින් පස්සේ, මැති ඇමතිවරුන් පස්සේ ගිහිල්ලා පින්සෙණ්ඩු වෙලා කොහොම හරි ලියුමක් අරගෙන තමන්ගේ දරුවා ජනප්‍රිය පාසලකට තල්ලු කරලා දමන්න. ඒක දැවැන්ත ඛේදවාචකයක් විධියට අපි දකිනවා.

පසුගිය ආණ්ඩුවේ හිටපු ප්‍රසිද්ධ ඇමතිවරයකු වන එස්.බී. දිසානායක මහත්මයා දරුවන්ගේ අම්මලාට, තාත්තලාට කියපු කථාවක් තමයි, ගමේ තිබෙන සියලු පාසල් වසා දමා, තමන්ගේ දරුවන් අනිවාර්යයෙන්ම නගරයේ තිබෙන ජනප්‍රිය පාසල්වලට ඇතුළත් කරන්න කියලා. ඒකට හේතුව මොකක්ද? එතුමා ගමේ පාසලේ ඉගෙන ගත්තේ. නමුත්, එතුමා ගමේ පාසල අමතක කළා. ගමේ පාසල අමතක කරලා අද එතුමා අහිංසක අම්මලාට, තාත්තලාට ජයග්‍රහණය කළ නොහැකි බලාපොරොත්තු ඇති කරනවා.

අම්මා දරුවෙක් දස මාසයක් කුසේ දරාගෙන ඉඳලා මේ ලෝකයට බිහි කරන්න දැවැන්ත වෙහෙසක් දරනවා. එහෙම වෙහෙසක් දරලා දරුවෙක් බිහි කරලා, අවුරුදු 5 සම්පූර්ණ වූවාට පසු පාසලකට ඇතුළත් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යම් වර්ෂයක ජනවාරි 31න් පසු දරුවෙක් ඉපදුණොත්, ඒ දරුවාගේ වයස සම්පූර්ණ නැති නිසා පාසලකට යන්න ඊළඟ වර්ෂය වනතෙක් බලාගෙන ඉන්න ඕනෑ. මේක පුදුම අපරාධයක්. ඒ නිසා, දරුවාගේ වයස සම්පූර්ණ වෙන්නේ ජනවාරි 31ට පෙර නම්, අඩු ගණනේ මාසයකට කලින් දරුවා උපත ලබන්න ඕනෑ. ඒ නිසා වෛද්‍යවරයකු ලවා සිසේරියන් සැත්කමක් මඟින් මේ නොමේරූ දරුවා ගන්න සමහර අම්මලා පෙළඹිලා තිබෙනවා. නොමේරූ දරුවකුගෙන් අපට බලාපොරොත්තු වෙන්න පුළුවන් දේ මොකක්ද? එම දරුවන්ට පළමුවැනි වසරේ ඉඳලා අභියෝග ජය ගැනීමේ හැකියාව, මානසික සහ ශාරීරික වර්ධනය අහිමි වෙනවා. ඒක හරි අපරාධයක්. අද වනතුරුත් මේ පිළිබඳව නිසි ක්‍රියා මාර්ගයක් අරගෙන නැහැ කියලා අප විශ්වාස කරනවා.

අපි දන්නවා, අද පළාත් සභා පාසල් සහ ජාතික පාසල්වල ඉන්න විදුහල්පතිවරු, විදුහල්පතිවරියන්, ඒකට අත් උදවු දෙන උප විදුහල්පති, විදුහල්පතිවරියන්, ඒ පාසලේ ඉන්න ජ්‍යෙෂ්ඨ ගුරුවරුන් - මම කියන්නේ මේ හැම දෙනාම කියලා නොවෙයි - විශාල පිරිසක් මෙම දරුවන් පාසලට ඇතුළත් කරන්න සල්ලි ගන්න පෙළඹිලා තිබෙන බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා, ප්‍රසිද්ධ ජාතික පාසල්වල, පළාත් සභා පාසල්වල විදුහල්පතිවරියන් අල්ලස් ගෙන අල්ලස් දැලට කොටු වෙලා තිබෙන හැටි. ඒ විස්තර අපි පත්තරවල, රූපවාහිනියේ නිවුස්වල දැකලා තිබෙනවා. ඔවුන් දරුවන් විකුණනවා. තමන්ටත් දරුවන් ඉන්නවාය කියන හැඟීම ඔවුන් තුළ ඇත්තේ නැහැ. සමහර මැති ඇමතිවරු තමන්ගේ ධුර කාලය තුළ විදුහල්පතිවරුන්ට ඒ දරුවන් පාසල්වලට ඇතුළත් කර ගැනීමට අවකාශය ලබා දුන්නා. ඒක හරියට "වඳුරාට දැලි පිහිය දුන්නා වාගේ" තමයි. ඒ ක්‍රමය තවම නිවැරැදි වෙලා නැහැ. විශේෂයෙන්, මේ සම්බන්ධයෙන් ගරු රෝහිණී කුමාරි මන්ත්‍රීතුමියත් එක්ක සම්බන්ධ වෙලා, එතුමියගේ සභාපතිත්වයෙන් පළමුවැනි වසරට ළමයි ඇතුළත් කර ගැනීමට විශේෂ ක්‍රමවේදයක් සකස් කරන්න අපි මැදිහත් වුණා. එහිදී, අපි විවිධාකාර තත්ත්ව සැලකිල්ලට ගෙන එම ක්‍රමවේදය සකසා තිබෙනවා. නමුත්, ඒ ක්‍රමවේදය ක්‍රියාත්මක කරන පුද්ගලයන්ගේ තිබෙන ගති, හරියට "ආරේ ගුණ නැරේ - මල්ල කිහිල්ලෙන් නැරේ" කියනවා වාගේ තවමත් වෙනස් වෙලා නැහැ. ඒ නිසා අදත් අම්මලා තාත්තලාට සිද්ධ වෙලා තිබෙනවා, තම දරුවන්ට නියමිත පාසල අහිමි වීම නිසා, ඒ දරුවන් කරේ තබා ගෙන ගිහින්, පාරවල් ගණනේ රස්තියාදු වෙලා, ඔවුන්ගේ අයිතිය ආරක්ෂා කර ගැනීමට බලධාරින්ට සහ දේශපාලනඥයන්ට බලපෑම් කරලා එතුමන්ලාගේ ඇස් අරවන්න. මේ තත්ත්වය ඉතාම කනගාටුදායකයි. මම පෞද්ගලිකව දන්නවා, ජාතික පාසල්වල සහ පළාත් සභා පාසල්වල ඉන්න විදුහල්පතිවරුන්, විදුහල්පතිවරියන් පිළිබඳව. ඒ වාගේම මම මේ පිළිබඳව අවංකව දන්නවා; මට විශ්වාසයක් තිබෙනවා; අත්දැකීමක් තිබෙනවා. මස් රාත්තල් දෙකට, අරක්කු බෝතලයට, සල්ලිවලට මේ දරුවන් පාසලට ගන්නවා. එක දවසක් තංගල්ලේ මස් වෙළෙඳාම් කරන මුදලාලි කෙනෙකු මට කිව්වා, "අනේ මන්ත්‍රීතුමා, කකුල් දෙක අල්ලලා වඳින්නම්, මට කියන්න ලජ්ජයි මගේ දරුවා එක වසරට ඇතුළු කළ පාසලේ විදුහල්පතිවරයාගේ නිවසට හැම දාම මස් කිලෝ දෙක දෙක යවන්න ඕනෑ" කියලා. ඇත්ත කථාවක් මම මේ කියන්නේ. අද මේ වාගේ ඛේදවාචකයක් තමයි තිබෙන්නේ. විළිලජ්ජයි, අරක්කු බෝතලයටත් දරුවා පාසලට ඇතුළත් කර ගන්නවා. පාසලේ විදුහල්පතිවරයා තමයි මේවා ගන්නේ. අපි මේවා ඕනෑ තරම් දැකලා තිබෙනවා. මාධ්‍යවලින් හෙළිදරව් කරලා, දඬුවම් දීලා තිබෙනවා. ඒත් ඔවුන් කිසිම ආකාරයක පාඩමක් ඉගෙන ගෙන නැහැ. මම මේ කියන්නේ හැමකෙනාටම නොවෙයි. මේ සම්බන්ධයෙන් අපි කථා බහ කරලා, ඔවුන්ට පැහැදිලි කර දුන්නා. එක එක රජයන් සහ එක එක 'අමාත්‍යාංශවලින් මේ සම්බන්ධයෙන් විවිධ උපක්‍රම භාවිත කළා. 'ළඟම පාසල-හොඳම පාසල', 'සපිරි පාසල්' සංකල්ප ක්‍රියාත්මක කළා. නමුත් එම පාසල් නිවැරදිව ඒ තැන්වල ස්ථානගත කරලා, එම පාසල්වලට සමගාමීව අඩු පහසුකම් තිබෙන පාසල්වලට භෞතික හා මානව සම්පත් ටික ලබාදීලා එම පාසල් සම්පූර්ණ කිරීමයි කළ යුතු වන්නේ. ඒ සපිරි පාසලට හෝ හොඳම පාසලට හෝ ජනප්‍රිය පාසලට යම්කිසි කිලෝමීටර් ගණනක දුරකින් එම පාසල ආරම්භ කරලා, ඒකට අවශ්‍ය මානව සහ භෞතික සම්පත් ලබාදීම කරනවා නම් අපි විශ්වාස කරනවා, යම් ප්‍රමාණයකට හෝ මේ තත්ත්වයෙන් ගොඩ එන්න පුළුවන්කම තිබෙනවා කියලා. නමුත් ඒ සම්බන්ධයෙන් කටයුතු ක්‍රියාත්මකවීමේදී ඒවා නිසියාකාරයෙන් සිදු වුණේ නැහැයි කියන එකයි අපි සඳහන් කරන්නේ. ඒ නිසා අද සල්ලි තිබෙන මිනිසුන් සුදුසුකම් නැති වුණත් විවිධාකාර ක්‍රම යටතේ තමන්ගේ දරුවන් අවශ්‍ය පාසල්වලට ඇතුළත් කරවනවා. පාසලකට දරුවෙකු ඇතුළත් කර ගැනීමේදී ශාඛමූලික පදනම මත වේවා, ආසන්න පදිංචිය මත වේවා, දෙමව්පියන් ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන්වීම මත වේවා, සහෝදර සහෝදරියන් එම පාසලේ අධ්‍යාපනය ලබා තිබීම සහ තවත් විවිධාකාර සුදුසුකම් පදනම් කර ගෙන ඇතුළත් කර ගත්තත්, අන්තිමේදී මේ එකකටවත් අහු නොවී අහිංසක දුගී දුප්පත් අම්මලා, තාත්තලාගේ දරුවන් තවමත් පාසලක් නැතිව දුක් විඳිනවා. දැන් ජනවාරි මාසයත් අවසාන වෙන්නයි හදන්නේ. ඒ දෙමව්පියන් අපි හම්බ වෙන්න ඇවිල්ලා අපට මේ දුක් ගැනවිලි කියනවා. අපි නිරුත්තරයි ඒවාට. ඒ නිසා සල්ලි නැති මිනිසුන්ට අද මහා ඛේදවාචකයකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. මේවාට යම් ආකාරයක නිවැරදි විසඳුම් තිබෙනවා; විසඳුම් නැත්තේ නැහැ. ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය සහ අපි එකතු වෙලා එතුමියගේ සභාපතිත්වයෙන් යුක්ත කමිටුව සාකච්ඡා කරන වෙලාවේත් එයට සම්බන්ධ වූ විදුහල්පතිවරු, අධ්‍යක්ෂවරු, අධ්‍යාපන ලේකම්තුමන්ලා වැනි විවිධ තලවල ඉන්න අයට අපි මේ තත්ත්වය උදාහරණ සහිතව පැහැදිලි කරලා දුන්නා; තේරුම් කරලා දුන්නා. නමුත්, අදත් මේවා යම් ප්‍රමාණයකින් සිදු වෙනවා. මේවාට තදබල විධියේ දේශපාලන බලපෑම් තිබෙනවා. ඒවාට විදුහල්පතිවරු බොහොමයක් යට වෙලා ඉන්නවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, මෙන්න මේ කියන ආකාරයට කටයුතු සිදු කළොත් යම් ප්‍රමාණයකින් හෝ මේකට විසඳුමක් දෙන්න පුළුවන්කමක් තිබෙනවා කියලා. මේකට නිශ්චිත ගුරු මාරු ප්‍රතිපත්තියක් පළාත් සභා මට්ටමින්, ජාතික පාසල් මට්ටමින් ක්‍රියාත්මක කරනවා නම්, යම්තාක් දුරකට මේකෙන් ගොඩ එන්න පුළුවන්කම තිබෙනවාය කියලා අපි විශ්වාස කරනවා. ඒ ගුරු මාරු ප්‍රතිපත්තිය සාධාරණ සර්වකාලීන එකක් විය යුතුයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, අපට තිබෙන කාලය ඉතා සීමිතයි.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
මම ඉක්මනින්ම කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගුරුවරයෙක් දැන් ඉන්න පාසලේ සිට අල්ලපු පාසලට ස්ථාන මාරු කළාට වැඩක් වෙන්නේ නැහැ. ගුරු මාරු ප්‍රතිපත්තිය ඒක නොවෙයි. ජනප්‍රිය පාසලක අඩු ගණනේ අවුරුදු 3ක් හිටපු ගුරුවරියක් ගමේ පාසලට අවුරුදු 3කට දමනවා නම්, යම්තාක් දුරකට ඒ ගමේ පාසලේ ළමයි ජනප්‍රිය පාසලට එන එක නතර වෙනවා ඇති කියලා අපි විශ්වාස කරනවා.

මම උදාහරණයක් කියන්නම්. හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල කොට්ඨාසයේ නාකුළුගමුව ප්‍රාථමික විද්‍යාලයට සුදුසුකම් ඇති නාකුළුගමුව කුඩාවැල්ල ප්‍රදේශයේ ළමයි සියලුදෙනාම 2017 වසරේ පළමුවැනි වසරට ගියේ තංගල්ල ආදර්ශ ප්‍රාථමික විද්‍යාලයට සහ තංගල්ල ප්‍රාථමික විද්‍යාලයටයි. 2018 අවුරුද්දේ ගුරු මාරු ප්‍රතිපත්තියක් අනුව තංගල්ල ආදර්ශ ප්‍රාථමික විද්‍යාලයේ ගුරුවරියක් නාකුළුගමුව ප්‍රාථමික පාසලට දැම්මා. ඇමතිතුමනි, ඔබතුමා විශ්වාස කරන්න, 2018 අවුරුද්දේදී කුඩාවැල්ලේ ළමයි 50ක් විතර තංගල්ල ආදර්ශ ප්‍රාථමික විද්‍යාලයේ පළමු වසරට එන එක මුළුමනින්ම නතර වුණා. මෙන්න මේ විධියට ප්‍රායෝගික විසඳුම් තිබෙනවා. ගුරු මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන අය හරියට සාධාරණව කල්පනා කරලා ඒ කටයුතු සිදු කරනවා නම්, මම කලින් කියපු විධියට වෙන් වෙලා, කොන් වෙලා, හුදකලා වෙලා ඉන්න දරුවන්ට රස්තියාදු වෙන්න ලැබෙන්නේ නැහැ. ඒ දරුවන්ට සාධාරණයක් ඉටු කිරීමේ හැකියාව එයින් ලැබෙනවාය කියන එක අපි විශ්වාස කරනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් අධ්‍යාපන බලධාරින්ගේ ඇස් ඇරලා, ඇස් යොමු කරලා මේ දරුවන්ට සාධාරණයක් ඉෂ්ට කරන්න මැදිහත් වෙන්න කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා.

[අ.භා.6.44]

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව පළමුව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. නිසි වයස සම්පූර්ණ කර පාසල් අධ්‍යාපනයට ඇතුළත් වීමට සූදානම්ව සිටින දරුවන්ට අපේක්ෂිත පාසල් ලබා දීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් අවශ්‍ය යැයි ද ඒ සඳහා කටයුතු සකස් කරන්න යැයි ද යෝජනා කරමින් ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව ස්ථිර කරමින් ඒ පිළිබඳව යම් අදහසක් ප්‍රකාශ කරන්නට මා බලාපොරොත්තු වෙනවා.

දරුවෙකු පාසලේ පළමු වසරට ඇතුළත් වෙනවා කියන්නේ, ඒ දරුවා ජීවිත ගමන යැම සඳහා අවශ්‍ය මාර්ගයට පා තැබීමයි කියන එක අපි දන්නවා. ඒ වාගේම, දෙමවුපියන්ගේ එකම බලාපොරොත්තුව තම සම්පත වන දරුවන්ට අධ්‍යාපනය ලබා දීමයි. ඒ සඳහා ගන්නා මූලික පියවර තමයි පළමු වසරට දරුවෙකු ඇතුළත් කරවීම. මෙහිදී අප සැලකිලිමත් වෙන්න ඕනෑ කාරණයක් තිබෙනවා. නගරබද පාසල්වල තද බදය ඇති වීම සම්බන්ධයෙන් අප වෙනම කථා කරන්නට ඕනෑ. නමුත්, ගම්බද ප්‍රදේශවල මේ තත්ත්වය ඇති වී තිබීම අප සැලකිල්ලට ගන්න ඕනෑ.

පන්ති කාමරයක සිටින දරුවන් ගණන 40ක් කළ යුතුයි කියන යෝජනාවක් රජය ගෙනැවිත් තිබෙනවා. අපි මේ යෝජනාව පිළිබඳව මීට වඩා විචාරාත්මකව කථා කරන්නට ඕනෑය කියා මම හිතනවා. පය බරවායට පිටිකර බෙහෙත් බැඳලා හරියන්නේ නැහැ කියන එක මම මේ වෙලාවේ මතක් කරනවා. පන්ති කාමරයක ඇත්තටම සිටිය යුතු ළමුන් ගණන කීයද කියන එක පිළිබඳව අපි විවාද කරන්නට ඕනෑ. අධ්‍යාපනය පිළිබඳ ජාත්‍යන්තරයේ තිබෙන පරාමිති මොනවාද කියන එක අප සැලකිල්ලට ගන්න ඕනෑ. මනෝ විද්‍යාඥයන්, එහෙම නැත්නම් අධ්‍යාපනඥයන් පන්තියක සිටිය යුතු ළමයින් ගණන සම්බන්ධයෙන් දරන අදහස් මොනවාද කියන එක අප සැලකිල්ලට ගන්න ඕනෑ. පන්තිවල උගන්වන ගුරුවරුන්, විදුහල්පතිවරුන් ඒ සම්බන්ධයෙන් දරන මතය මොකක්ද කියන එක අප සැලකිල්ලට ගන්න ඕනෑ. ඒ වාගේම, ළමයින් 40ට වැඩියෙන් සිටින, ළමයින් 40ක් සිටින, ළමයින් 35ට වැඩියෙන් සිටින, ළමයින් 20ට වැඩියෙන් සිටින පන්තිවල දරුවන්ගේ අධ්‍යාපන තත්ත්වය කෙසේද යන්න පිළිබඳව ඒ අයගේ මූලික සංකල්ප ලබා ගැනීම පිළිබඳව සමීක්ෂණය කරන්න ඕනෑ. එහෙම කළොත් පන්තියක සිටිය යුතු ළමයින් ගණන 40ද කියන එක පිළිබඳව අපට හොඳ තීරණයක් ගන්න පුළුවන් වෙයි කියා මා හිතනවා. කාලච්ඡේදයකට තිබෙන්නේ මිනිත්තු 40යි කියලා අපි දන්නවා. ඒ මිනිත්තු 40 කාලච්ඡේදය ආරම්භ වීමට පෙර ගුරුවරයා හෝ ගුරුවරිය ළමයින් 40ක් සිටින පන්තියකට ආවොත් මිනිත්තු 40ම උගන්වන්න පුළුවන්. වෙනත් පන්තියක සිට එනකොට මිනිත්තු කිහිපයක් ගත වෙනවා. එතකොට උගන්වන්න පුළුවන් වෙන්නේ මිනිත්තු 35යි කියලා අපි හිතමු. පාඩම ගොඩ නඟන්නට මිනිත්තු 20ක් විතර යනවා. එතකොට දරුවන් පිළිබඳ අධීක්ෂණයට, ඇගැයීම කර ගැනීමට තිබෙන්නේ මිනිත්තු 15යි. පන්තියක ළමයින් 40ක් සිටින විට එක දරුවකු කෙරෙහි අවධානය යොමු කරගන්න ගුරුවරයාට මිනිත්තු භාගයක වෙලාවක් හෝ ලැබෙනවාද කියලා අප සොයන්නට ඕනෑ. ගුරුවරියක වශයෙන් කටයුතු කළ නිසා මම දන්නවා, දරුවන් කෙරෙහි ගුරුවරයාගේ අවධානය යොමු කිරීමේ වගකීම පිළිබඳව වාගේම, ගුරුවරයාගේ පීඩනය කොච්චරද කියන එක පිළිබඳවත්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කතාව කෙටියෙන් අවසන් කරන්නම්. පන්තියේ සිටින ළමයින් 40දෙනා පිළිබඳවම අවධානය යොමු කිරීමේදී ගුරුවරයා ලොකු පීඩාවකට පත් වෙනවා. ගුරුවරුන් කීදෙනෙක් ඇවිත් ඒ පිළිබඳව කථා කරනවාද කියලා මනෝ වෛද්‍යවරුන්ගෙන් ඇහුවොත් කියයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රාථමික පන්තිවල ඉගෙනුම ලබන අවධිය තමයි මූලික සංකල්ප ලබා දෙන අවධිය. නවය පන්තියට විතර යනකල් මූලික සංකල්ප ලබා දීම තමයි සිදු වන්නේ. දරුවාට මූලික සංකල්ප ටික විධිමත්ව නොලැබුණොත් මොකද වෙන්නේ? මෙය කාලය අරගෙන කතා කළ යුතු කාරණයක් වන නිසා මට තවත් පොඩි කාලයක් ලබා දෙන්න. මූලික සංකල්ප ටික විධිමත්ව නොලබන දරුවා මූලික සංකල්ප නැතිව ඉතිරි ටික සම්පූර්ණ කර ගන්නේ කොහොමද, විභාගවලට මුහුණ දෙන්නේ කොහොමද? ප්‍රාථමික පන්තියේදී ළමයින් ගණන වැඩි වුණොත් හොඳද, ළමයින් ගණන අඩු වුණොත් හොඳද කියන කරුණ පිළිබඳව රජය අවධානය යොමු කරයි. ගුරුවරයාට පහසු වෙන්නේ, දරුවාට වඩාත් සුදුසු වන්නේ ළමයින් වැඩි පන්ති කාමරය ද, ළමයින් අඩුවෙන් සිටින පන්ති කාමරය ද?

මෙන්න මේ කාරණාව හේතු කොටගෙන නගරය තුළ ඇති වන තද බදය නැති කරන්නටත්, ගමේ පාසල වැහෙන්න යන එක

නවත්වන්නටත්, තම පරිසරය තුළම වැඩෙමින් දරුවාට ළඟම තිබෙන පාසලට යන්නටත් අවශ්‍ය වටාපිටාව හදා දෙන්න "ළඟම පාසල - හොඳම පාසල" ආදි වැඩසටහන් මඟින් විවිධ අවස්ථාවලදී විවිධ රජයන් තීන්දු අරගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීම සඳහා චක්‍රලේඛයක් එනවා. ඒ තමයි, අංක 2008/21 දරන චක්‍රලේඛය. මේ චක්‍රලේඛය අවුරුද්දෙන් අවුරුද්ද - විටින් විට- සංශෝධනයට ලක් වුණා. මා නියෝජනය කරන අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ අනුකම්ටුවේදීත් 17/2016 දරන චක්‍රලේඛයට අපි සංශෝධන 21ක් ඇතුළත් කළා. එසේ සංශෝධනය කරපු චක්‍රලේඛය තමයි දැන් ක්‍රියාත්මක වෙන්නේ. මේ තිබෙන්නේ, ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක S.C.F.R. No: 235/2011 දරන නඩුවේ තීරණය. පන්තියක ඉන්න ඕනෑ ළමයි ගණන 35යි කියන එක 2016 සිට ඉදිරියට ක්‍රියාත්මක කළ යුතු බවට නියෝගයක් දීලා තිබෙනවා. මෙම ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව මා මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මෙම සීමාව නඩු තීන්දුවකින් ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. එහෙම නම්, ළමයින් සංඛ්‍යාව 40ක් කිරීම සුදුසු ද කියා මා අහනවා.

ඉතිහාසයේ ගත් වැරැදි තීන්දු නිසා -අධිසේවක පදනම මත විදුහල්පතිවරුන් පත් කිරීම, අධිසේවක පදනම මත අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින් පත් කිරීම ආදිය නිසා- ඇති වූ විසඳා ගත නොහැකි ප්‍රශ්න -ගැටලු- ගණනාවක් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ අදත් තිබෙනවා. ඒ වාගේම, නැවත වතාවක් ළමයින් 40ක් පන්ති කාමරයට ගොනු කිරීම මඟින් ඉදිරියට විසඳා ගන්න බැරි ගැටලු ඇති කරන්න එපා කියන කාරණයත් මා මේ අවස්ථාවේදී මතක් කරනවා. පන්ති කාමරයකට ළමුන් 40ක් ඇතුළත් කරලා මේ ඇති කරන්න යන්නේ අලුතින් ගුරු සහායකවරුන් බඳවා ගැනීමේ ක්‍රමයක් නම්, පද්ධතියට හානි වන ආකාරයේ තීන්දු නොගැනීමට වග බලා ගන්න කියාත් මා ඉල්ලා සිටිනවා.

පාසල ආසන්නයේ සිටින දරුවාට කිසිම ගැටලුවක් නැතිව පාසලට එන්න පුළුවන් විධියට ළඟම තිබෙන පාසලේ පහසුකම් වැඩි කරමින් ගුරුවරුන් අවශ්‍ය ප්‍රමාණය ලබා දිය යුතුයි. මා ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව යළිත් වරක් ස්ථිර කරමින්, ළමුන් 40 සංඛ්‍යාවට යන්නේ නැතිව පන්ති කාමර ප්‍රමාණය වැඩි කරමින් හෝ පාසල ළඟ සිටින ළමයාට විධිමත්ව, තද බදයකින් තොරව ඉගෙන ගන්න පුළුවන් ක්‍රමවේදයක් සකස් කර දීම සුදුසුයි කියා මා මේ ගරු සභාවට ප්‍රකාශ කර සිටිනවා.

[අ.භා.6.52]

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තැබීමේ යෝජනාව සම්බන්ධයෙන් මගේ අදහස් ද ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම ගැන මා ඔබතුමාට ස්තුතිවන්ත වනවා. මේ යෝජනාවේ සඳහන් කාරණාව විශේෂයෙන් අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජිකයන් හැටියට එතුමා ද ඇතුළුව අප සියලුදෙනා නිතර සාකච්ඡා කරන මාතෘකාවක්. මේ කාරණය ගැන හැම දාම සාකච්ඡා කරනවා. නමුත්, පන්තියක සිටිය යුතු ළමයි 35 සීමාව 40 කිරීමේ යෝජනාව නිසා අපට තවම ස්ථිර -වෙනස් නොවන- ප්‍රතිපත්තියක් රටට හදා ගන්න බැරි වෙලා තිබෙනවා. අප සලකා බැලිය යුතු ප්‍රධාන කාරණය තමයි, පන්ති කාමරයක සිටිය යුතු ළමයි ගණන 35 කියන යෝජනාව එන්නේ ඇයි කියන එක. මනෝ විද්‍යාත්මකව, ළමයෙකුට ඉගෙන ගන්න තිබෙන වටාපිටාව සැදීම, ලෝකයේ දියුණු රටවල තිබෙන දත්ත සැලකිල්ලට ගැනීම වාගේම අපේ දරුවන්ට අලුතින් හිතන්න, චින්තනය වෙනස් කරන්න අවශ්‍ය වටා පිටාව සැදීමට සුදුසු නීතියක් හැටියට තමයි පන්ති කාමරයක සිටිය යුතු ළමයින් ගණන 35යි කියන නීතිය ඇති වෙන්නේ. ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය කිව්වා වාගේ මේක ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවකින් තීරණය වෙච්ච කාරණයක්. එහෙම නම්, මේ කාරණය සම්බන්ධයෙන් රටට ස්ථිර ප්‍රතිපත්තියක් අවශ්‍යයි. ඒ නිසා මේ 35 සීමාව වෙනස් කරන්න එපා කියලා අපි යෝජනා කරනවා. මේ වෙනස් කිරීම නිසා මූලික වශයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විශාල අර්බුද ගණනාවක් ඇති වනවා. පළමුවන එක තමයි, ළමුන් 35 සීමාව 40 කිරීම නිසා ප්‍රධාන පාසල් ටිකට තිබෙන ඉල්ලුම වැඩි වීම සහ ප්‍රධාන පාසල් ආසන්නයේ තිබෙන කුඩා පාසල් ටික ඔක්කෝම වැසෙන තත්ත්වයක් අනාගතයේදී ඇති වීම.

අපේ රජය තිබුණු කාලයේ "ළඟම පාසල - හොඳම පාසල" වැඩසටහන ක්‍රියාත්මක කරන්න අපි සැලසුම් හදලා, අවශ්‍ය ගොඩනැඟිලි පහසුකම් හා යටිතල පහසුකම් සියල්ල ලබා දුන්නේ අනාගතයේ මෙන්න මෙවැනි ප්‍රශ්නයක් ඇති නොවන්නයි. උදාහරණයක් විධියට මගේ අත් දැකීම් අනුව මම දැක තිබෙනවා, ජපානය වාගේ රටවල ඕනෑම දරුවකුගේ ලිපිනය අනුව කොයි පාසලටද යන්නේ කියන එක ඉබේම තීරණය වෙලා තිබෙනවා. ඒ දරුවා යා යුතු පාසල, ඒ පාසලෙන් වෙනත් පාසලකට යනවා නම් සුවිශේෂී හේතු තියෙන්න ඕනෑ. ඒක ඉතාම අමාරු කාර්යයක්. ඒකට හොඳම විසඳුම තමයි "ළඟම පාසල - හොඳම පාසල" කියන concept එක. තමන්ගේ නිවස ආසන්නයේ - නිවස ළඟ - ඉඳලා පුළුවන් තරම් පයින් යන දුරකින් තිබෙන පාසල්වලට තමයි ලෝකයේ බොහෝ රටවල දරුවන් යන්නේ. නමුත් ලංකාවේ ක්‍රමවේදය තුළ - මට මතකයි, 1982 වර්ෂයේ මම කොළඹ ආනන්ද විද්‍යාලයට එනකොට උදේ හත වෙනකොට කොළඹට එන්න ඕනෑ නිසා උදේ නැඟිටලා, හතරහමාර බස් එකේ ආවේ. 1982 වර්ෂයේ සිටම අපි මේ අර්බුදයේ ඉන්නවා. උදේ හතරහමාරට පිටත්වෙලා ගිහින් ඉස්කෝලේ අවසන් වෙලා ආපහු ගෙදර එනකොට හවස තුනහමාර, හතර වෙනවා. අදත් ඒ තත්ත්වය අපි අත් විඳිනවා. ප්‍රධාන පෙළේ පාසල්වලට එන්නේ එම පාසල් ළඟම පදිංචි දරුවන් නොවෙයි. පැය දෙක, තුනක කාලයක් ගතවෙන දුරක ඉඳන් එන දරුවන් තමයි ඒ පාසල්වලට එන්නේ. මේ නිසා මොකද වෙලා තිබෙන්නේ? එම නිසා දරුවකුට ඉගෙන ගන්න තිබෙන කාල සීමාව සීමාසහිත වෙලා තිබෙනවා. පාසලේ දී ඉගෙන ගන්න කාලයට අමතරව දරුවකුට අලුතින් හිතන්න තිබෙන කාලය සම්පූර්ණයෙන්ම නැති වෙලා තිබෙනවා. එම දරුවා පාසල අවසන් වී නැවත ගෙදර ගියාට පස්සේ මානසික පීඩනයෙන් ඉන්නේ. මහන්සි වෙලා ගෙදර ගියාම ඉක්මනින් කරන්නේ නිදා ගන්න එකයි. එහෙම නැත්නම් ඒ පීඩනයත් එක්ක දරුවා අධ්‍යාපනයෙන් බැහැර වෙනවා. ඒ නිසා අපි කළ යුත්තේ, පන්ති කාමරය තුළ විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයෙන් පරිබාහිරව මේ රටේ අනාගතය ගැන හිතන අලුත් චින්තනයක් ඇති කිරීමයි; අලුතින් හිතන්න පුළුවන් දරු පරපුරක් නිර්මාණය කිරීමයි. ඒකට ඉතා අවශ්‍ය කාරණය තමයි දරුවන් ඉගෙන

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

ගන්නා පරිසරය. ඒ පරිසරය බොහොම සීමිත ඉඩක් බවට පත් වුණොත්, pack වෙන්න, pack වෙන්න දරුවාගේ චින්තන ශක්තිය විනාශ වෙනවා. ඒ නිසා පසුගිය දිනවල අපි ආංශික අධීක්ෂණ කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කළා. ඒ වාර්තාවේ අපි කථා කළේ, STEM අධ්‍යාපනය ගැනයි. විද්‍යාව, ගණිතය, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව සම්බන්ධයෙන් අධ්‍යාපන ක්‍රමය වෙනස් වෙන්න ඕනෑ ආකාරය ගැනයි. එම වාර්තාව අතුළේ මේ සියලු කාරණා ගැන අපි කථා කර තිබෙනවා. විසිඑක් වැනි ශත වර්ෂයට අවශ්‍ය දැනුම, - අපි ඒකට කියනවා "21st Century Skills" කියලා. දරුවන් අධ්‍යාපනය හැදෑරිය යුතු විවිධ ක්ෂේත්‍ර ලෝකය හඳුනා ගෙන තිබෙනවා. එම හඳුනාගත් ක්ෂේත්‍ර පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ඇති දරුවන් බිහි කළේ නැත්නම්, රටේ අනාගතයේ උත්පාදනය වන රැකීරක්ෂාවලට අවශ්‍ය උපාධිධාරීන් බිහි කිරීමෙන් වැළකෙනවා. බොහොම පහසුවෙන් පන්ති කාමරයේ අධ්‍යාපනය කිරීම, නැත්නම් පන්ති කාමරය තුළ චින්තන ශක්තිය වැඩි කිරීම තුළින් දරුවන්ගේ skills develop කිරීම ආදී සියලුදේවල් සඳහා අවශ්‍ය වටපිටාව හැදෙන එකට මේ සියලු කාරණා බලපානවා. ඒ නිසා විශේෂයෙන්ම අපි අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ආණ්ඩු මාරු වෙද්දී ප්‍රතිපත්ති වෙනස් නොකර, පන්ති කාමරයක් තුළ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව තිස්පහ, හතළිහ කරන්න කියලා. මේ දේවල් කරන්නේ තමන්ගේ ඡන්දදායකයන් සතුටු කරන්න නම්, ඒ තුළින් වෙන්නේ අධ්‍යාපනය නැවතත් වළ පල්ලට ගෙන යෑමයි. ඒ නිසා අලුතින් හිතන පරපුරක්, ලෝකය වෙනස් කරන්න පුළුවන් පරපුරක් හදන්න නම්, අලුතින් දියුණු වන තාක්ෂණයත් එක්ක ඉදිරියට යන, skills එක්ක ලෝකය ජය ගන්න කණ්ඩායමක් හදන්න නම් අපේ රටට වෙනස් නොවෙන අධ්‍යාපන ප්‍රතිපත්ති අවශ්‍යයි. ඒ නිසා තමයි "ළඟම පාසල - හොඳම පාසල" වැඩසටහන හරහා මෙන්න මේ ප්‍රතිපත්තිය රටේ ස්ථාපිත කරලා, ගමේ පාසල දියුණු කරන්න අපි යෝජනා කළේ. ගමේ පාසල ඇතුළෙන්ම විශ්වවිද්‍යාලය දක්වා යන දරුවන් බිහි කරන්න පුළුවන් නම් ඒක ඒ ගමට සම්පතක් වෙනවා. ඒ ගම තව තවත් දියුණු වෙනවා. ගමේ දරුවන් ගම ගැන හිතන්න ගන්නවා. අද වෙන්නේ මොකක්ද? නමට විතරක් ගම තිබෙනවා, දරුවන් නගරයට එනවා. අම්මලා, තාත්තලා කරන්නේ මොකක්ද? නගරය ළඟ ගෙයක් කුලියට ගෙන ඒ ගෙදර අම්මා විතරක් ඉන්නවා, තාත්තා ගමේ ඉන්නවා. එහෙම නැත්නම් තාත්තා විතරක් ඒ ගෙදර ඉන්නවා, අම්මා ගමේ ඉන්නවා. මේ ආදී ප්‍රශ්න නිසා අම්මයි, තාත්තයි එකට සිටිය යුතු අපේ වටිනාම සංස්කෘතියත් අද විනාශවෙලා තිබෙනවා. මෙය ඛේදවාචකයක්. මේ ඛේදවාචකය අපි තේරුම් ගත්තේ නැත්නම්, පැලැස්තර අලවන, ඒ වෙලාවේ අවශ්‍යතාවට අනුව විසඳුම් දෙන ක්‍රමවේද ගැනම කථා කළොත් අපේ ශ්‍රී ලාංකීය ජාතිය ඉදිරියට යන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එම නිසා මේ වැදගත් සභාවෙන් අපි ඉල්ලා සිටිනවා, විශේෂයෙන් අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කර ස්ථිර ප්‍රතිපත්තියක්, වෙනස් නොවන ප්‍රතිපත්තියක් ඇති කරන්න උත්සාහ කරන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ වේලාව ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මියගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු ප්‍රසන්න රණතුංග මහතා (කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය සහ සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යතුමා)
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - கைத்தொழில் ஏற்றுமதி மற்றும் முதலீட்டு மேம்பாடு அமைச்சரும் சுற்றுலா மற்றும் விமானச் சேவைகள் அமைச்சரும்)
(The Hon. Prasanna Ranatunga - Minister of Industrial Export and Investment Promotion and Minister of Tourism and Civil Aviation)

"ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු මයන්ත දිසානායක මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு மயந்த திசாநாயக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. MAYANTHA DISSANAYAKE *left the Chair, and* THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *took the Chair.*

[අ.භා.7.00]

ගරු ජානක වක්කුඹුර මහතා (අපනයන කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜானக வக்கும்புர - ஏற்றுமதிக் கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Janaka Wakkumbura - State Minister of Export Agriculture)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියගෙන් අවසරයි.

අපේ ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද යෝජනාව කාලෝචිත යෝජනාවක්. මේ දිනවල පාසල්වලට දරුවන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් සමහර විද්‍යාලවල යම් යම් ගැටලු තිබෙනවා. මා ඊයේ ඇඹිලිපිටියට ගිය වෙලාවේ ඇඹිලිපිටිය ජනාධිපති විද්‍යාලයට -ජාතික පාසලට- දෙමවුපියන් රාශියක් දරුවන් අරගෙන ආවා. ගරු ඇමතිතුමනි, එම පාසලේ තිබෙන ප්‍රශ්නය මේකයි. 1 වසරේ පන්ති 9ක් තිබුණා. අවුරුදු දෙකකට, තුනකට පෙර එයින් පන්ති 2ක් ඉවත් කර තිබෙනවා. මේ රටේ ජනගහනය අඩුවෙලා නැහැ, ජනගහනය වැඩිවෙලා තිබෙනවා. නමුත් පාසල්වල පන්ති අඩුවෙලා තිබෙනවා. එතකොට සිද්ධ වෙන්නේ පාසල්වලට ඇතුළත් කර ගන්නා දරුවන් ප්‍රමාණය තවත් අඩුවීමයි. ඒ අඩුවීම තුළ දරුවන්ට පාසලක් නැතුව ඇවිද ඇවිද ඉන්න වෙනවා. ඒ දරුවන්ගේ දෙමවුපියන් අද රත්නපුරය පළාත් අධ්‍යක්ෂතුමා හම්බ වෙන්නත් ඇවිල්ලා තිබුණා. දැන් ඒ අයට අමාත්‍යාංශයට එන්න කියා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ දරුවන් පාසල් යා යුතු කාලයේ පාසලක් සොයමින් මහ පාරේ ඇවිදින්නට සිදු වෙලා තිබෙනවා. ඒ නිසා මෙම පාසල්වල එක පන්තියක් හෝ වැඩි කරන්නය කියලා මා ඉල්ලනවා. ඒ දරුවන්ගේ දෙමවුපියන් දවස් 2ක් මේ ගැන උද්ඝෝෂණය කළා. පාසල්වල එක පන්තියක් හෝ වැඩි කර දුන්නොත්, ඒ දරුවන් පාසල්වලට ඇතුළත් කර ගන්න පුළුවන්කමක් ලැබෙයි. ඒ පාසල්වල ඉඩ පහසුකම් පවා තිබෙනවා. හැබැයි සමහර විද්‍යාලවල විදුහල්පතිවරු තමන්ගේ හිතු මනාපයට තමයි කටයුතු කරන්නේ. දැන් පාසලට තිබෙන දුර ප්‍රමාණය බලන්න කවකටුව තියලා රවුමක් ගහනවා. ගහක් තිබෙනවාද, ඇළක් තිබෙනවාද, ළමයින්ට එන්න පුළුවන්ද කියලා බලන්නේ නැහැ. මේ ජාතික

පාසල ළඟ චන්ද්‍රිකා වැවට ජලය යන මහ ඇළ තිබෙනවා. මහ ඇළෙන් එහා පැත්තේ තමයි ප්‍රාථමික විද්‍යාලය තිබෙන්නේ. ළමයින් පීනලා යන්නද? ඒ ගොල්ලන්ට ළඟම පාසල මේ පාසලයි. හැබැයි දුර අනුව බැලුවොත් ළඟම පාසල ප්‍රාථමික විද්‍යාලයයි. මේවා තේරුම් ගන්නේ නැතුව තමයි විදුහල්පතිවරු මේ චක්‍රලේඛවලට අනුව වැඩ කරන්නේ.

මගේ ගමේ තිබෙනවා, නිරිඇල්ල විද්‍යාලය. පලාවෙල විද්‍යාලය කියලා තව විද්‍යාලයක් තිබෙනවා. දිගාන කියන ගමේ ළමයින්ට මහ පාර දිගේ බස් එකේ ඇවිල්ලා පලාවෙල විද්‍යාලය ළඟින් බහින්න පුළුවන්. හැබැයි නිරිඇල්ල විද්‍යාලයට කිලෝමීටර් එකහමාරක් පයින් යන්න ඕනෑ. ඒ විද්‍යාලය ළමයින්ට ළඟයි. හැබැයි යන්න තිබෙන්නේ පයින්. බස් එකේ එන ළමයින්ට මහ තිබෙන පාසලට යනවාට වඩා දුර තිබෙන පාසලට යන එක තමයි පහසු වෙන්නේ. අපි බලන්න ඕනෑ, දරුවන්ට පහසුවෙන් යන්න පුළුවන් විධියට පාසලක් තෝරා දෙන්න. එහෙම නැත්නම් අම්මාට, තාත්තාට සිද්ධ වෙන්නේ දරුවා අරගෙන පාසලට යන එන එකයි. 1 වසරට ළමයින් ඇතුළත් කර ගැනීමට ඒ දෙමවුපියන් හැමදාම දේශපාලනඥයන් පස්සේ එනවා. එය අපටත් කරදරයක්; දෙමවුපියන්ටත් කරදරයක්. මේ කරදරය අවසන් කරන්න අපි කටයුතු කරන්න ඕනෑ.

ඊළඟට 6 වසරට දරුවන් ඇතුළත් කර ගැනීමේදීත් ප්‍රශ්නයක් තිබෙනවා. මගේ ප්‍රදේශයේ කලවාන ජාතික පාසලේ විදුහල්පතිතුමා ඒ සම්බන්ධයෙන් එක එක නීති දමනවා. එක පාසලකින් ළමයින් ඇතුළත් කර ගන්නේ නැහැයි කියනවා. ඇත පාසලක ළමයින් ඇතුළත් කර ගන්නවා. මම ඒ ගැන අදත් පළාත් අධ්‍යක්ෂතුමාට කිව්වා. ඒ වාගේ අය ගැන පරීක්ෂණයක් පවත්වලා අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ. නැත්නම් දෙමව්පියන් ළමයින් අරගෙන කාර්යාල වටේ කැරකෙනවා. පළාත් කාර්යාලයට යනවා; කලාප කාර්යාලයට යනවා. අනේ! ඒ දරුවෝත් සුදු පාට ගවුමක්, කමිසයක් ඇඳගෙන අම්මාගේ අතේ එල්ලිලා යනවා. මා ඔබතුමාගෙන් ඉල්ලනවා, ආයෙත් මතු නොවන විධියට මේ ප්‍රශ්නය විසඳන්න කියලා. ගොඩක් වෙලාවට අපි බලන්න ඕනෑ, දරුවාගේ පැත්තෙන්. දරුවාගේ පැත්තෙන් බලලා තමයි මේ ප්‍රශ්නය විසඳන්න ඕනෑ. මා හිතනවා, අපේ ඇමතිතුමා මේ ප්‍රශ්නය පිළිබඳව සාධාරණව බලලා කටයුතු කරයි කියලා. ඇඹිලිපිටිය ජාතික පාසලේ ඒ වහපු පන්ති දෙකෙන් එකක්වත් ආපසු ඇරලා දුන්නොත්, ඒ දරුවන්ගේ ප්‍රශ්නයට යම් කිසි විසඳුමක් ලැබෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දරුවන් වැඩි වෙනවා මිසක් අඩු වෙන්නේ නැහැ නේ. ඉස්කෝල වැහෙන්න හේතුව තමයි සෑම දෙමව්පියෙක්ම තමන්ගේ දරුවා නගරයේ පාසලකට ඇතුළත් කරන්න බලාපොරොත්තු වීම. ඒකට උප්පැන්න සහතිකයේ ඉඳලා ඒ ඉස්කෝලේ ළඟ ලිපිනයක් ඇතුළත් කරලා අවශ්‍ය ලියකියවිලි හදනවා. අපටත් ඒ ගැන කරන්න දෙයක් නැහැ. ගෙවල් කුලියට අරගෙන, ඒ වෙනුවෙන් කරන්න පුළුවන් සියලු දේවල් දෙමව්පියන් කරනවා. ගමේ පාසලට යවන්න කියලා අපි කොච්චර කිව්වත්, ඕනෑම කෙනෙක් කැමැතියි තමන්ගේ දරුවා ඉහළ පාසලකට යවන්න. ගොඩක් අය කියනවා, "ගමේ පාසල වැහෙන්න දෙන්න එපා" කියලා. හැබැයි ඒ ඉස්කෝලවලට ළමයි යවන්නේ නැති අයම තමයි එහෙම කියන්නේ. තමන්ගේ ළමයි ඒ ඉස්කෝලවලට යවන්නේ නැහැ. හැබැයි, "ගමේ පාසල තිබෙන්නම ඕනෑ" කියලා කියනවා. ඒත් ඒ කියන අයගේ ළමයි ඒ ඉස්කෝලවල නැහැ.

අපි සියලුදෙනාගේම බලාපොරොත්තුවක් තිබෙනවා හොඳ පාසල් පද්ධතියක් හදන්න. අපේ ආණ්ඩුව කාලයේ අපි අලුත් පාසල් රාශියක් හැදුවා. මම ඒ කාලයේ පුංචි පාසල් හතක් හැදුවා. අද ඒවා ගොඩක් දියුණු වෙලා තිබෙනවා. අපි "කලවාන රාජකීය විද්‍යාලය" කියලා අලුත් පාසලක් හැදුවා. දැන් එහි ළමයි 600ක් ඉන්නවා. ටවුමෙන් ඈත වුණත් දෙමව්පියන් ඒ ඉස්කෝලෙට දරුවන් අරගෙන යනවා. අපි ඒ වාගේ අලුත් ඉස්කෝල හදලා දෙන්න ඕනෑ.

පසුගිය කාලයේ -මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ කාලයේ- අපි රත්නපුර නව නගරයේ මුල් ගලක් තැබුවා, අලුත් ප්‍රාථමික පාසලක් හදන්න. ඒ දරුවන්ට යන්න පාසලක් නැහැ. අපි අක්කර දහයක ඉඩමක් අරගෙන, ප්ලෑන් එක ඇඳලා, ටෙන්ඩර් කැඳවලා, ඔක්කෝම කරලා මුල් ගලත් තැබුවා; සල්ලිත් දුන්නා. හැබැයි, පසුගිය අවුරුදු හතරහමාරක කාලය තිස්සේ, රත්නපුර නව නගරයේ අපි අලුතින් හදන්න හදපු ඒ පාසලේ ඉදිකිරීම් කටයුතු කිසිවක් කළේ නැහැ. හේතුව, ඒකට අපි "මහින්ද රාජපක්ෂ විද්‍යාලය" කියලා නම තැබුව නිසායි. අපි එදා ඒ ආණ්ඩුවට කිව්වා, "නම අයින් කරලා මේ පාසල හදන්න" කියලා. නමුත් ඒ පාසල හැදුවේ නැහැ. වර්තමාන අපේ ආණ්ඩුවෙන්, ගරු ඇමතිතුමනි, ඔබතුමාගෙන් අපි ඉල්ලනවා, ඒ පාසලේ වැඩ පටන් අරගෙන, රත්නපුර ප්‍රදේශයේ දරුවන්ට තිබෙන ගැටලුවට විසඳුමක් ලබා දෙන්න කියලා. ඒ ප්‍රදේශයේ අලුත් ප්‍රාථමික පාසලක් හැදෙන්න ඕනෑ. එම නිසා, ඒ පාසල හදන්න කටයුතු කරන්න කියා ඉල්ලා සිටිමින්, මේ ප්‍රශ්නය තවත් ඔබ දුවන්නේ නැති වෙන්න, මෙයට ස්ථිරසාර විසඳුමක් ලබා දෙන්න ඔබතුමාට ශක්තිය, ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමින්, මා නිහඬ වෙනවා. ස්තුතියි.

[අ.භා.7.07]

ගරු රංජිත් සියඹලාපිටිය මහතා (අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய - கல்விச் சேவைகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Ranjith Siyambalapitiya - State Minister of Education Services)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඉතාම කාලෝචිත මාතෘකාවක් පිළිබඳව කථා කරන්න මේ සභාව යොමු කරවා තිබීම ගැන ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමාට අපි ස්තුතිවන්ත වෙනවා.

2020 වර්ෂයේ, පළමුවන ශ්‍රේණියට දරුවන් ඇතුළත් කර ගන්නේ 2009.05.24 දිනැති 29/2019 චක්‍රලේඛය අනුවයි. ඒක හැම පාර්ශ්වයක් සමඟම සාකච්ඡා කරලා බොහොම සැලකිල්ලෙන් හදපු චක්‍රලේඛයක්. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු, අධ්‍යාපන ලේකම්වරු, අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු බලධාරීන්ගේ අදහස් එහි ගොනු වෙලා තිබෙනවා. ඒ වාගේම අධ්‍යාපන ලේකම්තුමා 2019.02.22 දින වෙනම චක්‍රලේඛ සංශෝධන කමිටුවක් පත් කළා. එම කමිටුවේ නිර්දේශත් මෙතැන ගොනු වෙලා තිබෙනවා. ඒ වාගේම, විවිධ රාජ්‍ය ආයතනවල සහ ජාතික පාසල්වල විදුහල්පතිවරුන්ගේ අදහස් ඒ සඳහා ගොනු කරගෙන තිබෙනවා. ඒ වාගේම, මහජන නියෝජිතයන්ගෙන් ලැබෙන යෝජනා, විශේෂයෙන්ම පාර්ලිමේන්තු අධීක්ෂණ කාරක සභාවේ යෝජනා යන සියල්ලත් එහි ගොනු වෙලා තිබෙනවා. මෙම චක්‍රලේඛය සකස් කිරීමේදී, ඒ සඳහා උනන්දු වූ සියලු ආයතනවල -මා ඒ ආයතන සියල්ලේම නම් කියන්න යන්නේ නැහැ.- යෝජනා ගොනු කර ගැනීමට විශේෂ වෙහෙසක් දරලා තිබෙනවා. විශේෂයෙන්ම, හැම දාම මේ වෙනුවෙන් අදහස් දැක්වූ, දීර්ඝ කාලයක් ගුරුවරියක ලෙස සේවය කළ, මාතලේ දිස්ත්‍රික්කයේ අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමිය පවා මේ සඳහා යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. මේ සඳහා පත් කළ චක්‍රලේඛ සංශෝධන කමිටුව දිගින් දිගටම මේ පිළිබඳව සාකච්ඡා කර

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

තිබෙනවා. ඔවුන් රැස්වීම් වාර විශාල සංඛ්‍යාවක් පවත්වා තිබෙනවා, ඒකමතික තීරණයකට එන්න. පාර්ලිමේන්තු අධීක්ෂණ කාරක සභාව සමඟද ඉතා සෘජු සම්බන්ධතාවක් පවත්වා, ආංශික අධීක්ෂණ කාරක සභාවේ අධ්‍යාපනය පිළිබඳ අනුකාරක සභාවේ සභාපති, රෝහිණී කුමාරි විජේරත්න මැතිනිය, ගරු නිහාල් ගලප්පත්ති මැතිතුමා, ගරු සිරිනාල් ද මෙල් මැතිතුමා, ගරු වේලු කුමාර් මැතිතුමා, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මැතිතුමා, ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මැතිතුමා යන සාමාජිකයන් සමඟ විශාල වාර ගණනක් සාකච්ඡා කරලා තමයි මේ චක්‍රලේඛය අවසානයේ නීතියක් බවට පත් කර තිබෙන්නේ.

කෙසේ වුවත්, මේ චක්‍රලේඛය ක්‍රියාත්මක කරද්දී යම් යම් ප්‍රශ්න පැන නැඟී තිබෙනවා. අපි මේ සඳහා විසඳුම් ලබා දිය යුතුයි. දරුවන්ට අධ්‍යාපනය, දෙමාපියන්ගේ පීඩනය වෙලා. අපේ ගරු ජානක වක්කුඹුර රාජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ, අද දෙමාපියන් විශාල පීඩනයක ඉන්නවා. එදිනෙදා කටයුතු කර ගැනීමට බැරි තරම් සමාජ පීඩනයක් මේ තුළ නිර්මාණය වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේක අපේ කථා බහට ලක් වූ එක යෝජනාවක්. කෙටි කාලීන විසඳුම්, මැදි කාලීන විසඳුම් සහ දිගුකාලීන විසඳුම් සමඟින් මේ ප්‍රශ්නයට උත්තර හොයන්න ඕනෑ කියලා අධ්‍යාපන අමාත්‍යාංශය හැටියට අපි කල්පනා කරනවා. දැන් මේ සිසුන් 35 කියන සංඛ්‍යාව 40 දක්වා වැඩි කිරීම කියන්නේ, ඉතා කෙටි කාලීන යෝජනාවක්. හැබැයි, මේක හිතුමතේට කරන්න කොයි වෙලාවකවත් අපි උත්සාහ කරන්නේ නැහැ. මොකද, මේක අනිවාර්යයෙන්ම අධිකරණයට කරුණු ඉදිරිපත් කරලා ලබා ගත යුතු තීරණයක්.

තිබෙන අලුත් තත්ත්වයත් එක්ක දැන් තවත් අලුත් යෝජනාවක් ඉදිරිපත් වෙලා තිබෙනවා, චක්‍රලේඛ දෙකක් ඉදිරිපත් කරන්න කියලා. ඒ, විශේෂයෙන් තරගකාරී පාසල්වලට එක් චක්‍රලේඛයක් සහ තරගකාරී නොවන පාසල්වලට තවත් චක්‍රලේඛයකුත් වශයෙන්. මොකද, මේ පාසල් දෙකටම එක චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීම තුළිනුත් මේ ප්‍රශ්නය තවත් බැරෑරුම් වෙලා, උග්‍ර වෙලා, පැටලිලි සහිත වෙලා තිබෙනවා. ඉතින් මෙවැනි උත්සාහ ගන්නා අතරේ, අපි සූදානම් මේවා සඳහා සුදුසු වැඩ පිළිවෙළක් සකස් කරන්න. විශේෂයෙන්ම වර්තමාන රාජ්‍ය නායකයා හැටියට ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා එතුමාගේ වැඩසටහනේ සුවිශේෂී අවස්ථාවක් අධ්‍යාපනය සඳහා ලබා දීලා තිබෙනවා. ඒ තුළ ඉතා පැහැදිලිව හැම දරුවකුටම ලොවට ගැළපෙන අධ්‍යාපනයක් වාගේම, හොඳ අධ්‍යාපනයක් ලබා දීමේ වගකීම පැවරිලා තිබෙනවා. ඒ නිසා අපි සූදානම්, දිගුකාලීන විසඳුම් මේ සඳහා ලබා දෙන්න.

දැනටමත් අපි අධ්‍යාපනඥයන්ගෙන් සැදුම්ලත් කාර්ය සාධන බළකායක් පත් කරලා මාස හයක කාලයක් ලබා දීලා තිබෙනවා, වහාම මේ සඳහා විසඳුම් ලබා දෙන්න කියලා. දැන් අපි සූදානම්, දැනට පවතින ජාතික පාසල් 374 ජාතික පාසල් 1,000 දක්වා වැඩි කරලා ඒ අවශ්‍ය පහසුකම් ඒ පාසල්වලට ලබා දෙන්න. ඒ වාගේම, ත්‍රෛභාෂා පාසල්, සුපිරි පාසල් හැටියට සැලකෙන පාසල් 20ක් හැම දිස්ත්‍රික්කයේම ඇති කරන්න කටයුතු කරනවා. අපේ ගරු ජානක වක්කුඹුර මැතිතුමා කියපු, රත්නපුරයේ නව නගරයේ මුල් ගල් තබා තවමත් ඉදි කර නැති ඒ පාසල ඉතා ඉක්මනින් ඒ යටතේ ඉදි කර ඒ වැඩකටයුතු නිමා කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම, ජනාධිපති කාර්ය සාධන බළකාය හරහාත් අධ්‍යාපනය ශක්තිමත් කරන්න අවශ්‍ය යෝජනා ගන්න අපි සූදානම්.

මම තවත් වැදගත් කාරණාවක් කියන්නම්. අපොස උසස්පෙළ විභාගයෙන් සමත්ව විශ්වවිද්‍යාලයට ඇතුළත් වීම සඳහා Z-score එක තීරණය කිරීමේදී, දැනට පවතින දුෂ්කර දිස්ත්‍රික් පදනම වෙනුවට දුෂ්කර පාසල් හඳුනා ගනිමින් කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මොකද, දැන් දුෂ්කර දිස්ත්‍රික්ක හඳුනා ගෙන තිබෙනවා. හැබැයි, මේ දිස්ත්‍රික්ක ප්‍රමාණයෙන් දැන් සියයට 90ක් දුෂ්කර දිස්ත්‍රික්ක බවටත් පත් වෙලා තිබෙනවා. මෙතැනදී ඒ දිස්ත්‍රික්කය තුළ තිබෙන අසමතුලිතතාව ගැනත් බලන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියත් දන්නවා ඇති, අම්පාර අග නගරයේ පාසලක තිබෙන පහසුකම් සහ ඈත පොතුවිල් සහ අක්කරෙයිපත්තුවේ තිබෙන පාසලක ඇති පහසුකම් අතර ලොකු වෙනසක් තිබෙන බව. ඒ නිසා අපි සූදානම්, පාසල් පද්ධතිය ශ්‍රේණි ගණනාවකට බෙදලා පාසලට පොදු ලකුණු පද්ධතියක් ලබා දෙන්න. ඒ දුෂ්කර පාසලේ දරුවාට - තමන්ගේ දිස්ත්‍රික්කයේ වුණත්- අග නගරයේ තිබෙන පාසලේ සිටින දරුවාට වඩා පහසුවෙන් උසස් අධ්‍යාපනය සඳහා ළඟා වීමට අවශ්‍ය පහසුකම් ලබා දීමට අපි කටයුතු කරනවා.

විභාග කේන්ද්‍රීය නොවන, ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක් සකස් කිරීම සම්බන්ධව අපේ ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමා කථා කළා. වැදගත්ම දේ වන්නේ, රජයෙන් රජයට, එහෙම නැත්නම් ඇමතිවරයාගෙන් ඇමතිවරයාට වෙනස් වන මේ අධ්‍යාපන ප්‍රතිපත්තිය ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් බවට පත් කිරීමයි. මේ සියල්ල පිළිබඳ සරල ක්‍රමයක් තිබිය යුතුයි. දැන් අපි දන්නවා, විශ්වවිද්‍යාලයට දරුවන් ඇතුළත් කිරීම ගැන කාටවත් පීඩනයක් නැති බව. කවුරුත් ඒ සම්බන්ධයෙන් ඇමතිවරයා හොයා ගෙන එන්නෙත් නැහැ, අමාත්‍යාංශයට එන්නෙත් නැහැ. ඒ නිසා එවැනි සරල ක්‍රමයක් හදන්න අවශ්‍යයි. තමන්ගේ දරුවා පාසලට ඇතුළත් කිරීම පිළිබඳව කෙනෙකුට අවබෝධ වෙන ඒ වාගේම, තවත් කෙනෙකුට උල්ලංඝනය කරන්න බැරි ක්‍රමවේදයක් හදන්න අවශ්‍යයි. විශේෂයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශය දරුවන් පාසල්වලට ඇතුළත් කිරීමේ වගකීමෙන් මුදවා, ප්‍රතිපත්ති සකසන්නා බවට පත් කරලා නුදුරු අනාගතයේදී මේ මහා ගැටලුවට දීර්ඝ කාලීන විසඳුම් ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ අතර මේ ප්‍රශ්නයට කෙටිකාලීනව විසඳුම් සොයන්නේ කොහොමද කියන එක ගැනත් අපි වෙහෙසෙනවා කියන කාරණාව වගකීමෙන් ප්‍රකාශ කරනවා. මේ කාලසීමාව තුළ අපේ කාර්ය සාධන බලකායේ සිටින විද්වත් මහත්වරුන්ගේ වාර්තාව ලද විගසම සමාජයේ මේ පිළිබඳ උනන්දුවක් දක්වන සියලුදෙනාගේ, පාර්ලිමේන්තුවේ, ආංශික අධීක්ෂණ කාරක සභාවේ සියලුදෙනාගේ අවධානයට ලක් කරමින් වැඩි දෙනෙකුගේ ඒකමතික තීන්දුව පරිදි දිගුකාලීනව විසඳුම් ලබාදෙන්න අපි බලාපොරොත්තු වෙනවා. එක පැත්තකින් දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබාදීමටත්, අනික් පැත්තෙන් දෙමව්පියන්ට තිබෙන මහා අසහනකාරී පීඩනය නැති කිරීමටත්, ලොවට ගැළපෙන අධ්‍යාපනයක් සහිත දරුවෙක් නිර්මාණය කිරීමේ වගකීම ඉෂ්ට කිරීමටත් අපි බලාපොරොත්තු වෙන බව මේ අවස්ථාවේ වගකීමෙන් ප්‍රකාශ කරනවා.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒ සම්බන්ධයෙන් ගැටලුවක් නැහැ. නමුත් ජනප්‍රිය පාසල්වලට ඇති ඒ පීඩනය නැති කර ගන්න වුවමනා නම්, මා කියපු විධියට අනිවාර්යයෙන්ම ගුරු මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න ඕනෑ. එය පාසලෙන් පාසලට නොවෙයි, අර දුෂ්කර ගමේ තියෙන පාසලට නගරයේ පාසලේ සිටින ජනප්‍රිය ගුරුවරිය අඩුම ගණනේ අවුරුදු තුනකටවත් මාරු කරනවා නම් නගරයේ පාසල්වලට තිබෙන පීඩනය අනිවාර්යයෙන්ම තුනී කර ගන්න පුළුවන්කම තිබෙනවා.

එතකොට දරුවන් නගරයට ගෙනෙන්නේ නැහැ. මම ඒ පිළිබඳව උදාහරණයක් කියමින් සිටියේ ඒ වෙලාවේ. තංගල්ලේ අපි එහෙම දෙයක් කළා. නමුත් ඒක දිගට පවත්වාගෙන යන්නේ නැහැ.

ඊළඟට ඔබතුමා කිව්වා, ජාතික විශ්වවිද්‍යාලවල ඇති ප්‍රශ්නය ගැන. ගරු රාජ්‍ය ඇමතිතුමනි, තවමත් බලන්න, උසස් පෙළ දෙවැනි අවුරුද්දේ විභාගය ගන්නාතුරුම පළමු අවුරුද්දේ විභාග ප්‍රතිඵල එන්නේ නැහැ. ප්‍රතිඵල ආවත් මොකක්ද වෙන්නේ? දෙවැනි අවුරුද්දේ ප්‍රතිඵල එනතුරු විශ්වවිද්‍යාලයට ගන්නේ නැහැ. දෙවැනි අවුරුද්දේ ළමයාගේ ප්‍රතිඵල හොඳයි. නමුත් ඒ ළමයාට ආපසු විශ්වවිද්‍යාලයට යන්න හම්බ වෙන්නේ නැහැ. මේ ගැටලුව තවමත් දිගටම පවතින දෙයක් නේ. මේ සඳහාත් ඉක්මනින් ක්‍රමවේදයක් හදනවා නම්, අපට මේ තිබෙන ගැටලු යම් ප්‍රමාණයකින් නිරාකරණය කර ගන්න පුළුවන් කියලා අපි විශ්වාස කරනවා. අපි මේ කාරණය සෑහෙන කාලයක් තිස්සේ ඔබතුමන්ලාට කියලා තිබෙනවා. අපේ බිමල් රත්නායක සහෝදරයා, සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා, ඒ වාගේම නලින්ද ජයතිස්ස සහෝදරයා මේ පිළිබඳව දිගින් දිගටම කථා කරලා තිබෙනවා. ඒ නිසා මේ ප්‍රශ්නයට එලදායී විසඳුමක් දෙන්න කියන ඉල්ලීම කරනවා.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමා ඉදිරිපත් කළ ඒ කරුණ ඉතා වැදගත්. එය මගේ කථාවෙන් ගිලිහී ගිය කොටසක්. විශේෂයෙන්ම ගුරුවරුන්ගේ පුහුණුව ගැන කථා කරනවා නම්, අප සතුව තිබෙන ගුරු විද්‍යාපීඨ 19ම විශ්වවිද්‍යාල බවට පත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. හැම ගුරුවරයෙක්ම උපාධිධාරී අධ්‍යාපනඥයකු බවට පත් කිරීම එක කාරණාවක්. ඒ වාගේම මේ තිබෙන අසමතුළිත ගුරු මාරු ක්‍රමයට විසඳුම් සොයන්නත් ඕනෑ. අපේ රටේ ගුරුවරුන් දෙලක්ෂ හතළිස් හත්දහසක් ඉන්නවා. ඒ කියන්නේ ළමුන් 17දෙනෙකුට එක ගුරුවරයෙක් ඉන්නවා. එය දකුණු ආසියාවේ ඉතාම හොඳ තත්ත්වයක්. හැබැයි, මේ තිබෙන අසමතුලිතතාව, පාසල් වශයෙන් තිබෙන විෂමතාව, භාෂාමය වශයෙන් තිබෙන විෂමතාව, ඒ වාගේම විෂයයන් වශයෙන් තිබෙන විෂමතාව ඉතාම ඉහළයි. සමහර දිස්ත්‍රික්කයක අග නගරයේ ඇති පාසල්වල ගුරුවරු ඉන්නවා. නමුත් කෙළවර තිබෙන පාසල්වල ගුරුවරු ඇත්තේම නැහැ. සමහර පාසලක අතිරික්ත ගුරුවරු 50ක් ඉන්නවා. භාෂාමය වශයෙන් ගත්තොත්, වතු පාසල්වල අධික ගුරු හිඟයක් තිබෙනවා. මේ සියල්ලම ගොනු කර ගත්ත වැඩසටහනක් තමයි කාර්ය සාධක බලකායට අපි භාරදීලා තිබෙන්නේ. අපි මේ පිළිබඳව ඉතාම විනිවිදභාවයෙන් යුතු වැඩ පිළිවෙළකට යන්න බලාපොරොත්තු වනවා. සරලවම කිව්වොත්, පසුගිය කාලයේ අධ්‍යාපන අමාත්‍යාංශය පත්වෙලා තිබුණේ, ඒ වාගේම වගකීම බවට පත්වෙලා තිබුණේ දරුවන් පාසල්වලට ඇතුළත් කිරීම, ගුරුවරුන් මාරු කිරීම සහ විශේෂයෙන්ම අනධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවා ගැනීම කියන කාරණා සම්බන්ධයෙන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි මෙන්න මේ කාරණා තුනෙන්ම මිදිලා ප්‍රතිපත්ති සකසන්නා බවට ආරූඪ වෙලා ඒ වගකීම භාරගෙන මේ කරුණු සඳහා ස්ථිරසාර පිළියම් සෙවීමේ ව්‍යායාමයක යෙදිලා ඉන්නවාය කියන කාරණය කියන්න කැමැතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 7.18ට, 2020 ජනවාරි 22වන බදාදා අ.භා. 1.00 වන තෙක් කල් ගියේය.

அதன்படி பி. ப. 7.18 மணிக்கு பாராளுமன்றம், 2020 சனவரி 22, புதன்கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 7.18 p.m. until 1.00 p.m. on Wednesday, 22nd January, 2020.

සැ.යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන
නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා
හැන්සාඩ් සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

Contents of Proceedings :

Final set of manuscripts Received from Parliament :

Printed copies dispatched :

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.